අද

2021-02-01
සඳුදා
010 / 021
RS.20/=


# නැ. ජැටියේ තීරණාත්මක දිනය අද

**ආණ්ඩුවෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබෙන ලකුණු**

**සාකච්ඡා අසාර්ථක වුණොත් වෘත්තීය සමිති වැඩවර්ජනයකට සූදානමින්**

● ඉන්දික හේවාවිතාරණ

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය 100%ක් වරාය අධිකාරිය යටතේ පවත්වාගැනීම පිළිබඳව තීරණාත්මක සාකච්ඡාවක් කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සුරැකීමේ වෘත්තීය සමිති එකමුතුව සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමග අද (01දා) පැවැත්වෙයි.

වරායේ නැ.පර්යන්තය පිළිබඳව ජනාධිපතිවරයා විසින් ධනාත්මක ප්‍රතිචාරයක් දක්වා ඇතැයි ද ඒ අනුව අදාළ තීරණය අගමැතිවරයා සමග පැවැත්වෙන සාකච්ඡාවේ දී ප්‍රකාශ වීමට නියමිත බවද වාර්තා වෙයි.

කෙසේ වෙතත් අගමැතිවරයා සමග අද පැවැත්වෙන සාකච්ඡාවලදී නැ.පර්යන්තයේ හිමිකාරිත්වය පිළිබඳව නිසි පිළිතුරක් නොලැබුණහොත් වරාය සේවකයන් වැඩ වර්ජනයක් සිදු කිරීමට තීරණය කර ඇතැයි කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සුරැකීමේ වෘත්තීය සමිති එකමුතුව සඳහන් කරයි.

නැගෙනහිර පර්යන්තයේ කොටස්වලින් ප්‍රමාණයක් ආයෝජකයෙකුට ලබාදීමට ගෙන තිබෙන තීරණය අහෝසි කර, එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන බවට ආණ්ඩුවෙන් ලිඛිත පොරොන්දුවක් අවශ්‍ය බවද එම සංගමයේ සභාපති සංජය කුමාර වැලිගම මහතා සඳහන් කළේය.

නැගෙනහිර පර්යන්තයේ කොටස්වලින් 49%ක් ආයෝජකයෙකුට ලබාදීමට සැලසුම් කිරීමට එරෙහිව 29වැනිදා සවස 1.00 සිට ආරම්භ කළ අකුරට වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය අඛණ්ඩව සිදුකරන බවද ඔහු සඳහන් කළේය.

අදාළ ගැටලුව පිළිබඳ අද (01දා) අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ වෘත්තීය සමිති අතර සාකච්ඡාවක් පැවැත්වෙන බවත්, අකුරට වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය දිගටම පවත්වාගෙන යමින් මෙම සාකච්ඡාවලට සහභාගි වන බවත් කියා සිටියේය.

අදාළ ගැටලුවට නිසි පිළිතුරක් නොලැබුණහොත් සේවයෙන් ඉවත්ව සිටීමේ වෘත්තීය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට තීරණය කර තිබෙන බවද ඔහු පවසා සිටියේය.

අකුරට වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය නිසා වරායවල බහාලුම් මෙහෙයුම් සිදුවන්නේ දෛනිකව 35% - 45%ත් අතර ප්‍රමාණයක් පමණක් බවද හෙතෙම සඳහන් කළේය.

# වරාය රැකගැනීමට දිස්ත්‍රික්ක 14කදී විරෝධතා

● එච්.අයි. තුෂාර

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ කොටස් ආයෝජකයෙකුට ලබාදීමට එරෙහිව අද (01දා) රට පුරා දිස්ත්‍රික්ක දාහතරකදී විරෝධතා ව්‍යාපාර පවත්වන බව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය සඳහන් කරයි.

දහවල් 12.00ට මෙම විරෝධතා ව්‍යාපාර ආරම්භ කරන බවත්, ආණ්ඩුව ගෙන තිබෙන තීරණය වෙනස් කර 100%ක්ම නැගෙනහිර පර්යන්තයේ අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරියට සතුකර දිය යුතු බවත් එම සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ මහතා සඳහන් කළේය.

>>P2



## "නැ. ජැටිය විකිණීම හෝ බදුදීම කිසිවිටෙකත් කරන්නේ නෑ" - අගමැති මහින්ද රාජපක්ෂ

>>P2



## "නැ.පර්යන්තයේ පූර්ණ හිමිකාරීත්වය අහිමිවන පියවරකට පක්ෂ 10ක් විරුද්ධයි" - ජාතිපෙ නායක අමාත්‍ය විමල් වීරවංශ

>>P2




## "වරාය නැගෙනහිර පර්යන්තයේ තත්ත්වය සුබවාදීව විසඳේවි" - වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක

>>P2



## සැෂේ පැකට් හා ප්ලාස්ටික් තහනම මාර්තු 31දා සිට

>>P3

## ව්‍යවස්ථා කමිටුවට මැතිවරණ කොමිෂන් සභාවෙන් කරුණු 8ක්

>>P3

## නිදහස් දින සැමරුම TNA වර්ජනය කරයි

>>P3

## ඊයේත් භූකම්පන

## මඩොල්සිම හා ඒ අවට ගම්මාන කිහිපයකට දින 10ක පමණ කාලයක් ඇතුළත භූ කම්පන 04ක් සිදුවෙලා - ගම්වාසීහු කියති

>>P7


## බන්ධනාගාර, පැලියගොඩ හා දිවුලපිටිය කෝවිඩ් පොකුර 60,174ක්

>>P2

**සමස්ත ආසාදිත සංඛ්‍යාව 64,157ක් දක්වා ඉහළට, සුව වූ පිරිස 57,159ක්, මරණ සංඛ්‍යාව 313කි**

## බස් හිමියෝ සහන ඉල්ලති

**හෙට සිට වෘත්තීය ක්‍රියාමාර්ග, විසඳුම් නොලැබුණොත් 03දා සිට සේවයෙන් ඉවතට**



● ඉන්දික හේවාවිතාරණ

ඉන්දියාවෙන් ලැබුණු කෝවිඩ් - 19 එන්නත යුද හමුදා සමාජිකයන් තිස් එක්දහසකට එන්නත් කිරීම් සිදුකරන බව යුද හමුදා මූලස්ථානය සඳහන් කරයි.

>>P2

## කෝවිඩ් රෝගීන්ගෙන් 23,360ක් කොළඹ දිස්ත්‍රික්කයෙන්

'කෝවිඩ්-19' රෝගීන් වාර්තා වීම යටතේ ඊයේ (31දා) උදෑසන 10.00 පමණ වනවිට රට තුළින් වාර්තා වූ සමස්ත කෝවිඩ් රෝගීන්ගෙන් 23,360දෙනෙකු කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී තිබේ.

>>P2

## යුද හමුදාවේ 31,000කට කෝවිඩ් එන්නත විදිනවා

- යුද හමුදා මූලස්ථානය

>>P3

## කෝවිඩ්-19 වෛරසයේ බලපෑම

**2021 ජන.31 වැනිදා රාත්‍රී 09.00 වනවිට තත්ත්වය**

**මෙරටින් වාර්තා වූ ප්‍රමාණයන්**

| ආසාදිතයන් | මරණ | පූර්ණ සුවය ලැබූ |
|---|---|---|
| 64,157 | 313 | 57,159 |

**ලෝකයේ වාර්තා වූ ප්‍රමාණයන්**

| ආසාදිතයන් | මරණ | පූර්ණ සුවය ලැබූ |
|---|---|---|
| 102,059,807 | 2,201,428 | 73,910,664 |

මෙම QR CODS මගින් ගෲප් වෙත පිවිසිය හැකිය

TELEGRAM VIBER WHATSAPP

නවතම තත්ත්වය දැන ගැනීමට www.ada.lk සහ FB පිටුව වෙත පිවිසෙන්න.

## කාලගුණය

**උපරිම උෂ්ණත්වය**
34°C
රත්නපුරය

**අවම උෂ්ණත්වය**
11°C
නුවරඑළිය

### වැසි තත්ත්වය

උතුර/ උතුරුමැද/ නැගෙනහිර/ ඌව/ වයඹ/ සබරගමුව/ බස්නාහිර පළාත් හා මාතලේ/මාතර/ නුවරඑළිය/ ගාල්ල/ මහනුවර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවල වැසි ඇතිවිය හැකිය.

### සුළං තත්ත්වය

ගිගුරුම් සහිත වැසි සමග තාවකාලික තද සුළං ඇතිවිය හැකිය.

### මුහුද

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය හා මඩකලපුව හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

බලපිටිය සිට කොළඹ, පුත්තලම හරහා මන්නාරම දක්වා හා හම්බන්තොට සිට පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැකිය. සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැකිය.

අද

## කර්තෘ මණ්ඩලය

**ලිපිනය:**
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

**දුරකථන:**
2479670, 2479671

**ෆැක්ස්:**
2479668

**විද්‍යුත් තැපෑල:**
ada@wijeya.lk / adanewspaper@gmail.com

**වෙළෙඳ දැන්වීම් අංශය:**
011 2479 830

**බෙදාහැරීමේ අංශය:**
011 2479 625

**දායකත්ව අංශය:**
011-2479 626

අද

## පාඨක අයිතීන් සුරැකීම

**අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.**

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති.

පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, **ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම** වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.



**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම**

**Press Complaints of Sri Lanka**


**96, කිරුළ පාර, කොළඹ 05.**

| | |
|---|---|
| දුරකතනය | 5353635 |
| ෆැක්ස් | 5335500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |

**FOLLOW US**

facebook.com/ada.daily/
twitter.com/adha_news
instagram.com/adanewspaper/

## අද CARTOON




# "නැ. ජැටිය විකිණීම හෝ බදුදීම කිසිවිටෙකත් කරන්නේ නෑ" – අගමැති මහින්ද රාජපක්ෂ

● අනීෂා මානගේ



කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකිණීම හෝ බදුදීම කිසිවිටෙකත් සිදුනොකරන බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා මේ බව පැවසුයේ, ඊයේ (31දා) තංගල්ල කාර්ල්ටන් නිවෙසේදී මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් අග්‍රාමාත්‍යවරයා,

"කොළඹ වරායේ නැගෙනහිර ජැටිය සම්බන්ධයෙන් ඇති වී තිබෙන ප්‍රශ්නයට ඇත්ත වශයෙන්ම විපක්ෂය අපට චෝදනා කරන්න දෙයක් නැහැ. අපි වරාය කාටවත් දෙන්නෙත් නැහැ. විකුණන්නෙත් නැහැ. බදු දෙන්නෙත් නැහැ. එය අපේ පාලනය යටතේ තිබෙනවා. මම හිතන්නේ වෘත්තීය සමිති ඒක දන්නවා. අපි බොහොම පැහැදිලිව වෘත්තීය සමිතිවලට කියන්නේ අපි මේ පිළිබඳ සාකච්ඡාවක්වත් කරලා නැහැ එහෙම දෙනවද කියලා. ඒ නිසා මේ ගැන ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. අපි කීයටවත් දෙන්නෙත් නැහැ.

වැඩවර්ජන කරන්න දෙයක් නැහැ. මට ඇවිත් කිව්වා නම් මම ඇත්ත පැහැදිලි කරලා දෙනවා. කැබිනට් මණ්ඩලයේ බහුතරයක් ඉන්නේ විකුණන්න ඕනෑ නැහැ කියන පදනමේ. ජනාධිපතිතුමා ඉන්නෙත් ඒ මතයේ. දේපළ විකිණීම අපේ ප්‍රතිපත්තිය නෙවෙයි. ඒ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙනියන්න නෙවෙයි අපට බලයදී තිබෙන්නේ" යනුවෙන් පැවසීය.

# "නැ.පර්යන්තයේ පූර්ණ හිමිකාරිත්වය අහිමිවන පියවරකට පක්ෂ 10ක් විරුද්ධයි" – ජානිපෙ නායක අමාත්‍ය විමල් වීරවංශ

● නවෝද්‍යා පවනි



කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් වරාය අධිකාරියට ඇති පූර්ණ හිමිකාරීත්වය අහිමි වන ආකාරයේ කවර පියවරකට හෝ ආණ්ඩුව ගමන් කරන්නේ නම් තම පක්ෂයද ඇතුළු ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින පක්ෂ 10ක් එයට විරුද්ධව කටයුතු කරන බව ජාතික නිදහස් පෙරමුණේ නායක, කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා පැවසීය.

ආණ්ඩුවේ පක්ෂ 10ක ඒකමතික ස්ථාවරය ප්‍රකාශයට පත් කරමින විමල් වීරවංශ මහතා මේ බවද පවසා සිටියේය.

කොළඹ පිහිටි තම නිල නිවසේදී ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින දේශපාලන පක්ෂ 10ක නායකයන්ගේ සහභාගිත්වයෙන් පැවති සාකච්ඡාවෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ වීරවංශ මහතා,

"කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සුරැකීම වෙනුවෙන් වරාය වෘත්තීය සමිති, ජාතික සංවිධාන එක්ව ගෙනයන සටන පිළිබඳ සාකච්ඡා කිරීමට ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින පක්ෂ 10ක් මෙම ස්ථානයට පැමිණියා. එම පක්ෂ නියෝජනය කරන කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු පක්ෂ නායකයන් ඒ අතර සිටිනවා. එම පක්ෂ 10ට අමතරව අපි තවත් පක්ෂ 04කට ඇරයුම් කළා. ඉන් තුනක් ප්‍රායෝගික හේතූන් මත එන්න බැහැ" කියා දැනුම් දුන්නා.

අපි මෙහිදී මූලිකවම, 'නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් වරාය අධිකාරියට ඇති පූර්ණ හිමිකාරීත්වය අහිමි වන ආකාරයේ යම් පියවරකට ආණ්ඩුව ගමන් කරනවා නම් එයට විරුද්ධ විය යුතුයි' කියන ස්ථාවරයට ආවා. ඒ අනුව ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින දේශපාලන පක්ෂ 10ක් ඒකමතිකව 'කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය පූර්ණ වශයෙන් වරාය අධිකාරිය සතුව තිබිය යුතුයි' යන ස්ථාවරයේ තමයි ඉන්නේ. 'නැගෙනහිර පර්යන්තයේ කිසිම කොටසක් කවර හෝ පාර්ශ්වයකට ලබා නොදිය යුතුයි, එය වරාය අධිකාරියට පමණක් සතු විය යුතුයි' යන ස්ථාවරයේ සිට අපේ පක්ෂ 10 ක්‍රියා කරනවා. ඉදිරියේදීත් අපේ පක්ෂ 10 ආණ්ඩුවේ මෙන්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව වෙනුවෙනුත් රටේ සුබ සිද්ධිය වෙනුවෙනුත් එකට එකතු වී කටයුතු කිරීමටත් මේ අවස්ථාවේදී එකඟතාවකට ආවා.

අපේ ජනබල පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී පූජ්‍ය අතුරලියේ රතන හිමි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්, රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර, පිවිතුරු හෙළ උරුමයේ නායක, බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල, නව ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක, රාජ්‍ය අමාත්‍ය වාසුදේව නානායක්කාර, ලංකා සම සමාජ පක්ෂය ප්‍රධාන ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ, ජාතික නිදහස් පෙරමුණේ ජාතික සංවිධායක, රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ, ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග යන පිරිස මෙම සාකච්ඡාවට එක්ව සිටියහ.

# පැය 4ක දී රථවාහන නඩු 5,514ක්

● ඉන්දික හේවාවිතාරණ

පැය හතරක කාලයක් සමස්ත ලංකාවම ආවරණය වන ආකාරයට සිදුකළ විශේෂ පොලිස් මෙහෙයුමකදී රථවාහන වැරදි සම්බන්ධ නඩු 5,514ක් ලබාගෙන ඇතැයි පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

අදාළ මෙහෙයුම සිදුකළ කාලය තුළදී රථවාහන 43,596ක් පරීක්ෂා කර තිබෙන අතර, මෙහිදී බීමත් රියැදුරන් 195ක් අත්අඩංගුවට ගෙන තිබේ.

වරෙන්තුකරුවන් 243දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙන අතර, මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් පුද්ගලයන් 172ක්, බඳින තුවක්කු සමග තිදෙනෙකු, සැකපිට පොලීසියට අවශ්‍ය කර සිටින සැකකරුවන් හතළිහක් හා සැකපිට 201දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙන බවද පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

මෙම මෙහෙයුමේදී පුද්ගලයන් 80,985ක් පරීක්ෂා කළ බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා සඳහන් කළේය.

මෙම මෙහෙයුමේදී බඳින තුවක්කු තුනක්, නීති විරෝධී මත්පැන් ලීටර් 8942ක්, කංසා කිලෝග්‍රෑම් 07 ග්‍රෑම් 331ක්, හෙරොයින් ග්‍රෑම් 27ක්, වෙනත් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 337ක් අත්අඩංගුවට ගෙන තිබේ.

පසුගිය 30වැනිදා සවස 2.00 සිට සවස 6.00 දක්වා කාලය තුළදී මෙම මෙහෙයුම් සිදුකර තිබෙන අතර, මේ සඳහා පොලිස් නිලධාරීන් 14,420ක් සහභාගි වී තිබේ. මාර්ග බාධක 1964 යොදා සිදු කළ මෙම මෙහෙයුමේදී අත්අඩංගුවට ගත් පුද්ගල ප්‍රමාණය 611කි.

## පළමු පිටුවෙන්...

### කෝවිඩ් රෝගීන්ගෙන් 23,360ක්...

මීට අමතරව ගම්පහ දිස්ත්‍රික්කයෙන් කෝවිඩ් රෝගීන් 12,820ක්, පුත්තලම දිස්ත්‍රික්කයෙන් රෝගීන් 681ක්, කළුතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 4,321ක්, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 215ක්, මහනුවර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 2,427ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1,191ක්, පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් රෝගීන් 149ක්, යාපනය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 192ක්, රත්නපුර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1206ක්, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1067ක්, මොනරාගල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 255ක්, අම්පාර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1211ක්, මාතලේ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 486ක් වාර්තා වේ.

එමෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1,357ක්, බදුල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 342ක්, මාතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 853ක්, මඩකලපුව දිස්ත්‍රික්කයෙන් රෝගීන් 332ක්, හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් රෝගීන් 333ක්, වවුනියාව දිස්ත්‍රික්කයෙන් රෝගීන් 317ක්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 404ක්, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 742ක්, කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 35ක්, මන්නාරම දිස්ත්‍රික්කයෙන් රෝගීන් 136ක්, මුලතිව් දිස්ත්‍රික්කයෙන් රෝගීන් 15ක් වශයෙන් ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකින්ම කෝවිඩ් රෝගීන් වාර්තා වී තිබෙන බව වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි.

මීට අමතරව කෝවිඩ්-19 රෝගීන් බවට සැකකරන පුද්ගලයන් 767දෙනෙක් වෛද්‍ය අධීක්ෂණය යටතේ ප්‍රතිකාර ලබා ගනිමින් සිටිති.

විදේශ රටවල සිට පැමිණි ශ්‍රී ලාංකිකයන් 1892දෙනෙකුට ඊයේ (31දා) දිනය වනවිට 'කෝවිඩ්-19' වෛරසය ආසාදනය වී ඇතැයි තහවුරු වී තිබෙන අතර, මෙරටට පැමිණි විදේශිකයන් 150දෙනෙකුටද 'කෝවිඩ්-19' වෛරසය ආසාදනය වී තිබෙන බවට තහවුරු වී ඇත.

ශ්‍රී ලංකාවේ ජනගහනය සැලකීමේදී මිලියනයකට රෝගීන් 2903ක් වාර්තා වන අතර, මරණ ප්‍රමාණය මිලියනයකට 13ක් ලෙස වාර්තා වේ.

### බස් හිමියෝ සහන ඉල්ලති...

පසුගිය 29 වැනි දින යුද හමුදා සාමාජිකයන් දහසකට එන්නත් ලබාදීම සිදුකළ බවත්, ඉන් පසුව සෑම දිනකම හත්දහස් පන්සීයකට එන්නත් ලබාදීම සිදුකල බවත් යුද හමුදා මාධ්‍ය අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් නිලන්ත ප්‍රේමරත්න මහතා සඳහන් කළේය.



මේ අනුව අදාළ එන්නතේ පළමු මාත්‍රාව ලබාදීම හෙට (02දා) දිනයෙන් අවසන් වන බවත්, නාරාහේන්පිට යුද හමුදා රෝහල, පනාගොඩ යුද හමුදා රෝහල යන රෝහල් තුළ සේවය කරන යුද හමුදා වෛද්‍යවරුන්ට හා අනෙකුත් සෞඛ්‍ය කාර්යමණ්ඩලවලට සහ කෝවිඩ් 19 මර්දන කටයුතුවල නිරත හමුදා සාමාජිකයන්ට අදාළ එන්නත ලබාදීම සිදුකරන බවත් ඒ මහතා කියා සිටියේය. කෝවිඩ් - 19 එන්නත ලබාදීම පසුගිය 29 වැනි දින නාරාහේන්පිට යුද හමුදා රෝහලේදී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

### වරාය රැකගැනීමට දිස්ත්‍රික්ක...

මේ අනුව අද දහවල් 12.00ට අම්පාර විදුලි බලමණ්ඩලය ඉදිරිපිට, මොනරාගල මැදගම නගරය, ගාල්ල නගරය, වරාය ඉදිරිපිට, හබරාදූව සහ බද්දේගම නගරවල, හලාවත රෝහල ඉදිරිපිට, පුත්තලම නගරය, වෙන්නප්පුව හා ආණමඩුව නගරවල, අනුරාධපුර DS වටරවුම අසල යන ස්ථානවලදී විරෝධතා පැවැත්වෙන බවද ඔහු පවසා සිටියේය.

මීට අමතරව ගම්පහ දුම්රියපොළ ඉදිරිපිටදී, පොළොන්නරුව හා මැදිරිගිරිය නගරවලදී, ත්‍රිකුණාමල වරාය ඉදිරිපිටදී, කුරුණෑගල හා කුලියාපිටිය නගරවලදී, රත්නපුර හා ඇඹිලිපිටිය නගරවලදී, හම්බන්තොට, බෙලිඅත්ත, අම්බලන්තොට නගරවලදී, කඹුරුපිටිය නගරයේදී, මාතලේ නගරයේදී හා නුවරඑළිය රාගල නගරයේදී ද මෙම උද්ඝෝෂණ පවත්වන බවද හෙතෙම සඳහන් කළේය.

# "වරාය නැගෙනහිර පර්යන්තයේ තත්ත්වය සුබවාදීව විසදේවි" – වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර පර්යන්තය පිළිබඳ මතුව ඇති ආන්දෝලනාත්මක තත්ත්වය සුභවාදීව විසඳෙනු ඇතැයි බලාපොරොත්තු වන බව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා පැවසීය.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්මන් තත්ත්වය පිළිබඳ දැනුම්දීම සඳහා පෙරේදා (30දා) පැවැති මාධ්‍ය හමුවක් අමතමින් ඔහු මේ බව කීය.

නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලු වෘත්තීය සංගම් ඇතුළු පාර්ශ්වවල අදහස් යෝජනා පදනම් කරගනිමින් රජය වෙත ඉදිරිපත් කළ වාර්තාව රජය විසින් අනුමත කරනු ඇතැයි විශ්වාස කරන බවද ඒ මහතා සඳහන් කළේය.

පසුගිය රජය ඇති කළ තත්ත්වයක් මත නිර්මාණය වූ මෙම තත්ත්වය, ජාත්‍යන්තරය හා සම්බන්ධ අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් පසු විසඳ ගැනීමේ යම් යම් ගැටලු අවස්ථා උද්ගත වන බවත්, ඒ සඳහා නිසි ක්‍රමවේද ඔස්සේ පියවර ගන්නා බවත් හෙතෙම සඳහන් කළේය.

ඒ අනුව නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේම මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවකාශය හිමිවනු ඇති බවට විශ්වාස කරන බවත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය, සියලු සේවක මහත්ම මහත්මීන් හා සියලු වෘත්තීය සමිති මේ සඳහා එක්සත්ව කටයුතු කරමින් නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පවත්වාගැනීමට නොපසුබට උත්සාහයෙන් කටයුතු කළ බවත් රත්නායක මහතා තවදුරටත් කියා සිටියේය.

# බන්ධනාගාර, පෑලියගොඩ හා දිවුලපිටිය කෝවිඩ් පොකුර 60,174ක්

**සමස්ත ආසාදිත සංඛ්‍යාව 64,157ක් දක්වා ඉහළට, සුව වූ පිරිස 57,159ක්, මරණ සංඛ්‍යාව 313කි**

● ඉන්දික හේවාවිතාරණ

බන්ධනාගාර, පෑලියගොඩ හා දිවුලපිටිය 'කෝවිඩ්-19' පොකුර තුළින් ඊයේ (31දා) දිනයේදී රෝගීන් 837ක් වාර්තා වීමත් සමග එම පොකුරු තුළින් වාර්තා වන සමස්ත රෝගීන්ගේ සංඛ්‍යාව 60,174ක් දක්වා ඉහළ ගොස් ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත 'කෝවිඩ්-19' රෝගීන්ගේ සංඛ්‍යාවද 64,157ක් දක්වා ඉහළ ගොස් තිබෙන අතර, 'කෝවිඩ්-19' හේතුවෙන් සිදුව ඇති මරණ සංඛ්‍යාව 313කි. සුවය ලැබූ සමස්ත රෝගීන්ගේ ප්‍රමාණය 57,159කි.

# නිදහස් දින සැමරුම TNA වර්ජනය කරයි

● වවුනියාව මධුෂංඛ අමරසිංහ

මෙවර 73 වැනි ජාතික නිදහස් දිනය හා ජාතික නිදහස් දින සැමරුම වර්ජනය කිරීමට දෙමළ ජාතික සන්ධානය තීරණය කර ඇතැයි දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා පැවසීය.

ඉලංගෙයි තමිල් අරසුකච්චි පක්ෂයේ ඊයේ (31දා) පැවැති දේශපාලන මණ්ඩල සාකච්ඡාවෙන් පසුව මාධ්‍ය හමුවක් පවත්වමින් සුමන්තිරන් මහතා මේ බව කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා පවසා සිටියේ,

"දෙමළ ජනතාවට සිදුවන අඛණ්ඩ මර්දනයන් හේතුවෙන් මෙවර ජාතික නිදහස් දිනය වර්ජනය කිරීමට තීරණය කළා. ඒ වගේම මෙරට සිදු වූ බව කියන මානව හිමිකම් කඩවීම් හා ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ මීළඟ සැසිවාරය සඳහා වන නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පත් කර ඇති ත්‍රිපුද්ගල විශේෂ කමිටුව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රතික්ෂේප කළ යුතුයි.

උතුරු නැගෙනහිර පළාත්වල ජීවත්වන දෙමළ ජනතාවට එරෙහිව ආණ්ඩුව විසින් සිදු කරනු ලබන මර්දනයන් පිළිබඳ අප සාකච්ඡා කරනු ලැබුවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන අප ජනතාවගේ ඉඩම් අත්පත් කර ගැනීම් ආරම්භ කර තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හින්දු ආගමික සිද්ධස්ථාන වෙනස් කිරීමේ සැලසුමක් ක්‍රියාත්මක කරන ආකාරයක්ද වර්තමානයේ දැක ගන්න පුළුවන්.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මීළඟ සැසිවාරය සඳහා සියලු දෙමළ දේශපාලන පක්ෂවල එකඟතාව එම කවුන්සිලයේ සියලු සාමාජික රටවල තනාපතිවරුන් වෙත යැවීමට හැකිවීම පිළිබඳ සතුටු වෙනවා.

මේ අතර වත්මන් ආණ්ඩුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් කමිටුවක් පත් කර තිබෙනවා. එයට අපගේ අදහස් යෝජනා දැනටමත් අප යවා අවසන්. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්නේ නම් එහි ජාතික ගැටලුව සඳහා වන විසඳුමක් අඩංගු විය යුතුමයි. ජාතික ගැටලුවට විසඳුමක් නොමැති නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් කිසිදු ඵලයක් අත් නොවන බව අප පෙන්වා දී තිබෙනවා.

එම කමිටුව එළඹෙන 20 වැනිදා අප පක්ෂය හමුවීමට සූදානම්ව සිටිනවා. එම අවස්ථාවේදීත් අපි අපගේ ස්ථාවරය දැනුම්දීමට කටයුතු කරනු ලබනවා.

ශ්‍රී ලංකාවේ ජාතික නිදහස් දින සැමරුම දෙමළ ජනතාව අඛණ්ඩව වර්ජනය කර තිබෙනවා. ශ්‍රී ලංකාවේ නිදහස් දිනය අපි සමරන්නේ නැහැ. නමුත් පසුගිය ආණ්ඩුව කාලයේදී ලබාදුන් පොරොන්දු හේතුවෙන් ජාතික නිදහස් දින සැමරුමට මමත් සම්බන්ධන් මහතාත් සහභාගි වුණා. එහෙත් එම ආණ්ඩුවත් අපට ලබාදුන් පොරොන්දු ඉටු කිරීම අමතක කළා. එබැවින් මෙවරත් අපි ජාතික නිදහස් දිනය වර්ජනය කරනු ලබනවා" යනුවෙනි.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ශ්‍රීධරන්, ඉලංගෙයි තමිල් අරුසකච්චි පක්ෂ නායක මාවෙයි සේනාධිරාජා මහත්වරුන් ඇතුළු පිරිසක්ද සහභාගි වූහ.

# ව්‍යවස්ථා කමිටුවට මැතිවරණ කොමිෂන් සභාවෙන් කරුණු 8ක්

● ඉන්දික හේවාවිතාරණ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා පත් කර ඇති කමිටුව වෙත මැතිවරණ ක්‍රියාවලියට අදාළව හා මන්ත්‍රීවරුන් සම්බන්ධ කරුණු අටකින් යුත් යෝජනාවක් භාරදීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර තිබේ.

මේ අනුව පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ඉදිරිපත් කරන ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූර ඡන්ද විමසීමෙන් පසු දින 07ක් තුළ නම් කළ යුතු බවත්, එසේ නොකරන අවස්ථාවලදී අදාළ පක්ෂය නාමයෝජනා ලබාදෙන විට භාරදෙන ජාතික ලැයිස්තු නාමලේඛනයේ අනුපිළිවෙළට මන්ත්‍රී ධූර ගැසට් කිරීමට අදාළ යෝජනාව ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත.

මීට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බවට පත් වී පළමු වසර දෙක තුළදී රෝගී තත්ත්වයක් හෝ වෙනත් විශේෂ හේතුවක් නොමැතිව අදාළ කාලය තුළ පවත්වන පාර්ලිමේන්තු දින ගණනින් තුනෙන් එකක්වත් සහභාගී නොවන මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී ධූර අහෝසි කරන ලෙසත් යෝජනාවක් සකස් කර තිබේ.

මීට අමතරව පුරවැසියන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සෘජුවම මූලික අයිතිවාසිකමක් ලෙසට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමේ යෝජනාව හා මැතිවරණයට තරග කරන සෑම අපේක්ෂකයෙකුම ප්‍රතිඵල නිකුත් කර දින 30ක කාලයක් තුළ මැතිවරණ වියදම් හා ආදායම් මූලාශ්‍ර කොමිසමට ලබාදීමේ යෝජනාව හා නියමිත කාලය තුළ අදාළ වාර්තා ලබානොදෙන පිරිස් හා දෝෂ සහිතව වාර්තා ඉදිරිපත් වන පිරිස්වලට මන්ත්‍රී ධූර අහෝසි කිරීම හා පරාජිත අපේක්ෂකයෙකු නම් ඔහුට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට අදාළ බලය මැතිවරණ කොමිසමට ලබාගැනීමේ යෝජනාව පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරයෙකු වරදක් සිදු කර අධිකරණයෙන් වරදකරුවෙකු ලෙස පසු ඔහු මන්ත්‍රී ධූරයක් දැරීමට නුසුදුස්සෙකු වන්නේ නම්, ඒ පිළිබඳ විමර්ශනය කර මන්ත්‍රී ධූරයෙන් හෝ සභික ධූරයෙන් එම තැනැත්තා ඉවත් කිරීමේ බලය මැතිවරණ කොමිසමට ලබාදීම.

මීට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්ම තරුණ හා කාන්තා නියෝජනය ප්‍රතිශතයක් ඇති කිරීමට අදාළ යෝජනාවත් ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

ජනමත විචාරණයකදී දැනට පවතින එක් නිශ්චිත කරුණක් පිළිබඳ ජනමත විමසීම පමණක් වන නිසා යම් විධානයක් හෝ විධාන කිහිපයක් සඳහා ජනතා අදහස් ලබා ගැනීමට හැකිවන පරිදි සංශෝධන ඉදිරිපත් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට තීරණය කර තිබේ.

# සැෂේ පැකට් හා ප්ලාස්ටික් තහනම මාර්තු 31දා සිට

● නිදර්ශනී වික්‍රමසිංහ

තනි භාවිත සහ කෙටිකාලීන භාවිත ප්ලාස්ටික් තහනම එළඹෙන මාර්තු 31වැනිදා සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඒ අනුව ශුද්ධ පරිමාව මිලිලීටර 20ට/ශුද්ධ බර ග්‍රෑම් 20ට සමාන හෝ ඊට අඩු සැෂේ (ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීමට භාවිත කිරීම සඳහා හැර), හුළංවලින් පිරවිය හැකි සෙල්ලම් බඩු (බැලුන්, බෝල, දියමත පාවෙන/පිහිනුම් තටාකවලදී භාවිත කරන සෙල්ලම් බඩු සහ ජල ක්‍රීඩා උපකරණ හැර), ප්ලාස්ටික් කූර (Stem) සහිත කොටන් බඩ්ස් (Cotton Buds) (වෛද්‍ය/සායනික ප්‍රතිකාර සඳහා භාවිත කරන ප්ලාස්ටික් කොටන් බඩ්ස් හැර) භාවිතය තහනම් කර ඇත.

ජාතික පාරිසරික පනතින් පරිසර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ප්ලාස්ටික් නියාමනයට අදාළ ගැසට් පත්‍ර 02ක් නිකුත් කිරීමට පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා කටයුතු කර ඇති අතර, ඊට අදාළ නියාමන කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

එහිදී අංක 2211/51-2021 ජනවාරි මස 21 වැනි දින දරණ ගැසට් පත්‍රයට අනුව ඉහත සඳහන් කරන ලද නිෂ්පාදිතවලට අමතරව යම් ක්‍රියාවලියක්, වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා භාවිත කරනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා පොලිඑතිලීන් ටෙරප්තැලේට් (PET) හෝ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC) ද්‍රව්‍ය භාවිතයද තහනම් කර තිබේ.

මීට අමතරව අංක 2211/50- 2020 ජනවාරි මස 21වැනි දින දරණ ගැසට් පත්‍රය යටතේ එක් එක් ප්ලාස්ටික් වර්ගය හඳුනාගැනීම සඳහා යෙදිය යුතු ජාත්‍යන්තරව භාවිත කරනු ලබන සංකේත ක්‍රමයක් හඳුන්වා දී තිබේ.

ප්ලාස්ටික් අයිතම භාවිතය මගින් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම මෙම තහනම හරහා අපේක්ෂා කෙරෙන අතර, මාර්තු මස 31වැනි දිනට පසු අදාළ ප්ලාස්ටික් නිෂ්පාදනය සහ වෙළෙඳාම් කරන පුද්ගලයන්ට එරෙහිව ජාතික පාරිසරික පනතට අනුව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවද මධ්‍යම පරිසර අධිකාරිය අවධාරණය කරයි.

# ශ්‍රී ලංකා ක්‍රිකට් හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කෝප් හමුවට

● නිදර්ශනී වික්‍රමසිංහ

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම මසදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) හමුවට කැඳවීමට එම කාරක සභාව තීරණය කර තිබ්.

ඒ අනුව එළඹෙන 11වැනිදා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කෝප් කමිටුවට කැඳවීමට නියමිතය. එසේම 12වැනිදා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කැඳවීමට නියමිත අතර, එහිදී ළමා අපයෝජන සම්බන්ධයෙන් වන විශේෂ විගණන වාර්තාව සැලකිල්ලට ගනු ඇත.

මීට අමතරව මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධිඅවදානම් කලාපවල ජීවත්වන ජනතාව නැවත පදිංචි කිරීමට අදාළ ව්‍යාපෘතියේ ප්‍රගතිය විමසා බැලීම 24වැනිදා සිදු කිරීමට කෝප් කමිටුව තීරණය කර තිබේ.

අනතුරුව ශ්‍රී ලංකාවට ප්ලාස්ටික් ආනයනය කළමනාකරණය කිරීම සහ ඒවා මෙරට තුළ භාවිතය පිළිබඳ විශේෂ විගණන වාර්තාවක් 26වැනිදා සැලකිල්ලට ගැනීමට නියමිත බවද සඳහන්ය.

# මුස්ලිම් නීතිය සංශෝධනය කිරීමට වෙනම කමිටුවක්

● නිදර්ශනී වික්‍රමසිංහ

මුස්ලිම් නීතිය සංශෝධනය කිරීම සඳහා වෙනම කමිටුවක් පත්කර ඇති බව අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා ප්‍රකාශ කළේය.

හෙතෙම සඳහන් කර සිටියේ නීති සංශෝධනය සම්බන්ධයෙන් වූ ක්‍රියාවලිය ආප්ප බාන්නා සේ සිදු කළ නොහැකි බවයි.

කෙසේ වුවද කමිටු 11ක් පත්කර නීතිය පිළිබඳ සංශෝධන මේ වනවිට සිදු කරමින් පවතින බවද අමාත්‍යවරයා පැවසීය.

කොළඹදී පැවැති උත්සවයක් අමතමින් පෙරේදා (30දා) මේ පිළිබඳ වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා,

"මේ වනවිට අපි කමිටු 11ක් දාලා නීතිය පිළිබඳ සංශෝධන කරගෙන යනවා. මේක ආප්ප බානවා වගේ එක දවසින් කරන්නට බැහැ, මට ඕන දේවල්. මුස්ලිම් නීතිය සංශෝධනය කිරීම සඳහාත් මම වෙනම කමිටුවක් දාලා තියෙනවා. ඒක මට අමතක වෙලා නැහැ." යැයි පැවසීය.

# වරාය කොටස් ලබාදීමට එරෙහිව කොළඹදී අද සත්‍යග්‍රහ ව්‍යාපාරයක්

● එච්.අයි. තුෂාර

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ කොටස් ඉන්දීය ආයෝජකයෙකුට ලබාදීමට ගෙන තිබෙන තීරණය අහෝසි කරන ලෙස ඉල්ලා කොළඹදී අද (01දා) සත්‍යග්‍රහ ව්‍යාපාරයක් පවත්වන බව ජාතික භික්ෂු පෙරමුණ සඳහන් කරයි.

ස්වාමීන් වහන්සේලා පිරිසක් කොළඹ පිටකොටුව ඓතිහාසික බෝධිය අබියසදී මෙම සත්‍යග්‍රහය පවත්වන බවද එම සංගමයේ ප්‍රධාන ලේකම් වකමුල්ලේ උදිත හිමියෝ අවධාරණය කළහ.

නැගෙනහිර ජැටියේ කොටස්වලින් 49%ක් ඉන්දීය ආයෝජකයෙකුට ලබාදීමට අදාළ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට ආණ්ඩුව සැලසුම් කර තිබෙන බවත්, එම තීරණය අහෝසි කර නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක විය යුතු බවත් උන්වහන්සේ පවසා සිටියහ.

පර්යන්තයේ කොටස් ආයෝජකයෙකුට ලබාදීමට අදාළව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළහොත් එය පරාජය කිරීමට වෘත්තීය සමිති සමග ඒකාබද්ධ වී ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවද එහිමියෝ කියා සිටියහ.

# යුද හමුදාවේ 31,000කට කෝවිඩ් එන්නත විදිනවා

## - යුද හමුදා මූලස්ථානය

● ඉන්දික හේවාවිතාරණ

ඉන්දියාවෙන් ලැබුණු කෝවිඩ් - 19 එන්නත යුද හමුදා සාමාජිකයන් තිස් එක්දහසකට එන්නත් කිරීම් සිදුකරන බව යුද හමුදා මූලස්ථානය සඳහන් කරයි.

පසුගිය 29වැනි දින යුද හමුදා සාමාජිකයන් දහසකට එන්නත් ලබාදීම සිදු කළ බවත්, ඉන් පසුව සෑම දිනකම හත්දහස් පන්සීයකට එන්නත් ලබාදීම සිදු කළ බවත් යුද හමුදා මාධ්‍ය අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් නිලන්ත ප්‍රේමරත්න මහතා සඳහන් කළේය.

මේ අනුව අදාළ එන්නතේ පළමු මාත්‍රාව ලබාදීම හෙට (02දා) දිනයෙන් අවසන් වන බවත්, නාරාහේන්පිට යුද හමුදා රෝහල, පනාගොඩ යුද හමුදා රෝහල යන රෝහල් තුළ සේවය කරන යුද හමුදා වෛද්‍යවරුන්ට හා අනෙකුත් සෞඛ්‍ය කාර්යමණ්ඩලවලට සහ කෝවිඩ් 19 මර්දන කටයුතුවල නිරත හමුදා සාමාජිකයන්ට අදාළ එන්නත ලබාදීම සිදුකරන බවත් ඒ මහතා කියා සිටියේය.

කෝවිඩ් - 19 එන්නත ලබාදීම පසුගිය 29 වැනි දින නාරාහේන්පිට යුද හමුදා රෝහලේදී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

# හුදෙකලා තත්ත්වයෙන් ඉවත්වන ප්‍රදේශ

● එච්.අයි. තුෂාර

කෝවිඩ්-19 තත්ත්වය තුළ හුදෙකලා තත්ත්වයට පත්කර තිබූ ප්‍රදේශ කිහිපයක් අද (01දා) උදෑසන 5.00 සිට හුදෙකලා තත්ත්වයෙන් මුදාහැර තිබේ. මේ අනුව නාරාහේන්පිට පොලිස් වසමේ 100 වත්ත, වරාය පොලිස් වසමේ පහළ ශාන්ත ඇන්ඩෘස් පෙදෙස, ඉහළ ශාන්ත ඇන්ඩෘස් පෙදෙස සහ ඇන්ඩෘස් පාර හුදෙකලා තත්ත්වයෙන් මුදාහැර ඇත. මීට අමතරව පෑලියගොඩ පොලිස් වසමේ ගඟබඩ ග්‍රාම නිලධාරී වසමේ 90 වත්තද හුදෙකලා තත්ත්වයෙන් නිදහස් කර තිබේ.

# ඉඩම් ඔප්පු 17,000කට ජනාධිපති අත්සන් තබයි

● නිදර්ශනී වික්‍රමසිංහ

ගැටලු නිරාකරණය කොට අවසන් වරට සැකසූ ඉඩම් ඔප්පු 17,000ක් සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මේ වනවිට අත්සන් තබා තිබේ.

ඒ අනුව එම ඔප්පු මෙම මස තුළදී ජනතාවට බෙදා දීම සඳහා කටයුතු කෙරෙනු ඇති බව සඳහන්ය.

එසේම පාරම්පරිකව කෘෂිකර්මාන්තය සඳහා උපයෝගී කරගත් ඉඩම්වල අඛණ්ඩව වගා කිරීමට ගොවීන්ට අවස්ථාව සැලසෙන ලෙස නව නීතිරීති ක්‍රියාත්මක කිරීමත් සමග පැරණි චක්‍රලේඛ යටතේ පවරා ඇති නඩු ඉල්ලා අස් කර ගන්නා ලෙස ජනාධිපතිවරයා නිලධාරීන්ට උපදෙස් දී ඇත.

හෙතෙම සඳහන් කර ඇත්තේ ගම සමග පිළිසඳර වැඩසටහනේදී ජනතාවගෙන් ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් වනජීවී, වන සංරක්ෂණ, පරිසර, ඉඩම් ඇතුළු සියලු දෙපාර්තමේන්තු හා ආයතනවලට ජනතා යහපතට ඉවහල්වන අයුරින් නව නීති සැකසීමට පියවර ගන්නා ලෙසයි.

ඒ අනුව පවතින ගැටලු නිරාකරණය කරමින් නව නීති කඩිනමින් සකස් කෙරෙන බවත්, වසර ගණනාවක සිට රාජ්‍ය ආයතන සමග නඩු කියමින් පීඩාවට පත්ව සිටින ජනතාවට සහන සලසනු පිණිස මෙම තීරණයට එළඹි බවත් ජනාධිපති කාර්යාලය සඳහන් කළේය.

# 'ඉසුරුමත් හෙට දිනක් සෞභාග්‍යමත් මවුබිමක්'

# 73වැනි ජාතික නිදහස් දින සැමරුම පෙබරවාරි 04දා



නිදහස් දින සැමරුම් පෙරහුරුවේ අවස්ථා

● ඉන්දික හේවාවිතාරණ/ ඡායාරූප: ලහිරු හර්ෂණ

ඉසුරුමත් හෙට දිනක් සෞභාග්‍යමත් මවුබිමක් තේමා යටතේ 73වැනි ජාතික නිදහස් දින සැමරුම සෞඛ්‍ය මාර්ග උපදේශවලට අනුව සිදුකිරීමට රජය තීරණය කර තිබේ.

පෙබරවාරි 04වැනිදාට යෙදී තිබෙන ජාතික නිදහස් උත්සවය නිදහස් චතුරස්‍රයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

නිදහස් දින සැමරුම පෙළපාලිය ආරක්ෂක අංශ සාමාජිකයන් අටදහස් තිස්පහක හා ශිෂ්‍යභට සාමාජිකයන් තුන්සිය පනස්පහක සහභාගිත්වයෙන් පැවැත්වීමට නියමිතව තිබේ.

මේ අනුව යුද හමුදා සාමාජිකයන් හාරදහස් තුන්සිය විසිපහක් හා නාවික හමුදා සාමාජිකයන් අටසිය හැටඅටක් ගුවන් හමුදා සාමාජිකයන් නවසිය හතළිස් පහක් පොලිස් නිලධාරීන් එක්දහස් තුන්සිය අසූදෙකක් සිවිල් ආරක්ෂක බළකා නිලධාරීන් පන්සිය පහළොවක් ශිෂ්‍ය භටයන් තුන්සිය පනස්පහක් සහභාගිත්වයෙන් සැමරුම් උත්සවය පැවැත්වේ.

73වැනි ජාතික නිදහස් දින සැමරුමට සමගාමීව දිවයින පුරා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර, සියලු ජාතීන් නියෝජනය කරමින් සම්ප්‍රදායික සංස්කෘතික අංගවලට මුල්තැනක් ලබාදෙමින් මෙම වැඩපිළිවෙළ සිදුකිරීමට නියමිතව තිබේ.

# "ස්වයං නිරෝධායනය වන අය නිවසේ නොසිටියොත් නීති මගින් කටයුතු කරනවා"

## - පොලිස් මූලස්ථානය

● ඉන්දික හේවාවිතාරණ

කෝවිඩ්-19 තත්ත්වය තුළ ස්වයං නිරෝධායනයට ලක් කරන පිරිස් අදාළ නිවෙස්වලින් හා පරිශ්‍රවලින් විවිධ අවස්ථාවල පිටතට ගමන් කරන බවට වාර්තා වන බවත්, එසේ සිදුකළහොත් නීති මගින් කටයුතු කරන බවත් පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

නීති උල්ලංඝනය කරමින් නිවෙස්වලින් හා අදාළ පරිශ්‍රවලින් එළියට පැමිණෙන පිරිස් හඳුනා ගැනීම සඳහා ස්වයං නිරෝධායන කටයුතු සිදුකර පරිශ්‍ර හා නිවෙස් අවට සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් ඊයේ (31දා) සිට යොදවා තිබෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය. මීට අමතරව අදාළ නිවෙස්වලට හා පරිශ්‍ර තුළට පිටස්තර පුද්ගලයන් ඇතුළුවීමත් වරදක් බවත්, ඔවුන්ට එරෙහිවත් නීතිය ක්‍රියාත්මක කරන බවත් ඒ මහතා පවසා සිටියේය.

ස්වයං නිරෝධායනයට ලක් කරන පිරිස් සෞඛ්‍ය බලධාරීන් ලබාදෙන උපදෙස්වලට අනුව අදාළ කාලයම නිවෙස් තුළ හෝ පරිශ්‍ර තුළම රැඳීසිටිය යුතු බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

# සත්වෝද්‍යාන අද සිට විවෘතයි

● දෙහිවල - එච්.එම්. ධර්මපාල

ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඇති දෙහිවල සත්ත්වෝද්‍යානය, පින්නවල සත්ත්වෝද්‍යානය හා හම්බන්තොට සෆාරි සත්ත්වෝද්‍යානය කෝවිඩ්-19 වසංගතයෙන් පසු නරඹන්නන් සඳහා පෙබරවාරි මස 01වැනිදා සිට විවෘත කිරීමට නියමිත බව දෙහිවල සත්ත්වෝද්‍යාන නියෝජ්‍ය අධ්‍යක්ෂිකා අනෝමා ප්‍රියදර්ශනී මහත්මිය පවසා සිටියාය.

මේ අනුව දිනපතා උදෑසන 8.30 සිට ප.ව. 6.00 දක්වා විවෘතව තැබෙන අතර, නරඹන්නන් මුඛ ආවරණ පැලඳ නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමයට අනුව ඇතුළු වී නරඹන ලෙසත් සතුන් සඳහා කිසිදු ආහාරපාන වර්ග ලබාදීමෙන් වැළකී සිටින ලෙසත් විශේෂ ඉල්ලීමක්ද කර සිටියි.



# අන්තර්ජාල දැන්වීම් දමා මුදල් වංචා කළ අයෙක් අත්අඩංගුවට

● ඉන්දික හේවාවිතාරණ

සංගීත භාණ්ඩ හා පරිගණක අඩු මුදලකට ලබාදෙන බව පවසා අන්තර් ජාලයේ දැන්වීම් පළ කර අත්තිකාරම් මුදල් ලබාගෙන ජනතාවට වංචා සිදුකළ පුද්ගලයෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

භාණ්ඩ අඩු මුදලකට ලබාදෙන බව පවසා මෙම පුද්ගලයා අන්තර්ජාලය හරහා අත්තිකාරම් මුදල් ලබාගෙන තිබෙන බවත්, මෙවැනි වංචනික ක්‍රියාවට හසුව තිබෙනවා නම්, ඒ පිළිබඳ 071-8591753 දුරකථන අංකය මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලෙසද පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා සඳහන් කළේය.

අන්තර්ජාලය හරහා ගිණුම්ගත කරන මුදල් සොරකම් කර ඇති අතර, ජාතික හැඳුනුම්පත් උපයෝගී කරගෙන ලබාගෙන තිබෙන බවත්, මේ පිළිබඳ ලැබුණු පැමිණිලිවලට අනුව සිදුකළ පරීක්ෂණවලට අනුව 29 හැවිරිදි නාත්තණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වැලිගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බවත් ඒ මහතා පවසා සිටියේය.

අදාළ පුද්ගලයා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදීත් විවිධ පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් හයක් සන්තකයේ තිබූ බවත්, මේ පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තවදුරටත් පරීක්ෂණ පවත්වන බවත් අජිත් රෝහණ මහතා පැවසීය.

මේ පුද්ගලයාගේ වංචාවට හසු වී තිබෙනවා නම්, අදාළ දුරකථන අංකයට ඇමතුමක් ලබාදී පැමිණිල්ලක් කිරීමට හැකියාව තිබෙන බවද හෙතෙම සඳහන් කර සිටියේය.

# කොවැක්ස් සංවිධානයෙන් එන්නත් ලබාගැනීම ගැන තොරතුරු ආණ්ඩුව ජනතාවට හෙළිකළ යුතුයි

## එජාප නායක, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ

● නවෝද්‍යා පවනි



කොවැක්ස් සංවිධානයෙන් එන්නත් ලබාගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කර තිබේද? එම එන්නත් මෙරටට ලැබෙන්නේ කවදාද? යන්න ඇතුළු එම ගිවිසුම පිළිබඳ සියලු තොරතුරු ආණ්ඩුව විසින් ජනතාවට හෙළි කළ යුතු බව එක්සත් ජාතික පක්ෂ නායක, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

මෙරට තුළ වෛරස් පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇති කිරීමට මෙතැන් පටන් කටයුතු සැලසුම් කළ යුතු බව ද වික්‍රමසිංහ මහතා කියා සිටියේය.

ඒ මහතා මේ බව පැවසුවේ ඊයේ (31දා) නුගේගොඩ ප්‍රදේශයේ පැවැති විශේෂ සංවාදශීලී හමුවකට එක්වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා,

"කොවැක්ස් සංවිධානයෙන් මෙරට 3%ක ප්‍රමාණයකට එන්නත් ලැබෙන්නට නියමිතව තිබෙනවා. ආණ්ඩුව එන්නත් ලබා ගැනීම වෙනුවෙන් අත්සන් කර තිබෙන ගිවිසුම කුමක්ද? ඒ එන්නත ලැබෙන්නේ කවදාදැයි තවම කියා නැහැ. දැනට ලැබිලා තියෙන එන්නත් ලබාදෙන්න පුළුවන් 20%ක පිරිසකට පමණයි. ඉතිරි 80% සඳහා එන්නත් නිෂ්පාදන ගිවිසුමක් අප අත්සන් කර තිබේද? මේ කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුව ජනතාවට කරුණු හෙළි කළ යුතුයි.

එමෙන්ම කොරෝනා පාලනය වෛද්‍ය විද්‍යාව දන්නා අයට භාර දෙන්න. අප සෑම විටම වෛද්‍ය උපදෙස් අනුව ක්‍රියා කළ යුතුව තිබෙනවා. එසේ නොකරනවා නම් අපට විශාල ප්‍රශ්නයක් ඇතිවෙනවා.

එමෙන්ම අප අනාගතය ගැනත් සිතිය යුතුයි. පළමුවෙන්ම එච්.අයි.වී, ඉන්පසුව ඉබෝලා ආදී වෛරස් ඇතිවුණා. ඒ සියල්ලටම වඩා වේගයෙන් කොරෝනා වෛරසය පැතිරෙමින් තිබෙනවා. එය මර්දනය කරන්නට කොපමණ කලක් ගත වේ දැයි කියන්නට බැහැ.

උදාහරණයක් ලෙස ගතහොත් මීළඟ වසර 60 ඇතුළත ඇති වෙන වෛරස් මොනවාදැයි කියන්නට බැහැ. අප ඒ සඳහා සූදානම් විය යුතුව තිබෙනවා. වෛරස් යුද්ධයකට සූදානම් වීමත් ජාතික ආරක්ෂාව යටතට ගෙන සලකන්නට හැකියාව තිබෙනවා. අපට ඉන්නේ වෛරස විද්‍යාඥයන් ස්වල්පයක් පමණයි. ඒ සංඛ්‍යාව අනාගතයේ දී වැඩි කරගත යුතුයි. ඒ අතර දැනට සිටින විශේෂඥයන්ගෙන් ප්‍රයෝජන ගත යුතුයි.

මේ රටේ වෛරස රෝග පර්යේෂණ ආයතනයක් නැහැ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඩෙංගු පර්යේෂණායතනයක් තිබෙනවා. ඒ අය ඔක්ස්ෆර්ඩ් පර්යේෂණයටත් උදව් කරනවා. වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ මාස හයක හෝ අවුරුද්දක වෛරස පිළිබඳ පාඨමාලාවක් තිබෙනවා. මේ ක්ෂෙත්‍රය දියුණු නොකළහොත් ඊළඟ වසර 60 වනවිට අපට විවිධ වෛරස්වලට යට වෙන්නට සිදුවෙනවා. ඒ නිසා වෛරස පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇති කරන ලෙස අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. විශ්වවිද්‍යාල මෙන්ම වෛද්‍ය අංශයත් එකතු කොට දැන් සිටම එය ආරම්භ කරන්න" යැයිද සඳහන් කළේය.




# ශිෂ්‍යත්ව කඩයිම් ලකුණු පහළ දැමීම ගැන ජනපති අද තීන්දුවක් දිය යුතුයි

## – ලංකා ගුරු සේවා සංගමය

● එච්.අයි. තුෂාර

ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ පදනම මත පාසල්වලට සිසුන් බඳවාගැනීම සඳහා නිකුත් කර තිබෙන කඩයිම් ලකුණු පහළ දැමීම පිළිබඳ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අද (01දා) තීන්දුවක් ලබාදිය යුතු බව ලංකා ගුරු සේවා සංගමය සඳහන් කරයි.

අදාළ ගැටලුව විසඳීමට අධ්‍යාපන බලධාරීන් කටයුතු නොකරන නිසා කොටුව දුම්රිය පොළ ඉදිරිපිට සිට ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා අද (01දා) විරෝධතා පාගමනක් පවත්වන බවද එම සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ මහතා සඳහන් කළේය.

පාසල් සුරැකීමේ ජනතා ව්‍යාපාරය හා අසාධාරණයට පත් ශිෂ්‍යයන්ගේ දෙමාපියන් ඒකාබද්ධ කරගනිමින් මෙම විරෝධතා පාගමන පවත්වන බවද ඔහු පවසා සිටියේය.

පාසල්වලට බඳවාගන්නා ලකුණු ප්‍රමාණය අධික ලෙස ඉහළ දැමීම නිසා ග්‍රාමීය පාසල්වල හා දුෂ්කර පාසල්වල ඉගෙනුම ලබා ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වූ බොහෝ පිරිසකට පහසුකම් සහිත පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී තිබෙන බවද ඒ මහතා සඳහන් කළේය.

මෙම ගැටලුව විසඳගැනීම සඳහා අධ්‍යාපන බලධාරීන් සමග සිදුකළ සාකච්ඡා අසාර්ථක වී තිබෙන බවත්, මේ නිසා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මෙම ගැටලුවට විසඳුම් ලබාදිය යුතු බවත් හෙතෙම පවසා සිටියේය.

# 'සදාචාර විරෝධී අන්‍යාගමික පනත් කෙටුම්පත' සම්මත කරගැනීමට ජනපතිගේ අවධානය ඕනෑ

## – 'හෙළ බොදු සවිය' සංවිධානය

● නිදර්ශනි වික්‍රමසිංහ

ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත නාහිමියන් විසින් 2004 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 'සදාචාර විරෝධී අන්‍යාගමික පනත් කෙටුම්පත' පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට ජනාධිපතිවරයාගේ අවධානය යොමුවිය යුතු යැයි 'හෙළ බොදු සවිය' සංවිධානය අවධාරණය කරයි.

එම සංවිධානය පෙන්වා දෙන්නේ, පක්ෂ විපක්ෂ දේශපාලනඥයන් ඇතුළු රටේ බෞද්ධ ජනතාව අන්‍යාගම්වලට හරවා ගැනීමේ දැවැන්ත කුමන්ත්‍රණයක් රට පුරා ක්‍රියාත්මක වෙමින් පවතින බවත්, ඒ අනුව ඒ පිළිබඳ ජනාධිපතිවරයාගේ දැඩි අවධානය යොමුවිය යුතු බවත්ය.

එසේම වත්මන් ආණ්ඩුව බහුතර සිංහල බෞද්ධයන්ගේ ඡන්දයෙන් තේරී පත් වූ ආණ්ඩුවක් බව ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇති බව පෙන්වා දෙන 'හෙළ බොදු සවිය' සංවිධානය, 2/3 බහුතර ආණ්ඩුවක් තිබියදීත් සිංහල බෞද්ධයන් අන්‍යාගම්වලට හරවා ගැනීම ඉතාමත් කනගාටුදායක බවද ප්‍රකාශ කරයි.

මේ සම්බන්ධයෙන් 'අද' පුවත්පතට අදහස් දක්වමින් එම සංවිධානයේ සභාපති පූජ්‍ය බුදුගල ජිනවංශ හිමියන් සඳහන් කර සිටියේ, ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත නාහිමියන් විසින් 2004 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 'සදාචාර විරෝධී අන්‍යාගමික පනත් කෙටුම්පත' සම්මත වීමට සියලු කටයුතු එවකට සිදුවෙමින් පැවතියද විදෙස් බලපෑමක් මත එය එසේ සිදු නොවූ බවට කරුණු අනාවරණ වූ බවයි.

ඒ අනුව අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නැවත රජයේ අවධානය යොමු විය යුතු බවද අවධාරණය කළ උන්වහන්සේ, මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා දැනුම්වත් කරමින් වූ ලිපියක් යොමු කිරීමට කටයුතු කර ඇති බවද පැවසූහ.



එහිදී වැඩිදුරටත් සිය අදහස් දැක්වූ පූජ්‍ය බුදුගල ජිනවංශ හිමියෝ,

"2004දී ජාතික හෙළ උරුමයෙන් පාර්මේන්තුවට වඩින ස්වාමීන් වහන්සේලාගේ ප්‍රධානම වගකීම වූයේ සිංහල බෞද්ධයන් සදාචාර විරෝධී ලෙස අන්‍යාගම්වලට හරවා ගැනීම වැළැක්වීමේ පනතක් ඉදිරිපත් කිරීමයි. එම පනතෙ මූඛය පරමාර්ථය වන්නේ, අහිංසක බෞද්ධයන් ක්‍රිස්තියානි ආගමට හැරවීම වැළැක්වීමයි. මුල් කාලයේ දුප්පත් ගම්මානවලට ගොස් බෞද්ධයන්ට විවිධ ගෘහ උපකරණ ලබාදී ආගමට හරවා ගත්තා. බෞද්ධ රෝගී ජනතාව සොයා ගොස් බුද්ධ ප්‍රතිමා පොළොවේ ගසා බුදු හාමුදුරුවෝ යක්ෂයෙක් ලෙස හඳුන්වා ආගමට හැරවීම සිදු කළා. අද වනවිට විශාල බෞද්ධ ව්‍යාපාරිකයන්, දේශපාලන නායකයන්, සමාජයේ ගරු කරන පුද්ගලයන්ගේ දුරුවලතා උපයෝගී කරගෙන අන්‍යාගම්වලට හරවා ගෙන තිබෙනවා.

ලෝකයේ රටවල්වල ජනතාව බෞද්ධ දර්ශනය වැලඳ ගන්නා විට ලංකාවේ බෞද්ධයන් විවිධ හේතු හා දුරුවලතා නිසා ආගමට හැරවීමේ විශාල කුමන්ත්‍රණයක් රට තුළ ක්‍රියාත්මක වන බව පැහැදිලියි. අද වනවිට වතුකරයේ හා උතුරුකරයේ සිටින ද්‍රවිඩ හින්දු ජනතාව විශාල වශයෙන් මෙම කතෝලික නොවන පිරිස් ඇමෙරිකන් ආගමට හරවා ගෙන අවසන්. මේ සියල්ල සිදු කරන්නේ රාජ්‍ය නොවන ආයතන හරහා සිදුකරන ව්‍යාපාරවලින්. මේ පිළිබඳ වරින් වර සිදු කරන ලද බෞද්ධ කොමිසම් වාර්තා මගින් ඇති තරම් තොරතුරු හෙළි කර තිබෙනවා. අද වනවිට ආණ්ඩු පක්ෂයෙත් විපක්ෂයෙත් පිරිස් මෙම ආගම්වලට හසු වී අවසන්.

වත්මන් ආණ්ඩුව බහුතර සිංහල බෞද්ධයන්ගේ ඡන්දයෙන් පත් වන ආණ්ඩුවක් බව ගරු ජනාධිපතිතුමා විසින්ම දෙවරක්ම සිදුකරන රාජාසන කතාවලදී පැහැදිලි කර තිබෙනවා. 2/3 බහුතර ආණ්ඩුවක් තිබියදී සිංහල බෞද්ධයන් අන්‍යාගම්වලට හරවා ගැනීම ඉතාමත් කනගාටුදායකයි. එම නිසා සිංහල බෞද්ධයන් ආරක්ෂා කරනවා නම්, හැකි ඉක්මනින් ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත නාහිමියන් ඉදිරිපත් කරන ලද සදාචාර විරෝධී අන්‍යාගමික පනත සම්මත කර සිංහල බෞද්ධයන් හා ද්‍රවිඩ හින්දු ජනතාව මෙම මර උගුලින් බේරාගැනීමට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කළ යුතුයි. ඒ සඳහා මැදිහත් වන ලෙස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමගෙන් ඉල්ලා සිටිනවා" යැයිද පැවසූහ.

# ශ්‍රමිකයන් 60,000ක් යළි පැමිණීමේ අපේක්ෂාවෙන්

● එච්.අයි. තුෂාර

කෝවිඩ් - 19 තත්ත්වය තුළ විදේශගත ශ්‍රමිකයන් හැට දහසකට අධික ප්‍රමාණයක් මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින බව විදේශගත ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ ජාත්‍යන්තර සංවිධානය සඳහන් කරයි.

පසුගිය වසරේ මාර්තු මාසයේ සිට මෙම පිරිස් ලංකාවට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින බවත්, ගෙවී ගිය කාලය තුළ හැටදහසකට ආසන්න ප්‍රමාණයක් ලංකාවට පැමිණ තිබෙන බවත් එම සංවිධානයේ ලේකම් සුභාෂණ සත්‍යජිත් මහතා සඳහන් කළේය.

මෙලෙස පැමිණි පිරිස්වලින් ගුවන් ටිකට්පත්වල සාමාන්‍ය මිලට වඩා දෙගුණයක් මුදල් ගෙවීමට සිදුවූ බවත්, මීට අමතරව හෝටල්වල නිරෝධායනයට ලක්වූ පිරිස්වලින් හෝටල් ගාස්තු ලෙස දිනකට හත්දහස් පන්සීයක මුදලක් අය කරගත් බවත් හෙතෙම කියා සිටියේය.

මේ නිසා විදේශගත ශ්‍රමිකයන් කඩිනමින් ලංකාවට ගෙන්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කරන ලෙසට හා ගුවන් ටිකට්පතට අදාළ මුදල පමණක් අයකර එලෙස පැමිණෙන සියලුමදෙනා නිවෙස්වල නිරෝධායනයකට ලක්කරන ලෙසට විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලිඛිතව ඉල්ලා සිටි බවද ඒ මහතා සඳහන් කළේය.

පසුගිය අප්‍රේල් මාසයේදී කුවේට් රටේ වීසා නොමැතිව රැඳී සිටි පිරිස් ලංකාවට ගෙන්වා ගැනීමට කුවේට් රට සහන කාලයක් ලබාදුන් බවත්, එම සහන කාලය තුළ අදාළ පිරිස් ගෙන්වා ගැනීමට කටයුතු නොකළ බවත් ඒ මහතා පවසා සිටියේය.

මේ නිසා පන්දහසකට ආසන්න පිරිසක් දැඩි අසරණ තත්ත්වයකට පත්ව සිටින බවත්, එම පිරිස් ලංකාවට ගෙන්වා ගැනීමටද කඩිනම් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවත් සුභාෂණ සත්‍යජිත් මහතා සඳහන් කළේය.

මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින බොහෝ දෙනෙකුට මේ වනවිට රැකියා අහිමි වී තිබෙන බවත්, මේ නිසා මෙම පිරිස්වලින් යැපුණු පිරිස් පවා මෙරට තුළ අසරණ වී සිටින බවත් ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේය.

# 2016 වසරේ සිට රාජ්‍ය සේවයට එක්වූ 160,000කට විශ්‍රාම වැටුප් අසාධාරණයක්

## – ඒකාබද්ධ සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානය

● ඉන්දික හේවාවිතාරණ

යහපාලන ආණ්ඩුව විසින් රාජ්‍ය සේවකයන්ගේ පූර්ණ විශ්‍රාම වැටුප අහිමි කිරීම නිසා 2016 වසරේ සිට මේ දක්වා කාලය තුළ රාජ්‍ය සේවයට එක්වූ එක්ලක්ෂ හැටදහසකට අධික පිරිසකට දැඩි අසාධාරණයක් සිදුව තිබෙන බව ඒකාබද්ධ සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානය සඳහන් කරයි.

මෙලෙස රාජ්‍ය සේවයට එක් වූ පිරිසෙන් සැලකිය යුතු පිරිසක් සංවර්ධන නිලධාරී සේවාවට අයත් බවද එම සංගමයේ ලේකම් ධම්මික මුණසිංහ මහතා පැවසීය.

යහපාලන ආණ්ඩු සමයේදී ඉවත් කළ පූර්ණ විශ්‍රාම වැටුප් ක්‍රමය නැවත ඇති කරන බවට වර්තමාන ආණ්ඩුව මැතිවරණ වේදිකාවල පොරොන්දු පිට පොරොන්දු ලබාදී තිබුණද, මෙතෙක් ඊට අදාළ වැඩපිළිවෙළ සකස් කර නොමැති බවද ඒ මහතා පවසා සිටියේය.

2016 වසරින් පසු රාජ්‍ය සේවයට බඳවා ගන්නා සෑම කෙනෙකුටම ලබාදෙන පත්වීම් ලිපියේ සඳහන් වන්නේ, රජය විසින් ඉදිරියේ තීරණය කරන විශ්‍රාම වැටුපකට යටත්වන බවට සඳහන් කර විශ්‍රාම වැටුප් අයිතිය කප්පාදු කර තිබෙන බවද ලේකම්වරයා පැවසීය. මේ නිසා අයිතීන් දිනාගැනීම සඳහා සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානයක් ඇති කර මෙම ගැටලු විසඳ ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවද ධම්මික මුණසිංහ මහතා පවසා සිටියේය.

යහපාලන ආණ්ඩු සමයේදී සිදුකළ මෙම ක්‍රියාව නිසා ත්‍රිවිධ හමුදාව පොලීසිය ගුරු විදුහල්පති සේවය ඇතුළු සමස්ත රාජ්‍ය සේවයටම එක්වන පිරිස්වලට පූර්ණ විශ්‍රාම වැටුප අහිමි වී තිබෙන බවද හෙතෙම පැවසීය.



# ජාවාරම්කාරයන් කිහිපදෙනෙකු වත්මන් ආණ්ඩුව මෙහෙයවන බවට පෙනෙන්න තිබෙනවා

## – සිංහල රාවය සංවිධානයේ පූජ්‍ය අක්මීමන දයාරතන හිමි

● දිනේෂ් සමරකෝන්

ජාවාරම්කාරයන් කිහිපදෙනෙකු වත්මන් ආණ්ඩුව මෙහෙයවන බවට පෙනෙන්න තිබෙන බවත්, එලෙස සිදුවන්නේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ දැනුවත්භාවයෙන්ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන බවත් සිංහල රාවය සංවිධානයේ පූජ්‍ය අක්මීමන දයාරතන හිමියෝ පැවසූහ.

ඊයේ (31දා) කොළඹ පැවති මාධ්‍ය හමුවකට එක්වෙමින් උන්වහන්සේ මේ බව සඳහන් කළේය.

මෙරට ජනතාවට වෙනත් විකල්පයක් නොමැති බැවින් ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ලෙස පත් කරගත් බවත්, ඒ අනුව මන්දබුද්ධිකභාවය ඇති කරගත් පිරිස ඉවත් කර සබුද්ධික පිරිසක් සමග කටයුතු කරන්නේ නම් රට ඉදිරියට ගෙන යාමට හැකි බවත් සඳහන් කළ පූජ්‍ය අක්මීමන දයාරතන හිමියෝ,

"ආණ්ඩුවට කිසිසේත්ම අයිතියක් නෑ රටේ රාජ්‍ය සම්පත් විජාතීකරණය කරන්න. අනිත් එක රටේ අභ්‍යන්තරයේ තිබෙන ටයර් කර්මාන්තශාලාවක් හෝ කුරුඳු කර්මාන්තශාලාවක් හෝ වෙනත් නිෂ්පාදන කර්මාන්තශාලාවක් වත් විජාතිකයෙකුට බදු දීම ආණ්ඩුවට කරන්න බෑ. රටේ ජනතාවගේ කැමැත්ත තියෙනවා නම් බදු ක්‍රමයකට ගියාට ආයෝජකයන්ට දුන්නට කමක් නෑ. නමුත් මේ දෙක රටේ මර්මස්ථාන දෙකෙන් එකක්. ඒ අනුව අපිට නැගෙනහිර පර්යන්තය අහිමි වුණා කියන්නේ විශාල වශයෙන් හානියට පත්වෙන අවස්ථාවක්.

මොකද ආර්ථික වශයෙන් බිඳ වැටීමක්. රටේ ස්වෛරීභාවයට හා ස්වාධීනත්වයට ඇතිවන විශාල මරු පහරක්. ඒ වගේම තමයි රටේ විරැකියාවෙන් පෙළෙන ජනතාව තවත් අගාධයට ඇද දැමීමක්. අපි මේ අයට ආණ්ඩුව ලබා දුන්නේ වැරදිවලින් තොර රටක් හදන්න කියන කාරණාවට.

රටේ දේශීය සම්පත් සකස්කරගෙන ,දේශීය නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කරලා වගේ ක්‍රමවේදයක් තමයි අපි බලාපොරොත්තු වුණේ.ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති වුණාට පස්සේ ඔහු ගත්ත ක්‍රියාදාමයන් සමූහය සාර්ථකයි. ඔහු කුළුබඩු ගේන එක නැවැත්වුවා. අපි හිතනවා අපේ රටේ තරුණයෝ පවා සෑම බිම් අඟලක්ම වගා කරන්න පටන් ගත්තා. නමුත් ඒ සියල්ල බිඳ වට්ටමින් අද වනවිට ජාවාරම්කාරයෝ කිහිපදෙනෙක් විසින් මේ ආණ්ඩුව මෙහෙයවන තත්ත්වයක් තමයි දකින්නට ලැබෙන්නේ.

මේ වරාය දීම හරහා ඒ ජාවාරම්කාරයන්ට විශාල ලාබයක් හිමිවෙනවා ඇති. ඒ නිසා ආණ්ඩුව ජනාධිපතිවරයා නොමග යවමින් මේ ජාවාරම්කාරයේ මේ වැඩ කටයුත්ත කරන්නේ. එහෙම නැත්නම් ජනාධිපතිවරයා දැනුවත්වද කියන ප්‍රශ්නයකුත් අපිට තිබෙනවා. ඒ නිසා ජනාධිපතිවරයාට අපි කියන්නේ මේ බලය නැති වුණාට පස්සේ රනිල් වික්‍රමසිංහ වගේ කල්පනා කරාට වැඩක් වෙන්නේ නෑ. ඒ නිසා බලය තිබෙන අවස්ථාවේ මොළය පාවිච්චි කරලා වැඩ කරන්න ගියොත් තමයි සාර්ථක ආණ්ඩුවක් අපිට දකින්න ලැබෙන්නේ. මේ රටේ ජනතාවට වෙන විකල්ප නෑ. විකල්පයක් නැති නිසා තමයි ගෝඨාභය බලය ශක්තියක් බවට පත් කරලා ජනාධිපතිවරයෙක් බවට පත් කළේ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා ඔබතුමා මේ මන්දබුද්ධිකභාවය ඇතිකරගත් පිරිස ඉවත් කරලා සබුද්ධික පිරිසක් සමග මේ කටයුත්ත කළොත් යහපත් දැක්මෙන් යුක්තව රට ඉදිරියට ගෙන යන්න පුළුවන්." යැයිද පැවසූහ.

# පළාත් කීපයකට අද වැසි වාර කීපයක්

● එච්.අයි. තුෂාර

උතුර, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත්වලත්, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලත් අද (01දා) දිනයේදී වැසි වාර කිහිපයක් ඇතිවිය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

සවස 1.00න් පසු බස්නාහිර, සබරගමුව, වයඹ පළාත්වලත් ගාල්ල, මාතර හා මහනුවර දිස්ත්‍රික්කවලත් තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත්, සමහර ස්ථානවලට මිලිමීටර් 100 තරම් වූ තද වැසි ඇතිවිය හැකි බවත් කාර්යයේ නියුක්ත කාලගුණ විද්‍යාඥ ශානිකා දිසානායක මහත්මිය සඳහන් කළාය.

බස්නාහිර, මධ්‍යම, සබරගමුව, දකුණු පළාත්වල උදෑසන කාලයේ මීදුම් තත්ත්වයත් ඇතිවිය හැකි බවද ඇය පවසා සිටියාය.

ගිගුරුම් සහිත වැසි ඇතිවන විට එම ප්‍රදේශවල සුළඟෙහි වේගය තාවකාලිකව ඉහළ යා හැකි බවත්, මේ නිසා තද සුළං මගින් සිදුවන අනතුරු හා අකුණු අනතුරු වළක්වාගැනීමට ජනතාව කටයුතු කළ යුතු බවත් ඒ මහත්මිය සඳහන් කළාය.

# නැ. පර්යන්තය ඉන්දියානු සමාගමක් සමග එක් වී සංවර්ධනය කිරීම හොඳ දෙයක් ලෙස සලකනවා

## – හිටපු අමාත්‍ය නුවරඑළිය පා.ම පලනි දිගම්බරම්

● හැටන් - රංජිත් රාජපක්ෂ

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියානු සමාගමක් සමග එක් වී සංවර්ධනය කිරීම තමන් හොඳ දෙයක් ලෙස සලකන බවත්, ඒ සඳහා තම පූර්ණ සහයෝගය ලබාදෙන බවත් හිටපු අමාත්‍ය නුවරඑළිය දිස්ත්‍රික් පා.ම පලනි දිගම්බරම් මහතා පැවසීය.

ඒ මහතා මේ බව කියා සිටියේ පෙරේදා (30දා) ජාතික කම්කරු සංගමය සහ කම්කරු ජාතික පෙරමුණේ සමාජිකයන් හමුවීමේ රැස්වීමක් හැටන් ඩී.කේ. ඩබ්ලිව් සංස්කෘතික ශාලාවේ පැවති අවස්ථාවේදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක් වු පලනි දිගම්බරම් මහතා,



"කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ගැන කතා කරනකොට , යහපාලන ආණ්ඩුව මෙවැනි හවුල් ව්‍යාපාර සිදු කරනකොට පොහොට්ටුවේ කට්ටිය කිව්වා වරාය , ඉඩම් , ගුවන්තොටුපලවල් විකුණනවා කියලා චෝදනා කරා. දැන් මේ ආණ්ඩුව ඇවිල්ලත් ඒකම කරන්න යනවා, මම පටු දේශපාලනය කරන්න කැමති නැ.

මම ගිය ආණ්ඩුවේ ඉන්නකොට ඒකට සහයෝගය දුන්නා, අපේ රටේ ජාතික සම්පත් විකුණනවාට කවුරුත් කැමති නෑ. නමුත් ආයෝජකයෙක් ඇවිල්ලා ඒක සංවර්ධනය කරනවා නම් ඒකට ඉඩ දෙන්න ඕනි. මොකද අපේ රටට දැන් සල්ලි නෑ , ණය බර වැඩි වෙලා තියෙන්නේ. ආයෝජකයෙක් ඇවිල්ලා ඒක සංවර්ධනය කරලා අපිට ඒකෙන් 51' ලාභයක් එනවානම් අපි සතුටු වෙන්න ඕනි.

විමල් වීරවංශ , උදය ගම්මන්පිල මහතා ගිය ආණ්ඩු තියෙනකොට මොනවද කිව්වේ අරක විකුණනවා, මේක විකුණනවා කියලා , දැන් කට වහගෙන ඉන්නවා. අපි මේ ආණ්ඩුවට කියනවා මේක ආයෝජකයෙකුට ලබා දීලා සංවර්ධනය කරලා ලාභ උපයනවා නම් අපි ඒකට පූර්ණ සහයෝගය දෙනවා." යනුවෙන් පැවසීය.

# මීගමුව, කටාන ජල යෝජනා ක්‍රමය මාර්තුවේදී විවෘත වෙයි

● නිදර්ශනි වික්‍රමසිංහ

රුපියල් මිලියන 13000ක් පිරිවැයක් දරමින් ඉදි කෙරෙන මීගමුව, කටාන ජල යෝජනා ක්‍රමය එළඹෙන මාර්තු මස විවෘත කිරීමට රජය අපේක්ෂා කරයි.

මෙම ජල යෝජනා ක්‍රමය යටතේ ග්‍රාම සේවා වසම් 45ක් ආවරණය වන පරිදි උතුරු කුලුන බම්බුකුලිය ග්‍රාමයේදීත්, මධ්‍යම කුලුන තිඹිරිගස්කටුව ප්‍රදේශයේදීත් එසේම දකුණු කුලුන ආඩිඅම්බලම ප්‍රදේශයේත් යනාදී ලෙස ප්‍රධාන ජල කුලුනු 03ක් ඉදි කෙරේ. ඒ අනුව එම එක් කුලුනක ජල මීටර් කියුබ් 2000ක ධාරිතාවයකින් යුක්ත වන අතර සමස්ත ධාරිතාව ජල මීටර් කියුබ් 6000කි. කුලුනු සඳහා ජල සම්ප්‍රේෂණය කිලෝ මීටර් 12ක් වන අතර ජලය බෙදාහැරීම කිලෝ මීටර් 240ක ප්‍රදේශයක් ආවරණය කෙරේ. මෙමගින් ප්‍රදේශයේ පවුල් 55100කට සෙත සැලසීමට අපේක්ෂිතය. මේ අතර බම්බුකුලිය ප්‍රදේශයේ ස්ථාපිත ජල කුලුන නිරීක්ෂණය සඳහා ප්‍රදේශයේ දේශපාලන නියෝජිතවරියක වන රාජ්‍ය ඇමතිනී සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පසුගියදා එක්ව සිටියාය. ඒ අනුව එහිදී නව ජල සැපයුම් සම්බන්ධතා ලබාදීම සදහා නිකුත් කෙරෙන අයදුම්පත් සංකේතාත්මකව බෙදාදීම රාජ්‍ය අමාත්‍යවරිය අතින් සිදු කෙරිණි.

# අස්වැන්න විකුණා ගැනීමට නොහැකි වීමෙන් පට්ටිවෙල ඉන්නල ගොවීන් අපහසුතාවට

◀ මාතලේ ▶





■ එස්. කරුණාරත්න

ගලේවෙල පට්ටිවෙල ප්‍රදේශයේ ඉන්නල (රටල) සහ ඉඟුරු වගා කළ ගොවීන් සිය අස්වැන්න විකුණා ගැනීමට නොහැකි වීම නිසා අසරණ තත්ත්වයට පත්ව සිටිති. මේ නිසා ඔවුහු සිය අස්වැන්න නෙළීමෙන් පවා ඉවත්ව සිටිති.

ප්‍රදේශයේ මහා පරිමාණයෙන් කාබනික පොහොර යොදාගෙන වගා කරන එස්.ඒ. රතනපාල මහතා අක්කර 15ක ඉන්නල (රටල) වගා කොට තිබේ. එමෙන්ම ඉඟුරු කිලෝ ලක්ෂයකට අධික ප්‍රමාණයක් ඔහුගේ ගොවිපොළේ තවමත් ගැලවීමකින් තොරව පවතී.

ඉන්නල අස්වැන්න නෙළීම සිදු කරමින් සිටින අවස්ථාවේ එහි ගිය අපට දැක ගැනීමට හැකි වූයේ අස්වැන්න නෙළීම අතහැර දමා ඇති විශාල භූමියක් බවයි.

එමෙන්ම දැනට කාන්තාවන් යොදා අස්වැන්න ලබා ගැනීම සිදු කළ ද ඒවාට කිලෝ එකක් සඳහා රුපියල් 40 -50 දක්වා මිලත් පවතින බවද රත්නපාල මහතා පැවසීය. රටල අස්වැන්න සාර්ථකව මෙවර ලැබී තිබෙන බවත් ඒ සඳහා සාධාරණ මිලක් ලැබෙන්නේ නම් තමාට පාඩු නොවන බවද ගොවීහු පෙන්වා දෙති.





කෙසේ වෙතත් අස්වැන්න නෙළන කම්කරුවන්ට වැටුප් ලබා දීමට නොහැකි වීම නිසා අස්වැන්න නෙළීම අත්හැර දමා ඇති බවද රතනපාල මහතා පැවසීය.

කාබනික වගා ක්‍රමය යටතේ තමන් වගා කළ අක්කර 15ක ඉන්නල (රටල) ගොවිපොළ අවශ්‍ය අයෙකුට ලබාදීමට හැකි බවත් අවශ්‍ය කෙනෙක් වෙතොත් ගොවිපළටම පැමිණ මිලදී ගැනීමට හැකි බවද හෙතෙම පවසා සිටියේය.

එමෙන්ම රජයේ ඉල්ලීම මත දේශීය ආහාර නිෂ්පාදනයට තමා වැඩි දායකත්වයක් ලබා දුන් බව පවසන ඒ මහතා ඉඟුරු වගා කොට මේ වනවිට අස්වැන්න නෙළීම අතහැර දමා ඇති ආකාරය පෙන්වා දුන්නේය. තමන් වගා කළ ඉඟුරු මිලදී ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර දෙන්නැයි ඒ මහතා රජයෙන් ඉල්ලා සිටියේය.

තමන් පත්ව ඇති තත්ත්වය පිළිබඳ අදහස් දැක්වූ එස් .ඒ . රතනපාල මහතා මෙසේ පැවසීය.



"මම විශාල වශයෙන් ගොවිතැන් කරන කෙනෙක්. ලොකු බලාපොරොත්තුවක් තිබුණා මේ ජනාධිපතිතුමා පත් වෙනකොට අපේ දේශීය ගොවිතැනට තැනක් එයි කියලා ලැබේවි කියලා. ඒ නිසාම තමයි අපි කහ, ඉඟුරු, ඉන්නල වගේ විශාල වශයෙන් දේශීය ගොවිතැන වැඩි වශයෙන් කරන්න ගත්තේ. පනහකට වැඩිය පිරිසක් මගේ ගාව වැඩ කරනවා. හැබැයි අද සිද්ධ වෙලා තියෙන්නෙ දේශීය වගා කරපු අපට අස්වැන්න නෙළීම පවා අතහැරලා දාන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැටුප් ලබන ඕනෑ තරම් මිනිස්සු ඉන්නවා. ඒ අය ඇහැක් ඇරලා බලන්නේ නැහැ මේ වගේ විශාල ගොවිපළවල් පිළිබඳව. අපි දන්නවා ජනාධිපතිතුමාට මේවා මිලදී ගන්න වගාබිම්වලට යන්න බැහැ. හැබැයි රජයේ නිලධාරීන් මේ පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. මේ වගේ ගොවිපොළවල් කිහිපයක් වහලා දැම්මොත් මේ රටට වෙන පාඩුව කොපමණද කියලා සොයලා බලා කටයුතු කළ යුතුයි. අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ කරුණාකරලා මේ අපේ අස්වැන්න මහපොළොව නැවත පස් වෙන්න දෙන්න එපා රටේ මිනිස්සුන්ට කන්න දෙන්න වැඩපිළිවෙළක් හදන්න කියලයි."

◀ නුවරඑළිය ▶

# නුවරඑළිය නගරය කේන්ද්‍ර කොට ගත් සංචාරක කලාපයක් ඉදිරියේදී ඇති කරනවා

## – සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග



■ ශාන් හුලංනුගේ

නුවරඑළිය නගරය කේන්ද්‍ර කොට ගත් සංචාරක කලාපයක් ඇති කිරීමට ඉදිරියේදී පියවර ගන්නා බව සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවැසීය.

නුවරඑළිය දිස්ත්‍රික් ජීවනෝපාය සංවර්ධන කමිටු රැස්වීමේදී ඒ මහතා එසේ පවසා සිටියේය.

දිවයින පුරා නව සංචාරක ස්ථාන 6059ක් හඳුනාගෙන ඇති බවත් ඉන් 318ක් නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් බවත් ඒ මහතා පැවසීය. මෙම සංචාරක ස්ථාන දෙස් විදෙස් සංචාරකයන් අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ලබන බවත් ඒ මහතා කීය. නානුඔය නගරයේ සිට නුවරඑළිය නගරය දක්වා කේබල් කාර් ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරනු ලබන බවත් මේ සඳහා රජය යූරෝ මිලයන 52ක ආයෝජනයක් සිදු කිරීමට නියමිතව ඇති බවත් අමාත්‍යවරයා මෙහෙදී වැඩිදුරටත් පවසා සිටියේය.

◀ පොළොන්නරුව ▶

# විදුලිසැර වැදී වනඅලියෙක් මරුට

## අනවසර විදුලි සැර වැදීම සම්බන්ධයෙන් පුද්ගලයෙක් අත්අඩංගුවට



■ පොළොන්නරුව - තුෂාර තෙන්නකෝන්

පොළොන්නරුව වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලිතැන්න ප්‍රදේශයේ විදුලි සැර වැදී මියගිය වනඅලියෙකුගේ සිරුරක් ඊයේ (31දා) උදෑසන සොයාගත් බව වැලිකන්ද වනජීවී කාර්යාලය පවසයි.

උසින් අඩි අටයි අඟල් නවයක් පමණ වන මෙම පිරිමි වනඅලියාගේ වයස අවුරුදු 35ක් පමණ වන බව එම වනජීවී නිලධාරියා ප්‍රකාශ කර සිටියේය.

මෙම වසරේ පළමුවැනි මස ජනවාරි මාසයේ අවසාන දිනය අද වනවිට වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වනඅලි - මිනිස් ගැටුම හේතුවෙන් වනඅලි හයදෙනෙකුගේ ජීවිත ස්වභාවධර්මයාට අහිමි වී ගොස් ඇති අතර ඊට ආසන්නතම සිදුවීම වන මෙම වනඅලි මරණය හයවැනි මරණය වීම කණගාටුදායක කරුණකි.

ප්‍රදේශවාසීන් පවසන අන්දමට මෙම වනඅලියා ප්‍රදේශයේ මිනිස් ජීවිත රැසක්ද හානි කර ඇති බවත් වගාබිම් රැසක්ද විනාශ කර දමා ඇති බවද අප හමුවේ පැවසීය.

කෙසේ නමුත් වනඅලියා මියගොස් සිටි කුඹුරු ඉඩමේ අයිතිකරු මේ වනවිට වැලිකන්ද වනජීවී බීට්ටු කාර්යාලය මගින් අත්අඩංගුවට ගෙන ඇති අතර මෙ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන කටයුතු වනජීවී නිලධාරීන්ගේ මෙහෙයවීම මත සිදු කෙරේ.

# කුඩු රජවරුන්ට සෙල්ලම කරන්න ඉඩ තබන්නේ නැහැ

## – ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න



■ වාරණ - ආනන්ද ඉ ජයකොඩි

"ඉදිරියේදී කුඩු තොග අත්අඩංගුවට ගත්තු සැණින් විනිශ්චයකාරවරයෙකුගේ නිරීක්ෂණයට ලක් කොට සුළු ප්‍රමාණයක් සාම්පල වශයෙන් තබා ගෙන ඉතිරි සියල්ල විනාශ කිරීමේ වැඩපිළිවෙළක් හදනවා" යැයි ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න මහතා පැවසීය

අත්තනගල්ල රජමහා විහාරස්ථානයේ විහාරාධිපති ආචාර්ය පන්විල ශ්‍රී ආනන්ද නාහිමියන්ගේ රුපියල් මිලියන හයක පමණ වියදමකින් උඟුරාපොල නවදිගන්තයේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන භූමියේ ඉදි කරන ලද නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි වෙමින් හෙතෙම එසේ කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ආරක්ෂක ලේකම්වරයා,

" වර්තමානයේ පවතින ක්‍රමය තමයි කුඩු තොග අත්අඩංගුවට ගෙන රස පරීක්ෂක වාර්තා එන තෙක් ගබඩා කර තැබීම. මේ ක්‍රමයේ දූෂණ සිදුවෙනවා. එසේ අත්අඩංගුවට ගෙන ගබඩා කර තබන කුඩුවලින් කොටසක් නැවත වෙළෙඳ පොළට යනවා. මේ ක්‍රමය අපි වහාම නැවැත්විය යුතුයි. ඉදිරියේදී අත්අඩංගුවට ගන්නා කුඩු තොග වහාම විනිශ්චයකාරවරයෙකුගේ නිරීක්ෂණයට ලක් කොට සුළු ප්‍රමාණයක් පමණක් සාම්පල වශයෙන් තබා ඉතිරි සියල්ල විනාශ කිරීමේ වැඩපිළිවෙළක් හදනවා. තමුන්නාන්සේලා දන්නවා කුඩු රජවරු හිර ගෙදර ඉඳගෙන තමයි කුඩු ජාවාරම මෙහෙය වන්නේ කියල. කුඩු රජවරුයි පාතාලයයි දෙකක් නොව එකක් එහෙම නම් අපි කුමක්ද කළ යුත්තේ මේ මහා විනාශය වහාම නැවැත්විය යුතුයි. හිර ගෙවල් ඇතුළේ සිට කර ගෙන යන මේ සෙල්ලම දුෂ්කර වුවත් අපි කෙසේ හෝ මර්දනය



කරනවා. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහත්මයාගේ මූලිකත්වයෙන් ඒ ක්‍රමය නැවැත්වීමේ වැඩපිළිවෙළක් දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අනෙක් පැත්තෙන් කුඩුවලට ගොදුරු වන අහිංසක දරුවන් එයින් මුදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක්ද සකස් කළ යුතු වෙනවා. එය දැනටමත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කර ගෙන යනවා.

දරුවො බන්ධනාගාරගත කළාම ඔවුන් එළියට එන්නේ කුඩු රජවරු බවට පත් වෙලා. එක් තමයි සත්‍යය. එහෙමනම් මේ ක්‍රමයත් නැවැත්විය යුතුයි. දරුවො බන්ධනාගාරගත කිරීමකින් තොරව කළ යුත්තේ කුමක්ද. එවැනි දරුවො අත්අඩංගුවට ගත්තු සැණින් විනිශ්චයකාරවරයෙකුට ඉදිරිපත් කර බන්ධනාගාරගත කිරීමකින් තොරව විනිශ්චයකාරවරයාගේ නියෝග පරිදි මෙවැනි ආයතනවලට යොමු කිරීමේ වැඩපිළිවෙළක්ද ඉදිරියේදී සකස් කරනවා. අද මේ අපේ නායක හාමුදුරුවෝ එයට ආරම්භ පියවරක් තැබුවා. නායක හාමුදුරුවන්ගේ රුපියල් මිලියන හයක වියදමකින් තනා නිම කොට අද බාරදුන් මේ ගොඩනැගිල්ල තුළ දරුවො හැට දෙනෙකුට පහසුකම් තිබෙනවා. මේ කරපු සත්කාර්යය අපේ නායක හාමුදුරුවන්ට ගෞරව පූර්වක ස්තුතිය පුද කරනවා. ඒ වගේම මේ ගොඩනැගිල්ල තැනීමේ තාක්ෂණ දායකත්වය හා ශ්‍රම දායකත්වය නාවික හමුදාව ලබා දී තිබෙනවා. නාවික හමුදාවේ ඒ සියලු නිලයන්ටද ස්තුතිය පුදකරනවා. මේ ස්ථානයට තවත් ගොඩනැගිලි හතක් අවශ්‍යතාව තිබෙනවා." යැයිද පවසා සිටියේය

අත්තනගල්ල රජමහා විහාරස්ථානයේ විහාරාධිපති ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමියෝද මෙහිදී අදහස් දැක්වූහ.

ආරක්ෂක ලේකම්වරයා විසින් ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමියන් වෙත සමරු තිළිණයක්ද පිළිගන්වන ලදී. මෙහිදී පෞද්ගලික ආයතනක අධිපතිවරයෙකු වන චන්දික විරාජ් තාඹුගල මහතා විසින් තවත් ගොඩනැගිල්ලක් තැනීමට මූල්‍ය පරිත්‍යාගයක් කළේය. සිමෙන්ති සමාගමක් විසින් තවත් පරිත්‍යාගයක් හා ඇමරිකාවේ නිව්යෝක් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මංගලිකා ද සිල්වා මහත්මිය විසින් නව ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ පරිත්‍යාගයක්ද කළාය. මෙහිදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නව වෙබ් අඩවියක්ද ආරම්භ කරනු ලැබීය. මේ අවස්ථාවට මේජර් ජෙනරාල් ජගත් අල්විස්, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය, ආරක්ෂක අමාත්‍යාංශයේ සහකාර ලේකම් සමන්ති වීරසිංහ, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති වෛද්‍ය ලක්නාත් වෙළගෙදර ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

◀ බදුල්ල ▶

# එල්.ටී.ටී.ඊයට අයත් බව කියන විදේශීයක නිෂ්පාදිත ගිනිඅවියක්, මැගසිනයක් සහ උණ්ඩ 30ක් සොයාගැනේ



■ බදුල්ල - පාලිත ආරියවංශ

එල්.ටී.ටී.ඊ සංවිධානයට අයත් යැයි සැකකරන පිස්තෝලයක්, මැගසිනයක් සහ උණ්ඩ 30ක් පෙරේදා (30දා) රාත්‍රියේ බදුල්ල, වේවැස්ස වත්ත ප්‍රදේශයේදී සොයාගත් බව බදුල්ල පොලිස් කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය පවසයි.

බදුල්ල පොලිස් කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය සිදු කළ මෙහෙයුමකදී බදුල්ල වේවැස්ස වත්තේ ජල ටැංකියක් අසල ගල්වලට සගවා තිබියදී උණ්ඩ සොයා ගත් අතර, පිස්තෝලය වැලිකන්ද වඩුමුනේ ලදු කැලෑවක දොළක් අයිනේ වලලා තිබියදී සොයාගෙන තිබේ.

මනාලෙස ඇසුරුම් කර තිබූ මෙම පිස්තෝල අඩි දෙකහමාරක් පමණ කැණීම් කිරීමේදී සොයාගෙන තිබෙන අතර, එම පිස්තෝලය විදේශීයක නිෂ්පාදනය කරන ලද්දක් බවත් පරීක්ෂණවලදී අනාවරණය විය.

සිද්ධිය සම්බන්ධයෙන් බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වසන්ත කන්දෙවත්ත හා සහකාර පොලිස් අධිකාරී ප්‍රදීප් වීරසේකර යන මහත්වරුන්ගේ උපදෙස් මත බදුල්ල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක වේහිත රාජපක්ෂ සහ, බදුල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චානක චිරංජීව විජේරත්න යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# ගුරුකැලේ ගම්මානයට අලුතින් සුරාසැලක් විවෘත කිරීමට එරෙහි විරෝධතාවක්

"ජනතාවට පානීය ජලය වෙනුවට මත් පැන් හලක් ලබාදීම ජනතාව පත් කරගත් රජයකින් අනුමත කරන්න බෑ"

## – දොළුව ශ්‍රී බිම්බාරාම විහාරාධිපති උඩපළාත අධිකරණ සංඝනායක ශාස්ත්‍රපති උඩගම ඥානිස්සර නාහිමි



■ ගම්පොළ - සුරංග දිල්හාන්

ගම්පොළ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගුරුකැලේ ගම්මානය තුළ සුරා සැලක් විවෘත කිරීමට සැලසුම් සකස් කරමින් සිටිනවාට එරෙහිව ප්‍රදේශයේ මහ සංඝරත්නය ඇතුළු ගම්වාසීන් එම ප්‍රදේශය තුළ ඊයේ (31දා) උද්ඝෝෂණයක නිරත වූහ.

විහාරස්ථාන 16ක විහාරාධිපති නාහිමිවරු ඇතුළු මහ සංඝරත්නයත්, ගම්මාන 26ක් නියෝජනය කරමින් ප්‍රදේශවාසීනුත් මේ සඳහා සහභාගී වූහ.

1995 වසරෙන් පසු දොළුව ගුරුකැලේ ගම්මානය තුළ විවෘත කර තිබූ මෙම සුරාසැල නිසා ප්‍රදේශයේ තරුණයන් ඇතුළු වැඩිහිටියන් මත් වතුරට ඇබ්බැහිවී විනාශ වූ බවත් සෑම නිවසකම අඬදබර වැඩිවී දුප්පත්කම හා අසමගිය පිරුණු ගම්මානයක් ඇතිවූ බවත් විරෝධතාකරුවෝ පෙන්වා දුන්හ. මෙම තත්ත්වය සමග ඇතිවූ ජනතා විරෝධය නිසා පසුගිය රජය සමයේදී මෙම සුරාසැල වසා දැමුවද නැවතත් මෙම රජය තුළදී එහි හිමිකරුවන් එය විවෘත කිරීමට පියවර ගෙන ඇති බවද සඳහන් කළහ.

මෙම විරෝධතාකරුවන් ගුරුකැලේ බෝධිය අසලට එක්වී එහිදී ආගමික වතාවත් පවත්වා අනතුරුව පෙළපාලියකින් ගුරුකැලේ හන්දිය දක්වා පැමිණියේ විරෝධතා පාඨද පවසමිනි.

◀ මහනුවර ▶

මෙහිදී අදහස් දැක්වූ දොළුව ශ්‍රී බිම්බාරාම විහාරාධිපති උඩපළාත අධිකරණ සංඝනායක ශාස්ත්‍රපති උඩගම ඥානිස්සර නාහිමියන් රැස්ව සිටි ජනතාව අමතා ප්‍රකාශ කළේ, ජනතාව හා මහ සංඝරත්නය එක්ව පත්කළ මේ රජය තුළින් මෙවැනි දෙයක් බලාපොරොත්තු නොවූ බවත්, ප්‍රදේශයේ ජනතාවට ජලය නොමැතිව ඉල්ලීම් කරද්දී ඔවුන්ට මත්වතුර ලබාදෙන්න කටයුතු කිරීම අනුමත කළ නොහැකි බවත්ය.

මෙම උද්ඝෝෂකයන් අතරට හිටපු මධ්‍යම පළාත් සභා මන්ත්‍රී හා වත්මන් ග්‍රාමීය කුඹුරු වැව් හා වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යවරයාගේ ලේකම් නිශ්ශංක හේරත් මහතා පැමිණි අතර තමා හා රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මහතා මෙම සුරාසැල නැවත විවෘත කිරීමට නොදෙන බව ප්‍රකාශ කිරීම සමග උණුසුම් තත්ත්වයක්ද ඇතිවිය.

එහිදී මහා සංඝරත්නය හා විරෝධතාකරුවන් එම ප්‍රකාශය ලිඛිතව දෙන ලෙසත් ලබාදී ඇති සුරාසැල් අවසර පත්‍රය දොළුව ප්‍රාදේශීය ලේකම්වරිය වෙත ලබාදෙන ලෙසත් ඉල්ලා සිටියහ.

මේ පිළිබඳව සුරාසැල් හිමියන් හා මහා සංඝරත්නය සමග සාකච්ඡා කිරීම සඳහා අද (01දා) දින දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පැමිණීමට තීරණය කිරීමෙන් පසු උද්ඝෝෂකයෝ විසිර ගියහ.

# සිරදඬුවම් නියම වූ රන්ජන් රාමනායකට සාධාරණයක් ඉටුකරන ලෙස ඉල්ලමින් විරෝධතා




■ මීරිගම - කාන්ති/මුල්කිරිගල - හඳුගල ගුණරත්න

සිරගතකර සිටින පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මහතාට සාධාරණයක් ඉටුකරන ලෙස ඉල්ලමින් සමගි ජන බලවේගය විසිවන් සංවිධානය කරන ලද විරෝධතාවන් ද්විත්වයක් ඊයේ (31දා) දහවල් දිවුලපිටිය හා බෙලිඅත්තර නගරවලදී පැවැත්විණි.

සමගි ජන බලවේගය පක්ෂයේ දිවුලපිටිය ආසන සංවිධායක හසිත විජේසිංහ මහතාගේ සංවිධානය කළ විරෝධතාවට ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන හර්ෂණ රාජකරුණා සහ හිටපු ඇමති එඩ්වඩ් ගුණසේකර මහත්වරුන් සමග ප්‍රාදේශීය සභා නියෝජිතයන් ඇතුළු පාක්ෂිකයන් පිරිසක් එක්ව සිටි අතර, හිටපු දකුණු පළාත් සභා මන්ත්‍රී බෙලිඅත්ත ආසන සංවිධායක නිහාල් වෙදආරච්චි මහතා විසින් සංවිධානය කරනු ලැබූ උද්ඝෝෂණයට සමගි ජන බලවේගයේ හිටපු ඇමති හා හම්බන්තොට පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙඩආරච්චි මහතා ඇතුළු පාක්ෂිකයන් රැසක් එක්ව සිටියහ.

ආණ්ඩුවේ දේශපාලඥයෝ මරණීය දණ්ඩනයට නියමවූවන්ට පවා පාර්ලිමේන්තුවට පැමිණීමේ අවස්ථාව සලසාදී තිබෙන වකවානුවක කථානායකවරයා රන්ජන් රාමනායක මහතාටද පාර්ලිමේන්තුවට පැමිණීමේ අවස්ථාව සලසා දිය යුතු බව විරෝධතාකරුවෝ ඉල්ලා සිටියහ.

# වැලිකඩ බන්ධනාගාරය මිල්ලෑව ප්‍රදේශයට ගෙන ඒමට එරෙහිව විරෝධතාවක්

■ පාදුක්ක - ඩී.එන්.රෙක්සි

මිල්ලෑව ප්‍රදේශයේ අක්කර 250ක පමණ ඉඩමක රුපියල් කෝටි 50ක් පමණ මුදලක් වැයකර ඉදිකිරීමට යෝජිත නව බන්ධනාගාර සංකීර්ණයට එරෙහිව මිල්ලෑව එකමුතු සංවර්ධන පදනම සංවිධානය කළ විරෝධතාවක් මිල්ලෑව නාගස් හන්දියේදී ඊයේ (31දා) පැවැත්විණි. විවිධ විරෝධතා පුවරු රැගෙන සටන් පාඨ කියමින්



විරෝධතාවට එක්ව සිටි පිරිස් පැයකට ආසන්න කාලයක් විරෝධතාවේ නිරත වූහ. මෙම බන්ධනාගාරය ඉදිවුවහොත් පාදුක්ක, හොරණ නගර අවට ප්‍රදේශවාසීන්ට අනාගතයේදී අතිවිශාල සමාජීය අර්බුද රාශියකට මුහුණ දීමට සිදුවිය හැකි බවත්, මෙම යෝජනාව මුළු ප්‍රදේශයටම කොඩිවිනයක් බවද විරෝධතාකරුවෝ පෙන්වා දුන්හ..

# මඩොල්සිම හා ඒ අවට ගම්මාන කිහිපයකට දින 10ක පමණ කාලයක් ඇතුළත භූ කම්පන 04ක් සිදුවෙලා

– ගම්වාසීහු

## භූ කම්පන සම්බන්ධයෙන් සෙවීමට භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ විශේෂ කණ්ඩායමක් ඇකිරිය ගම්මානයට යෑමට නියමිතයි

– බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂ ඊ.එල්.එම්. උදය කුමාර

● මීගහකිවුල - එන්.කේ. නිශ්ශංක

දින 10ක පමණ කාලයක් ඇතුළත සිදුවූ සිවුවන භූ කම්පනය වාර්තා කරමින් මඩොල්සිම පොලිස් වසමට අයත් ඇකිරිය හා ඒ අවට ගම්මාන කිහිපයක ඊයේ (31) අලුයම 2.56 ට පමණ භූ කම්පනයක් සිදුවූ බව ගම්වාසීහු පිරිසක් පැවැසූහ.

භූ කම්පනය තත්පර 30කට පමණ කාලයක් පැවැති බවත්, දැවැන්ත හඬක් කණ වැකුණු අතර ඇතැම් නිවාස සෙලවී ගිය අතර, එම භූ කම්පනවලින් කිසිදු ජීවිත හෝ දේපළ හානියක් සිදුවී නොමැති බවද ඔවුහු වැඩිදුරටත් පවසා සිටියහ.

"ඊයේ (31) පාන්දර නිදාගෙන සිටි වේලාවක පොළව යටින් විශාල වාහනයක් යනවා වගේ දැනුණා. වහලෙත් හෙල්ලුණා. ඒ සද්දෙට අවදිවෙලා බලද්දිත් පොලව යටින් ඒ සද්දේ දිගටම ආවා. විනාඩියක් තරම් මේ සද්දේ තියෙන්න ඇති. වේලාව බලද්දි අලුයම තුනට ඇති" යැයි මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ඇකිරිය ප්‍රදේශයේ ත්‍රිරෝද රථ රියැදුරෙකු වන ප්‍රියන්ත දිසානායක මහතා පැවැසීය.

මඩොල්සිම පොලිස් වසමට අයත් ඇකිරිය හා ඒ අවට ගම්මාන කීපයක ඉකුත් 22 දිනයේදීද අලුයම 3.30, 3.38ට හා අලුයම 3.56ට මෙවැනිම භූ කම්පන තුනක් සිදුවිය.

මේ සම්බන්ධයෙන් බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂ ඊ.එල්.එම්. උදය කුමාර මහතාගෙන්ද විමසීමේදී මෙසේ පැවසීය.

"ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඇකිරිය ගම්මානයෙන් ඉකුත් 22 දින හා ඊයේ (31) දින භූ කම්පන කීපයක් වාර්තා වුණා. මෙහි රික්ටර් මාපකාංග අගය සම්බන්ධයෙන් විවිධ වෙනස්කම් ඇතිවීම නිසා මට ඒ සම්බන්ධයෙන් තවමත් නිශ්චිත අගයක් ප්‍රකාශ කරන්න බැහැ. කොහොම වුණත් වාසනාවකට මෙන් කිසිම අයෙකුට හෝ දේපළකට හානි සිදුව නැහැ. ආසන්න වශයෙන් මේ අයුරින් භූ කම්පන සිදුවීම පිළිබඳව අපේ අවධානය යොමුව තිබෙනවා. අප මේ වනවිටත් ඒ සම්බන්ධයෙන් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය දැනුවත් කිරීමක් සිදුකර තිබෙනවා. ඒ අනුව විශේෂ කණ්ඩායමක් මේ වනවිට එම ප්‍රදේශය වෙත යාමට පිටත්වී තිබෙනවා.

කොහොම වුණත් භූ කම්පන සම්බන්ධයෙන් කලින් දැන ගැනීමේ හැකියාවක් අපට නැහැ. ඒ වගේම ජනතාවටත් ඒ සම්බන්ධ දැනුමක් නැහැ. එම නිසා අප ඉක්මනින්ම දිනකදී මෙම ගම්මානයට ගිහින් ඒ සම්බන්ධයෙන් ගම්වාසීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කිරීමටත් බලාපොරොත්තු වෙනවා."

ඊයේ (31) භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නිලධාරියෙකු සම්බන්ධ කරගැනීමට උත්සාහ කළද එය ව්‍යවර්ථ විය.

◀ මාතර ▶

# කැස්බෑ බිත්තර 600ක් සමගින් සැකකරුවන් සිවුදෙනෙක් අත්අඩංගුවට



● දික්වැල්ල - නිමල් ලන්දගේ

ලුණුකලපුව හා කළුකැටිය ප්‍රදේශවලදී ඊයේ (31දා) අලුයම සිදුකළ වැටලීමකදී කැස්බෑ බිත්තර 600කට අධික ප්‍රමාණයක් සමග සැකකරුවන් සිවුදෙනෙකු දූෂණ මර්දන අංශය විසින් අත්අඩංගුවට ගත් බව දික්වැල්ල පොලීසිය පවසයි.

23 හා 62 හැවිරිදි වයස්වල පසුවන සැකකරුවන් බෙලිඅත්ත, ලුණුකලපුව, කළුකැටිය ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

නාවික හමුදාව විසින් ලබාදුන් තොරතුරක් මත දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක ගාමිණි ශාන්ත මහතා ඇතුළු නිලධාරීන් සිදුකළ වැටලීමේදී අදාළ සැකකරුවන් කැස්බෑ බිත්තර සමගින් අත්අඩංගුවට ගෙන තිබේ.

රාත්‍රියේදී ගොඩගන්නා ලද බිත්තර තැන් තැන්වල සඟවා තබා අලුයම් කාලයේ පොදු ප්‍රවාහන සේවා මගින් බෙලිඅත්ත ඇතුළු ප්‍රදේශවලට ප්‍රවාහනය කර ඇති බවද පරීක්ෂණවලදී අනාවරණය විය.

සැකරුවන් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

සිද්ධිය සම්බන්ධයෙන් දික්වැල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජී.පී.ටී. ඉෂාන් මහතාගේ උපදෙස් පරිදි අපරාධ අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක ගාමිණි ශාන්ත මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

◀ බදුල්ල ▶

# රු.1000ක දෛනික වැටුප ඉල්ලා වතු කම්කරුවෝ විරෝධතාවයක



● හාලිඇල- විජේරත්න රත්නායක

රජය අය වැයෙන් පොරොන්දුවූ පරිදි වතු කම්කරුවන්ට රුපියල් දහසක දෛනික වැටුප වහා ලබාදෙන ලෙස ඉල්ලා ඊයේ (31) දහවල් පස්සර නගරයේදී විරෝධතාවක් පැවැත්විණි.

අය වැයෙන් පොරොන්දුවූ රුපියල් 1000 වහා ලබාදෙනු යන මැයෙන් සමස්ත ලංකා වතු කම්කරු සංගමය මෙම උද්ඝෝෂණය සංවිධානය කොට තිබූ අතර පස්සර, ලුණුගල, මඩොල්සීම යන ප්‍රදේශයන්හි වතු කම්කරු නියෝජිතයන් පිරිසක් ඊට එක්ව සිටියහ.

විවිධ විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් විරෝධතා පාඨ කියමින් ඔවුහු පැයක පමණ කාලයක් සිය විරෝධතාවේ නිරත වූහ.

සමස්ථ ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කිටිනන් සෙල්වරාජ් හා එම සංගමයේ ලේකම් ජේ.එම්.ඒ. ප්‍රේමරත්න යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් මෙම උද්ඝෝෂණය සිදුකෙරිණි.





# ප්‍රදේශ දෙකක අනතුරු දෙකකින් පුද්ගලයන් 5ක් මරුට

● ගම්පහ ටෝනි කරුණානායක/ කඳාන - රුක්මන්/ ජා-ඇල ප්‍රසංග පෙරේරා/ හැටන් - රංජිත් රාජපක්ෂ/ ශාන් හුලංනුගේ

ඒකල හා නියංගම්දොර නගර ආශ්‍රිතව ඊයේ (31දා) උදෑසන සිදුවූ රිය අනතුරු දෙකකින් පුද්ගලයන් 5දෙනෙකු ජීවිතක්ෂයට පත්ව ඇති බව ජාඇල හා පුඩළුඔය පොලිසි පවසයි.

කොළඹ මිනුවන්ගොඩ ප්‍රධාන මාර්ග යේ ඒකල ගුවන් හමුදා කඳවුර ඉදිරියේ දී ඊයේ (31) උදෑසන වෑන් රථයක් පාරෙන් ඉවතට පැන බස් නැවතුම්පොළ තාප්පයේ ගැටීමෙන් එම වෑන් රථයේ ගමන් කළ තිදෙනකු ජීවිතක්ෂයට පත්ව ඇති බව ජා-ඇල පොලීසිය පවසයි. මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ රද්දොළුවේ සහ පමුණුගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වන වෑන් රථයේ රියැදුරු වූ සුමින්ද නිශාන්ත තිලකරත්න (අවු. 48) සහ ටිරෝන් එරල් හාඩි (අවු.64) සහ තුෂාර චාමින්ද (අවු.49) තිදෙනාය.

මේ අතර පුඩළුඔය තලවන්තැන්න ප්‍රධාන මාර්ගයේ කොත්මලේ නියංගම්දොර ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්තශාලාවක් අසලදී යතුරුපැදියක් සහ ටිපර් රථයක ඊයේ (31දා) උදෑසන ගැටීමෙන් යතුරුපැදියේ ගමන් ගත් තරුණයන් දෙදෙනෙකු එම ස්ථානයේම ජීවිතක්ෂයට පත්වී ඇති බව පුඩළුඔය පොලීසිය පවසයි.

එලෙස මියගොස් තිබුණේ කරගස්තලාව කටුකිතුල ප්‍රදේශයේ පදිංචිව සිටි එල්.එන්.කේ.ජී. දිනේෂ් (අවු. 19) සහ කලපිටිය ප්‍රදේශයේ පදිංචිව සිටි විමුක්ති සඳරුවන් (අවු.19) නමැත්තන්ය.

සිද්ධි සම්බන්ධයෙන් ජා-ඇල හා පුඩළුඔය පොලීසි වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# වළවේ ගඟේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත සිසුන් පිරිසකගෙන් සිසුවියක් දියේ ගිලී මරුට

## මෙම ක්ෂේත්‍ර චාරිකාව බලන්ගොඩ අධ්‍යාපනය කාර්යාලය දැනුම්වත් නොකර පෞද්ගලිකව සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවක්

– බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක පී.ජී. ආරිපාල

● රාස්සගල - එන්. සම්පත් / රත්නපුර - ලසන්ත නිරෝෂණ පෙරේරා/ බුදුගල - සෝමරතන හිමි/ බලන්ගොඩ - රෝහණ වසන්ත

බලන්ගොඩ කල්තොට වළවේ ගඟ ආශ්‍රිතව ක්ෂේත්‍ර පුහුණු චාරිකාවකට සහභාගී වූ පාසල් සිසුන් පිරිසක් වළවේ ගඟේ කල්තොට බටකොළ ඇල්ල ප්‍රදේශයේ දිය නාමින් සිටියදී සිසුවියක් දියේ ගිලී පෙරේදා (30දා) පස්වරුවේ ජීවිතක්ෂයට පත්ව ඇති බව කල්තොට පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්වූයේ, බලන්ගොඩ, කුරගල, තැන්න පදිංචිව සිටි ජී.එම්. නිරෝෂිකා කුමාරි (අවු. 16) නමැති පාසල් සිසුවියකි.

ඇය සහ මවුපියන් මීට පෙර හොරණ ප්‍රදේශයේ පදිංචිව සිට ඇති අතර, පසුව දැනට මාස තුනකට පමණ පෙර බලන්ගොඩ කුරගල, තැන්න ප්‍රදේශයට පදිංචියට පැමිණි තිබෙන බවත්, බලන්ගොඩ අධ්‍යාපන කලාපයට අයත් ර/ තැන්න විදුහලේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිට තිබේ.



මියගිය සිසුවිය

එම විදුහලේ 11 ශ්‍රේණියේ සිසුන් 12දෙනෙකු සහ ගුරුවරියක සමග මෙම ක්ෂේත්‍ර පුහුණු චාරිකාවට එක්වී ඇති අතර, එම ක්ෂේත්‍ර පුහුණු චාරිකාවට අයත් ක්‍රියාකාරකමක් ලෙස සිසුන් පිරිස වලවේ ගඟේ බටකොළ ඇල්ල කොටසේ දියනාමින් සිටියදී මෙලෙස අනතුර සිදුවී ඇති බවත් පරීක්ෂණවලදී අනාවරණය විණි.

ඇය දියේ ගිලුණු පසු ප්‍රදේශවාසීන් සහ කල්තොට පොලීසිය එක්ව සිදුකළ මෙහෙයුමකදී සිරුර ගොඩට ගෙන කල්තොට රෝහලට ඇතුළත් කර ඇති අතර, වැඩිදුර ප්‍රතිකාර සඳහා බලන්ගොඩ මූලික රෝහල වෙත මාරු කිරීමෙන් අනතුරුව ජීවිතක්ෂයට පත්ව තිබේ.

අදාළ සිද්ධිය සම්බන්ධයෙන් බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක පී.ජී. ආරියපාල මහතාගෙන් කළ විමසීමකදී පැවැසුවේ, මෙම ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය දැනුවත් කර නිල වශයෙන් සංවිධානය කර ගිය වැඩසටහනක් නොවන බවත් අදාළ ගුරුවරිය සහ දරුවන් පිරිස පෞද්ගලිකව සංවිධානය වී ගොස් ඇති ක්ෂේත්‍ර පුහුණු චාරිකාවක් බවත්ය.

සිද්ධිය සම්බන්ධයෙන් කල්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක තරංග හපුගස්වත්ත මහතාගේ උපදෙස් පරිදි නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

◀ මන්නාරම ▶

# කෝටි 02ක කේරළ ගංජා තොගයක් මාන්තෙයි මුහුදු වෙරළින් හමුවෙයි



● වවුනියාව - මධුෂංඛ අමරසිංහ

මන්නාරම මාන්තෙයි ප්‍රදේශයේදී සඟවා තිබූ රුපියල් කෝටි දෙකකට ආසන්න වටිනාකමින් යුත් කේරළ ගංජා කිලෝග්‍රෑම් 67 ග්‍රෑම් 500ක් තිබී පෙරේදා (30දා) සොයාගත් බව නාවික හමුදාව පැවසීය.

උතුරුමැද නාවික විධානයේ නිලධාරීන් පිරිසක් විසින් මාන්තෙයි මුහුදු වෙරළේ සිදුකළ සෝදිසි මෙහෙයුමකදී කැලෑවේ ස්ථාන දෙකකදී ගෝනී තුළ සඟවා තිබූ අදාළ කේරළ ගංජා තොගය සොයා ගෙන තිබේ.

එහිදී ගෝනි දෙකක් තුළ පාර්සල් 32ක අදාළ කේරළ ගංජා තොගය හමුවී ඇති අතර සොයාගත් කේරළ ගංජා රැගෙන ආ පුද්ගලයන් කවුරුන්දැයි යන්න මෙතෙක් අනාවරණය වී නොමැත.

මෙම කේරළ ගංජා තොගය ඉන්දියාවේ සිට මුහුදු මගින් බෝට්ටුවලින් මාන්තෙයි මුහුදු වෙරළට රැගෙනවිත් මෙලෙස මුහුදු වෙරළේ සැඟවීමට ජාවාරම්කරුවන් පියවර ගෙන ඇති බවට නාවික හමුදාව සැක පළ කරයි.

සොයාගත් කෝරල ගංජා තොගය වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා වංකාලෙයි පොලීසිය වෙතට භාර දීමට නාවික හමුදාව පියවරගෙන තිබේ.

# නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 10කට නව සභාපතිවරු පත් කරනවා

– නැගෙනහිර පළාත් ආණ්ඩුකාරිනී අනුරාධා යහම්පත්

● ත්‍රිකුණාමලය - චමෝද්‍යා නේත්‍රාංජලී අමරජීව

ගැටලුකාරී තත්ත්ව ඇති වී ඇති නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන10ක් සඳහා ඉදිරියේදී නව සභාපතිවරු පත් කරන බව ආණ්ඩුකාරිනී අනුරාධා යහම්පත් මහත්මිය පැවසුවාය.

මහ නගර සභාවක්, නගර සභාවක් හා ප්‍රාදේශීය සභා අටක ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වය මත නව සභාපතිවරු මෙලෙස පත්කරන බව ආණ්ඩුකාරවරිය පෙන්වා දුන්නාය. සභාපතිවරු පත්කිරීමේදී බහුතර බලයක් ඇති පක්ෂයක් වේ නම් පක්ෂ මහ ලේකම්වරයා හරහා සභාපතිවරු පත් කරන අතර එසේ නොවන පළාත් පාලන ආයතනයක් නම් බහුතරයේ කැමැත්ත මත ඡන්ද විමසීමකින් මෙම පත්කිරීම් සිදු කිරීමට නියමිතය.

අම්පාර මහ නගර සභාව හා එරාවූර් නගර සභාව මෙන්ම පොතුවිල්, පදියතලාව, ඉරකාමම්, මන්මුණේ, කෝරළේපත්තු, කෝරළේ පත්තු උතුර, තඹලගමුව හා සේරුවිල යන ප්‍රාදේශීය සභා සඳහා මෙලෙස නව සභාපතිවරු පත් කිරීමට නියමිතය.

1989 අංක 12 දරන පළාත් සභා (අනු ශාංගික විධි විධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන නගර සභා / ප්‍රාදේශීය සභා නියමයන්ට අනුකූලව ආණ්ඩුකාර වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම කටයුතු සිදු කිරීමට නියමිතය.

◀ නුවරඑළිය ▶

# නොර්වුඩ් ප්‍රා.සභා සභාපතිට ඇප

● හැටන් - රංජිත් රාජපක්ෂ

පුද්ගලයෙකුට පහර දුන්නේ යැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් සැකපිට බගවන්තලාව පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන පෙරේදා 30දා අධිකරණයට ඉදිරිපත් කළ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවේ සභාපති රවි කුලන්දවේල් මහතා රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුදාහරින ලෙස හැටන් දිසා විනිසුරු සහ මහේස්ත්‍රාත් ජේ.ට්‍රොස්කි මහතා නියම කළේය.

මෙම නඩුව එළඹෙන මාර්තු 30 දින කැඳවීමට ද මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරන ලදී.

නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පලනි දිගම්බරම් මහතාගේ පෞද්ගලික ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරන සුප්පයියා කමලදාසන් නමැත්තාට නොර්වුඩ් ප්‍රාදේශීය සභාවේ සභාපති රවි කුලන්දවේල් මහතා විසින් පසුගිය 29දා පහර දී තුවාල සිදු කර බවට තුවාලකරු විසින් පොලිසියට කළ පැමිණිල්ලක් මත සැකකාර සභාපතිවරයා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

පහර කෑමට ලක් වුවේ යැයි කියන පලනි දිගම්බරම් මහතාගේ පෞද්ගලික ලේකම්වරයා මේ වන විට දික්ඔය මූලික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

බගවන්තලාව පොලිස් වසමට අයත් මොරා වත්තේ පිහිටි 319 ජී ග්‍රාම සේවා කාර්යාලයට සේවාවක් ලබා ගැනීමට තමන් ගිය අවස්ථාවේ ඒ අසලට පැමිණි සභාපතිවරයා තමන්ට බැණ තර්ජනය කරමින් පහර දුන් බව පහර දීමට ලක් වුවේ යැයි කියන දැනට දික්ඔය මූලික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන සුප්පයියා කමලදාසන් මහතා පැවසීය.

මේ අතර අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සභාපතිවරයා වහාම අත්අඩංගුවට ගන්නා ලෙස බල කරමින් බගවන්තලාව කර්කස්වොල් වත්තේ වතු කම්කරුවෝ පිරිසක් එම වතු යායේදී පසුගිය (30දා) උදෑසන උද්ඝෝෂණයකද නිරත වූහ.



# පරිගණක හා සංගීත භාණ්ඩ විකුණ බවට අන්තර්ජාලයේ දැන්වීම් පළ කරමින් මුදල් වංචා කළ සැකකරුවෙක් අත්අඩංගුවට

● බිමල් ශ්‍යාමන් ජයසිංහ

උසස් තත්ත්වයේ සංගීත භාණ්ඩ සහ පරිගණක ඉතා ඉක්මනින් අඩු මුදලට විකුණන බවට අන්තර්ජාලයේ දැන්වීම් පළකර මුදල් වංචාව යෙදුණු පුද්ගලයෙකු පෙරේදා (30දා) කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වැලිගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පැවසීය.

29 හැවිරිදි සැකකරු නාත්තන්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සැකකරු සන්තකයේ තිබී විවිධ පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් හයක් තිබී පොලිස් භාරයට ගෙන තිබේ.

එම භාණ්ඩ මිලදී ගැනීමට යම් අයෙකු කැමතිනම් ඒ සඳහා බැංකු ගිණුම් අංකයට මුදල් බැර කරන ලෙස දන්වා එලෙස බැර කරන ලද මුදල් කාඩ්පතක් උපයෝගී කරගෙන ලබා ගෙන එම ගිණුම අවසන් කිරීමට කටයුතු කර ඇති බවත්, රු.10,000, 20,000 ආදී වශයෙන් දිනපතා විශාල පිරිසකගේ මුදල් වංචා කර ඇති අතර, සැකකරු විසින් විවිධ පුද්ගලයන්ගේ හැඳුනුම්පත් සොරකම් කිරීමෙන් ගිණුම් ආරම්භ කර ඇති බවත් පරීක්ෂණවලදී හෙළිවී තිබේ

මේ සම්බන්ධයෙන් අදාළ ගිණුම් හිමිකරුවන් දුෂ්කරතාවන්ට ලක්ව ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සිදුකළ මෙහෙයුමකදී සැකකරු අත්අඩංගුවට ගෙන තිබෙන බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

ඔබත් මෙම පුද්ගලයාගේ වංචාවට අසුවී ඇත්නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂවරයාගේ 0718591753 දුරකථන අංකයට ඇමතුමක් ලබාදී පැමිණිල්ලක් ලබාදීමට කටයුතු කරන ලෙස මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් ඉල්ලා සිටියි.

# අපවත් වී වදාළ පනාමුරේ සුමනසිරි හිමියන්ගේ ආදාහන පූජෝත්සවය අද



● රත්නපුර - ලසන්ත නිරෝෂණ පෙරේරා

ඇඹිලිපිටිය ශ්‍රී සංඝාරාම විහාරාධිපති විචිත්‍රභානක පූජ්‍ය පනාමුරේ සුමනසිරි නාහිමියෝ අපවත් වූහ.

උන්වහන්සේ අපවත් වනවිට 55 හැවිරිදි වියේ පසු වූහ. ඇඹිලිපිටිය ප්‍රදේශයේ සමාජ ආගමික සහ ශාසනික ක්ෂේත්‍රවල පුළුල් මෙහෙවරක යෙදුණු භික්ෂූන් වහන්සේ නමක් ලෙස උන්වහන්සේ ප්‍රකටය.

පනාමුරේ සුමනසිරි නාහිමියන්ගේ ආදාහන පූජෝත්සවය අද පෙබරවාරි 01වැනිදා පස්වරුවේ ඇඹිලිපිටිය ගම් උදා ක්‍රීඩා පිටියේදී සිදු කිරීමට නියමිතය.




# කැබිතිගොල්ලෑව කෝවිඩ් මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය ප්‍රාථමික පාසල හරහා ගලා යෑමෙන් ජීවිතවලට කෝවිඩ් අවදානමක්

## - පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර

◀ අනුරාධපුරය ▶

● හොරොව්පොතාන - සිඩ්නි රුවන් උබේපාල

කෝවිඩ් රෝගීන් සඳහා ප්‍රතිකාර කරනු ලබන කැබිතිගොල්ලෑව රෝහල් කැළි කසළ සහ අපද්‍රව්‍ය මිශ්‍ර කානු පද්ධතිය කැබිතිගොල්ලෑව ප්‍රාථමික පාසල හරහා ගලා යෑම එම පාසලේ ඉගෙනුම දරුවන් කෝවිඩ් රෝගයේ බිල්ලක් බවට පත් කිරීමක් බවත් එම නිසා මෙම අනාරක්ෂිත කානු පද්ධතිය වහාම ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බවත් අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර මහතා පැවසීය

මැදවච්චිය නගරයේදී පෙරේදා (30දා) පැවැති මාධ්‍ය හමුවකදී මන්ත්‍රීවරයා එසේ පැවසීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා,

"කැබිතිගොල්ලෑව ප්‍රාථමික පාසල තියෙන්නේ කැබිතිගොල්ලෑව නගරයේ. කැබිතිගොල්ලෑව රෝහල ඊට ආසන්නවම තිබෙනවා. පසුගිය කාලයේ කෝවිඩ් රෝගීන් සඳහා වෙන් කළ රෝහලක් මේක. දිවයින පුරා කෝවිඩ් පොසිටිව් අය ගෙනත් නේවාසිකව ප්‍රතිකාර කරන්නේ මේ රෝහලේ. සෑම රෝගියෙක්ම රෝගීන් ලෙස සලකලා ආරක්ෂිත ක්‍රමයට මෙය පවත්වාගෙන යාවි කියන බලාපොරොත්තුවෙන් අපි නිහඬව බලන් හිටියා මේ රෝහල දෙස. අවසානයේදී මේ රෝහලේ ආරක්ෂිත පාලනය බිඳී ගියා. එහි ප්‍රතිඵලය ලෙස රෝහලේ සේවයේ යෙදුණ වෛද්‍යවරුන්ට පවා මෙම රෝහලේ සේවය කරමින් සිටියදී කෝවිඩ් පොසිටිව් වුණා. එහෙම පාලනයෙන් ගිලිහුණ රෝහලේ කැළි කසළ සහ අපද්‍රව්‍ය මිශ්‍ර ජලයේ කානු පද්ධතියක් අද වනවිට





කැබිතිගොල්ලෑව ප්‍රාථමික පාසල් භූමිය හරහා ගලා යනවා. මේ වන විට පාසල් ආරම්භ කරලා තියෙන්නේ. හයක්, හතරක් නොතේරෙන දරුවන් දැන් මේ පාසලට එනවා. මේ අය මේ කානුව අසලින් ගමන් කරනවා. සමහර අය ඒ ජලය සමග සෙල්ලම් කරනවා. මේ දරුවන්ට කිසි දෙයක් තේරෙන්නේ නැහැ. අධ්‍යාපනයේ ප්‍රාථමික මට්ටමේ සිටින දරුවෝ මේ. මෙහෙම ගියොත් මේ අයට වෛරසය ඉක්මනින් ශරීරගත වෙන්න පුළුවන්. මේක ලොකු අවදානමක්. සුළුවෙන් සිතන්න බෑ. වහාම බලධාරීන් මේ පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. මේ අනාගතය බාරගන්න ඉන්න මල් කැකුලු කෝවිඩ් වෛරසයට බිලි දෙන්න එපා කියලා මම රජයෙන් ඉල්ලා සිටිනවා. ඒ නිසා කඩිනම් විසඳුමක් මෙයට ලබා දෙන්න කියලා නැවත වතාවක් මම බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවාත" යැයි ද පවසා සිටියේය.

# තුඩැල්ලේ මාළු අපනයන සැකසුම් මධ්‍යස්ථානයක 88කට කෝවිඩ්

● ජා-ඇළ - ප්‍රසංග පෙරේරා

ජා-ඇළ සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී බලප්‍රදේශයට අයත් තුඩැල්ල පිහිටි මාළු අපනයන සැකසුම් මධ්‍යස්ථානයකින් කෝවිඩ් 19 ආසාදිතයන් 88දෙනෙකු ඊයේ (31දා) වනවිට හඳුනාගත් බව ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්.ඩබ්ලිව්.එම්.වයි. විජේසිංහ මහතා පැවසීය.

මෙම ආයතනයේ සේවකයන් 25දෙනෙකු පමණ ඒකල කොටුගොඩ ප්‍රදේශයේදී නිරෝධායන නීති උල්ලංඝනය කරමින් සාදයක් පවත්වා ඇති බවටද කරුණු අනාවරණය වූ බව විජේසිංහ මහතා පවසා සිටියේය.

ප්‍රථමයෙන් එම පිරිසට රෝග ලක්ෂණ පහළ වී ඇති අතර පසුව කරනු ලැබූ පී.සී. ආර්. පරීක්ෂණයේදී අදාළ පුද්ගලයන් ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇත. එම ආසාදිතයන් මේ වනවිට රෝහල්ගත කිරීමට කටයුතු කරමින් සිටින බවද ඔවුන්ගේ ආශ්‍රිතයන් ස්වයං නිරෝධායනයට ලක් කර අදාළ ආයතනය විෂබීජහරණයට ලක්කළ බවද පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පැවසීය.

◀ ගාල්ල ▶

# යතුරුපැදියක් හා ලංගම බස් රථයක් ගැටී යතුරුපැදියේ ගමන් ගත් යුවළ මරුට



● පිටිගල - ඩී.ජේ. විජේසිංහ

ඇල්පිටිය - අවිත්තාව ප්‍රධාන මාර්ගයේ නාලන්දා මහ විදුහල ආසන්නයේදී පෙරේදා (30දා) පෙරවරුවේ සිදුවූ යතුරුපැදි හා බස් අනතුරකින් යතුරුපැදියේ ගමන් ගත් යුවළ ජීවිතක්ෂයට පත්ව ඇති බව ඇල්පිටිය පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්වූයේ, අවිත්තාව ඕපාත පන්සල අසල පදිංචිව සිටි සහන් රෝහිත ජයසිංහ හා ඕපාතගම විදානලාගේ රමණී පුෂ්පලතා නමැති යුවළකි.

මරණයට පත් යුවළ යතුරුපැදියෙන් ඕපාත සිට ඇල්පිටිය දෙසට ගමන් කරමින් සිටියදී ඇල්පිටිය දෙස සිට අවිත්තාව බලා ධාවනය වූ ලංගම බස් රථයට ගැටීමෙන් අනතුර සිදුව ඇති බවත්, බස් රථය විරුද්ධ දිසාවට ගොස් විදුලි කණුවක ගැටී නතර වී තිබූ බවත් පරීක්ෂණවලදී අනාවරණය විය.

සිද්ධිය සම්බන්ධයෙන් ඇල්පිටිය පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.



# සංචරණ සීමා ලිහිල් කරන්නැයි මහියියාව ජනතාව විරෝධතාවක

● ෂෙන් සෙනෙවිරත්න

කෝවිඩ් වෛරස ව්‍යාප්තිය හේතුවෙන් දැනට මාස දෙකක් පමණ කාලයක් වසා තබා තිබෙන මහියියාව ගම්මානයේ සංචරණ සීමා ලිහිල් කරන්නැයි ඉල්ලමින් එම ගම්මානයේ ජනතාව පෙරේදා (30දා) සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සාමකාමී විරෝධතාවක නිරත වූහ.

එම ගම්මානයේ පදිංචි පවුල් 2000ක පමණ පිරිසක් සංචාරණ සීමා ඉවත් නොකිරීම නිසා දැඩි අපහසුතාවකට පත්ව සිටින බවත්, පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පවා මේ නිසා අඩාළ වී තිබෙන බව විරෝධතාකරුවෝ පැවසූහ.

අවස්ථා කිහිපයකදී පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළත් එහි ප්‍රතිඵල නිකුත් වීමේ ඇති ප්‍රමාදය නිසා මෙසේ ජනතාව අපහසුතාවට පත්වී සිටින බවද ඔවුහු පෙන්වා දුන්හ.

පවතින තත්ත්වය හේතුවෙන් මෙවර පළමු වසර සඳහා ළමුන් ඇතුළත් කිරීමට ඉල්ලුම්පත් යොමුකළ දරුවන්ගේ දෙමවුපියන්ට අභියාචනාවලට පවා යාමට නොහැකි වූ බව රිස්වාන් මවුලවිතුමන් පැවසීය.

මහනුවර නාගරික මන්ත්‍රී ආනන්ද සරත් කුමාර මහතා පවසා සිටියේ, මහියියාව ප්‍රදේශයේ පළමු කෝවිඩ් රෝගියා හඳුනා ගැනීමෙන් පසු ඔහුගේ ආශ්‍රිතයන් පිරිසක් රන්ටැඹේ නිරෝධායන කඳවුරට යොමුකළ බවත් ඉන් අනතුරුව ගමේ සෙසු පිරිසට එකවර පී.සී.ආර්. පරීක්ෂණවලට භාජනය නොකර කඩින්කඩ එය කිරීම නිසා මෙම ගැටලුව මතුව තිබෙන බවත්ය.

# අත්තනගල්ල කොට්ඨාසයේ කෝවිඩ් ආසාදිත ගණන 732ක්

● වාරණ - ආනන්ද ඉ. ජයකොඩි

අත්තනගල්ල කොට්ඨාසයේ ඊයේ (31දා) වනවිට කෝවිඩ් 19 වෛරස ආසාදිතයන් 732ක් වාර්තා වී ඇති බව අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

තිහාරිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කලාපයෙන් ආසාදිතයන් 154ක් වශයෙන් වැඩිම පිරිසක් වාර්තා වී ඇත.

මේ කාලය තුළ කෝවිඩ් ආසාදිත මරණ තුනක් අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයෙන් වාර්තා වී තිබේ.

# ගනේපල්ලේ උත්සවයකට සහභාගී වූ 60ක් නිරෝධායනයට

◀ කෑගල්ල ▶

● යටියන්තොට - සමන් එස්. රත්නායක

යටියන්තොට ගනේපල්ලේ නිවසක පැවැති මල්වර වීමේ උත්සවයක දින කීපයක් වැඩ කළ කෝවිඩ් ආසාදිත පවුලේ ඥාතියෙකු හේතුවෙන් එම උත්සවයට සහභාගී වූ ගමේ පවුල් 60ක් නිරෝධායනයට ලක්කළ බව යටියන්තොට සෞඛ්‍ය නිලධාරී කාර්යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක කෝලිත ආරියදාස මහතා ඊයේ (31දා) පැවසීය.

ඒ මහතා ප්‍රකාශ කළේ, මෙවැනි උත්සව වත්මන් තත්ත්වය හමුවේ චාරිත්‍රවලට පමණක් සීමා කරමින් පවුලේ අය සමග සිදු කරන ලෙස උපදෙස් දුන්නද සෞඛ්‍ය උපදෙස් අනුගමනය නොකිරීම හේතුවෙන් මෙවන් තත්ත්වයක් ඇතිවන බවයි. තවද උත්සවයේ වැඩ කටයුතු කළ අය හා එයට සහභාගි වූවන් සමහරෙක් මුව ආවරණ පවා පැළඳ නොසිටි බවට වාර්තා වන බවත් ඒ මහතා මෙහිදී සඳහන් කළේය.

මේ හේතුවෙන් නිරෝධායනයට ලක්කළ පවුල්වල රජයේ සේවකයන්, වතු නිවාසවල පදිංචි වතුසේවකයන්, හමුදා නිලධාරීන්, පාසල් සිසුන් ගුරුවරුන් ඇතුළු විශාල පිරිසක් සිටින බව සෞඛ්‍ය අංශ පවසයි.

පසුගිය 25වැනිදා පැවැති මෙම උත්සවයට සහභාගි වූ කෝවිඩ් ආසාදිතය පුද්ගලයා ජා-ඇළ ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක සේවකයෙකු වන අතර සේවා ස්ථානයෙන් පී.සී.ආර්. පරීක්ෂණය සිදු කිරීමේදී කෝවිඩ් ආසාදිත බවට තහවුරු වී ඇති බව පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා තවදුරටත් සඳහන් කළේය.

◀ පුත්තලම ▶

# පුත්තලමින් කෝවිඩ් ආසාදිතයන් 44ක් සොයා ගැනේ

● ආරච්චිකට්ටුව - ලලිත් නවරත්න

පුත්තලම දිස්ත්‍රික්කයේ එක් දිනයක් තුළ හඳුනාගත් වැඩිම කෝවිඩ් ආසාදිතයන් ප්‍රමාණය වන ආසාදිතයන් 44ක් පෙරේදා (30දා) වාර්තා වූ බව සෞඛ්‍ය අංශ බලධාරීහු සඳහන් කරති.

එම ආසාදිතයන් වෙන්නප්පුව, මහවැව, ආරච්චිකට්ටුව, මුන්දලම, පුත්තලම, මාරවිල, ආණමඩුව යන සෞඛ්‍ය බලප්‍රදේශවලින් වාර්තා වී ඇති බව සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

සියලුම ආසාදිතයන් දිවයින තුළ ස්ථාපිත කර ඇති විශේෂ කෝවිඩ් ප්‍රතිකාරක මධ්‍යස්ථාන වෙත ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ඇති අතර එම ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් 1800ට අධික සංඛ්‍යාවක් තම නිවෙස්වලම ස්වයං නිරෝධායනයට යොමුකර ඇති බව එම සෞඛ්‍ය බලධාරීහු පවසති. එම පිරිස් සඳහා පී. සී. ආර් පරීක්ෂණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස වශයෙන් සිදු කරන බව පවසන පුත්තලම දිස්ත්‍රික් පරිපාලන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ආර්.පී. අබේරත්න මහතා, නියමිත නිරෝධායන නීතිවලට අනුව තම නිවෙස්වලම රැඳී සිටිමින් සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව කටයුතු කරන ලෙස එම නිරෝධායකයන්ගෙන් ඉල්ලා සිටියි.

# බලන්ගොඩින් නව ආසාදිතයන් 09ක්

## බලන්ගොඩ රෝහලේ පිරිමි ශල්‍ය වාට්ටුව තාවකාලිකව වසා දැමේ

◀ රත්නපුර ▶

● රාස්සගල - එන්. සම්පත්/ බෙලිහුල්ඔය - එස්. රත්නායක

බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ නව කෝවිඩ් වෛරස ආසාදිතයන් 09දෙනෙකු ඊයේ (31දා) හඳුනාගෙන ඇති බව බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

කිරිමැටිතැන්න ප්‍රදේශයේ පුද්ගලයන් 06දෙනෙකු, දෙහිගස්තලාව ප්‍රදේශයේ පුද්ගලයන් 02දෙනෙකු සහ රාස්සගල, හල්වතුර කන්ද ප්‍රදේශයේ පදිංචි පොලිස් විශේෂ කාර්ය බළකායේ අයෙකුට මෙලෙස කෝවිඩ් -19 වෛරස වී ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇතැයි බලන්ගොඩ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීහු පැවසූහ.

ඔවුන්ට ඉකුත් 27වැනිදා සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණවල වාර්තා ලැබීමෙන් පසු මෙලෙස තහවුරු වූ බවද මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීහු වැඩිදුරටත් පැවසූහ.

මේ අතර, බලන්ගොඩ මූලික රෝහලේ රෝහලේ ශල්‍ය වෛද්‍ය පිරිමි වාට්ටුව ඊයේ (31දා) තාවකාලිකව වසා දැමීමට පියවර ගත් බව එම රෝහලේ ප්‍රකාශකයෙක් පැවසීය.

ශල්‍යකර්මයක් සඳහා රෝහලේ 8 වාට්ටුවේ නේවාසිකව සිටි රෝගියෙකු ශල්‍යකර්මයට ප්‍රථම කළ පී.සී.ආර් පරීක්ෂණයවලින් කෝවිඩ් ආසාදනය වී ඇති බවට තහවුරු වීමෙන් පසු මෙම වාට්ටුව තාවකාලිකව වසා දැමීමට පියවර ගත් බව එම ප්‍රකාශකයා පැවසීය.

මෙම රෝගියා මේ වනවිට රෝහලේ වෙන්ව ඇති වෙනම වාට්ටුවක් සඳහා යොමු කර ඇති අතර කෝවිඩ් ප්‍රතිකාර සඳහා යොමු කිරීමට නියමිතව ඇති බවද රෝහල් ප්‍රකාශකවරයා වැඩිදුරටත් පවසා සිටියේය.

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

SEYLAN BANK PLC

T & H

**සෙලාන් බැංකුව පීඑල්සී**
**නාවල ශාඛාව මඟින්**
**දෙහිවල, කළුබෝවිල පිහිටි නවීන මහල් නිවසක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

මෙම දේපළ වත්තල සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ සිය ලියාපදිංචි අංක පීවී 69089 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සෙරන්ඩිබ් ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දෙහිවල පදිංචි පරණවිදානලාගේ දිල්ශාන් එසිනාහත් බොතේජු යන අය බන්ධනදායි/ උකස්කරුවන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

**උපලේඛනය**

සහාධිපත්‍ය ඉඩම් කොටස එක්ස්/එෆ්ඕ/යූ 1
දෙහිවල, ස්කූල්, ලේන් වරිපනම් අංක 41 දරන එක්ස්/එෆ්ඕ/යූ 1 සහාධිපත්‍ය ඉඩම් කොටස පහත සඳහන් පරිදි සමන්විත වේ.
(අ) බිම් මහල එක්ස්/එෆ්ඕ/යූ 1 සහාධිපත්‍ය ඉඩම් කොටස
(ආ) සහාධිපත්‍ය ඉඩම් කොටස ඒපී 1 රථගාල
(අ) බිම් මහලෙහි එක්ස්/එෆ්ඕ/යූ 1 සහාධිපත්‍ය ඉඩම් කොටස පහත සඳහන් පරිදි මායිම් වේ.
උතුරට : සීඊ 1 — නැගෙනහිරට : සීඊ 1 සහ සීඊ 3
දකුණට : අමතර ඉඩම් කොටස් ඒපී 1 සහ ඒපී 2 — බස්නාහිරට : පාර
පත්ලෙන් : මෙම ඉඩම් කොටසේ කොන්ක්‍රීට් බිම — මුදුනින් : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්/යූ 1
බිමෙහි වර්ග ප්‍රමාණය : වර්ග මීටර් 133කින් යුක්ත වේ
(ආ) සාහාධිපත්‍ය ඉඩම් කොටස බිම් මහල් ඒපී1 (රථගාල) පහත සඳහන් පරිදි මායිම් වේ.
උතුරට : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්ඕ/යූ 1 සහ සීඊ 1
නැගෙනහිරට : සීඊ 1
දකුණට : සීඊ1 සහ අමතර ඉඩම් කොටස ඒපී 2 — බස්නාහිරට : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්ඕ/යූ 1
පත්ලෙන් : මෙම ඉඩම් කොටසේ කොන්ක්‍රීට් බිම — මුදුනින් : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්1/යූ
බිමෙහි වර්ග ප්‍රමාණය: වර්ග මීටර් 14කින් යුක්ත වේ.

**සාහාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන් පහත සඳහන් පරිදි වේ.**
(අ) ගොඩනැගිල්ල පිහිටි ඉඩම, සාහාධිපත්‍ය දේපළට අදාළ විවෘත ඉඩකඩ ඇතුළුව
(ආ) අත්තිවාරම, කුලුනු, බාල්ක, යට ලී, ආධාරක සහ ගොඩනැගිල්ලේ වහල.
(ඇ) විදුලිය, දුරකතන, ගුවන්විදුලි, රෙඩිෆියුෂන්, රූපවාහිනී, ජල නළ, ජල ටැංකි, ජලය සඳහා සම්ප්, උඩ ජල ටැංකි, පොම්පාගාරය, නළ, ජලාපවහන මාර්ග, මෑන්හෝල්ස් සහ කැළි කසළ නිශ්කාශන වැනි ප්‍රධාන සේවා සඳහා සවිකිරීම.
(ඈ) දේපළෙහි සිය පැවැත්මට නඩත්තුවට සහ ආරක්ෂාවට සාමාන්‍යයෙන් පොදුවේ භාවිතයේ ඇති අත්‍යවශ්‍ය සහ යෝග්‍ය සියලු වෙනත් කොටස් සහ පහසුකම්.
බලයලත් මිනින්දෝරු ගාමිණී. බී. දොඩන්වෙල විසින් සාදන ලද 2013 ජූනි 24 දිනැති අංක 9623 දරන සහාධිපත්‍ය සැලැස්මේ නිරූපණය කර සහ විස්තර කර ඇති පොදු අංගයන්ගේ සහ ස්ථානවල නිර්වචනය සහ විස්තරය.
(අ) සීඊ (i) ස්ථානය - බිම් මහල — (ii) විස්තරය - විවෘත ප්‍රදේශය
(iii) බද්ධ නිවාස කොටසට ප්‍රවේශය - බද්ධ නිවාස කොටස් ප්‍රවේශය එක්ස්/එෆ්ඕ/යූ 1 සහ එක්ස්/ එෆ්1/යූ 10
(ආ) සීඊ 2 (i) ස්ථානය - බිම් මහල — (ii) විස්තරය - අහසට විවෘතව ඇත.
(ඇ) සීඊ 3 (i) ස්ථානය - බිම් මහල සහ ඉහළ මහල — (ii) විස්තරය - තරප්පු පෙළ
(iii) බද්ධ නිවාස කොටසට ප්‍රවේශය - එක්ස්/එෆ්1/යූ 1 බද්ධ නිවාස කොටසට අතරමැදි ප්‍රවේශය.

**සහාධිපත්‍ය දේපළට ප්‍රවේශය**
බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2013 ජූනි මස 24 දිනැති අංක 9623 දරන එකී සහාධිපත්‍ය සැලැස්මේ බස්නහිර මායිම උඩින් සහ විස්තර කර ඇති සහ කියැවෙන පරිදි පාර දිගේ සහ උඩින් හා යටින් ප්‍රකාශකහට සහ සිය අනුප්‍රාප්තිකයන්ට සහ පැවරුම්ලාභීන්ට සේවකයින්ට කුලීකරුවන්ට ආරාධිතයන්ට ආගන්තුකයින්ට යාමට ඊමට සහ ප්‍රතිගමනයට පූර්ණ සහ නිදහස් අයිතිය නිදහස සහ බලපත්‍රය සහ සියලු වේලාවන්හි නිත්‍ය මාර්ග අයිතිය සහ ප්‍රකාශක විසින් බලය පවරන ලද සමාන අයිතිවාසිකම් ඇති සියලු වෙනත් පුද්ගලයින්ට සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් කුමන ආකාරයේ වුවද සියලු කාරණා සඳහා දහවල් හෝ රාත්‍රී කාලයේ සමාන අයිතිවාසිකම් ඇති වෙනත් අය සමඟ පොදුවේ විදුලි කේබල්, උඩු රැහැන් සහ ජලය ගෑස් ජලාපවහන පද්ධති සහ ජලාපවහන නළ සහ ප්‍රධාන නළ සහ වෙනත් කුමන ආකාරයේ වුවද මෙවලම් පහත විස්තර කරනු ලබන පාර තුළ දිගේ උඩින් සහ යටින් යෙදීමට අයිතිය සමඟ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අංක 10350 දෙහිවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හත්බෝධිවත්ත වෝර්ඩ් අංක 05 කළුබෝවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්.එච්.බී. ජෝසප් විසින් සාදන ලද 1967 පෙබරවාරි 12 දිනැති අංක 77 සැලැස්මේ නිරූපණය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ අඩි 10ක් පළල පාරක් වන ලොට් 6 ලකුණු කළ ඉඩම් කොටසට මායිම් උතුරට: පාසල් මාවතද නැගෙනහිරට : ලොට්ස් 1 සහ 2 ද, දකුණට : ලොට්ස් 3 සහ 4 සහ බස්නාහිරට : ලොට් 5 ද යන මායිම් තුළ පර්චස් තුනක් (අ.0 රූ. 0 පර්. 03) විශාල ඉඩම.

**වර්ග මීටර් 133 කින් යුත් ඉහත සඳහන් මහල් නිවාසය ඊට අයත් සියලු පහසුකම් සහ අයිතිවාසිකම්ද සමඟ සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලතල අනුව 2021 පෙබරවාරි මස 22 වන දින පෙරවරු 10.00ට ඒම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**දේපළට පිවිසීම :-** දෙහිවල, ගාලු පාරේ, විලියම් මංසන්ධියේ සිට කළුබෝවිල රෝහල පාරේ කොහුවල දෙසට කි.මී. 1ක පමණ දුරක් ගොස් වම්පසට ඇති අල්විස් ඇවනිව් එකට හැරී තවත් මීටර් 100ක පමණ දුරක් ගොස් නැවතත් වම්පසට ඇති මාර්ගයට හැරී මීටර් 125ක පමණ දුරක් ගොස් වම්පසට ඇති පාසල් පටුමඟට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 100ක පමණ දුරක් ගිය විට අදාළ නිවාස ඒකකය මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් - 19 උපදෙස් සහ නීතිරීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පත්වනු ඇත.

**යෝජනා සම්මුති දැන්වීම :** රජයේ ගැසට් පත්‍රයේ 2019.10.18 වන දින පළවී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත්වල 2019.10.23 වන දින පළවී ඇත. විකිණීමේ නිවේදනය රජයේ ගැසට් පත්‍රයේ 2021.01.29 වන දින පළවී ඇත.

**ගෙවීමේ ක්‍රමය :-** සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.
1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්)
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3000/-
5. ලිපිකරු සහ ඝෝෂක වේතන රු. 1500/-
6. සියලුම ප්‍රචාරක වියදම්
7. ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමඟ වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී අංක, 90 ගාලු පාර, කොළඹ 03 දු.ක. 0112456476, 2456480
ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

**තුසිත් කරුණාරත්න (සාම විනිසුරු)**
**බලයලත් වෙන්දේසිකරු**
**සහ උසාවි කොමසාරිස්**

**ටී.ඇන්ඩ්.එච්. ඔක්ෂන්**
**50/3, විහාර මාවත, කොලොන්නාව**
**දු.ක. 0113068185, 0112572940**



# ඉදිරියේදී සැමට ලැබෙන කෝවිඩ් එන්නත් ගැන දැනුවත්ද?

**covid-19 වෛරසය සඳහා මේ වන විට ලෝකයේ එන්නත් කිහිපයක්ම භාවිත කිරීම ඇරඹුණු අතර, පසුගියදා ලංකාවටද Oxford AstraZeneca ආයතනය මගින් නිර්මාණය කළ සීරම් ඉන්ස්ටිටියුට්හි නිෂ්පාදනය කරන ලද Covishield එන්නත ලැබුණි. එම එන්නත භාවිත කිරීම සහ ඒ වටා ඇති ඔබ දැනුම්වත් විය යුතු කරුණු සහ ඉදිරියේදී ලැබෙන එන්නත් පිළිබඳව මෙම ලිපියෙන් ආවරණය කිරීමට අප උත්සාහ ගත්තෙමු.**

● කැළුම් දේවින්ද / නදීශානි පතිරණ


## covid-19 සඳහා එන්නත්කරණය යනු කුමක්ද?


covid-19 වෛරසයෙන් ආරක්ෂා වීමට ඇති සරල ආරක්ෂාකාරී ඵලදායී ක්‍රමයකි. මෙහිදී ඔබේ ශරීරයේ පවතින ස්වාභාවික ප්‍රතිශක්තීකරණය covid-19 වෛරසයට විරුද්ධව ක්‍රියාකාරී වීමට සලස්වයි. වෛරසයට එරෙහිව තමාගේ සිරුරේ ඇති ප්‍රතිශක්තීකරණය ශක්තිමත් කරයි. එන්නත ලබාගත් පුද්ගලයෙකුට නැවත වෛරසය ඇතුළු වූ විට ප්‍රතිශක්තීකරණ පද්ධතියේ මතක තබාගැනීමේ සෛල එය හඳුනා ගනී. එවිට ප්‍රතිශක්තීකරණ පද්ධතිය ක්‍රියාත්මක වීමෙන් ඔබ රෝගී වීමට ප්‍රථම වෛරසය විනාශ කර දමයි.

## එන්නතක ඇති වැදගත්කම

ඖෂධීය නොවන රෝග වැළැක්වීමේ ක්‍රමවේදයන් covid-19 මැඩපැවැත්වීමට වැදගත් වුවද එමගින් තවදුරටත් රෝගය පාලනය කිරීම අපහසු වී ඇත. එම නිසා එන්නත්කරණය මගින් covid-19 වෛරසයෙන් සිදුවිය හැකි රෝගී තත්ත්වයන් සහ සංකූලතා මගින් සිදුවන මරණ වැළැක්වීමට බලාපොරොත්තු වේ. ලෝකයේ සියලු ජනතාව මෙන්ම ශ්‍රී ලාංකිකයන්ද මෙම වසංගත තත්ත්වය නිසා වසංගත තෙහෙට්ටුවෙන් (Pandemic fatigue) පෙළේ. එබැවින් ඔවුන් හට පුද්ගල දුරස්ථභාවය, අවම සමාජ සංසරණය හා එදිනෙදා අනුගමනය කළ යුතු නිසි සෞඛ්‍ය පුරුදු පවත්වාගෙන යාමේ අපහසුවක් තිබේ. මේ තත්ත්ව යටතේ වසංගතය පිටුදැකිය හැකි එකම ක්‍රමවේදය එන්නත්කරණය සමග රෝගය වැළැක්වීමේ නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම බව පෙනේ.










## එන්නත ලබාගැනීමේ ඇති වැදගත්කම

covid-19 වෛරසය ඉතා ඉක්මනින් පැතිරෙන ව්‍යාධිජනක වෛරසයකි. covid-19 වෛරසය මගින් අධික ලෙස රෝගී වීම, රෝහල්ගත ප්‍රතිකාර අවශ්‍ය වීම, දිගුකාලීන සංකූලතා ඇතිවීම මගින් මරණයට පත්වීම පවා සිදුවිය හැකිය. ඔබ එන්නත ලබාගැනීම මගින් ඔබේ ආරක්ෂාවද, ඔබේ පවුල සහ ඔබ අවට සිටින අයගේ ආරක්ෂාවද වැඩි වීමේ හැකියාව වැඩි වේ. හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් සිටීම covid -19 වැලඳීමේ හා එය පැතිරවීමේ අවදානම අඩු නොකරයි. වෛරසය ආසාදනය වී ඇති අවස්ථාවක ඔබට ඉතා සුළු රෝග ලක්ෂණ හෝ කිසිදු රෝග ලක්ෂණයක් නොතිබුණත්, ඔබගේ ආදරණීයන්ව සහ ඔබ අවට සිටින අයව ආසාදනය කිරීමේ හැකියාවක් ඇත. එන්නත ලබාගැනීම මගින් අප හා සමාජය ආරක්ෂා වීමක් සිදුවන අතර, එය අප සතු සමාජ වගකීම ඉටුකිරීමක්ද වේ.

## ලංකාවේ ආරම්භක එන්නත?

Oxford AstraZeneca ආයතනය මගින් නිර්මාණය කර, සීරම් ඉන්ස්ටිටියුට්හි නිෂ්පාදනය කරන ලද Covishield එන්නත ශ්‍රී ලංකාවේ covid -19 රෝගය සඳහා භාවිත කරන ආරම්භක එන්නතයි. මෙම එන්නත අඩපණ කරන ලද ( එම්.එම්.ආර්, පැපොල වැනි) එන්නත් වර්ගවලට සමානය. මෙම එන්නතෙහි covid -19 ප්‍රතිදේහජනකයට සමාන ජානයක් ඇතුළත් කර ඇත. (SARS-Cov 2 නැතහොත් COVID 19හි ඇති spike ප්‍රෝටීනය) මෙම එන්නත ශරීරයේ ප්‍රතිශක්තීකරණ පද්ධතියේ ඇති වැදගත් සෛල දෙවර්ගයක් වන B සහ T සෛල සක්‍රිය කරන අතර, එමගින් ප්‍රබල ප්‍රතිශක්තීකරණයක් සහ මතකයක් ඇති කරයි.

## එන්නත් ක්‍රියාවලියට පෙර

එන්නත ලබාගැනීම සඳහා ලියාපදිංචි වීමේදී ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය, ඔබගේ දුරකථන අංකය, ඔබගේ වර්තමාන ලිපිනය සහ ඔබගේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශය යන තොරතුරු නිවැරදිව ලබාදිය යුතුය.

## එන්නතෙන් පසු


එන්නත 100% ඵලදායී නොවිය හැකි නමුත්, එය සැලකිය යුතු ආරක්ෂාවක් ලබාදෙයි. එන්නතෙහි පූර්ණ සඵලතාව ලබාගත හැක්කේ මාත්‍රාවන් දෙකම ලබාගැනීමෙන් පසුව පමණි. අදාළ එන්නත් මාත්‍රා දෙක සම්පූර්ණ කිරීමෙන් පසු ඇතිවන ප්‍රතිශක්තීකරණයෙන් ලැබෙන ආරක්ෂාව පවතින කාලය පිළිබඳව මෙතෙක් තහවුරු කර නොමැත. එන්නත ලබාගැනීමෙන් පසු වෛරසය ඔබගෙන් තවත් අයෙකුට බෝ නොවන බවට තවමත් නිශ්චිතව හඳුනාගෙන නැත.

## Covishield එන්නත ක්‍රියාත්මක වන ආකාරය

මෙම එන්නත වෛරස් දෛශික එන්නතක් වේ. එහි ඇති අඩපණ කරන ලද එනම් හානියක් නොවන ලෙස සකස් කරන ලද වෛරසයෙහි ප්‍රතිදේහජනයක් ලෙස ක්‍රියාකරන ජානය ඇතුළත්ව ඇත. එනම් covid -19 වෛරසයට ආවේණික වූ spike ප්‍රෝටීනයට හෝ එහි කොටසකට ප්‍රතිචාර දැක්වීමක් සිදු වේ. පුද්ගලයෙකුට එන්නත ලැබුණු විට ප්‍රතිශක්තීකරණ පද්ධතිය සහ එහි මතක සෛල ක්‍රියාකාරී වීම ආරම්භ වේ. එන්නත් ලබාගත් පුද්ගලයෙකුට පසුකාලීනව වෛරසය ආසාදනය වූ විට ප්‍රතිශක්තීකරණ පද්ධතිය ඒ වනවිටත් වෛරසය හඳුනාගෙන ඇති බැවින් වෛරසයට ඉක්මනින් පහර දීමට පටන් ගෙන එය විනාශ කරනු ලබයි.

## එන්නත ලබාදෙන්නේ කා හටද?

Covishield එන්නතෙහි සැපයුම ඉතා සීමිත බැවින් එය වැඩිපුරම අවශ්‍ය පුද්ගලයන්ට හෝ ප්‍රමුඛතා කණ්ඩායම්වලට පළමුව ලබාදෙයි. ඒ අනුව covid -19 වසංගතය මැඩලීමට ප්‍රමුඛව ක්‍රියාකරන සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලයට සහ අනෙකුත් පළමු පෙළ නිලධාරීන් වන ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සහ පොලිස් නිලධාරීන්ට මුල් අදියරයේදී ලබාදෙයි. එමෙන්ම වයස අවුරුදු 60ට හෝ ඊට වැඩි වැඩිහිටි පුද්ගලයන්ට සහ ඉහළ වයස් සීමාවන්ගේ සිට පහළ වයස් සීමාවන් දක්වා වන (වයස අවුරුදු 18ට වැඩි) පුද්ගලයන්ටද මෙම එන්නත ලබාදෙයි. මෙහිදී සුදුසුකම් ලත් ජනගහනයෙන් 80%ක් ආවරණය වනු ඇතැයි අපේක්ෂා කරයි. මෙහිදී එන්නත්කරණය සඳහා ප්‍රමුඛතාවය ලබාදීමේ නිර්ණායකයන් වන්නේ covid - 19 වෛරසයට නිරාවරණය වීමට බොහෝදුරට ඉඩ ඇති පුද්ගලයන් (දෛනික රාජකාරී තුළින් ඔවුන් රෝගී පුද්ගලයන් සමග කටයුතු කරන ආකාරය සහ covid-19 අර්බුදය කළමනාකරණය කිරීමේදී අත්‍යවශ්‍ය සේවාවන්හි යෙදෙන) සහ රෝගය වැලඳීමට හා එහි සංකූලතා ඇතිවීමේ වැඩි අවදානමක් ඇති අය වීමයි. සෞඛ්‍ය සේවා සහ ඉදිරිපෙළ සේවකයන්ට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කර ඇත්තේ ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරී ඉටුකිරීමේදී වෛරසයට නිරාවරණය වීමට ඇති ඉහළ අවදානම නිසාය. එමෙන්ම







අත්‍යවශ්‍ය සේවා සැපයීමේදී ඔවුන්ගේ කාර්යභාරය තීරණාත්මකය. එන්නත් ලබාදීමෙන් පළමු පෙළ සේවකයන්ගෙන් ප්‍රජාවට වෛරසය සම්ප්‍රේෂණය වීමේ අවදානම අවම කරගත හැකි අතර, සෞඛ්‍ය, නිරෝධායන සහ නීතිය හා සාමය පවත්වාගෙන යාමේ අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව සැපයිය හැකි වේ. අන් අය එන්නත ලබාගැනීමේදී ඔවුන්ටද ඉහළ පෙළ සේවකයන් උපදේශකයන් විය හැකි අතර, ප්‍රජාව සඳහා වටිනා හා විශ්වාසදායක තොරතුරු ප්‍රභවයන් වනු ඇත. එමෙන්ම විශ්වාසදායී ප්‍රජා සම්පත්දායකයන් ලෙස තමන්ගේම එන්නත් කිරීමේ අත්දැකීම් බෙදාහදා ගැනීමෙන් ඔවුන්ට සාමාන්‍ය ජනතාවට විශ්වාසයක් ලබාදිය හැක.

වයස අවුරුදු 50 සහ ඊට වැඩි පුද්ගලයන්ට මෙම වෛරසය වැලඳීමේ වැඩි අවදානමක් තිබෙන බව වෛසරය ආරම්භයේ සිටම ඔබ සියලුදෙනා දන්නා කරුණකි. පුද්ගලයෙකුගේ වයස වැඩිවීමත් සමගම වෛරසය බෝ වීමේ අවදානමද වැඩිවේ. එන්නත ලබාදෙන වැඩිහිටි කණ්ඩායමට නිධන්ගත රෝගාබාධ හෝ බෝ නොවන රෝග හෝ රෝග වැලඳීමට ඇති අවදානම් තත්ත්ව ඇති අතර, එය covid - 19 වෛරසයේ ආසාදන අවදානම, රෝහල්ගත කිරීම, සංකූලතා ඇති වී එමගින් මරණය සිදුවීම වැනි අවස්ථා වැඩි කරයි.

මෙම වයස් කණ්ඩායමේ පුද්ගලයන්ට ආසාදනය වුවහොත් රෝහල්ගත වී සිටිය යුතු කාලය දිගු නිසා සෞඛ්‍ය සේවා සම්පත් භාවිතයද දීර්ඝ කාලයකට අවශ්‍ය වේ.

## එන්නත්කරණයේ වැරදීම් හේතුවෙන් ඇති විය හැකි ප්‍රතික්‍රියා

ප්‍රතිනිර්මාණය (Reconstitution) කිරීමේ දෝෂ සිදුවීම (වැරදි තනුකකාරක යොදා ගැනීම, අත්වැරදීමකින් තනුකකාරකය වෙනුවට වෙනත් ඖෂධයක් ආදේශ කිරීම, එන්නත හා සිරින්ජය අපවිත්‍ර වීම, එන්නත් කටුව හෝ එහි වැස්ම අතින් හෝ වෙනත් වස්තුවකින් ස්පර්ශ කිරීම, උපරිම නිර්දේශිත කාලයෙන් පසු ප්‍රතිනිර්මාණය කරන ලද එන්නත් භාවිත කිරීම) මෙම වැරදි මගින් දරුණු ප්‍රතික්‍රියා ඇති කළ හැකි අතර, එමගින් බරපතළ අතුරු ආබාධ හෝ ඇතැම් විට මරණය පවා සිදුවිය හැකිය. එමෙන්ම මෙම වැරදි වළක්වාගත හැකි අතර, මේවා වැළැක්වීම තුළින් ප්‍රතිශක්තීකරණ වැඩසටහන පිළිබඳව ඇති විශ්වාසය තහවුරු කළ යුතුය.

## covid -19 එන්නත පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ පැවසීම

2020 දෙසැම්බර් මැද වනවිට covid -19 වෛරසයට එරෙහිව එන්නත් සායනික ඇගයීම් සඳහා යොමු වී තිබුණි. තවත් එන්නත් 166ක් පූර්ව රසායනික ඇගයීම් සඳහා යොමු වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් 2021.01.24 දින වනවිට Pfizer එන්නත සඳහා පමණක් හදිසි වලංගුතාවය (emergency validation) ලැබී ඇත. කෙසේ වෙතත් එක් එක් රටෙහි ජාතික ඖෂධ නියාමන අධිකාරියට තම රටෙහි ජාතික මට්ටමේ භාවිතය සඳහා එන්නත් අනුමත කළ හැකිය.

## එන්නත්කරණය සේම මතක තබාගත යුතු වැදගත් කරුණු

මුලදී ලබාගත හැකිවන්නේ එන්නතෙහි සීමිත ප්‍රමාණයක් පමණි. එහි සැපයුම වැඩි කිරීමට එන්නත් නිපදවන රටවලින් එන්නත් වර්ග කිහිපයක් ලබාගැනීමට අවශ්‍ය වේ. ඒ අනුව නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාවට එන්නත් කිහිපයක් ලැබීමේ හැකියාව ඇත. සීමිත එන්නත් සැපයුමක් තුළ covid -19 රෝගය සම්ප්‍රේෂණය වීම වැළැක්වීමට එන්නතටම පමණක් හැකිවන්නේ නැත. එන්නත ලබාගැනීම මගින් පමණක් කෙනෙකු ආසාදිතයකු වීම වළක්වා ගත නොහැකි අතර, පුද්ගල දුරස්ථභාවය, මුඛ ආවරණ පැලඳීම, දෑත් නිරන්තරයෙන් සේදීම, විෂබීජනාශක දියර භාවිතය ඇතුළු covid -19ට එරෙහි සෞඛ්‍ය උපදෙස් සියල්ල නිරන්තරයෙන් පිළිපැදිය යුතුය. එමෙන්ම මෙම එන්නතෙහි ආරක්ෂණ කාලසීමාව තවමත් ඇත්තේ අවිනිශ්චිත තත්ත්වයක බැවින්ද සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍යය.

## “එන්නත ලබාගත් පසු කාඩ්පතෙහි නිවැරදිව දිනය සටහන් වී ඇත්දැයි බලන්න”



Covishield එන්නතෙන් ඇති විය හැකි සංකූලතා පිළිබඳව පැවසූ **සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රජා වෛද්‍ය විශේෂඥ උත්පලා අමරසිංහ මහත්මිය,**

“ ඕනෑම ඖෂධයක් හෝ එන්නතක් ලබාගැනීමෙන් අනතුරුව අතුරු ආබාධ ඇතිවෙන්න පුළුවන්. මේවා බොහෝවිට තාවකාලික ආබාධයි. සාමාන්‍යයෙන් මෙම එන්නත විද පැය කිහිපයකට පසුව බහුලව ඇතිවන අපහසුතා කිහිපයක් තිබෙනවා.

- **එන්නත විදින ස්ථානයේ රතු පැහැ වීම, කැසීම, සුළු ඉදිමීම් හා වේදනාවක්.**
- **ඇඟ සීතල කරවමින් ඇතිවන උණ ගතිය. මෙහිදී වෙව්ලීමක් වුවද ඇතිවිය හැකියි.**
- **හිසරදය.**
- **ඔක්කාරය, වමනය හා බඩ පෙරළීම**
- **මාංසපේශී සහ සන්ධිවල වේදනාව (ඇඟපත වේදනාව)**


මෙම අතුරු ආබාධ ඇති වුවහොත් ඒ සඳහා පැරසිටමෝල් නියමිත මාත්‍රාවෙන් (පැය හයෙන් හයට) ලබාගන්න. සාමාන්‍යයෙන් මෙම ලක්ෂණ එන්නත විදීමෙන් දින කිහිපයකට පසුව පහව යනු ඇති. යම් හෙයකින් මෙම සංකූලතා වැඩි වුවහොත් හෝ දිගටම පැවතුණහොත් වෛද්‍ය අවවාද ලබාගන්න. එසේ නැතිනම් 1999, වසංගතවේද අංශය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ ප්‍රදේශයේ වෛද්‍යවරයෙකුගෙන් උපදෙස් ලබාගන්න පුළුවන්.

තමන්ට වෙනත් රෝගී තත්ත්වයන් තිබෙනවා නම් ඒ පිළිබඳව වෛද්‍ය උපදෙස් ලබාදීම සඳහා එන්නත්කරණ ස්ථානවල වෛද්‍යවරු ඉන්නවා. පුද්ගලයෙකුට එවැනි ආකාරයේ වෙනත් රෝග තිබෙනවා නම් ඔහු පිළිබඳ තීරණය ඒ අදාළ වෛද්‍යවරු ගන්නවා. ඒ නිසා එවැනි රෝග පිළිබඳව අනිවාර්යෙන්ම ඔවුන් වෛද්‍යවරුන් දැනුම්වත් කළ යුතුයි. එහිදී අවශ්‍ය පර්යේෂණ කිරීමෙන් අනතුරුවයි විශේෂිත රෝගාබාධ තිබෙන කෙනෙකුට එන්නත ලබාදෙන්නේ.

පළමු මාත්‍රාව ලබා දී හරියටම මාසයකින් තමයි දෙවැනි මාත්‍රාව ලබාදෙන්නේ. පළවෙනි මාත්‍රාව එන්නත් කිරීමේදී අදාළ තැනැත්තාට එන්නත් කාඩ්පතක් නිකුත් කරනවා. එම එන්නත් කාඩ්පතෙහි නිවැරදිව දිනය සටහන් වී තිබෙනවාද කියලා පරීක්ෂා කළ යුතුයි. නැවත දෙවැනි මාත්‍රාව ලබාගැනීමට පැමිණෙන විට එම එන්නත් කාඩ්පත රැගෙන ඒම අනිවාර්යයි. මාසයක් යන විට තවත් එන්නත් වර්ග කිහිපයක් අපට ලැබෙනවානේ. එතකොට පළමු මාත්‍රාවේදී ලබාගත් එන්නතම දෙවැනි මාත්‍රාවේදීත් ලබාගත යුතුයි. දෙවැනි මාත්‍රාවේදීද යම් යම් සංකූලතා හෝ අතුරු ආබාධ යම් පමණකින් ඇතිවෙන්න පුළුවන්.

අවුරුදු 18ට අඩු දරුවන්ට සහ ගර්භිණී මවුවරුන්ට එන්නත ලබාදීමට තවම නිර්දේශ කරලා නැහැ. ඔවුන් සඳහා එන්නත ලබාදීමට අවශ්‍ය පර්යේෂණවලට මෙම එන්නත තවම යොදාගෙන නැහැ. එම නිසා මේ අවස්ථාවේදී ඔවුන්ට එන්නත ලැබෙන්නේ නැහැ. නමුත් එයින් අදහස් කරන්නේ ඒ අයට මේ එන්නත සුදුසු නැහැ කියන එක නොවෙයි.”

## “එන්නත ලබාගත් ඇතැම් පුද්ගලයන්ට රෝගය වැලඳීමේ අවදානමක් ඇත”




ලෝක සෞඛ්‍ය සංවිධානයද ජනතාවට නැගෙන ප්‍රධාන ගැටලු කිහිපයක් වෙනුවෙන් පිළිතුරු මෙලෙස ඉදිරිපත් කර ඇත.

### කෝවිඩ් 19 එන්නත ලබාගත් පුද්ගලයෙකුට කෝවිඩ් 19 වෛරසය ආසාදනය විය හැකිද?

එන්නත ලබාදීමෙන් පසු ශරීරයට ප්‍රතිශක්තිය (කෝවිඩ් 19 රෝගයට හේතු වන වෛරසයෙන් ආරක්ෂා වීම) ගොඩනැගීමට සාමාන්‍යයෙන් සති කිහිපයක් ගත වේ. ඒ කියන්නේ පුද්ගලයෙකුට එන්නත ලැබීමට පෙර හෝ පසුව කෝවිඩ් -19 ඇති කරන වෛරසය ආසාදනය වී රෝගාතුර විය හැකි බවයි. මෙයට හේතුව එන්නත සඳහා ආරක්ෂාව සැපයීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම මිස එන්නත අකාර්යක්ෂම වීම නිසා නොවේ. තවද කිසිදු එන්නතකට 100%ක කාර්යක්ෂමතාවයක් නොමැති හෙයින් කෝවිඩ් 19 එන්නත් ලබාගන්නා සමහර පුද්ගලයන්ට රෝගයට එරෙහිව ප්‍රමාණවත් ප්‍රතිශක්තියක් වර්ධනය නොවිය හැකි අතර, එම නිසා රෝගය වැලඳීමේ අවදානමක් පවතී.

### යම් පුද්ගලයෙකුට කෝවිඩ් 19 වෛරසය වැලඳී සුවය ලබා ඇත්නම්, ඔවුන්ට කෝවිඩ් 19 එන්නත ලබාගත හැකිද?

කෝවිඩ් 19 හා සම්බන්ධ දරුණු සෞඛ්‍ය අවදානම් සහ කෝවිඩ් 19 සමග නැවත ප්‍රතිනිර්මාණය කළ හැකි නිසා, කෝවිඩ් 19 දැනටමත් තිබේද යන්න නොසලකා සියලුම පුද්ගලයන්ට එන්නත් ලබාදිය යුතුය. එන්නත පිළිබඳ තීරණ ගැනීමේ අරමුණින් පූර්ව ආසාදනය සඳහා වෛරස් හෝ Serological පරීක්ෂණ නිර්දේශ නොකරයි. ස්වාභාවික ප්‍රතිශක්තිය ලෙස හැඳින්වෙන ආසාදනයකින් යමෙකු ලබාගන්නා ප්‍රතිශක්තිය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. ස්වාභාවික ප්‍රතිශක්තිය සහ එන්නත මගින් ඇතිකරන ප්‍රතිශක්තිය යන දෙකම කෝවිඩ් 19හි වැදගත් අංගයන් වන අතර, විශේෂඥයන් වැඩි විස්තර දැන ගැනීමට විවිධ පරීක්ෂණ හරහා උත්සාහ කරයි. මෙම අවස්ථාවේදී ඔබට කෝවිඩ් 19 තිබුණත්, නැතත් ආසාදන වැළැක්විය හැකි හොඳම ක්‍රමය වන්නේ පොදු ස්ථානවලදී මුව ආවරණ පැලඳීම, අනෙක් පුද්ගලයන්ගෙන් අවම වශයෙන් අඩි හයක් ඈතින් සිටීම, අවම වශයෙන් තත්ත්පර 20ක්වත් සබන් හා වතුරෙන් අත් සේදීම සහ සෙනග සිටින ස්ථාන සහ සීමිත අවකාශයන්ට යාමෙන් වළකින්න.

### එක් එන්නතක් වෙනත් එන්නතක් සමග හුවමාරු කර එන්නත් කර ගත හැකිද?

කෝවිඩ් 19 එන්නත් මාත්‍රා දෙකක් විද ගැනීමට සිදුවන අතර, පළමු මාත්‍රාව ගත් කාණ්ඩයෙන් තොරව වෙනත් එන්නතක් සමග හුවමාරු කර ගැනීමෙන් ඇතිවන ප්‍රතිඵල පිළිබඳ හෝ හැකියාව පිළිබඳ දත්ත මේ වනතුරු නොමැත. එකම නිෂ්පාදිතයක මාත්‍රාවන් දෙකක් භාවිත කරන ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය දැනට නිර්දේශ කරයි. විවිධ කෝවිඩ් 19 එන්නත් නිෂ්පාදන නොදැනුවත්වම මාත්‍රා දෙකෙන් විදගෙන ඇති විටෙක එන්නතෙහි අතිරේක මාත්‍රාවක් නිර්දේශ නොකරයි. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ ඉදිරිපත් කරන විට ඉදිරියේදී යාවත්කාලීන කළ හැකිය.

### කෝවිඩ් 19 එන්නත් මගින් දිගුකාලීන ප්‍රතිශක්තියක් ලබාදෙයිද?

මෙම එන්නත් නව එන්නතක් වන බැවින් ඒවා කෝවිඩ් 19ට එරෙහිව අඛණ්ඩව හා දීර්ඝකාලීන ප්‍රතිශක්තියක් ලබාදෙයි දැයි අපි තවමත් නොදනිමු.

### එන්නත මගින් පුද්ගලයෙකුට කෝවිඩ් 19 වෛරසය ආසාදනය විය හැකිද?

බලයලත් සහ නිර්දේශිත කෝවිඩ් 19 එන්නත් හෝ දැනට සංවර්ධනය වෙමින් පවතින කෝවිඩ් 19 එන්නත් කිසිවක කෝවිඩ් 19 වෛරසයට හේතු වන සජීවී වෛරසය අඩංගු නොවේ. මෙයින් අදහස් කරන්නේ කෝවිඩ් 19 එන්නත මගින් රෝගය ඇති විය නොහැකි බවයි. කෝවිඩ් 19ට හේතු වන වෛරසය හඳුනාගෙන සටන් කළ යුතු ආකාරය සියලුම එන්නත් මගින් අපගේ ප්‍රතිශක්තීකරණ පද්ධතියට උගන්වයි. සමහර විට මෙම ක්‍රියාවලිය නිසා උණ වැනි රෝග ලක්ෂණ ඇති කරයි. මෙම රෝග ලක්ෂණ සාමාන්‍ය වන අතර, ඉන් ඔබේ ශරීරය කෝවිඩ් 19ට හේතු වන වෛරසයෙන් ආරක්ෂා වන බවට ලකුණක් පෙන්නුම් කරයි.

### තුන්වන අදියර අත්හදා බැලීම් සම්පූර්ණ කර ඇති කෝවිඩ් 19 එන්නත් කීයක් තිබේද? ඒවා මොනවාද?

තුන්වන අදියර අත්හදා බැලීම් අවසන් කර ඇති කෝවිඩ් 19 එන්නත් හයක් මේ වන විට පවතියි. ඒවා නම් ෆයිසර් බයෝඑන්ටෙක්, මෝඩර්නා, ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනෙකා, ස්පුට්නික් V, සිනොෆාර්ම් සහ සිනොවැක්ය. මෙම නිෂ්පාදන හයේ කාර්යක්ෂමතා ප්‍රතිඵල ලෝක සෞඛ්‍ය සංවිධානයට ලැබී තිබේ. කෙසේ වෙතත්, සම-සමාලෝචනය කළ කාර්යක්ෂමතා ප්‍රතිඵල ලැබී ඇත්තේ එන්නත් ද්විත්වයක පමණි. ඒ ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනෙකා සහ ෆයිසර් බයෝඑන්ටෙක් යන එන්නත්ය.

# නැගෙනහිර පර්යන්තයෙන් 51%ක් වරාය අධිකාරියට අයිති වෙනවා කියලා ආණ්ඩුව කියන්නෙ බොරුවක්

## - නැගෙනහිර පර්යන්තය සුරැකීමේ එකමුතුවේ සමකැඳවුම්කරු සංජය කුමාර වැලිගම

● චාමර සම්පත්

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් කතාබහ මේ වන විට උග්‍ර මට්ටමකට පැමිණ ඇති අතර, මේ සම්බන්ධයෙන් අද (01දා) කැබිනට් පත්‍රිකාවක්ද ඉදිරිපත් වීමට නියමිතය. මේ අතර නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට ලබාදීමට විරුද්ධව වරාය සේවකයන් අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලියක්ද ආරම්භකර ඇත. මතුව ඇති තත්ත්වය සම්බන්ධයෙන් නැගෙනහිර පර්යන්තය සුරැකීමේ එකමුතුවේ සමකැඳවුම්කරු සංජය කුමාර වැලිගම මහතා සමග අපි සාකච්ඡා කළෙමු.

**රජය පවසන ආකාරයට කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ ආයෝජනයට ඔබලා විරුද්ධ වන හේතුව කුමක්ද?**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර පර්යන්තය සියයට සියයක් මෙහෙයවිය යුතුයි කියන යෝජනාවලිය කැබිනට් අනුකාරක සභාව වෙත අපි භාරදී තිබෙනවා. මේ අවස්ථාව වන විට නැගෙනහිර පර්යන්තය 51%ක් සහ 49%ක් ලෙස ආයෝජය කිරීමක් යැයි පවසමින් රජය මුසාවක් පවසන බව පැහැදිලියි. ඒ නිසා තමයි අපි පසුගිය සතියේ සිට අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළේ.

ආණ්ඩුව පවසන ආකාරයට නැගෙනහිර පර්යන්තයේ 51%ක් සහ 49%ක් ලෙස ආයෝජනය කරනවා කියන යෝජනාව අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. මොකද අපි සොයාගත් කරුණු අනුව එහෙම දෙයක් නැහැ. මෙම ආයෝජනය නිසා ශ්‍රී ලංකාවට ලැබෙන්නේ 15%යි කියලා තිබෙනවා. ඉතිරිය කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන්න ආණ්ඩුව සූදානම් වෙනවා. මේ ක්‍රියාවලියට අපි විරුද්ධයි.

අපේ වැඩපිළිවෙළට සහයෝගය දෙන්න සිවිල් සංවිධාන, වෘත්තීය සමිති, පූජ්‍ය පක්ෂය, කැබිනට් ඇමතිවරු පවා ඉදිරිපත්වෙලා ඉන්නවා. මේ නිසා අපි රජයට බලකරනවා රට පුරා විරෝධයක් නැගෙන්නට පෙර මේ යෝජනාව වහාම ඉවත් කරගන්න කියලා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 100%ම මෙහෙයවන අපගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා අපි කියන්න කැමතියි. අපේ රටේ සම්පත් පාවා දෙන්න අවශ්‍ය නැහැ .

ශ්‍රී ලංකා වාරාය අධිකාරිය රැකගැනීමට අපි දිවි හිමියෙන් කටයුතු කරනවා. නැගෙනහිර පර්යන්තයේ ආයෝජන මුවාවෙන් කරන හොර ජාවාරම, රටේ ජාතික සම්පත් කුණුකොල්ලයට පවා දීම වහාම නවත්වන්න කියල අපි ආණ්ඩුවට කියනවා.

නැගෙනහිර පර්යන්තය ඉන්දීය සමාගමකට දීලා ඉන්දියාව සතුටු කරන ගමන්, වරාය අධිකාරියේ දූෂිත නිලධාරීන් සහ ජනාධිපතිතුමා වටේ ඉන්න දූෂිත නිලධාරීන් කිහිපදෙනෙක් ඩීල් දාන බව පැහැදිලියි. ඒ නිසා තමයි 51%ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමිවෙන්නේ නැත්තෙ.

**නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකාවට හිමි වීමේ වාසිය ගැන කතා කළොත්?**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මේ පර්යන්තයේ මෙහෙයුම් කළ යුතුයි කියලා අපි මෙතරම්ම කියන්නේ ඇයි කියලා හැමෝම දැනගත යුතුයි. ඒ මොකද ඉන්දියානු මහද්වීපය තුළ ඇති විශාලතම සහ කාර්යක්ෂම වරාය බවට කොළඹ වරාය මේ වෙද්දි පත්වෙලා තිබෙනවා. එය ජාතික ආර්ථිකයට වගේම ජාතික ආරක්ෂාවට වැදගත් වෙන තැනක්. කලාපයේ භූගෝලීය පිහිටීම තුළ උනත් කොළඹ වරාය අතිසුවිශේෂී තැනක පිහිටලා තිබෙනවා. කොළඹ වරාය කියන මේ ඩොලර් උල්පත අපි ආරක්ෂා කරගත යුතුයි කියන්නේ ඒ හේතුව නිසයි.

එස්ඒජීටී(SAGT) සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග එකතුවෙලා ඇතිකරගත්තු ගිවිසුම 2029දී අහෝසි වෙනවා. එමගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එස්ඒජීටී(SAGT) ජැටිය හිමිවෙනවා. ලෝකයේ දැනට තිබෙන කාර්යක්ෂම වරායවල් අතරින් සියලුම මෙහෙයුම් සිදුවන වරායන් තුනක් පමණයි තිබෙන්නේ. එස්ඒජීටී(SAGT) ජැටිය වරාය අධිකාරියට හිමිවීමත් සමගම කාර්යක්ෂම ජැටියක් ලෙස මේ දෙකේම මෙහෙයුම් කරන්න අපිට පුළුවන් වෙනවා. ඒ වගේම මීටර් 18ක් ගැඹුරු පර්යන්තයක් ඉන්දියාවෙ වත් නැහැ. ඒ අනුව විශාල ප්‍රමාණයේ නැව් 06ක් සහ සාමාන්‍ය නැව් 04ක මෙහෙයුම් එකවිට කරන්න පුළුවන්. අන්තර් බහාලුම් ප්‍රවාහනය තුළ සිදුවන අමතර වියදම් අවම කර ගනිමින් අපේ කාර්යක්ෂමතාව වැඩිකරලා සමාගම්වලට ලාබදායී තත්ත්වයට ලබාදෙන්න පුළුවන් වෙනවා.



ඒ අනුව නැව් සමාගම් විශාල වශයෙන් කොළඹ වරායට ඇද ගැනීමට අවස්ථාව අපිට හිමිවෙනවා. නැගෙනහිර පර්යන්තය සියයට සීයක් වරාය අධිකරිය යටතේ තිබිය යුතුයි කියලා අපි කියන්නේ ඒ නිසයි.

ඒ වගේම තවත් හේතුවක් තිබෙනවා. ඒ තමයි ජයබහලු පර්යන්තයේ පස්වන අදියර කියලා හදපු නැති පර්යන්තයකට ගෙන ආපු දොඹකර තුනක් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකින් නැගෙනහිර පර්යන්තයේ ස්ථාපිත කරන්න අපිට අවස්ථාව ලැබුණා. ඊට පසුවත් මෙය ක්‍රියාත්මක නොකරන තැනකට නිලධාරීන් සහ ආණ්ඩුවේ බලධාරීන් ක්‍රියා කළා. අපි නැවත වතාවක් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් පටන් අරගෙන අගමැතිතුමා සමග සිදුකළ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ දොඹකර තුන යොදවලා නැගෙනහිර ජැටියේ මෙහෙයුම් ආරම්භ කරන්න පුළුවන් වුණේ. මේ නිසා 2020.10.27දා මෙහෙයුම් ආරම්භ කරපු නැගෙනහිර පර්යන්තයත් අද වන විට කෝටි 60කට වැඩි මුදලක් උපයලා තිබෙනවා. ඒ කියන්නේ මාස දෙකකට ආසන්න කාලය තුළ එපමණ මුදලක් උපයාගන්න අපිට හැකියාව ලැබුණා.

**නැව් ගෙන්වා ගැනීමේ මෙහෙයුමත් දුෂ්කර වූ බව වරෙක ඔබ පවසා තිබුණා?**

මේ මෙහෙයුම්වලදී නැව් ගෙන්වා ගන්නත් වෘත්තීය සමිති විදිහට අපිට ලොකු සටනක් කරන්න සිදුවුණා. මොකද මේ මෙහෙයුම් අලාභයි කියලා මේ නිලධාරීන් සෑම අවස්ථාවකදීම පෙන්නන්න හදනවා. ඒ නිසා බලහත්කාරයෙන් අපේ දැඩි බලපෑම මත නැව් නැගෙනහිර පර්යන්තයට යොමුකරලා තමයි මේ ලාභය ලබාගෙන තිබෙන්නේ. ඒ වගේම නැගෙනහිර පර්යන්තයේ දොඹකර හතරක් සහ ජංගම දොඹකර කිහිපයක් මිලදී ගන්න 2020/2021 කාලය සඳහා රුපියල් මිලියන 13728ක් වෙන්කර තිබෙනවා. මේ ඇණවුම සිදුකළා නම් මාස 12කට අඩු කාලයකදී මේ දොඹකර වරාය අධිකාරියට ලැබෙනවා. ඒ විදිහට දොඹකර ක්‍රියාත්මක කළොත් මෙගා ප්‍රමාණයේ නැවක් සහ ප්‍රීඩම් ප්‍රමාණයේ නැවකුත් එකවිට මෙහෙයවන්න අපිට හැකියාව ලැබෙනවා. ඒ කියන්නේ වසකරට ඩොලර් බිලියන 50ක් උපයන්න අපිට හැකියාව ලැබෙනවා. දොඹකර සියල්ල ස්ථාපිත කළ පසුව වාර්ෂික ඩොලර් බිලියන 100ට වැඩි මුදලක් උපයන්න පුළුවන් එකම සහ කාර්යක්ෂම පර්යන්තය බවට නැගෙනහිර පර්යන්තය පත්කරන්න අපිට පුළුවන්. අපි මෙච්චර කෑ ගහල කියන්නේ මේ වටිනාකම ගැනයි.

**ආයෝජනය සිදුකිරීමට යන අදානි සමාගම ගැනත් ඉන්දියාවේ මෙන්ම ලංකාවෙත් ප්‍රශ්න මතුවී තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?**

නැගෙනහිර ජැටිය සම්බන්ධ කැබිනට් පත්‍රිකාවට ජාත්‍යන්තර ටෙන්ඩර් පටිපාටියෙන් බැහැර ගිහින් අදානි කියන නාමය ඇතුළත් වුණේ කොහොමද කියන එක ගැන විශාල ගැටලුවක් තිබෙනවා. මේ තුළ දූෂණයක් සිදුවෙලා තියෙනවා කියලා අපි කියන්නේ ඒ නිසයි. මොකද කොළඹ වරායේ සී.අයි.සී.ටී (CICT) පර්යන්තය හදන්න ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීමක් කළ විට ඒ සඳහා ආයතන 07ක් ඉල්ලුම් කළා. එතැනදී ඩුබායි රාජ්‍යයෙන් සහ සිංගප්පූරු රාජ්‍යයෙනුත් ඉල්ලීම් කර තිබුණා. එවකට ජනාධිපති වුණේ මහින්ද රාජපක්ෂ මහත්තයා. මේ ටෙන්ඩර් කැඳවීමේදී ප්‍රතිනැවීගත කිරීම් ක්‍රියාවලියේදී කොළඹ වරායට තරගයක් දෙන රටක් එකතු කරගන්නේ නැහැ කියන දේ ගැන ඔහු පැහැදිලි එකඟතාවකට ආවා. ඒ අනුව තමයි චීන සමාගමක් වන සී.අයි.සී.ටී (CICT)ට ලබාදුන්නේ. එහෙම නැතිව සිංගප්පූරු රාජ්‍යයට ඉල්ලුම් කරන්න දුන්නා නම් මේ වනවිට ශ්‍රී ලංකාවේ බහාලුම් ක්‍රියාවලිය 20%ක් දක්වා අඩුවෙන්න තිබුණා. නාවික මෙහෙයුම් ක්ෂේත්‍රය තුළදී තරගකාරී ආයතන සමග ගැටෙන්න යන්නේ නැහැ. අදානි සමූහ ව්‍යාපාරය ඉන්දියාව තුළ වරායන් 11ක් මෙහෙයවනවා. ඉන්දියාවට අයිති එකම වරායත් ඔවුන්ට ලබාදෙන්න කියලා ඉන්දීය ආණ්ඩුවට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වගේම අදානි සමාගමට ඉන්දියාවේ විශාල විරෝධයක් තිබෙනවා. අදානි සමාගම නිසා ඉන්දියාවේ රජයේ වරාය වන ජවහල්ලාර්නේරු වරාය පාඩු ලබන තත්ත්වයට පත්කරන්න ඉන්දියාවේ අගමැතිවරයා කටයුතු කර තිබෙනවා. ඉන්දීය රටේ සම්පත් අදානි සමාගමට පැවරීමට එරෙහිව එරට වැසියෝ කරන අරගලය නිසා මේ වන විට ජීවිත 150ක් පමණ අහිමි වෙලා තිබෙනවා. මෙහෙම තියෙද්දි ඉන්දියාවේ කොලනියක් නැගෙනහිර පර්යන්තයේ හදන්න යනවාද කියන බරපතළ ගැටලුව අපිට තිබෙනවා. රෝහිත අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබෙන කැබිනට් පත්‍රිකාවේ අදානි සමාගමේ නම සම්බන්ධයෙන් අපිට ගැටලුවක් ඇතිවී තිබෙන්නෙත් ඒ නිසයි. ඒ වගේම එම කැබිනට් පත්‍රිකාවේ අදානි සමාගම ගැන පිටු දෙකක විස්තරයක් තිබෙනවා. නමුත් කොළඹ වරාය ගැන තිබෙන්නේ වචන කිහිපයක විස්තරයක් පමණයි. ජාත්‍යන්තර ටෙන්ඩර් කොන්දේසිවලට පටහැණිව සමාගමක් ඉදිරිපත් කිරීම වගේම ජපානයේ ක්‍රියාවලිය මේ තුළ සඟවා තැබීම බරපතළ කරුණක්. රටේ ජාතික සම්පත් විනාශ කරන මෙම අදානි සමාගම අපිට ලොකු හිසරදයක් වෙයි කියලා අපි හිතනවා. එහෙම තත්ත්වයක් තියෙද්දි රටේ සම්පත්, සේවක අයිතිවාසිකම් රකින්න ආපු ගෝඨාභය මහත්තයත් ඒකමද කරන්නේ කියලා අපිට බරපතළ ගැටලුවක් තිබෙනවා. මේ ප්‍රශ්නය අපි අගමැතිවරයාට යොමුකර තිබෙනවා. එතුමාගේ මැදිහත්වීම මතයි මේ ප්‍රශ්නය තාවකාලිකව විසඳලා තිබුණේ. අගමැතිතුමා ගැන අපිට විශ්වාසයක් තිබෙනවා. මහින්ද රාජපක්ෂ කියන ජාතික නායකයාගේ ආරක්ෂාව තුළ නැගෙනහිර පර්යන්තය රැකගත යුතුයි. මොකද එතුමා තමයි මේ පර්යන්තය ගොඩනැගුවේ. ඒ නිසා මහින්ද රාජපක්ෂ අගමැතිවරයා නැගෙනහිර පර්යන්තය සියයට සීයක් අපිට ආරක්ෂා කරලා දෙයි කියලා අපි විශ්වාස කරනවා.

**කවුරු කෑ ගැහුවත් ආණ්ඩුව ගත් තීරණය ක්‍රියාත්මක කරන බව ඇතැම් ඇමතිවරු මේ වනවිට පවසනවා . ඔබලාගේ ඉදිරි ක්‍රියාමාර්ග කෙසේ වේවිද?**

හැටනව ලක්ෂයකගේ ඡන්ද අරගෙන බලයට පැමිණිලා ඉන්න සමහර දේශපාලුවෝ අදහස් දක්නවා 'කවුරු විරුද්ධ උනත් මේක දෙනවා' කියලා. එහෙම කතා කරන්න එයාලට සදාචාරත්මක අයිතියක් නැහැ. රටේ ජනතාවගේ අයිතීන් ඇමතිවරුන්ගේ ප්‍රකාශ මත විකුණන්න දෙන්න බැහැ. මේ ජාතික සම්පත රැකගන්න වරාය සේවකයෝ දිවිහිමියෙන් කැපවෙලා ඉන්නේ. ඔය කෑගහන ඇමතිවරු මට්ටු වෙන්නේ මේ නැගෙනහිර පර්යන්තයෙන් තමයි. තමන් කවුද කියලා දන්නෙ නැති ඇමතිවරුන් ගැන ජනතාව තීන්දුවක් ගනියි. රටේ සම්පත් ආරක්ෂා කරගෙන රට සංවර්ධනය කරනවාද නැත්නම් මේ කියන විදිහට කටයුතු කරනවාද කියන තීරණය ඉක්මනින්ම ගැනීම ජනාධිපතිතුමාට පැවරෙන වගකීමක්.

අද පැවැත්වෙන කැබනට් මණ්ඩලයට නැගෙනහිර ජැටිය ගැන කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න කටයුතු කරනවා කියලා අපිට දැනගන්න ලැබුණා. රටට ආදරය කරන කැබිනට් ඇමතිවරු ඒකට විරුද්ධ වෙනවා කියලා අපිට පොරොන්දුවෙලා තිබෙන්නේ. ඒ නිසා රටේ අගමැතිවරයා ගැන අපිට ලොකු විශ්වාසයක් තිබෙනවා. එතුමත් අපිට බොරු කළොත් අපේ මළසිරුරු මතින් තමයි මේ හොර මගඩි ගනුදෙනුව සිදුකරන්න වෙන්නේ. නැගෙනහිර පර්යන්තය රැකගන්න අපි දිවිහිමියෙන් කැපවෙලා ඉන්නේ. නැගෙනහිර පර්යන්තය කියන්නේ වරාය අධිකාරියේ අවසාන හුස්ම පොද. අපි එකා පිට එකා මැරිල වැටුණත් මේ පර්යන්තය දෙන්නෙ නැහැ. ඒ සඳහා රටේ ජනතාව සියලුදෙනා අපි සමග එකතුවෙලා ඉන්නේ.

# ජනවාරි උද්ධමනය 3%ක් දක්වා පහළට



## - පෞද්ගලික රෝහල් ගාස්තු ඉහළ යෑමක්

● ෂමිල පෙරේරා

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති 4.2% සිට 2021 ජනවාරි මාසයේදී 3.0% දක්වා පහළ ගොස් තිබේ.

2020 ජනවාරි මාසයේ පැවති ඉහළ පදනම් අගය මගින් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා හේතු වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි. මේ අතර ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති 9.2% සිට 2021 ජනවාරි මාසයේදී 6.8%ක් දක්වා පහළ ගොස් ඇත. එමෙන්ම ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති 2.0% සිට 2021 ජනවාරි මාසයේදී 1.4%ක් දක්වා පහළ ගොස් තිබේ.

2021 ජනවාරි මාසයේදී ආහාර කාණ්ඩයෙහි රතු ළූණු, පොල් සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ ගියද, මාසය තුළ ලොකු ළූණු මිල ගණන්හි පහළ යෑමක් වාර්තා විය. මේ අතර ප්‍රධාන වශයෙන් සෞඛ්‍යය (පෞදග්ලික රෝහල් ගාස්තු) උපකාණ්ඩයේ දක්නට ලැබුණු මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ඉහළ යෑමක් 2021 ජනවාරි මාසයේදී දක්නට ලැබුණු බව ශ්‍රී ලංකා මහ බැංකුව වැඩිදුරටත් පවසයි.

# කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරමු, මේ මඟපෙන්වීම ඔබ සඳහායි

● ෂමිල පෙරේරා

කොළඹ කොටස් වෙළෙඳ පොළ ආයෝජකයන් වෙත හඳුන්වාදුන් නව පහසුකම් කිහිපයක් සම්බන්ධ තොරතුරු පසුගිය සති කිහිපයේ කතාබහ කළ අපි, එම නව පහසුකම් භුක්ති විඳින ආයෝජකයකු අත්හළ යුතු තවත් කරුණක් 'අද ව්‍යාපාරික පිටුව' ඔස්සේ මෙසේ ඔබ හමුවෙහි තබමු.

ඔබ නිසි පරිදි තේරුම් නොගත් සමාගම්වල කොටස් මිලදී ගැනීමට උත්සාහ නොකළ යුතුයි

බොහෝ ආයෝජකයන් පොදුවේ කරන තවත් වැරැද්දක් වන්නේ තමාට එතරම් දැනුමක් නොමැති අවබෝධයක් නොමැති




සමාගම්වල කොටස් ආයෝජනය කිරීමට උත්සාහ කිරීමය. උදාහරණයක් ලෙස ඔබ අවන්හලක් පවත්වාගෙන යන්නෙක් නම් එම ව්‍යාපාරය පිළිබඳව මනා වූ දැනුමක් තිබිය යුතුය.

කොටස් වෙළෙඳ පොළ ආයෝජනය සම්බන්ධයෙන් සලකා බලන විට, සමහර ආයෝජකයන්ට ආයෝජන වටපිටාව ගැන දැනුම ඇත්තේම නැත. ඔවුන් සිතනුයේ වාසි සහ ප්‍රතිලාභ ගෙනදෙන කොටස් ගැන පමණි. සමාගම අයත් වන්නේ කුමන ව්‍යාපාර ක්ෂේත්‍රයකටද, නිෂ්පාදනය කරනුයේ කුමන වර්ගයේ භාණ්ඩ හා සේවාද යන්න ගැන ඔවුන් සොයා බැලීමක් නොකරයි. එමෙන්ම වෙළෙඳ පොළ හැසිරීම පිළිබඳ අවබෝධයක් තිබීමද වැදගත්ය. එනම් ක්‍රමයෙන් ඉහළ යන වෙළෙඳ පොළක්ද, මන්දගාමී වෙළෙඳ පොළක්ද, පහළ බසින වෙළෙඳ පොළක්ද යනාදී වශයෙන් වෙළෙඳ පොළ ගමන් කරන දිශාව පිළිබඳ යම් හෝ අවබෝධයක් ඇතිව කොටස් ගනුදෙනුවල නිරතවීම ආයෝජකයෙකු වශයෙන් ඉතා වැදගත්ය.

කොටස් වෙළෙඳ පොළ ආයෝජනයේදී ආයෝජකයකුට ඕනෑම අවස්ථාවක ඉහළ වාසි ලබාගැනීමට අවස්ථාව ඇත. එම වාසි ලබාගැනීමට එම ආයෝජනයේ ස්වභාවය හොඳින් තේරුම්ගෙන තිබීම වැදගත්ය. ඔබ නීතීඥයෙකු නම් ඉන් ඉහළ ආදායමක් උපයා ගැනීමට එම වෘත්තීය පිළිබඳව හොඳින් අධ්‍යයනය කර තිබිය යුතුවේ. ඔබ ශල්‍ය වෛද්‍යවරයෙකු නම් ශල්‍යකර්මය මුල සිට අවසානය දක්වා නිසියාකාරව සිදුකර එහි සාර්ථකත්වයක් ලබාගත යුතුය. ආයෝජනයටද එය එසේමය. සාර්ථක ආයෝජකයෙකු වීමට ඔබ මුදල් යොමුකරන ආයෝජන ක්‍රමය ගැන හොඳ අවබෝධයක් තිබීම වැදගත් යයි පවසනුයේ එහෙයිනි.

තවත් මඟපෙන්වීමක් බලාපොරොත්තු වන්න...

# LANKAQR ගෙවීම් පහසුකම ලබාදීම සඳහා මහජන බැංකුව හා සෙලින්කෝ ලයිෆ් එක්වේ

මහජන බැංකුවේ LANKAQR ගෙවීම් පහසුකම ලබාදීමට කේතය ඔස්සේ සෙලින්කෝ ලයිෆ් රක්ෂණ හිමියන්ට ගෙවීමේ පහසුකම් සලසාදීම සඳහා මහජන බැංකුව සහ සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්වැල් බැඳගෙන තිබේ.

මේ සඳහා වන ගිවිසුම් හුවමාරු කරගැනීම මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ සහ සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් විධායක සභාපති ආර්.රෙන්ගනාදන් යන මහත්වරුන් අතර පසුගියදා සෙලින්කෝ ලයිෆ් ප්‍රධාන කාර්යාලයේදී සිදුකෙරිණි.



# SLTC සහ Deakin University බැඳීම් නැංවූ, Centre for Global Education



ඉංජිනේරු හා තාක්ෂණික ආධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වන Sri Lanka Technological Campus (SLTC), මෑතකදී කොළඹ SLTC Trace Expert City හි අතථ්‍ය ක්‍රමයට පවත්වන ලද විශේෂ උත්සවයකදී ඕස්ට්‍රේලියාවේ Deakin University සමග පවතින හවුල්කාරීත්වය තවදුරටත් දීර්ඝ කිරීම සඳහා වූ ගිවිසුමට අත්සන් තැබීය.

මෙම අවස්ථාවට සමගාමීව, Centre forGlobal Education ආයතනය නිල වශයෙන් ආරම්භ කිරීමද සිදුවූ අතර, මෙම ආයතනය, දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ජාත්‍යන්තර තලයේ අධ්‍යාපනයක් සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් පිරිනමන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

හවුල්කාරීත්වය අලුත් කිරීමේ ගිවිසුම සඳහා Deakin University වෙනුවෙන් එහි නියෝජ්‍ය උපකුලපති (ජාත්‍යන්තර සම්බන්ධතා) මහාචාර්ය ගැරී ස්මිත් විසින්ද, SLTC ආයතනය වෙනුවෙන් එහි නිර්මාතෘ-සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ඉංජිනේරු රංජිත් ජී. රුබසිංහ මහතා විසින්ද අත්සන් තබන ලදී.

මෙම එකඟතාවේ විශේෂත්වයක් නම් Bachelor of Artificial Intelligence පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා SLTC ආයතනයට මේ යටතේ අවසර ලබාදී තිබීමයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතනයකට මෙම ක්ෂේත්‍රයේ උපාධියක් පිරිනැමීම සඳහා අවස්ථාව ලැබෙන ප්‍රථම අවස්ථාව මෙය බව Deakin University හි විද්‍යා, ඉංජිනේරු සහ ඉදිකිරීම් පීඨයේ සහකාර පීඨාධිපති මහාචාර්ය බාස්කරන් මහතා පැවසීය.

මෙම හවුල්කාරීත්වය යටතේ කෘත්‍රිම බුද්ධිය, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය සහ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව යන විෂයන්ට අදාළව Bachelor of Artificial Intelligence, Bachelor of Computer Science, Bachelor of Information Technology සහ Bachelor of Software Engineering උපාධි පාඨමාලා 4 හැදෑරීමේ අවස්ථාව SLTC මගින් ශ්‍රී ලාංකේය ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ලබාදෙනු ඇත.

# OPPO A15 ශ්‍රී ලාංකේය වෙළෙඳ පොළට




OPPO නවතම දුරකථන මාදිලිය වන A15 මෙරටට හඳුන්වා දීමට OPPO Sri Lanka කටයුතු කර තිබේ. මෙහි AI Triple Camera පද්ධතිය සුපැහැදිලි ඡායාරූප ලබාදෙන අතර, 6.52" විශාල දර්ශන තිරය වඩාත් සුවිශේෂී විනෝදාස්වාද අත්දැකීමක් ලබාදෙයි. ආරෝපණය දිගුකල් රඳවා ගන්නා බැටරියක් සහ විශාල මතක ධාරිතාවක් සහිත OPPO A15 කෙනෙකුට සිය සම්බන්ධතා සියල්ල සිත් සේ පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

මෙම නව හඳුන්වා දීම සම්බන්ධයෙන් Xinda Lanka (OPPO Sri Lanka) හි ප්‍රධාන විධායක නිලධාරී බොබ් ලී මහතා අදහස් දක්වමින්, "පාරිභෝගිකයන්ගේ ජංගම ජීවන රටාවන්ට අතිශයින් වැදගත් වන විශේෂාංග රැසක් සමග OPPO A15 මාදිලිය හඳුන්වා දීමට ලැබීම අපට මහත් සතුටක්. AI Triple Camera පද්ධතිය මගින් විශිෂ්ට මට්ටමේ ඡායාරූප ගනිමින්, මෙහි විශාල දර්ශන තිරයේ සතුට විඳගන්නා අතරම පවුලේ අය සහ හිතමිතුරන් සමග සිත් සේ සම්බන්ධ වීමට මින් අවස්ථාව සලසා දෙනවා." යැයි සඳහන් කළේය.

OPPO A15 හි AI Triple Camera පද්ධතියට 13MP ප්‍රධාන කැමරාවක්, සෙ.මී.4ක තරම් සමීප දර්ශන සඳහා 2MP Macro Lens එකක් සහ Portrait ඡායාරූපවලට වැඩි depth එකක් සමග පසුබිමට ස්වාභාවික Bokeh Effect එක්කිරීමට 2MP Depth Camera එකක් ඇතුළත් කර තිබේ. ස්වාභාවික සුන්දරත්වය වැඩිදියුණු කරන විශේෂාංග මෙහි ඉදිරිපස කැමරාවට යොදා තිබේ. විවිධාකාරයේ ඡවි වර්ණ සහ මුහුණුවල හැඩයන්, අදාළ පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂභාවය, වයස සහ ජාතිකත්වය අනුව වඩාත් අලංකාර කිරීමට මෙම විශේෂාංගවලට හැකියාව ඇත. OPPO A15 මාදිලිය ජනවාරි 16දා සිට 3GB RAM සහ 32GB Storage සමග, Dynamic Black සහ Mystery Blue යන වර්ණ දෙකෙන් රු.29,900කට මිලදීගත හැකිය.

# ශ්‍රී ලංකාවේ අංක එකේ ටයර් සන්නාමය ලෙස DSI Tyres



DSI Tyres සමාගම SLIM Brand Excellence 2020 සම්මාන උළෙලේදී Product Brand of the Year කාණ්ඩයේ ලෝකඩ සම්මානයද, Local Brand of The Year කාණ්ඩයේ ලෝකඩ සම්මානයද, SLIM DIGI's 2.0 රිදී සම්මානයද ඇතුළු සම්මාන ත්‍රිත්වයකින් පිදුම් ලබමින් ඓතිහාසික ජයග්‍රහණයක් සනිටුහන් කර තිබේ.

DSI Tyres මීට පෙර වසරේ SLIM Turnaround Brand of the Year රන් සම්මානයෙන්ද පිදුම් ලැබීය. සාමාන්‍ය විකුණුම් ක්‍රියාවලිය අතික්‍රමණය කරමින් පාරිභෝගිකයන්ගේ පහසුව වෙනුවෙන් අන්තර්ජාල ඇණවුම් ඔස්සේ ටයර් නිවසටම ගොස් සවිකිරීම සේම, ආකර්ෂණීය ප්‍රවර්ධනයන් තුළ ඔවුන් ජනප්‍රිය වී ඇති බව ඔවුන් වැඩිදුරටත් පවසයි.

# දෙහිවල සත්තු වත්ත

හරි දිරියෙ

සතුන් කූඩු කර හෝ කොටුකර ප්‍රදර්ශනයට තබා ඇති ස්ථානයට 'සත්තු වත්ත' යැයි ව්‍යවහාර කෙරේ. දෙහිවල පිහිටා ඇත්තේ එවැනි තැනකි. එහෙත් මෙතැනට 'සත්තු වත්ත' යනුවෙන් ව්‍යවහාර කිරීම සුදුසු ද යන්න සලකා බැලිය යුතුය.

'වත්ත' යන විශේෂ්‍ය පදයට තබා ඇත්තේ 'සත්තු' යන විශේෂණයයි. 'වත්ත' යන්න වෙන්කර හඳුනා ගැනීමට 'සත්තු' විශේෂණ පදය යොදා ඇත. විශේෂණ හෝ සමාස පද ප්‍රකෘති ස්වරූපයෙන්ම සිටිය යුතු යැයි පිළිගත් සම්ප්‍රදායක් ඇත.

'සත්තු' යන පදයේ මුල 'සත්' යන පදය වේ. මෙහිදී 'වත්තට' විශේෂණය වී ඇත්තේ 'සත්' යන්නය. එහෙත් 'සත්වත්ත' යැයි ව්‍යවහාර නොකරන නිසා එය අනුක්ත බහුවචන රූපයෙන් තැබීම යෝග්‍ය වේ. ඒ 'සතුන්' යන පදයයි. ඒ අනුව 'වත්ත' යන විශේෂ්‍ය පදයට 'සතුන්' යන්න විශේෂණය කර 'සතුන් වත්ත' යනුවෙන් ව්‍යවහාර කිරීම වඩාත් සුදුසු මෙන්ම නිවැරදි ද වේ. ඒ නිසා දෙහිවල ඇත්තේ 'සත්තු වත්තක්' නොව 'සතුන් වත්ත'කි.

මෙතැනට 'සත්ත්වෝද්‍යානය" යනුවෙන් එය සංස්කෘතික වචනයකි. මුවන් තැන්න, අලින් බැඳි ගස ආදිය තවත් උදාහරණ වේ.

යසවර්ධන රුද්රිගු

# උපතින් ගෙනෙනා රෝග හා මරණය වන හැටි පෙන්වන ග්‍රහ යෝග

● නදීශානි පතිරණ

යමෙක් මෙලොව උපදින විටම ඔහුගේ හෝ ඇයගේ මරණය නළලේ කොටාගෙන පැමිණෙන බවට වූ කියමනක් ඈත අතීතයේ විසූ පැරැන්නන් අතර විය. පැරණි ඉසිවරුන්ද ඒහා සමානව ග්‍රහයෝග පිහිටන ආකාරයට ශාරීරික දුබලතා සහිත රෝගාබාධ ඇතිවන ආකාරය හා මරණය සිදුවන ආකාරය පිළිබඳව සඳහන් කර ඇත. ප්‍රවීණ ජෝතිර්වේදී, වාස්තුවිද්‍යා උපදේශක ලත්පඳුරේ දොන් දිශාන්ත මහතා මෙවර 'අද'ට ගෙන එනු ලබන්නේ උපතින් ගෙනෙනා රෝග හා මරණය වන හැටි පෙන්වන ග්‍රහ යෝග පිළිබඳ තතුයි.



සෑම කෙනෙක්ම පෙර ආත්මයන්වලදී කළා වූ අකුසල කර්ම මූලික කොටගෙන මෙම ආත්මයේදී කිසියම් රෝගයක් හෝ රෝග කීපයක් රැගෙන ජන්මය ලබයි. එය උපතේදී වන රෝග මෙන්ම ජීවත්ව සිටිනා විට යම් යම් වයස්වලදී වැලඳෙන්නා වූ රෝග වේ. සමහරෙක් එම රෝගය තුළින්ම මරණයට පත්වෙති.

එය උපදින විටම මරණයට පත්වීම, කෙටි දිනකින් මරණයට පත්වීම, සති, මාස, වසර කිහිපයකින් මරණයට පත්වන අල්පායුෂ යෝග මෙන්ම, මධ්‍යම ආයුෂ යෝග, දීර්ඝායුෂ යෝග ලෙස දක්නට ඇත. (ආයු බල පිළිබඳ ඉදිරියේදී වෙනත් ලිපියකින් අදහස් දක්වන්නට බලාපොරොත්තු වෙමි.) අද මෙහි සඳහන් කරන්නේ ජන්මයත් සමග ගෙනෙන ශාරීරික දුබලතා සහිත රෝග කීපයක් හා මරණය වන හැටි පෙන්වන රෝග හා අවස්ථා කීපයකි. පුරාණ ඉසිවරුන් ප්‍රකාශ කර ඇති පරිදි සෑම මනුෂ්‍යයෙකුටම හටගන්නා වූ රෝග හා මිය යන හැටි පෙන්වන ග්‍රහ යෝග පොත්පත්වල සඳහන් වේ.

ක්‍රි.ව. 505ත් 585ත් අතර කාලයේ ඉන්දියාවේ සිටියා යැයි අනුමාන කරන 'මිහිර' නමැති ආචාර්යතුමා විසින් රචිත 'වෘහජ්ජාතකය' නම් වූ මාහැඟි ග්‍රන්ථයේ සඳහන් පරිදි ශ්ලෝක අනුසාරයෙන්ද මෙහි සිද්ධීන් සඳහන් කරමි.

මාතෘකාව පිළිබඳ සඳහන් කිරීමට පෙර මිහිර ආචාර්යතුමා ගැන යම් සඳහනක් කිරීම වැදගත් යැයි සිතමි. වරාමිහිර නමින් ප්‍රචලිතව ඇත්තේ මිහිර ආචාර්යතුමාය. එකල මොහු රජුගේ උපදේශකයෙකි. අනාවැකි කියන්නාය. රජුගේ අග මෙහෙසින් වහන්සේට පුත් කුමරෙකු උපන්නාය. කුමරාගේ ජන්මපත්‍රය සාදා අනාගතය විමසා සිටීමට රජතුමා මිහිර ආචාර්යතුමා හමු විය.

අග මෙහෙසින් වහන්සේට පුත් කුමරෙකු ලැබී ඇති බවත් වැඩිපුර බලාපොරොත්තු තබා නොගන්නා ලෙසත් මිහිර විසින් ප්‍රකාශකර ඇත. ඔබ ඇයි එසේ කියන්නේ. ආචාර්ය කාරණාව හරියටම කියන්න යැයි රජතුමා ප්‍රකාශ කර ඇත. රජතුමනි පුත් කුමරාගේ ආයුෂ වර්ෂ පහයි. ඌරකු පහරදී මිය යනවා යැයි ප්‍රකාශ කර ඇත.

එම අනාවැකිය සමග දින, සති, මාස ගෙවී වසර 5කට ආසන්න විය. කුමක්ද ආචාර්ය ඔබේ අදහස. පුත් කුමරා වසර පහමද ජීවත් වන්නේ යැයි විමසා ඇත. එසේය රජතුමනි. පස් වසරයි යළිත් පවසා ඇත.

මෙම අනාවැකිය බොරු කිරීම සඳහා රජතුමා උපායක් යෙදීය. සත්මහල් ප්‍රාසාදයක් තනවා කුමරා එහි රැඳවීය. සත්මහල් ප්‍රාසාදය වටා මුරභටයින්ද අගල් 7ක් ස්ථානගත කළේය. දැන් නම් ඌරකු තබා කුඹියෙකුට වත් යුද භටයන්ගෙන් මිදී කුමරා සිටිනා තැනට යා නොහැක.

කුමරාගේ පස්වන උපන් දින දිනය උදාවිය. මිහිර ආචාර්යතුමා රජු සමග රාජ සභාවේය. උත්පත්තිය ලැබූ හෝරාව උදාවිය. ආචාර්ය ඔබතුමන් කියන්නේද දැන්වත් අනාවැකිය බොරු බව පිළිගන්නේද යැයි විමසා ඇත.

නැත රජතුමනි. අනාවැකිය එසේමයි. මේ මොහොතේ කුමරා ලේ විලක් මැද වැටී මියගොස් තිබිය යුතුයි පවසා ඇත.

වහා කලබල වූ රජතුමා ආරක්ෂකයන්, අමාත්‍යවරුන් පිරිවරා සත්මහල් ප්‍රාසාදය වෙත ගොස් ඇත.

පළමු මහලේ සේවිකාවන්ගෙන් විමසූ කුමරා සෙල්ලම් කරමින් සිට හෝරා දෙකකට පමණ පෙර ඉහළට ගිය බව පවසා ඇත. එසේ මහලින් මහල විමසමින් සය වන මහලට පැමිණි කල සේවිකාවන් කියා ඇත්තේ මීට සුළු වෙලාවකට පෙර කුමරා සත්වන මහලට ගිය බවය.

එකල ඌරා ඉන්දියාවේ ගෞරව සතෙකි. සත්වන මහලේ ඉහළ යෝධ ඌරකුගේ රූපයක් නිමවා සවිකර ඇත. කුමරා මරණය කරා ගොස් ඇත. මාරක අවස්ථාවේ ඉහළ ඇති යෝධ ඌරු රූපය (පාෂාණවලින් නිම වූ) කඩා වැටී ඌරාගේ දළ දරුවාගේ පපුව කිඳ බැස මියගොස් ඇත. රජතුමාට කියන්න කිසිත් නැත.

ඌරට කියන තවත් නමක් වන්නේ 'වරහා' යි. ඒ අනුව එතැන් සිට මිහිර ආචාර්ය වරා මිහිර නම් විය.

දැන් අපි මාතෘකාවට යොමු වෙමු.

**පාපලොකිතයෙඃ සීතාවනි ජයො**
**රස්තස්ථයොර්වාවයරුක්**
**කෙන්ද්‍රෙ කර්කට වෘශ්චිකාංශක ගතෙ**
**පාපෛර්යුතෙ ශුනයාරුක්**
**ශ්විත්‍රෘථ ධනස්ථයොර ශුභ යොග්වත්**
**දෙදයෙස්ංකරවො**

> **උපදින විටම මරණයට පත්වීම, කෙටි දිනකින් මරණයට පත්වීම, සති, මාස, වසර කිහිපයකින් මරණයට පත්වන අල්පායුෂ යෝග මෙන්ම, මධ්‍යම ආයුෂ යෝග, දීර්ඝායුෂ යෝග ලෙස දක්නට ඇත. ආයු බල පිළිබඳ ඉදිරියේදී වෙනත් ලිපියකින් අදහස් දක්වන්නට බලාපොරොත්තු වෙමි. අද මෙහි සඳහන් කරන්නේ ජන්මයත් සමග ගෙනෙන ශාරීරික දුබලතා සහිත රෝග කීපයක් හා මරණය වන හැටි පෙන්වන රෝග හා අවස්ථා කීපයකි. පුරාණ ඉසිවරුන් ප්‍රකාශ කර ඇති පරිදි සෑම මනුෂ්‍යයෙකුටම හටගන්නා වූ රෝග හා මිය යන හැටි පෙන්වන ග්‍රහ යෝග පොත්පත්වල සඳහන් වේ.**

**චන්ද්‍රෙබෙ වතිංජස්ත ගෙව විකලො**
**යද්‍යාර්කජොවෙගිගං**

ලග්නයෙන් සත්වැන්නේ සිටි සිකුරු කුජ දෙදෙනා කිසි පාපයෙක් විසින් දුටු කල්හි වාධ්‍ය රෝගී වේ. එනම් ඉදිමුම් බරවා ආදී රෝග ඇත්තෙක් වෙයි.

වෘශ්චික නවාංශකයට හෝ කටක නවාංශකයට ගිය චන්ද්‍ර තෙම කිසි පාපයෙකු හා යුක්ත විද එකල්හි උපන්නේ ගුහ්‍ය රෝගී අයෙක් වේ. ශනි කුජ දෙදෙනා දොළොස් වැන්නේ හා දෙවැන්නේ සිටි කල්හී චන්ද්‍රයා ලග්නයේද රවි සත් වැන්නේද වී නම් උපන් තැනැත්තා ශ්වේත කුෂ්ට රෝගය (සුදු කබර) ඇත්තෙක් වේ.

**අංක ශශිත්‍ය ශුභයොර්මෘගගෙ පතංහෙ**
**ස්වාසක්ෂය පලිහ කවින්ද්‍රධිගුල්ම භාජඃ**
**ශොෂි පරසාර ගෘහාංශ ගයොවේද්වොඃ**
**ක්ෂෙත්‍ර ස්වා යුගපදෙ කගයොඃ කෘශොවා**

චන්ද්‍රයා ශනි කුජ දෙදෙන මැද සිටිනා කල සූර්යා මකර රාශියේ ගත කල උපන්නේ නම් ශ්වාසය, ක්ෂයය, ප්ලීහය, විද්‍රධිය, ගුල්මය යන මේ යම් රෝග ඇත්තෙක් වේ.

හිරු සඳු දෙදෙන රාශි මාරුකරගෙන නවාංශකයේ විද එකල උපන්නේ ක්ෂය රෝගියෙකි.

**චන්ද්‍රෙශ් විමධ්‍යඛෂකර්ති මෘගාජභාගෙ**
**කුෂ්ටි සමන්ද රුධිරෙ තද වෙක්ෂිංතවා**
**යාතෙස්ත්‍රිකොණ මලිකර්කි වෘෂෙර්මාගෙව**
**කුෂ්ටිව පාප සහිකෙ රවලොකිතෙරේවා**

ධනු රාශියේ පස්වැනි නවාංශකයේ හෝ මීන කටක මකර මේෂ යන නවාංශකයක හෝ චන්ද්‍රයා සිටියේද එහි ශනි හෝ කුජද යුක්ත වුවහොත් හෝ දක්නාවේ නම් එකල්හි උපන්නේ කුෂ්ඨ රෝගියෙකි.

මෙම යෝගයේ චන්ද්‍රයා සුබ ග්‍රහයෙකු විසින් දකිනු ලැබුවහොත් කංශසිකාරි හෙවත් සොරි රෝගියෙක් වේ.

පස්වැන්නට හෝ නමවැන්නට ගිය වෘශ්චිකය කටකය වෘෂභය මකරය යන මින් එකක ශනි හෝ කුජගෙන් යුක්ත වේද කුෂ්ට රෝගියෙක් වේ.

**නිධනාර් ධනව්‍යාස්ථිතා රවි චන්ද්‍රාරය**
**මායථා තථා**
**බලවද ග්‍රහ දොෂකාර පෙණර් මනුජාතාඃ**
**ජනයංත්‍ය නෙත්‍රතාම්**

රවි,සඳු, කුජ ශනි අටවැන්නේ, සයවැන්නේ දොළොස් වැන්නේ දෙවැන්නේ කොයි ආකාරයකින් හෝ සිටියහොත් එකල උපන් මිනිසුන් අන්ධ වන්නේය.

මෙම හතර දෙනාගෙන් බලවත් වන ග්‍රහයා චන්ද්‍රයා වී නම් සෙම් හේතුවෙන් අන්ධ වේ. කුජ නම් පිත හේතුවෙන් අන්ධ වේ. රවි නම් ඌෂ්ණය හේතුවෙන් අන්ධ වේ. ශනි නම් වාතයෙන් හෝ ගල් පහරක් වැදී අන්ධ වේ.

**නවමාය තෘතියධීයුතා නව සොගේය**
**රශුභානිරීක්ෂිතාඃ**
**නියමාච් ප්‍රවණොපයාන්ද්‍ර රදවෙකෘත්‍ය**
**කරාශ්වසප්තවෙ**

රවි චන්ද්‍ර කුජ, ශනි නවවැනි එකොළොස්වැනි, තුන්වැනි, පස්වැනි ස්ථානවල යුක්ත වේද එය සුබ ග්‍රහයන් විසින් දකිණු නොලබන්නේද එකල උපත් තැනැත්තා බිහිරි වේ. එම ග්‍රහයන් සප්තම ස්ථානයේ වේද සුබ ග්‍රහයන් විසින් දකිනු නොලබන්නේද ඇද වූ දත් ඇත්තෙක් වේ.

**සංස්පෘෂ්ටඃ පවනෙන මන්දගයුතෙ දසුනෙ**
**විලග්නෙ ගුණො**
**සොතමාදො වනිජෙස්ථිතෙස්ත භවනෙ පීවෙ**
**විලග්නා ශ්‍රිතෙ**
**තද්වත්සූර්ය සුතොදයෙවති සුකෙ ධර්මාත්වස්**
**දසුනගෙ**
**ජාතෙවා සසහසුර්ශ්මිතනයෙ ක්ෂිතෙව්‍යයෙ**
**ශිතගො**

ලග්නයේ බ්‍රහස්පතිද සත්වැන්නේ සෙනසුරුද යුක්ත වූ කල වාත රෝගී වේ. අඟහරු සත්වැන්නේ බ්‍රහස්පති ලග්නයේද වී උපන්නේ නම් උන්මාද වේ.

අඟහරු නමවැනි, පස්වන, සත්වන තැනක වේද සෙනසුරු ලග්නගත වේද එකල උපන් තැනැත්තා උන්මාද වේ. සෙනසුරු සමග අව චන්ද්‍රයා දොළොස් වැන්නට ගිය කල උපන් තැනැත්තා චිත්ත විකල වේ.

**විවෘතදශනඃ පාපෛර්දෘෂ්ටෙ වෘෂාජභයොදයෙ**
**රවලතිරහෙක්ෂෙත්‍රෙ ලග්නෙ හයෙ වෘෂහෙපිටා**
**නව මසුකගෙ පාපෛර්දෘෂ්ටෙ**
**රවාවදෘඨෙක්ෂණො**
**දිනකර සුතෙ නෙකවයාධිඃ කුජේවිකලඃ ප්‍රමානි**

මේෂ වෘෂභ ධනු යන මෙයින් යම් රාශියක් ලග්නය වූද ලග්නය පාපින් දකීද විරූප දත් ඇත්තෙක් වේ.

මේෂ සිංහ වෘශ්චික, මකර, කුම්භ යන අසුභක් ක්ෂේත්‍රයක් හෝ ධනුට හෝ වෘෂභය ලග්නය වීද ලග්නය අසුබයන් විසින් දකින්නේද කට්ට සිතක් ඇත්තෙක් වේ. නව වැන්නට හෝ පස්වැන්නට ගිය රවි පාපයෝ දකින්ද දුර්වල ඇස් ඇත්තෙක් වේ. සෙනසුරු නව වැන්නට හෝ පස්වැන්නට ගිය කල අසුබයන් විසින් දකිනු ලැබුවේ නම් නොයෙක් ව්‍යාධි ඇත්තෙක් වේ. අඟහරු නව වැන්නට හෝ පස්වැන්නට ගිය කල අසුබයන් විසින් දකිනු ලැබුවේ නම් අබ්බගාතයෙක් වේ.

## මරණය

අටවැන්න ශුන්‍ය නම් එය දක්නා වූ බලවත් ග්‍රහයාගේ ධාතු කෝපයෙන් උපන් රෝගයකින් මරණයට පත්වේ.

සූර්යාට පිත - චන්ද්‍රයාට වා සෙම් - කුජට පිත - බුධට වා පිත් සෙම් - බ්‍රහස්පතිට සෙම් - සිකුරුට වා සෙම් - සෙනසුරුට වා - ද වේ.

ඒ අටවැන්න රාශිය කාල පුරුෂයාගේ යම් අවයවයකට වැටෙන්නේද එම අවයවයේ හටගන්නා වූ රෝගයකින් මරණය වේ.

අටවැන්න මේෂය නම් හිසේ රෝගයක්. වෘෂභය නම් මුහුණේ රෝගයක්. ආදී ලෙස වේ.

ශුන්‍ය වූ අටවැන්න බලවත් වූ බොහෝ දෙනෙක් විසින් දක්නා ලැබුවහොත් එම බොහෝ දෙනාට අයිති ධාතු කිපීමෙන් අටවැන්නට අයිති ශරීර කොටසේ හටගන්නා වූ රෝගයකින් මරණයට පත්වේ.

> **අට වැන්නේ රවි සිටීමෙන්, ගින්නෙන් සඳු සිටීමෙන් ජලයෙන්, කුජ සිටී නම් ආයුධයකින්, බුධ සිටී නම් උණ රෝගයෙන් ගුරු සිටීමෙන්, ආම රෝගයකින් සිකුරු සිටීමෙන්, ඌෂ්ණ රෝගයකින් ශනි සිටීමෙන් ක්ෂුධාවෙන් මරණය වේ. අටවැන්න චර රාශියක් නම් විදේශයකදී මරණය වේ. තිර රාශියක් නම් තමන්ගේ රටේදී මරණයට පත්වේ. උභය රාශියක් නම් මාර්ගයේදී මරණයට පත්වේ.**

එම ග්‍රහයන් අටේ සිටීමෙන් මෙසේද මරණයට පත්වේ. අට වැන්නේ රවි සිටීමෙන්, ගින්නෙන් සඳු සිටීමෙන් ජලයෙන්, කුජ සිටී නම් ආයුධයකින්, බුධ සිටී නම් උණ රෝගයෙන් ගුරු සිටීමෙන්, ආම රෝගයකින් සිකුරු සිටීමෙන්, ඌෂ්ණ රෝගයකින් ශනි සිටීමෙන් ක්ෂුධාවෙන් මරණය වේ. අටවැන්න චර රාශියක් නම් විදේශයකදී මරණය වේ. තිර රාශියක් නම් තමන්ගේ රටේදී මරණයට පත්වේ. උභය රාශියක් නම් මාර්ගයේදී මරණයට පත්වේ.

රවි කුජ දෙදෙන දසවැන්නේ සතර වැන්නේ සිටියේද ගල් ගැසීමෙන් මරණය වේ. ශනි, චන්ද්‍ර, කුජ සතර වැන්නේ සත්වැන්නේ, දසවැන්නේ සිටි කල ළිඳක වැටී මිය යයි. හිරු සඳු දෙදෙනා කන්‍යා රාශියේ සිට පාප ග්‍රහයෝ විසින් දකිනු ලබතොත් නෑයන්ගෙන් මරණය වේ. උභය රාශියක් ලග්නය වේද එහි හිරු සඳු දෙදෙනා සිටියේ නම් දියේ ගිලී මරණයට පත්වේ.

සෙනසුරු කටකයේ සඳු මකරයේ සිටි කල උපන් තැනැත්තා දිය උදරයෙන් මරණයට පත්වේ. චන්ද්‍රයා පාපයන්ගේ මධ්‍යයෙහි කුජගේ රාශියක නම් ආයුධයකින් හෝ ගින්නෙන් මරණය වේ.

චන්ද්‍රයා පාපයන් දෙදෙනෙකුගේ මධ්‍යයෙහි කන්‍යා රාශියේ සිටියේද ලේ විෂ වීමෙන් හෝ වේළීමෙන් මරණය වේ.

චන්ද්‍රයා මකරයේ හෝ කුම්භයේ පාපයන් දෙදෙනාට මැදිව සිටියේ නම් රැහැනින් එල්ලී හෝ වැටී හෝ ගින්නෙන් මරණයට පත්වේ.

අටවැන්න, දසවැන්න, සතරවැන්න යන තැන්හි සඳු, රවි, කුජ, ශනි යන ග්‍රහයෝ වේද එනම් 8 වැන්නේ හීන සඳුත් දසවැන්නේ කුජත් ලග්නයේ ශනිත් 4 වැන්නේ රවිත් වේද එකල උපන් තැනැත්තා පොලු, මුගුරු පහරකින් මරණයට පත්වේ.

කුජ, රවි, ශනි ග්‍රහයෝ 4-7-10 යන තැනක සිටි කල ආයුධයකින් ගින්නෙන් රාජ කෝපයෙන් මරණය වේ.

2වැන්නේ ශනි 4වැන්නේ සඳු 10 වැන්නේ කුජ සිටි කල උපන් තොමෝ පණුවන් හටගෙන මරණයට පත්වේ.

රවි 10 කුජ 4 සිටි කල උපන් අය යානවාහන වල ගැටී මිය යන්නේය. කුජ 7 ශනි සඳු රවි ලග්නයට සිටි කල උපන් අය යන්ත්‍රයකට හසුවී මිය යයි. කුජ, ශනි, සඳු, තුලා, මේෂ, මකර, කුම්භ රාශිවල සිටි කල අසූචි මධ්‍යයෙහි මැරේ.

මෙසේ සඳහන් කළේ පාප ග්‍රහ යෝග කීපයක් පමණි. හෘදරෝග, පිළිකා රෝග, අතපය විසන්ධි වීම් නහර පිපිරීම් විෂ ශරීරගතවීම් වැනි වූ කරුණු වලින් මිය යන අය පවා පහසුවෙන් හඳුනාගත හැක.

එසේම හිසේ සිට පාදාන්තය දක්වා සියලු ආකාරයේ අභ්‍යන්තර, බාහිර රෝග පහසුවෙන් හඳුනාගත හැක. ඉදිරියේදී ඒ ගැන ලිවීමට බලාපොරොත්තු වෙමි.

තෙරුවන් සරණයි.




**ජෝතිෂවේදී, වාස්තුවිද්‍යා උපදේශක**
**ලත්පඳුරේ දොන් දිශාන්ත**

# මහපොළොවේ ආරක්ෂකයා සඳු

**ජ්‍යෝතිර්වේදය අනුව සඳු ඉතාම සුවිශේෂීය. මේ සඳු ගැන ප්‍රවීණ ජ්‍යෝතිර්වේදී කේ.සී.ජේ. රත්නායක සැකෙවින් ගෙනෙන විස්තරයකි**





සඳු මහපොළොවේ අසමසම ආරක්ෂකයාය. බාහිර අජටාකාශයෙන් පෘථිවිය කරා ඇදී එන සියලු ශක්ති පදාර්ථ තමා වෙත ඇදගන්නා සඳු ඒවා හැකිතාක් පවිත්‍රකොට මහපොළොවට මුදාහරින ෆිල්ටරයක් ලෙස ක්‍රියාකරයි. දෙවනුව පෘථිවිය සහ අනෙක් ග්‍රහ ලෝක අතර ප්‍රධාන සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියාකරන සඳු මහපොළොවේ සමබරතාව කෙරෙහි තීරණාත්මක වේ. සඳුගේ මේ ක්‍රියාකාරීත්වය නොවන්නට මහපොළොවේ ශාක සහ ජෛව විවිධත්වය මෙතරම් සරුසාර වන්නේ නැත. ජ්‍යෝතිෂය අනුව සඳු ග්‍රහලොව මවු ලෙස සැලකෙන අතර, පෘථිවියේ ජීවය සඳු මත රැඳ පවතින බැව් එයින් නිවේදනය කෙරේ.

ඕනෑම පුද්ගලයකු උපදින ජන්ම නැකත තීරණය කෙරෙනුයේ ඒ වන විට සඳු තැන්පත්ව සිටින නැකැත සහ නැකැත් පාදය පදනම් කරගෙනය. ඔහුගේ හෝ ඇයගේ ලග්නයට වඩා සඳු තැන්පත්ව සිටි රාශිය සහ නැකැත් පාදය ප්‍රමුඛකොට ගැනීම සම්භාව්‍ය උසස් ජ්‍යොතිෂ ගණිතයේ රහසකි. කේන්ද්‍රයේ සඳු සහ අනෙක් ග්‍රහයන් අතර පිහිටන සමීපස්ථ සහ දුරස්ථ න්‍යාය මෙන්ම සඳු මූලික කොට ගත් ජ්‍යාමිතික සිතියම මත පුද්ගලයාගේ මෙලොව ගමන් මග තීරණය කෙරේ.

මේ අනුව බලන කල මහපොළොවට මෙන්ම එහි පවතින සමස්ත ජෛව පද්ධතීන්ටම සඳු සහ සඳුගේ ක්‍රියාකාරීත්වය තීරණාත්මක වන බව පෙනී යයි. සඳු යහපත් ලෙස ක්‍රියාකරන තාක් මහපොළොව සහ ජීවය සුරක්ෂිතය. යම් හෙයකින් සඳු අයහපත් ලෙස ක්‍රියාකරන්නේ නම් එවිට මහපොළොව සහ ජීවය අනාරක්ෂිතය.

සඳු මහපොළොවට සතුරු ලෙසින් ක්‍රියාකරන ප්‍රධාන අවස්ථා කිහිපයකි.

1. චන්ද්‍රග්‍රහණ අවස්ථාව
2. සූර්යග්‍රහණ අවස්ථාව
3. අමාවක - පුරපසළොස්වක සහ අව අටවක - පුර අටවක යන හතර පොහොය
4. සුපිරි සඳු උදාවන අවස්ථාව
5. සඳු සහ රාහු සංයෝගවන අවස්ථාව

මේ අවස්ථාවලදී සඳුට තම ප්‍රකෘති ස්වරූපය සහ ක්‍රියාකාරීත්වය අහිමිවන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් මහපොළොව අනාරක්ෂිත වේ. එවිට මහපොළොවේ සමතුලනය බිඳී යෑම මෙන්ම අජටාකාශයෙන් නිකුත් වන අතිමහත් විෂකුරු ශක්ති පදාර්ථ එක එල්ලේම පොළොව කරා ඇදී ඒම නිසා මිහිතලය දැඩි අවදානම්සහගත තත්ත්වයකට පත්වේ. බිහිසුණු භූ චලන හටගැනීම සහ සඳුගේ පිහිටීම අතර පවතින්නේ වෙන් කළ නොහැකි සම්බන්ධයකි. පුරපසළොස්වක පෝයදාට අහස ලස්සනය. එහෙත් ඒ ලස්සන යටින් සැඟවී තිබෙන්නේ බියකරු අවදානමකි. 2004 වසරේ දෙසැම්බර් 26දා පුරපසළොස්වක පෝයදා හටගත් සුනාමිය මේ සඳහා එක් නිදසුනකි. අන් සියලු දිනයන්ට වඩා පුරපසළොස්වක පෝයදා බියකරුය. ඒ මොහොතේ සුපිරි සඳු උදා වූයේ නම් ඒ දවස අතිබියකරුය.

හතර පොහොය මෙතරම් නපුරු වන්නේ කෙසේදැයි කෙනෙකු විසින් විමසනු ලැබීම සාධාරණය.

1. අමාවක පෝය දා රෑ අහස කට්ට කළුවරය. ජ්‍යෝතිෂය අනුව මේ දවස කිසිදු සුබ කටයුත්තකට යොදා නොගනී. මන්ද සඳු මුළුමනින්ම පාහේ හිරුගෙන් වැසී යන හෙයිනි. එනම් සඳු සහ හිරු එකම අංශකයේ පිහිටයි. මෙදින මළවුන්ගේ දිනය ලෙස සැලකීම ඉතා යුක්ති යුක්තය. එහෙත් හිරුගේ ග්‍රහණයෙන් නිදස්ව එන නව සඳු බටහිර ජ්‍යෝතිෂ සිද්ධාන්ත අනුව සුවිශේෂී අවස්ථාවකි.

2. පුර අටවක පොහොය යනු සඳු හිරුගෙන් අංශක 90ක් දුරස්ථ වූ අවස්ථාවය. එය අසුබ දෘෂ්ටියකි.

3. පුරපසළොස්වක පොහොය යනු සඳු හිරුගෙන් අංශක 180ක් දුරස්ථ වූ අවස්ථාවය. මෙය බටහිර සහ පෙරදිග යන භේදයක් නැතිව ඉතා අසුබ දෘෂ්ටියක් ලෙස සැලකේ.

4. අව අටවක පොහොය යනු අව සඳු අංශක 90කින් හිරුට සමීප වූ අවස්ථාවය. මේ අව සඳුගේ චතුරශ්‍ර දෘෂ්ටියද අසුබ වේ.

( හිරු සහ සඳු අතර හටගන්නා දුරස්ථ සහ සමීපස්ථ සිද්ධාන්තය මත හතර පොහොය නිර්මාණය වන අතර, ඉහත දැක්වූයේ ඒ පිළිබඳ ලුහුඬු සටහනක් පමණි. මේ නිසා මහපොළොවට ඇති කෙරෙන පීඩනය අනෙක් ග්‍රහයන්ගේ පිහිටීම අනුව උග්‍ර විය හැකිය. ඒවා වෙන් වෙන්ව අධ්‍යයනය කළ යුතුය.)

මේ අතරින් වඩාත්ම වැඩි අවදානම ගෙන දෙන්නේ පුරපසළොස්වක පොහොය දිනයයි. මෙදින සඳු හිරුගෙන් ඈත් විය හැකි උපරිම දුර වූ අංශක 180කින් ඉවතට යන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් මහපොළොව හිරු සහ අනෙක් ග්‍රහයන් වෙත පුළුල්ව නිරාවරණය වේ. යම් හෙයකින් සඳුට සමීපව හෝ දුරස්ථව ග්‍රහ පොකුරක් නිර්මාණය වී තිබුණේ නම් පොළොවේ සමතුලනය බිඳවැටීමෙන් බිහිසුණු භූ චලන හටගැනීමේ අවදානමක් නිර්මාණය වේ. අනෙක් අතින් පුරපසළොස්වක සඳු විසින් පොළොවේ ඇති සියල්ලම තමා දෙසට ඇද ගැනීමට තැත් කිරීම නිසා එයින්ද මහපොළොවට ඇති කෙරෙන්නේ පීඩනයකි. මේ පුරපසළොස්වක සඳු යම් හෙයකින් සුපිරි සඳු බවට පත්වූයේ නම් පෙර කී පීඩනය දෙගුණ වේ.

හතර පොහොයට සිල් ගැනීම සිංහල බෞද්ධයන් අතර පවතින ජනප්‍රිය කතාවකි. හතර පොහොය කෙසේ වෙතත් පුරපසළොස්වක පොහොයට නම් ඇතැම්හු සිල් සමාදන් වෙති. එහෙත් මේ සිරිත සහ ජ්‍යෝතිෂය අතර ඇති සම්බන්ධය බොහෝ දෙනෙක් නොදනිති. සඳුගෙන් පොළොවට ආරක්ෂාවක් නොලැබෙන දිනයේදී කළයුතු හොඳම ක්‍රියාව වන්නේ හැකිතාක් සිත කය දෙක සංවර කරගෙන සිටීමය. පොහොය දාට සුබ නැකැත් නැත. එහෙයින් මංගල කටයුතු, ඉදිකිරීම්, ව්‍යාපාර ආරම්භය ආදී කිසිවකට පොහොය දිනය යොදා නොගන්නා අතර, ජ්‍යෝතිෂය පිළිබඳව දැනුම ඇති පැරණි වෛද්‍යවරුන් මෙදින වෙද හෙදකම් පවා නොකෙළේය. පොහොය දාට හේනට කුඹුරට නොයන ගොවියා එසේ කෙළේ පොහොය දවසේ ඇති අනතුරුදායක බව අත්දැකීමෙන් පසක් කරගත් නිසාය.

# ඔබට අයිති කේන්ද්‍රය ඔබම නිවැරදිව බලාගන්න



උපත ලත් මොහොතටම අලලා සෑදෙන කේන්ද්‍ර සටහන භාව කේන්ද්‍ර සටහනයි. මෙසේ කේන්ද්‍ර සෑදීම ක්‍රිෂ්ණමූර්ති ක්‍රමය යැයි ඇතැම්හු කියති. නමුත් භාව කුතුහලය, ශුම්භ හෝරා ප්‍රකාශය යනාදී ඉපැරණි ග්‍රන්ථවල ප්‍රකාශන තත්කාල නිමිති ශාස්ත්‍රයේද දැක්වේ. ශ්‍රීමත් කල්‍යාණවර්මි රජතුමන් විසින් රචිත සාරාවලියේද යම් යම් ස්ථානවල භාව සටහන් ගැන කරුණු විස්තර කෙරේ. විශ්වයේ පවතින්නා වූ සියලුම (ග්‍රහ) වස්තූන් විවිධාකාර වේගයන්ගෙන් හා ඕලාකාර හැඩතලවලින් යුක්තව මොහොතින් මොහොත වෙනස් වෙමින් භ්‍රමණය වේ. ඒ හේතුව මත ග්‍රහලෝකයන්හි භ්‍රමණය වීම එකිනෙකා කෙරෙහි ඇති කරන ආකර්ෂණ හා විකර්ෂණ මෙන්ම විහිදුවන ආලෝක ශක්ති ප්‍රභවයන්ද වෙනස් වේ.

භාවානුරූපව ඔබගේ කේන්ද්‍ර සටහනේ දුක්වෙන ග්‍රහ පිහිටීම සලකමින් තමාට අනාගතයේදී ඇති කරන ඵල තමන්ම දැනගන්න, පහත සඳහන් කරුණු උපයෝගී කරගන්න.

උපත ලබන වෙලාවට අයත් වන ලග්නභාවයේ එක් එක් ග්‍රහ පිහිටීම ගැන මුලින්ම විමසා බලමු. ලග්නභාවයෙන් හොවා දක්වන කරුණු අතර ප්‍රධාන වන්නේ උපත ලත් අයගේ හැඩරුව, ගතිගුණ, පැහැය, ආත්මශක්තිය, කීර්ති ප්‍රශංසා, ශරීර ලප කැළැල්, දුකසැප හෙවත් ධනවත් බව, මවුපිය උරුම ගති හා තම හිස යනාදී තවත් බොහෝ කරුණු එළිදැක්වේ. එම භාවයට පත්වන අවස්ථාවේ ග්‍රහයන්ගේ ග්‍රහස්ඵුට මෙන්ම දෘෂ්ටි සංයෝගද ඵලාපල කෙරෙහි සුබාසුබ බලපානු ඇත. ග්‍රහයෙක් උච්ච හෝ ක්ෂේත්‍ර අංශක ඉදිරියට හෝ පසුකරමින් ගමන් කරන අවස්ථාවලදීද ක්‍රියාකාරී ශක්තීන් එකිනෙකට වෙනස් වේ. මිත්‍ර, සතුරු, නීච, සම, මුඪ යන අවස්ථාවලදීද ඵල වෙනස් වේ. ලග්නභාවයේ දෙපස සිටින ග්‍රහයන්ගේ එම ගතිගුණද බලපානු ඇත. මෙවැනි කරුණුද සැලකිල්ලට ගෙන ඵල තීරණය කරගැනීම ප්‍රඥගෝචර වෙයි.

ඔබට අයත් වන ලග්නයට හිමි ග්‍රහයා පළමුවෙන් හඳුනා ගනිමු. උදාවන ලග්න, පිළිවෙළින් මේෂ, වෘෂභ, මිථුන, කටක, සිංහ, කන්‍ය, තුලා, වෘශ්චික, ධනු, මකර,කුම්භ, මීන වශයෙන් දැක්වේ. මෙම රාශීන්ට ආවේණික අධිපති හා ක්ෂේත්‍ර ග්‍රහයන් පිළිවෙළින් කුජ, සිකුරු, බුධ, සඳු, රවි, බුධ, සිකුරු, කුජ, ගුරු, ශනි, ශනි, ගුරු යනුවෙනි. මෙහිදී රවිහා සඳුට එක එක රාශිය බැගින්ද අනෙක් සියලු ග්‍රහයන්ට රාශි දෙක දෙක බැගින්ද අයත් වේ. තවද මේෂ, වෘෂභ, කටක, කන්‍ය, තුලා, මකර, මීන යන රාශිවලට උච්ච ග්‍රහයන් වන්නේ රවි, සඳු, ගුරු, බුධ, ශනි, කුජ, සිකුරු වේ. මේවා පිළිවෙළින් අංශක 10, 03, 05, 15, 20, 28, 27 වශයෙන් ඇතුළත්ය. මේවාට 7වන රාශිය නීච රාශිය වේ.

ඉහත සඳහන් රාශිවල උච්ච හෝ අධිපතියන් එම රාශියේම සිටී නම් ආවේණික සුභ ඵල ගෙන දේ . නීච නම් උදාසීනවද, සතුරු නම් අසුබ ඵලද ගෙනෙන අතර සුබ ග්‍රහයන් ගුරු, (සඳු, සිකුරු හා බුධ) සංයෝග හෝ දෘෂ්ටි සහිත නම්ද අසුබ ඵල ගෙන නොදෙනු ඇත. මේ නිසා ඉදිරියේදී කරන ප්‍රකාශයන් නිවැරදිව වටහා ගන්න උත්සාහ කරන්න.

මේෂ රාශිය ලග්නභාවය වී එහි කුජ හෝ රවි ඉහත කී ආකාරයෙන් සිටීමෙන් රුචක යෝගය පිහිටයි. මේ අය කාර්යශූර, උනන්දුවෙන් ඕනෑම වැඩක් කිරීමට ඉදිරිපත් වේ. යන්ත්‍ර මන්ත්‍ර කටයුතු මෙන්ම අවි දරන යුද කටයුතුද, ආරක්ෂක උසස් නිලතල භාරව සිටීමට කැමති කැපී පෙනෙන කෙනෙකි. හැඩහුරුකමින් තේජවන්ත, වැඩුණු ශරීරයද කලු වුවත් රත් පැහැයට හුරු, සුදුම පාට ශක්තිමත් දත් හිමිය. බෙල්ල දැඩි හා වටකුරුය, හොඳ පෞරුෂත්වයකින් යුක්තයි. මෙවැනි යෝග කේන්ද්‍රයේ 10වැනි භාවයේ නම් අනිවාර්යෙන්ම රාජ්‍ය හෝ පෞද්ගලික උසස් තනතුරු දරනු ඇත. ස්ත්‍රී පුරුෂ බේදයකින් තොරව තම පරම්පරාවේ දියුණුව උදෙසා කැපවීමෙන් කටයුතු කරයි. සාමය හෝ දරුණු බව ස්ථානෝචිතව ක්‍රියාත්මක කරයි. අනෙකුත් සුබ ග්‍රහයන්ගේ බලපෑම් සහිත නම් ධාර්මිකත්වය අගය කරයි. පාප ග්‍රහ සංයෝගතා නම් ඉතා දරුණු වේ.

ඔබගේ ලග්නභාවය වෘෂභ නම් එහි ඉහත කී පරිදි සඳුහෝ සිකුරු සිටීමෙන් මාලව්‍ය යෝගය පිහිටයි. මේ අය පිරිපුන් හා දැකුම්කලු රත් පැහැයෙන් යුක්ත වේ. ස්ත්‍රියක් නම් හස්තිනී ගණයේය. පංච කල්‍යාණයෙන් යුක්තයි. මහත්ම නොවන සිහින් හැඩවැඩ සහිත ශරීරයකි. කලා කටයුතුවලට දක්ෂයි. ස්වභාවධර්මයට ඉතා ඇලුම් කරයි. මවට ඉතා ලැදිවේ. සුබ ගුරු හෝ බුධ නැකැත් සංයෝගතා අනුව දැහැමි රාජ්‍ය පාලකයෙක්ද වේ.

මේ කරුණු ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරයි. පළමු කී පරිදි අසුබ සංයෝග හෝ දෘෂ්ටි මත වෙනස් විය හැකියි . නමුත් මේ අයට යහමග කුඩා කල සිටම කියා දී හුරුකර ගැනීම කළ යුතුයි.

මිථුන ලග්නභාවයේ බුධ සිටින අතර, ගුරු ශනි යෝග සහිත නම් ඕනෑම කාර්යක් ඉක්මනින් ඉගෙන ගනී. දක්ෂතා සහිතයි. එකම ධනය බුද්ධියයි. විස්තරාත්මක දේශනයට දක්ෂයි. පවුලේ ප්‍රධානියා වශයෙන් තම පරම්පරාව ඉදිරියට ගෙන යයි. දෙමාපියන්ට මෙන්ම වැඩිහිටියන්ට ගෞරව සහිත කෙනෙකු වේ. ඇසූපිරූ තැන් බහුල කරගන්නා අතර, විශ්ලේෂණාත්මක දේශනවලට ඉතා දක්ෂයි. කලාවට මෙන්ම ස්වභාවධර්මයට ඇලුම් කරයි. යමක් දුටු පමණින් එය වටහාගෙන ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් උපතින්ම ලබා ඇත. දහමට ඉතා ළැදිය. දානමාන දීමට ඉතා කැමතිය. සඳු, ගුරු සම්බන්ධතාව අනුව යමක් වහා වටහා ගැනීමේ නුවණක් උපතින්ම ලබා ඇත. සැමවිට සාධාරණත්වය අගය කරයි. සාමයට කැමතියි. ශනි දුබල නම් කේන්තිකාරයෙකි. දිගටි අත් පා, වටකුරු හැඩය, දෙඅතේ දිග තරමට උස, පුරුෂ නම් තරමක් රළු වුද, ස්ත්‍රී නම් පියුමක මෙන් මොළොක් ශරීරයද, පිරුණු ළමැදක් යන ලක්ෂණ පෙන්නුම් කරයි. වාසනාවන්ත ගුණයෙන් යුක්තයි. මේ කරුණු වෙනස් වන්නේ ග්‍රහයන්ගේ දුබලතා පැවැතියහොත් පමණි.

කටක ලග්නභාවය හිමිකම් සහිතව සඳු හෝ සඳු ගුරු සංයෝගව උපත ලබා ඇත්නම් ඉතා වාසනාවන්තයි. නමුත් කටහඬ ටිකක් සැරයි. මිථුන ලග්නයේ භාව ඵලවලට ගොඩාක් සමීපව ක්‍රියා කරයි. ප්‍රසන්න පෙනුමකින් යුක්ත වේ. පැහැපත්, ශක්තිමත් ශරීරයකි. ලොව ධර්මතාවය හොඳින් වැටහේ. ඒ අනුව අනුන්ගේ දුක් වේදනා තමාට මෙන් දැනේ. හැකි උපකාර නොපිරිහෙළා ඉටුකරයි. අසල්වැසි කවුරුත් සමග කුලුපඟව විසීම එකම බලාපොරොත්තුවයි. ඉගෙනීමට ඉතා දක්ෂයි. වර්ණවත් පියකරු මුහුණක් හා සිනහමුසු බවක් නිතර දක්නට ලැබේ. හරිම සංවේදී කෙනෙකි. ස්ත්‍රී පුරුෂ භේද මේ විස්තරයට අදාළ නොවේ.

රවි ග්‍රහයා ලග්නභාවයේ වූ සිංහය නම් කුජ සිකුරු සංයෝග නම් ඔබ සිතන දෝෂය නැත. ආත්ම ශක්තිය උදෙසා හැකි සෑම උත්සාහයක්ම නොපසුබටව ක්‍රියාවේ යොදන කෙනෙකි. අන් අය පරදවා තමන්ගේ සිතැඟි අරමුණ ඉටුකර ගැනීම පෙරටුකොට ක්‍රියාත්මක වෙයි. බාධක මායිම් නොකරයි. දැඩි උත්සාහවන්තයි. පියාට ඉතා ළැදි අතර, රජයට පක්ෂපාතී වුවත්, කිසිවෙකුට යටත් වීම සිතිය නොහැකි තරම්ය. තේජවන්ත නෙත් සහිත ගාම්භීර පෙනුමක් හොවා දක්වයි. මෙහි දුබලතා ඉහත කී ආකාරයේ ග්‍රහ සංයෝග දෘෂ්ටි මත පවතී.

ලග්නභාවය කන්‍යාව වී එහි බුධ වක්‍ර නොවී කෙසේ සිටියත් භද්‍ර යෝගයයි. මෙය ඒකශෘත යෝගයකි. එහි තීව්‍රතතාවය සඳු, ගුරු හෝ කුජ, ගුරු සංයෝගතා අනුව ක්‍රියාත්මකයි. වෙළෙඳාම් ව්‍යාපාර, ඛනිජ සම්පත්, වගාකටයුතු, ග්‍රන්ථකරණය, දේශක යන තනතුරු යනාදිය ප්‍රමුඛස්ථානයේ ලා සැලකේ. බොහෝ නිහතමානී මිත්‍රතාවයට කැමැති වේ. ආධිත්‍ය යෝගයකට රවි යොමු වේ නම් පාලන තන්ත්‍රයේ මහත් පෙරළිකාරී කෙනෙකු වෙයි. පරම්පරාව ඉදිරියට ගෙන යනවාට වඩා ධනය රැස්කිරීමට සියලු ශක්තීන් යොමු කරනු ඇත.

ඉහත සඳහන් විස්තරය බොහෝදුරට ජ්‍යෝතිෂ ශාස්ත්‍ර කරුණුවලට ආවේණික වන අතර, මේ පොදු කරුණු වේ. තමාගේ උපන් ලග්නභාවය හා බලවත් ග්‍රහ පිහිටීම තම ශක්ති ප්‍රමාණ යම් තරමකට හෝ වටහා ගැනීමට මහෝපකාරී වන බව සත්‍ය වේ. ඉතිරි ලග්න සඳහා මෙවැනි විස්තර ඉදිරියේදී පැවසීමට බලාපොරොත්තු වෙමි.



**ජ්‍යෝතිෂ හා වාස්තු ශාස්ත්‍ර උපදේශක උත්තමාචාරයෙන් පිදුම් ලත් ඩබ්.එස් රාජපක්ෂ, ගම්පහ**

# සතිය ඔබට කොහොමද?



**සතිය ඔබට කොහොමද ? (පෙබරවාරි - 01 - සඳුදා සිට 07 ඉරිදා )**

මේ සතියේ ධනය, දේපළ, ඉපැයීම් මාර්ග මෙන්ම උරුම හිමිකම්, අයිතිවාසිකම් හා කිසියම් ලාභ ප්‍රයෝජනාදියක් හිමිවන තම භාග්‍ය සම්පත් උදාවන, එසේම ජීවනෝපාය මාර්ගයන්, රැකියා ව්‍යාපාර යනාදියත් හා තම දෛනික ජීවන ගමනේ බොහෝ අත්‍යවශ්‍ය කාර්යන්හි ප්‍රගතියක්, සාර්ථකත්වයක්, ස්ථාවරභාවයක් සතිය පුරා ගෙනදෙන, ගොඩනගන සතියේ ශුභඵලදායී ලග්න වනුයේ **මේෂ, වෘෂභ, කටක, සිංහ, කන්‍යා, ධනු, මකර** වැනි ලග්නයන්ය.

එබැවින් මෙවැනි ලග්නයකින් උපන් ඔබට මෙම සතිය තුළ සතුට ප්‍රීතිය ඇති වේ. වැඩකටයුතු සාර්ථක වේ. ඥාති මිත්‍රයන් සමගත්, උසස් අය සමගත් ආශ්‍රය ඇති වේ. යම් යම් ලාභ ප්‍රයෝජන ලැබෙන සතියක් වන්නේය. මිල මුදල් හා වෙනත් ද්‍රව්‍යමය ලාභයක් ලැබෙන සතියකි. දෛනික මූල්‍ය අවශ්‍යතාවය සැලසුම් කළ පරිදි සපුරාගත හැකි වන්නේය. රැකියා අංශවල නිරත අයට නොසිතූ වාසිදායක තත්ත්වයක් ඇති වේ. ආයතනය තුළ අමනාපව සිටි අය යළි හිතවත් කර ගැනීමට දැරූ උත්සාහය ඵල දරයි. විදෙස් රැකියාවක් පිළිබඳ අදහස් ඉටුකර ගත හැකි වේ. හවුල් හෝ ස්වයං ව්‍යාපාර කරන ඔබගේ අපේක්ෂිත ව්‍යාපාර ඉලක්ක සපුරාගත හැකි වන්නේය. අධ්‍යාපනය ලබන අයගේ අධ්‍යාපනයට අදාළ සැලසුම් බොහොමයක් ඉටුවන සතියක් වන අතර, ශාස්ත්‍රීය කටයුතුවලට වැඩිපුර යොමුවන්නන්ට ඉන් සාර්ථක ඵල අත්කරගත හැක. යුග දිවියේ හා ප්‍රේම දිවියේ වැඩකටයුතුවල නව මුහුණුවරක් ඇති වීමෙන් සිතට සතුටක් ගෙන දේ. ගෙදරදොර විවාහයට සම්බන්ධ ප්‍රීතිමත් අවස්ථාවකට කටයුතු පිළියෙල වේ.

මේ සතියේ තම අධ්‍යාපන කටයුතු දැනුම කුසලතාවයට සම්බන්ධ සියලු කාර්යන් මෙන්ම ඊට සම්බන්ධ අරමුණු, සැලසුම්, ගමන් බිමන්වලට අදාළ කාර්යන් මෙන්ම තම දෛනික ජීවන ගමනේ බොහෝ අත්‍යාවශ්‍ය කාර්යන්ට අවහිර බාධා ප්‍රමාදවීම් ඇති කිරීමට හේතු ගෙනෙන ලග්න වනුයේ **වෘශ්චික, කුම්භ, මීන** වැනි ලග්නයන්ය.

එබැවින් මෙවැනි ලග්නයකින් උපන් ඔබ ඉගෙනීම් කටයුතු වලට ගතවූ දිනවල පැවැති ස්වභාවයට වඩා උනන්දුව, උද්‍යෝයෝගය බෙහෙවින් අඩු වී යයි. ගතවූ සතියට සාපේක්ෂව ඉගෙනීම් කටයුතු වලට තිබූ උද්යෝගය කාර්යශූරත්වය හීන කරයි. ඔබ තුළ පොතපත කියවීමටත්, දැනුම බුද්ධිය වර්ධනය කර ගැනීමටත් ආශාව ඇති වුවත් විනෝදයටද බර වීම නිසා ඉගෙනීම් කටයුතු මගහැරීම්ද සිදුවෙයි. මෙවැනි දෙයට නතු නොවී උනන්දුවෙන් උද්‍යෝයෝගයෙන් ඉගෙනීම් කටයුතුවල නිරත වන්න. මිල මුදල් අතමිට ගැවසුණත් විශේෂයෙන් විනෝදාස්වාදයට හා ගමන්බිමන් වලට වැඩිපුර මුදල් වැය වේ. ආදායම් වියදම් සම තත්ත්වයේ පවත්වා ගැනීමට අසීරු වෙයි. ආදායම් මාර්ග යහපත් වුවද අනවශ්‍ය වියපැහැදම් නිසා යමක් ඉතිරි කර ගැනීමට නොහැකි වේ. ප්‍රමාණයට වඩා තම තත්ත්වය පෙනෙන ලෙස වියදම් කිරීමටත් සිත් දෙන බැවින් ඊට නතු නොවන්න.

මේ සතියේ ආදර සබඳතා හා යුගදිවියේ මෙන්ම ගෘහ ජීවිතයේ කාර්යන්ට අදාළව යම් යම් ප්‍රශ්නකාරී, ගැටලුකාරී ස්වභාවයන් මතුවන, පැනනගින ලග්න වනුයේ **මිථුන, සිංහ, තුලා** වැනි ලග්නයන්ය.

එබැවින් මෙවැනි ලග්නයකින් උපන් ඔබට මෙම සතියේදී නව ආදර සබඳතාවකට හා විවාහ යෝජනාවකට පසුබිම සැකසුණත් කියූ දේ අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වීම හා පොරොන්දුවක් කඩ කිරීම මත ප්‍රේමවන්තයා / ප්‍රේමවන්තිය අමනාප වීමට ඉඩ ඇත. ඔහු හෝ ඇය වෙනුවෙන් යම් යම් ආකාරයේ වියදම්ද යෙදේ. ප්‍රේමවන්තයා හෝ ප්‍රේමවන්තිය දුන් පොරොන්දුවක් පිළිබඳ විටින් විට සිතට සැක සංකා වැනි දෙයක් හට ගනී. සන්නිවේදන මාර්ග ඔස්සේ විරුද්ධ ලිංගිකයා සමග වැඩිපුර සම්බන්ධ වීමට හැකි වන්නේය. පහසුවෙන් විරුද්ධ ලිංගික සබඳතා ගොඩනැගුණත් හැඟීම්වලට මුල්තැන දී ඊට වහල් වී ක්‍රියා නොකරන්න. විටෙක මෙවැනි දෑ හේතුකොට ගෙන තමා ඇසුරු කරන විරුද්ධ ලිංගිකයාගේ විවේචනයට වුව ලක්විය හැක.

**බෙන්තොට-හේමන්ත.**
**www.isiwarajothisa.com**

**ග්‍රහ වස්තු ගෙනෙන අපල උපද්‍රව අතුරින් සෙනසුරු අපල භයානක තත්ත්වයන් ගෙන දෙන බව ඔබ දන්නවා ඇත. සෙනසුරු අපලයක් උදාවීමට පෙර ඒ පිළිබඳව දැනගැනීමට හැකි නම් එය ඔබට ඉන් මිදී ජීවිතය සාර්ථක කරගැනීමට හැකියාව ලැබේ. මේ සෙනසුරු අපල තිබෙනවාදැයි ගෙදරදීම දැනගැනීමට හැකි සරල ක්‍රමවේදයන් සහ ඉන් මිදීමට සිදු කළ හැකි පහසු ක්‍රියා පිළිබඳව කළුතර පයාගල ශ්‍රී රාවණ ජ්‍යෝතිර්වේද සහ වාස්තු සේවාවේ ජ්‍යෝතිර්වේදී කුමාර වෙත්තමුණි මහතා පැවසූ අදහස්ය.**



# සෙනසුරු අපල තිබේ දැයි ගෙදරදීම දැනගන්න



● **කැළුම් දේවින්ද**

විශ්වය නිර්මාණය වී ඇත්තේ පංච මහා භූතයන්ට අනුවය. (ආපෝ හෙවත් ද්‍රව ගතියද, තේජෝ හෙවත් ඌෂ්ණ ගතියද, වායෝ හෙවත් වායු ගතියද, පඨවි හෙවත් ඝන බව සහ ආකාශ හෙවත් හිස් බව පදනම් කරගෙන) වායෝ හෙවත් වායු බවට අධිපති සෙනසුරු හෙවත් ශනි අලස වූ ගති ඇති, කපිල (රත්රන්) පාට ඇස් ඇති, කෘෂ වූ උස් ශරීර ඇති, මහත් වූ දත් ඇති, විරූප කර්කෂ ලොම් හා හිස කෙස් ඇති, වෘතාධික ශරීර ඇත්තෙකි. එසේ හෙයින් සෙනසුරු ග්‍රහ අපල පිළිබඳව බොහෝදෙනා දක්වන්නේ දැඩි බියක් හා අකමැත්තකි. පෙර ආත්මභවයන්හි කරන ලද කුසල් අකුසල් පිළිබඳවද පුද්ගලයෙකුගේ උත්පත්ති කේන්ද්‍රයේ ඔහු හෝ ඇය මවු කුසින් මෙලොවට බිහි වන මොහොතේම සෙනසුරු ශුභ අශුභභාවය සහ බල දුබල තත්ත්වයන් පිළිබඳවද සෙනසුරුට හිමි වන්නේ විශේෂ ස්ථානයකි.

එමෙන්ම ග්‍රහ අපල පිළිබඳව සාකච්ඡා කිරීමේදී සෙනසුරු හෙවත් ශනිට හිමිවන ප්‍රමුඛස්ථානය සහ ඒ පිළිබඳව දක්වන උනන්දුව අනෙකුත් ග්‍රහයන්ට සාපේක්ෂව වැඩි වේ. ග්‍රහ මණ්ඩලයේ මහල්ලා, මෙහෙකරු, දුකට අධිපති, කර්මයට ඵල දෙන්නා ආදී විවිධ නම්වලින් ප්‍රචලිතය. යම් අයෙකුගේ උත්පත්ති හඳහනේ සෙනසුරු ශුභව පිහිටා තිබීම හෝ බලවත්ම රාශි වශයෙන් හෝ ස්ථාන වශයෙන් සිටීමෙන් ඕනෑම දුක් පීඩා වේදනා දරාගෙන තම අරමුණ හා අපේක්ෂාවන් මත කැපවීමෙන් අතිසාර්ථක ප්‍රතිඵල ළඟා කර ගැනීමට හැකිවනවා සේම සෙනසුරු අශුභව පිහිටීමෙන් ශරීරයේ නහර පද්ධතීන් සහ ස්නායු පද්ධතියට බලපෑම් ඇති වේ. එමෙන්ම ශරීරයට දුක් දෙන දීර්ඝකාලීන රෝගයන්, අනපේක්ෂිත බලවත් ධන හානි, ලෝබකම, කම්මැලිකම, අවිශ්වාසය, බලාපොරොත්තු සුන් වීම, හදිසි අනතුරු, වාත වේදනා, කැක්කුම්, වැටීම් තැළීම්, ඇට බිඳුම්, කොර ගැසීම්, දත් දිරා යාම්, එක්තැන් වීම්, බන්ධනාගාරගත වීම්, නඩුහබවල පැටලීම්, රක්ෂා කටයුතුවලට බාධා ගෙන දීම් වැනි අයහපත් ප්‍රතිඵල ළඟා කර දෙන බව පිළිගත් මතයකි. සමාජය තුළ මහත් වූ බියක් දනවන ග්‍රහයෙකු ලෙස සෙනසුරු හැඳින්වුවත් යම් පුද්ගලයෙකු කුසලයේ කටයුතු කරන්නේ නම් බිය විය යුතු නොවේ. මන්ද අකුසලයේ යෙදෙන අයට අයහපත් ප්‍රතිඵලද, නිරන්තරයෙන්ම කුසල් වඩන පුද්ගලයන්ට කරදරයක් හිරිහැරයක් නොවන්නට වග බලාගන්නා ධර්මයට හිතැති ග්‍රහයෙකු බැවින් යම් අයෙකුට උප්පත්ති කේන්ද්‍රයේ අසුබව පිහිටා තිබුණද ඔහු හෝ ඇයට අපල තත්ත්වයන්ගෙන් මිදී සිටීමට අවස්ථාව ඇත.

එමෙන්ම සෙනසුරුගේ සුබ හෝ අසුබ තත්ත්වයන් ඇතිවීමට අනෙකුත් ග්‍රහයන්ගේ පිහිටීම් අනිවාර්යෙන්ම බලපානවා සේම අපල පිළිබඳව සාකච්ඡා කිරීමේදී සෙනසුරු ඒරාෂ්ටක පිළිබඳවද වැඩි අවධානයක් යොමු කළ යුතුය. ලග්න ඒරාෂ්ටකය යනු සෙනසුරු දොළොස්වැන්නේත්, ලග්නයෙන් දෙවැන්නේත් ගතකරන්නා වූ වසර හතහමාරක කාලයයි. ජන්ම ඒරාෂ්ටකය යනු සෙනසුරු සහ චන්ද්‍රයා එකට සිටියදී උපත ලැබීමයි. එහි කාලය තීරණය වන්නේ ග්‍රහස්ඵුටයේ ගමන් කර ඇති අංශක ගණනත්, ඊට කලින් ගෙවූ වසර තිහත් ජන්මයාට බලපෑමක් නොවන අතර, ජන්ම ඒරාෂ්ටකය වශයෙන් බලපාන්නේ චන්ද්‍රයා සිටින රාශියේ හෙවත් උපත ලබන විට සෙනසුරා සිටින රාශියේ ඉදිරි අංශක ප්‍රමාණයත් සහ ඊළඟ රාශියේ 30 අනුව ගණනය කරන කාලසීමාවය. අෂ්ටම ඒරාෂ්ටකය යනු සෙනසුරු ලග්නයෙන් අටවැන්නට පැමිණීමයි. එම කාලය වසර දෙකහමාරකි.

සෙනසුරු මහ දශා, අතුරු දශා ඇතුළු සෙනසුරුට අයත් කාලයන් තුළ යමෙකුට විනාශයද, තවත් අයෙකුට යසඉසුරු ළඟා කර ගැනීමටද හැකි බව මතක තබාගත යුතුය. එසේම ආධ්‍යාත්මිකව සිත දියුණු කරන භාවනායෝගී පුද්ගලයන්ද, මහා පින් ඇති බුද්ධ පුත්‍රයන් වහන්සේලාද බිහිකිරීමට සෙනසුරුගේ දායකත්වයේ බල දුබල තත්ත්වයන් මත රඳා පවතී.

සෙනසුරුගෙ අපලයක් ඇති බවට ගෙදරදීම සොයා ගැනීමට හැකියාව ඇත. සෙනසුරු අපල තත්ත්වයක් ඇති විට පුද්ගලයෙකුගේ පාදවල විලුඹ, දණහිස, තුනටිය ආශ්‍රිත ප්‍රදේශවල සුළු වේදනා තත්ත්වයන් ඇති වේ. එක දිගටම එම වේදනාව නොමැති අතර විටෙක නහර ඇදුම් කෑම්, හිරිවැටීම් වැනි රෝග ලක්ෂණද උරහිසේ සිට පහළට අත්වල ඇඟිලි දක්වා විටින් විට වේදනාවක් හෝ හිරිවැටීමක් මෙන්ම සුළැඟිල්ල ආශ්‍රිතව ප්‍රදේශයේ දැවිල්ලක් හෝ පිච්චෙන ස්වභාවයක්ද ඇති වේ. එමෙන්ම ඔබගේ ගේදොර, ඉඩකඩම්, යානවාහනවල මෙන්ම ව්‍යාපාරික කටයුතුවල අසාමාන්‍ය ආකාරයේ බිඳවැටීම්ද, රැකියා ස්ථානවල ඇති වන ගැටලුකාරී තත්ත්වයන්ද, අනවශ්‍ය නඩුහබවල පැටලීම්ද, හදිසි අනතුරු යනාදී කරදරද සෙනසුරු අපල පිළිබඳව දැනගැනීමට ඔබට ඉඟි කරයි. ඔබ එය නිසියාකාරව දැන ගැනීම වඩාත් වැදගත් වේ. එවැනි අවස්ථාවල ඔබ පරිපූර්ණ ජ්‍යෝතිර්වේදියෙකුට ඔබේ ජන්ම පත්‍රය ලබා දී පරීක්ෂා කරගැනීමෙන් නිවැරදිව අපල තත්ත්වයන් හඳුනාගත හැක.

එමෙන්ම සෙනසුරු අපල තත්ත්වයක් ඇති බවට ඔබට නිවැරදිම දැන ගැනීමට අතීතයේ සිට ගුරුකුලවලට පමණක් සීමා වී තිබූ විශේෂ රහස් ක්‍රමයක් පිළිබඳව අනාවරණය කිරීමට අපි සිතුවෙමු. නිවසක ආරක්ෂකයා මෙන්ම නිවසේ සුරතලා වන්නේ ආදරණීය බලු රාළය. බල්ලාට සෙනසුරු අපල හඳුනා ගැනීමට හැකියාව පවතින අතරම අපලවලින් ඔබව මුදවා ගැනීමටද බල්ලාට පුදුමාකාර හැකියාවක් ඇත. මන්ද මිනිසාට වඩා සොබාදහමේ ඇති වන ක්‍රියාවන්, වෙනස්වීම් පිළිබඳව බල්ලාට මෙන්ම අනෙකුත් සතා සිවුපාවුන්ටද ඇත්තේ උසස් සන්නිවේදන හැකියාවකි. මිනිසාගේ සිරස සිරස් අතටත් සතුන්ගේ සිරස තිරස් අතටත් පිහිටා තිබීම නිසා සතා සිවුපාවුන්ට විශ්වය තුළ පවතින අදෘශමාන බලවේග වල ක්‍රියාකාරීත්වය ඉතා හොඳින් තේරුම් ගැනීමට හැකිය.

ඔබට සෙනසුරු අපලයක් ඇත්නම් ඔබගේ ආදරණීය සුරතල් බලු රාළ ඔබ ළඟට පැමිණි විගසම ඔබගේ වම් පාදයේ විලුඹ සිට දණහිසේ පහළ කොටස දක්වා ස්පර්ශ කරමින්ද සිප ගනී. බල්ලා එම ලබාදෙන ඉඟිය තේරුම් ගැනීමට ඔබට හැකියාව ඇති නම් සෙනසුරු අපල පිළිබඳව කල්තියා දැනගැනීමටත් හැකිය. විශේෂයෙන්ම ගෙදර ස්වාමියාට මෙන්ම බලු රාළට ආදරය කරුණාව දක්වන අයගේ පමණක් මෙලෙස බල්ලා ඉඟි කිරීම දැකිය හැක. මෙම ක්‍රමවේදය අත්හදා බලා යථාර්ථය තේරුම් ගැනීමට ඔබට හැකිය. එමෙන්ම වෙනත් අසුබ, අදෘශන බලවේගවලින් ඔබට හිරිහැරයක්, කරදරයක් සිදුනොවන්නට ඔබගේ සුරතලා ඔහුගේ ජීවිතය පූජා කර හෝ ඔබව ආරක්ෂා කිරීමට කටයුතු කරන බව ඔබ ඇතැම්විට දන්නවා ඇත.

සෙනසුරු අපලවලදී සතා සිවුපාවුන් ගහකොළ යනාදී සොබාදහමට එරෙහිව ක්‍රියාකරන පුද්ගලයන්ට සෙනසුරු දැඩි සේ දඬුවම් පමුණුවන බවත්, එවැනි පුද්ගලයන්ව නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි ලෙඩරෝග, හදිසි අනතුරු, මාරාන්තික බලපෑම් ගෙන ඒමට සෙනසුරු පසුබට නොවී කටයුතු කරයි. එමෙන්ම එවැනි පුද්ගලයන් හට කරදර පමුණුවන්නේ උස් පහත් කුල භේදයකින් තොරවය. ඒ නිසාම කර්මයට ඵල දෙන්නා යන නාමයෙන් සෙනසුරු හඳුන්වන්නට පැරැන්නෝ අමතක නොකළහ.

එමෙන්ම වතුර, ගහකොළ, ඇළදොළ, ගංගා, පාෂාණ මෙන්ම ස්වාභාවික වස්තූන් උපයෝගී කර ගනිමින් සෙනසුරු අපල මෙන්ම ග්‍රහ අපලවලින් මිදෙන්නට සෘෂිවරු, මුණිවරු සඳහන් කළ ක්‍රමවේද ඇතත්, කාලයාගේ ඇවෑමෙන් බොහෝ ස්වාභාවික පිළිවෙත් අද වනවිට සැඟව ගොස් ඇත. සෙනසුරු අපලයට ශනි මෘතුංජය, නීල මණ්ඩලය, අඝෝරය වැනි යන්ත්‍ර පිළිබඳව බොහෝ පිරිස් අවධානයට යොමු කළත්, කාර්යබහුල දිවි පෙවෙතක් ගතකරන වර්තාමනය වන විට නැකැත් ක්‍රමවේද ඇතුළු යන්ත්‍ර බලගන්වන්නට අවශ්‍ය ක්‍රියාකාරකම් නිවැරදිව කිරීමට ගතවන කාලය පිළිබඳව ගැටලුවක් පවතී. සෙනසුරු අපලවනලින් මිදෙන්නට ඔබගේ නිවසේ සිටින බලුරාළට ආදරය කරුණාව දක්වමින් සහ පෝෂණය කිරීමද, සෙනසුරාදා දින 03ක් හිරු නැගෙන්නට පෙර ගිතෙල් මිශ්‍රකර කිරිබතක් සකසා කපුටන්ට දානයක් දීම, මහාමාර්ගවල අතරමං වී සිටින සුනඛයන් සඳහා සෙනසුරාදා දින තුනක් දානයක් ලබාදීම, සෙනසුරා දින 09ක් හෝ 19ක් බුද්ධ වන්දනාවක්, බෝධි වන්දනාවක නිරත වීම, මහලු හෝ තරමක කුදු හෝ හැරමිටියක් භාවිත කරන යාචකයෙකු සඳහා ආහාරපාන ලබා දී කළු මිශ්‍ර වස්ත්‍රාභරණයක් පිළිගැන්වීමද, කාක නිල් පාෂාණය සහිත මුදුවක් පැලඳීම, පුරපසළොස්වක පොහෝ දිනට දින නවයකට පෙර සිට හිමිදිරියේ බ්‍රහ්ම මූර්තියෙන් බුද්ධ වන්දනාව, බෝධි වන්දනාව, නවග්‍රහ ශාන්තිය ඇතුළු සෙත් පිරිත් සජ්ඣායනය තුළින් අනතුරුව සෙනසුරු අපලයන්ගෙන් මිදීමට හැකිය. එහිදී

ඉහත ක්‍රියාවන් සිදුකර අවසානයේ පහත ශ්ලෝකය සජ්ඣායනය කර සෙනසුරු දෙවියන්ගෙන් අපල දුරු කරන ලෙස ඉල්ලා සිටින්න.

**සූර්ය පුත්‍රො:දීර්ඝ දෙහො - විශාලාක්ෂ්‍යං ශිවප්‍රියඃ**
**දීර්ඝචාරඃ ප්‍රයන්නත්වා - පීඩං හරතු මේ ශනිඃ**

> **සෙනසුරුගෙ අපලයක් ඇති බවට ගෙදරදීම සොයා ගැනීමට හැකියාව ඇත. සෙනසුරු අපල තත්ත්වයක් ඇති විට පුද්ගලයෙකුගේ පාදවල විලුඹ, දණහිස, තුනටිය ආශ්‍රිත ප්‍රදේශවල සුළු වේදනා තත්ත්වයන් ඇති වේ. එක දිගටම එම වේදනාව නොමැති අතර විටෙක නහර ඇදුම් කෑම්, හිරිවැටීම් වැනි රෝග ලක්ෂණද උරහිසේ සිට පහළට අත්වල ඇඟිලි දක්වා විටින් විට වේදනාවක් හෝ හිරිවැටීමක් මෙන්ම සුළැඟිල්ල ආශ්‍රිතව ප්‍රදේශයේ දැවිල්ලක් හෝ පිච්චෙන ස්වභාවයක්ද ඇති වේ.**

# "එන්නත් ජාතිකවාදයක්" ගැන WHO ප්‍රධානියාගෙන් අනතුරු ඇඟවීමක්

ලොව පුරා ක්‍රියාත්මක COVID-19 වෛරසයට එරෙහි එන්නත්කරණ ක්‍රියාවලියේදී "එන්නත්කරණ ජාතිකවාදයක්" පිළිබඳව තමන්ට වාර්තා වන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අධ්‍යක්ෂ ජනරාල් ටෙඩ්‍රොස් අදානොම් ගෙබ්රෙයේසුස් යළිත් වරක් අවධාරණය කරයි. ඒ අනුව මේ තත්ත්වයත් සමග මෙම එන්නත් වැඩසටහන් දැවැන්ත විෂමතාවක් බවට පත්වීමේ අවස්ථාවක් පවතින බවත් ඔහු සඳහන් කරයි.

ඒ අනුව මෙම වසංගත තත්ත්වයත් සමග ලොව පුරා පවතින මෙම උපයෝජනයේ විෂමතාව පිළිබඳ අනාවරණය කෙරුණු බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසා සිටියි. එහිදී ලෝකයේ පොහොසත් රටවල් සහ දුප්පත් රටවල් අතර මෙම වසංගතය පිටුදැකීමේ කටයුත්තේ වඩා වැඩි පරතරයක් ඇති වීම එහි ප්‍රතිඵලය බවද ඔහු පෙන්වා දෙයි.

"මේ වසංගතය මර්දනය සඳහා දායක කරගත හැකි හොඳම උපාංගය වන මෙම එන්නත් එක සමානව බෙදී නොයෑම අද වනවිට දරුණුම තර්ජනය බවට පත්වෙලා." ඔහු පවසයි.

මෙහිදී 2009 වසරේ ලොව පුරා ව්‍යාප්ත වූ H1N1 වසංගත අවස්ථාවේදී එය පාලනය සඳහා ඉදිරිපත් කළ එන්නත් සියලු දෙනාටම ලබාගත හැකි වූ බවත්, ඒ හරහා වසංගතය නිමාවට පත් කෙරුණු බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා සිහිපත් කර දෙයි.


එහෙත් අද තත්ත්වය වෙනස් බවත් පොහොසත් රටවල් මේ වනවිට සිය රටවල් තුළ එන්නත්කරණය අරඹා තිබෙද්දී, දුප්පත් රටවලට එම එන්නත් වැඩසටහන් ඇරඹීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කරයි. ඒ අනුව මෙම රටවලට එන්නත් නොලැබීම යනු වසංගත තවත් කාලයකට



ලොව තුළ පැවතීම බවද ඔහු පෙන්වා දෙයි.

ඒ අනුව මෙම තත්ත්වයට පිළියමක් ලෙස එන්නත්කරණයේදී පසුපසට තල්ලු වන දුප්පත් රාජ්‍යයන් වෙත සහාය දීමක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් COVAX වැඩසටහන දියත් කර තිබේ. ඒ හරහා සෑම සියලු දෙනාටම අවශ්‍ය එන්නත් ලබාගැනීම වෙනුවෙන් අරමුදල් සැපයීම එහි අරමුණ වී ඇතැයිද ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩිදුරටත් සඳහන් කර තිබේ.

## COVID-19 ආසාදිතයෝ ලක්ෂ 1026 ඉක්මවති



ලොව පුරා වාර්තා වන COVID-19 ආසාදිතයෝ සංඛ්‍යාව ඊයේ සවස 7.00 වන විට 102,667,800ක් දක්වා ඉහළ නැග තිබෙන බව එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ නව කොරෝනා තොරතුරු මධ්‍යස්ථානය මගින් සඳහන් කෙරිණි. ඒ අතරින් වැඩිම ආසාදිතයන් පිරිස එක්සත් ජනපදයෙන් වාර්තා වන අතර එය 26,076,028 කි. එසේම දෙවැනි වැඩිම ආසාදියන් වාර්තා වන ඉන්දියාවේ එම සංඛ්‍යාව 10,746,174 කි. බ්‍රසීලයෙන් වාර්තා වන සංඛ්‍යාව 9,179,975 කි. රුසියාවෙන් සහ එක්සත් රාජධානියෙන් වාර්තා ආසාදිතයන් සංඛ්‍යාව 3,808,348ක් සහ 3,806,993ක් දක්වා ඉහළ නැග ඇත.

## යුරෝපයේ සිට පැමිණෙන සංචාරකයන්ට ඉරානයෙන් දැඩි සීමාවක්



යුරෝපා රාජ්‍යයන්හි සිට ඉරානය වෙත පැමිණෙන සංචාරකයන් එරට තුළ සිදුකරන PCR පරීක්ෂාවකදී COVID-19 වෛරසය ආසාදිත නොවන බවට සනාථ කෙරුණත් ඔවුන් වෙත සති දෙකක නිරෝධායන සීමාවක් පැනවීමට තීරණය කෙරී ඇතැයි එරට ජාතික කොරෝනා වෛරස කාර්ය සාධක බළකාය පවසයි.

එහි ප්‍රකාශක අලිරෙසා රායිසි එරට රාජ්‍ය රූපවාහිනිය හරහා මේ පිළිබඳව අනාවරණය කර තිබේ. ඒ අනුව එම යුරෝපා ජාතිකයන් තමන් පැමිණෙන රටෙහිදී COVID-19 පරීක්ෂාවක් සිදු කරගෙන එහි සෘණාත්මක වාර්තාවක් රැගෙන ආවද, ඉරානය තුළදීද නැවතත් පරීක්ෂාවක් සිදුකර එයද සෘණාත්මක වුවත්, ඔවුන් සියලු දෙනාම මෙලෙස ස්වයං නිරෝධායනයකට ලක්කරන බව ඔහු පවසා ඇත.

මේ අතර ඉරාන ජනතාව දැනට රට තුළ ක්‍රියාත්මක සෞඛ්‍ය ක්‍රමවේද ආරක්ෂා කිරීම අනිවාර්ය බවත්, එසේ නොවුණහොත් ඉදිරි මාස දෙක ඇතුළතදී යළිත් වරකට රට තුළ වසංගත රැල්ලක් ඇතිවීමේ හැකියාවක් පවතින බවත් එරට ජනාධිපති හස්සන් රොයුහානි පැවසූ බවද ඉරාන මාධ්‍ය සඳහන් කරයි. එසේම මේ වනවිටත් ඉරානය එරට තුළ COVID-19 මර්දන එන්නතක් නිපදවීමට කටයුතු අරඹා ඇතැයිද ඔහු පවසා තිබේ.

## ප්‍රංශය තුළ තෙවැනි ලොක්ඩවුන් කිරීමක් නෑ

◄ FRANCE ►





ප්‍රංශය තුළ වාර්තා වන COVID-19 වසංගතයේ තෙවැනි ව්‍යාප්තිය හේතුවෙන් ඉදිරියේදී රට තුළ තෙවැනි ලොක්ඩවුන් කිරීමක් සිදු නොකරන බව එරට බලධාරීන් පවසයි. ඒ වෙනුවට රට තුළ දැඩි සංචරණ සීමා පනවන බවත්, දැනට රට පුරා ක්‍රියාත්මක සවස 6.00 සිට අලුයම 6.00 දක්වා වූ ඇඳිරි නීතිය එලෙසින්ම වන බවත් සඳහන් වෙයි.

ප්‍රංශ අගමැති ජීන් කැස්ටෙක්ස් පසුගිය සතිඅන්තයේදී මේ පිළිබඳව අනාවරණය කර තිබේ. ජනපති එමානුවෙල් මක්රෝන් සහ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් අතර පැවැත් වූ හමුවකින් අනතුරුව ප්‍රංශ රජය මෙම තීරණය ගෙන තිබේ.

"අපි දන්නවා මේ තත්ත්වය ප්‍රංශ ජනතාවට ඉතාමත් දැඩි ලෙස බලපා තිබෙනවා. ඒ නිසා තෙවැනි ලොක්ඩවුන් තත්ත්වයකට රට පත් නොකිරීමට අප තීරණය කර තිබෙනවා. එහිදී දැනට පවතින ඇඳිරි නීතියට අමතරව තවත් අමතර සීමා කිරීම් පැනවීමට අපි තීරණය කළා." යනුවෙන් ඔහු පවසා ඇත.

ඒ අනුව යුරෝපා සංගමයට අයත් නොවන රාජ්‍යයන් හා ප්‍රංශය අතර පවතින දේශසීමා අත්‍යවශ්‍ය සංචරණයන්ට හැර අනෙක් අවස්ථාවකදී වසා දැමීමටත්, යුරෝපා සංගමයද ඇතුළුව විදෙස් රටක සිට ප්‍රංශය වෙත පැමිණෙන අයෙකු සෘණාත්මක PCR පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමත් අනිවාර්ය කෙරී ඇත. එසේම පාසල් තවදුරටත් විවෘතව තැබීමටත්, හැකි සෑම දෙනාටම නිවෙස්හි සිට රාජකාරි කරන ලෙසත් අගමැතිවරයා ඉල්ලා තිබේ.

◄ ALGERIA ►

## ඇල්ජීරියාවත් COVID-19 එන්නත්කරණය අරඹයි



අප්‍රිකානු මහාද්වීපයේ පිහිටි ඇල්ජීරියාව පසුගිය සෙනසුරාදා (30දා) දිනයේදී සිය COVID-19 එන්නත්කරණය ඇරඹූ බව විදෙස් මාධ්‍ය පවසයි. එරට ඇල්ජයර්ස් අගනුවර බ්ලිඩා නගරයේදී මෙම කටයුතු සිදුව තිබේ. මෙම නගරය 2020 වසර මුලදී එරට තුළ ප්‍රථම වරට COVID-19 රෝගියෙකු හමුවූ පළමු වැනි ස්ථානය ලෙසින්ද සැලකෙයි.

රුසියාවේ ගැමෙලියා ආයතනය මගින් නිපදවූ SputnikV එන්නත මෙලෙස ජනතාව වෙත ලබා දී තිබේ. මෙම වැඩසටහන යටතේ පළමුවෙන්ම සෞඛ්‍ය අංශ සේවකයන් වෙත, වැඩිහිටියන් වෙත මෙන්ම අවදානමට ලක්ව සිටින පිරිස් වෙත මුල්ම එන්නත් ලබාදෙන බව රජය පවසයි.

ඇල්ජීරියානු රජය මගින් දැනටමත් බ්‍රිතාන්‍යයේ AstraZeneca සමාගම මගින් සහ චීනයේ Sinopharm සමාගම මගින් නිපදවා ඇති එන්නතක්ද ඇණවුම් කර කර ඇතැයි සඳහන් වෙයි. ඒ අනුව ඉදිරියේදී මෙම එන්නත්කරණ වැඩසටහන තවදුරටත් පුළුල් කිරීම අපේක්ෂාව බව එරට සෞඛ්‍ය අමාත්‍යවරයා සඳහන් කර සිටියි.

## COVID-19 වසංගතය හේතුවෙන් එමීරය විදේශිකයන්ට පුරවැසිභාවය දීමට යයි



◄ UAE ►

එක්සත් අරාබි එමීරයේ වෙසෙන විදේශිකයන් කිහිපදෙනෙකු වෙත පුරවැසිභාවය පිරිනැමීම එරට බලධාරීන් තීරණය කර ඇතැයි වාර්තා වෙයි. COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති එරට ආර්ථිකය වෙත ලබාදෙන සහන යටතේ මෙම පුරවැසිභාවය ලබාදෙන බව වාර්තා වෙයි.

ඒ අනුව මේ පිළිබඳව නිවේදනයක් නිකුත් කළ ඩුබායි නුවර පාලකයා වන ෂෙයික් මොහොමඩ් බින් රෂීඩ් අල් මක්ටොයුම්, "ආයෝජකයන්, විශේෂඥ කුසලතා ඇති පිරිස් මෙන්ම විද්‍යාඥයන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, කලාකරුවන්, ග්‍රන්ථ කර්තෘවරුන් ඇතුළු වෘත්තීන්හි නිරත වන පිරිස් වෙත සහ ඔවුන්ගේ පවුල් වෙත මෙම නව ක්‍රමවේදය හරහා එක්සත් අරාබි එමීරය තුළ පුරවැසිභාවය හිමි කරගත හැකියි." යනුවෙන් පවසා ඇත.

ඒ අනුව එක්සත් අරාබි එමීරයට අයත් එමීර හතෙන් එම පුරවැසිභාවය ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සහිත පුද්ගලයන් නම් කෙරනු ඇති බවත්, එලෙස පුරවැසිභාවය හිමි වන පුද්ගලයන්ට තමන්ගේ මුල් පුරවැසිභාවය තවදුරටත් පවත්වාගෙන යා හැකි බවත් ෂෙයික් මොහොමඩ් සිය ට්විටර් ගිණුම තුළ සඳහන් කර ඇත.

කෙසේ වෙතත් එක්සත් අරාබි එමීරය COVID-19 වසංගතය බවට සඳහන් කරමින් ගෙන ඇති මෙම තීරණය පිටුපස බොහෝ අරමුණු තිබෙන බව විචාරකයෝ පවසති. අද වනවිට එක්සත් අරාබි එමිරයේ ජනගහනයෙන් එරට පුරවැසියන්ගේ නියෝජනය සුළු වන අතර, එරට පැමිණ සිටින සංක්‍රමණික කම්කරුවන්ගේ සංඛ්‍යාව ඊට වඩා වැඩිය. එසේම එරට තුළ ක්‍රියාත්මක අඩු බදු ක්‍රමවේදය සහ සුඛෝභෝගී දැවැන්ත ව්‍යාපෘති නිසාද එරට වෙත සංචාරක ආකර්ෂණය ඉහළ යමින් පවතී.

## Hualong One තාක්ෂණය යොදා ඉදිකළ චීනයේ ප්‍රථම න්‍යෂ්ටික විදුලි බලාගාරය මෙහෙයුම් අරඹයි

- ලොව තෙවැනි පරම්පරාවේ න්‍යෂ්ටික විදුලි බලාගාර තාක්ෂණයක් භාවිත කරන සිවුවැනි රට චීනය වෙයි

◄ CHINA ►



චීනය තුළ නිපදවන ලද තෙවැනි පරම්පරාවේ න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක මාදිලියක් වන Hualong One තාක්ෂණය යොදා ගනිමින් ඉදිකළ එරට පළමු වැනි න්‍යෂ්ටික විදුලි බලාගාරය පසුගිය සෙනසුරාදා (30දා) දිනයේදී සිය වාණිජ මෙහෙයුම් ඇරඹූ බව චීනයේ ජාතික න්‍යෂ්ටික සංස්ථාව පවසයි.

චීනයේ ගිනිකොණදිග පිහිටි ෆුජිආන් පළාතේ ෆුකින්ග්හි මෙම න්‍යෂ්ටික බලාගාරය පිහිටුවා තිබේ. චීන මාධ්‍ය සඳහන් කරන ආකාරයට එක්සත් ජනපදය, ප්‍රංශය සහ රුසියාවට පසුව මෙලෙස තෙවැනි පරම්පරාවේ න්‍යෂ්ටික විදුලි බලගාර තාක්ෂණයක් භාවිත කරන සිවුවැනි රට බවටද චීනය පත්ව තිබේ.

මෙම Hualong One තාක්ෂණය චීනයේ ජාතික න්‍යෂ්ටික සංස්ථාව සහ චීනයේ ජෙනරල් නියුක්ලියර් පවර් කෝපරේෂන් යන සමාගම් එක්ව ඉදිරිපත් කර වූවකි. එහිදී මෙම බලාගාරයට අවශ්‍ය උපාංගවලින් 88%ක්ම දේශීයව නිපදවා තිබේ. සියලුම මූලික උපාංගද ඒ අතර වන බව පැවසෙයි.

මෙම න්‍යෂ්ටික බලාගාරය තවත් වසර 60ක ආයු කාලයක් සඳහා නිර්මාණය කර තිබේ. එහිදී නැවතත් න්‍යෂ්ටික ඉන්ධන යොදවන තෙක් එහි පිහිටි ප්‍රතික්‍රියාකාර 177ක් තවත් මාස 18ක කාලයක් නොකඩවා ක්‍රියාත්මක වෙයි. මෙම එක් ඒකකයක් තුළ කිලෝවොට් මිලියන 1.16ක උත්පාදන ධාරිතාවක් පවතින අතර, එය වසරකට කිලෝවොට් පැය බිලියන 10ක විදුලියකි.



මෙම විදුලිබලය මිලියනයක ජනතාවක් වෙසෙන මැදි මට්ටමේ සංවර්ධිත රාජ්‍යයක වාර්ෂික විදුලි බල අවශ්‍යතාව සම්පූර්ණ කරවන්නකි. එසේම මෙම බලාගාරය හරහා වාර්ෂිකව ගල්අඟුරු ටොන් මිලියන 3.12ක් ආරක්ෂා කරන බවත්, ඒ හරහා වසරකට කාබන්ඩයොක්සයිඩ් පිටවීම ටොන් මිලියන 8.16කින් අඩු කරවන බවත් පැවසෙයි.

## අභ්‍යවකාශයේදී ප්‍රථම පැළ බද්ධය සිදු කරයි



අභ්‍යවකාශයේදී ප්‍රථම පැළ බද්ධය සිදු කරමින් ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ එළවළු නිෂ්පාදන පද්ධති පරිශ්‍රය තුළදී පළමු වැනි වරට පැළයක් බද්ධ කිරීමක් සිදු කළ බව නාසා ආයතනය පවසයි. එම මධ්‍යස්ථානයට ගොස් සිටිනි නාසාහි ගගනගාමී මයික් හොප්කින්ස් විසින් මෙම පැළ බද්ධය සිදුකර තිබේ. එහිදී අබ සහ සලාද ගස් වර්ග කිහිපයක් මෙලෙස බද්ධ කිරීමට ලක්කර ඇත.

විශේෂයෙන්ම නාසා ආයතනය මගින් ඉදිරියේදී සිදුකිරීමට සැලසුම් කර ඇති දිගුකාලීන මෙහෙයුම්වලදී ඒ සඳහා සම්බන්ධ වන ගගනගාමීන් වෙනුවෙන් අවශ්‍ය පෝෂණය ලබාදීම වෙනුවෙන් මෙලෙස අභ්‍යවකාශය තුළ වගා කිරීම පිළිබඳව පර්යේෂණ සිදුකරමින් සිටියි.

මෙහිදී මැටි පාදක කරගත් වගා මාධ්‍යයක් සහ පොහොර එක්කොට සකස් කරගත් විශේෂිත පිරවුමක් තුළ මෙම පැළ වගා කිරීම සිදු කරයි. එහිදී අබ පැළ ඉතා හොඳින් වැඩෙමින් ඇති අතර, සලාද පැළවල වර්ධනය යම් පමණකින් මන්දගාමී බවට ගගනගාමී මයික් හොප්කින්ස් හඳුනාගෙන ඇත. ඒ අනුව මෙලෙස වර්ධනය බාල වූ සලාද ගස් වෙත තවත් රිකිලි බද්ධ කරමින් ඒවායේ වර්ධනය වේගවත් කිරීමට හැකියාව ලැබුණු බව හොප්කින්ස් සඳහන් කරයි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මෙම වැඩසටහනේ වගා විද්‍යාඥයෙකු වන ගිඕයිආ මාසා, "මෙම අත්හදා බැලීම ඉතාමත් සුවිශේෂයි. එය මගින් ගගනගාමීන්ගේ දක්ෂතාව පෙන්නුම් කරනවා. ඒ වගේම යමක් සිදු කිරීමේදී ඔවුන්ගේ කැපවීම ඉන් දක්වනවා. ඒ වගේම ක්ෂුද්‍ර ගුරුත්වයකදී පවතින වෙනසත් මෙහිදී දැකගත හැකියි." යනුවෙන් පවසයි.

ඒ අනුව මෙම සාර්ථකත්වයත් සමග ඉදිරියේදී පෘථිවිය මතටත් වඩා හොඳින් මෙම ක්ෂුද්‍ර ගුරුත්වය තුළදී පැළෑටි වර්ධනය සඳහා අවස්ථාවක් උදා කරදෙනු ඇතැයි බලාපොරොත්තු තබා තිබෙන බවද මෙම පර්යේෂණ කණ්ඩායම් සඳහන් කරයි.

## "බ්ලැක් ලයිව්ස් මැටර්" නොබෙල් සාම ත්‍යාගයට යෝජනා වෙයි






ඇමෙරිකා එක්සත් ජනපදය තුළ කළු ජාතිකයන්ට එරෙහිව එල්ල වන පීඩා කිරීම්වලට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා 2013 වසරේදී පිහිටවුණු 'බ්ලැක් ලයිව්ස් මැටර්' නම් සංවිධානය මීළඟ නොබෙල් සාම ත්‍යාගය සඳහා යෝජනා කෙරී ඇතැයි වාර්තා වෙයි.

පසුගිය වසරේ මැයි මාසයේදී එක්සත් ජනපදයේ පොලිස් නිලධාරියෙකු අතින් සිදුවුණු ජෝර්ජ් ෆ්ලොයිඩ් නම් කළු ජාතිකයාගේ ඝාතනයත් සමග මෙම සංවිධානය පිළිබඳ කතාබහ වැඩිවිය. එහිදී එම සංවිධානයේ මූලිකත්වයෙන් එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍ය ඇතුළු යුරෝපා රාජ්‍යයන්හිදීද දැවැන්ත උද්ඝෝෂණ ක්‍රියාත්මක විය. එම තත්ත්වයත් සමග ලොව තුළ වර්ගවාදී අසාධාරණයන්ට එරෙහි ගෝලීය ව්‍යාපාරයක් තත්ත්වයට පත්වීමට එම සංවිධානයට හැකියාව ලැබී ඇතැයි පැවසෙයි.

## මාස 8කට පසුව තායිවානයෙන් COVID-19 මරණයක්



2020 වසරේ මැයි මාසයෙන් පසුව ප්‍රථම වරට තායිවානයෙන් COVID-19 මරණයක් වාර්තා වී තිබෙන බව එරට සෞඛ්‍ය බලධාරීන් සඳහන් කරයි. මෙහිදී මරණයට පත්ව ඇති තැනැත්තා 80 හැවිරිදි කාන්තාවක බව හඳුනාගෙන ඇත. දේශීය ව්‍යාප්ත වූ COVID-19 පොකුරක ආශ්‍රිතයෙකු වන මෙම කාන්තාව COVID-19 ආසාදිත බවට හඳුනාගැනීමෙන් අනතුරුව රෝහල්ගත කර තිබේ.

පසුගිය මාසයේදී වාර්තා වූ මෙම ආසන්නතම වසංගත ව්‍යාප්තියත් සමග මේ දක්වා එරට තුළ රෝගීන් 19දෙනෙකු හඳුනාගෙන ඇත. මීට අමතරව විදේශයන්හි සිට පැමිණි 909දෙනෙකු තුළත් වෛරසය ඇති බවට සනාථ වී තිබේ. පසුගියදා සිදුවුණු මෙම මරණයත් සමග මේ දක්වා එරට තුළ සිදුව ඇති COVID-19 මරණ සංඛ්‍යාව 8ක් දක්වා ඉහළ නැග තිබේ.

## කැපිටල් හිල් උද්ඝෝෂණයට ට්‍රම්ප් හිතවාදිනියක් මුදල් දීලා



ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් අගනුවර කැපිටල් හිල් ගොඩනැගිල්ල තුළ පසුගිය ජනවාරි 06දා ඇති වූ ප්‍රචණ්ඩකාරී උද්ඝෝෂණය සඳහා එවකට ජනපතිවරයාව සිටි ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ආධාරකාරිනියක මුදල් ලබාදී ඇතැයි වාර්තා වෙයි.

ඒ අනුව එරට තුළ සුප්‍රසිද්ධ සුපිරි වෙළෙඳ සැල් ජාලයක් වන Publix හි හිමිකාරිනිය වන ජූලි ජෙන්කින්ස් විසින් මෙම උද්ඝෝෂණය පැවැත්වීම සඳහා ඩොලර් ලක්ෂ 3ක මුදලක් ප්‍රදානය කර ඇතැයි පැවසෙයි. ඇය ට්‍රම්ප්ගේ 2020 ජනපතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයේ මුල් පෙළේ දායිකාවක ලෙසින්ද හඳුනාගෙන ඇත.

එක්සත් ජනපද ඉතිහාසයේ වඩාත් දරුණුතම කළු පැල්ලමක් සටහන් වූ මෙම සිදුවීම අවස්ථාවේදී එක් පොලිස් නිලධාරියෙකු ඇතුළු පස්දෙනෙකු මරණයට පත්වූ අතර, තවත් 135දෙනෙකු පොලිස් අත්අඩංගුට පත්විය. එම අවස්ථාවේදී එරටට තේරීපත්ව සිටි ජනපති ජෝ බයිඩන්ගේ ජයග්‍රහණය ස්ථිර කරවීම සඳහා කැපිටල් හිල් ගොඩනැගිල්ලේ පැවැත්වෙමින් තිබූ ඡන්දය කඩාකප්පල් කිරීම මෙහි අරමුණ විය. මේ සඳහා සිය රිපබ්ලිකන් පක්ෂ ආධාරකරුවන් උසි ගැන්වූ බවට ට්‍රම්ප්ට චෝදනා එල්ල වී තිබේ.

# ක්‍රිකට් නිලවරණයේදී පාසල් ක්‍රිකට් සංගමයටත් ඡන්ද අයිතිය හිමිවන ලකුණු

● පැතුම් ශ්‍රී විජේරත්න

මෙම වසරේ පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය සඳහා මෙතෙක් ඡන්ද අයිතිය අහිමි කර තිබූ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයටද ඡන්ද අයිතිය හිමිවන ලකුණු පහළ වී තිබේ.

මේ බව නිරීක්ෂණය වූයේ නිලවරණ මෙහෙය වන විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු මාලිනී ගුණරත්න මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණ කමිටුව අදාළ ඡන්ද හිමි ක්‍රීඩා සමාජ ශ්‍රී ලංකා ක්‍රිකට් සාමාජික සංගම් වෙත යොමු කිරීමත් සමගිනි.

නිලවරණයේ ඡන්ද හිමි නාමලේඛනයට විරෝධතා දැක්වීමේ කාලය අද (01දා) පස්වරු 4.00ට අවසන් වන අතර, එම විරෝධතා ලිඛිතව සකස් කර නො. 35, මෛට්ලන්ඩ් පෙදෙස, කොළඹ-07 යන ලිපිනයට ගෙනවිත් භාරදීමට හෝ slcelection2021@srilankacricket.lk යන විද්‍යුත් ලිපිනයට ඊමේල් කිරීමේ හැකියාව පවතින බව නිලවරණ කමිටුව සාමාජික සංගම්වලට දන්වා තිබේ.

මෙවර නිලවරණය සඳහා සමස්ත ඡන්ද 146ක් පවතින අතර ඉන් 02ක් ඉවත් කර තිබේ. ඒ අනුව මෙවර නිලවරණය සඳහා සමස්ත ඡන්ද 144ක් ඡන්දය භාවිත කිරීමට නියමිතය. ඊට පළාත් ක්‍රිකට් සංගම් 05ක් (දකුණු පළාත් ක්‍රිකට් සංගමය ඊට ඇතුළත් කර ඇතත් දැනට ඡන්ද හිමිකම නොමැත යනුවෙන් දක්වා තිබේ), ක්‍රිකට් සංගම් (Cricket Associations) 06ක් දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් 22ක්, පාලන ක්‍රීඩා සමාජ 29ක්, අනුබද්ධ ක්‍රීඩා සමාජ 23ක් (කළුතර කායවර්ධන කවය ඊට ඇතුළත් කර ඇතත් දැනට ඡන්ද හිමිකම නොමැත යනුවෙන් දක්වා තිබේ) සුදුසුකම් ලබා තිබේ.

මෙහිදී පළාත් ක්‍රිකට් සංගම්, ක්‍රිකට් සංගම්, දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් සහ පාලන ක්‍රීඩා සමාජ සඳහා ඡන්ද 02 බැගින්ද, අනුබද්ධ ක්‍රීඩා සමාජ සඳහා එක් ඡන්දය බැගින්ද සුදුසුකම් ලබාදී ඇත.

දකුණු පළාත් ක්‍රිකට් සංගමයට සහ කළුතර කායවර්ධන කවය ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කර ඇතත් දැනට ඡන්ද හිමිකම නොමැත යනුවෙන් දක්වා තිබේ.

මේ අතර 2016 වසරේ සිට පාසල් ක්‍රිකට් සංගමයට ඡන්ද හිමිකම අහිමි කරමින් ක්‍රිකට් විධායක කමිටුවේ ස්ථිර එක් උපසභාපති තනතුරක් නිතරගයෙන් ලබාදීමට ව්‍යවස්ථා සංශෝධනයක් සහ ක්‍රීඩා පනතට රෙගුලාසි ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත් හිටපු ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා යොමු කළ අදාළ ගැසට් පත්‍රයට අනුව පාසල් ක්‍රිකට් සංගමයට මෙවර නිලවරණය සඳහා ඡන්ද හිමිකම හිමිවන ලකුණු පහළ වී තිබේ.

2016 වසරේ සිට මෙතෙක් සියලුම ක්‍රීඩා සංගම් (ක්‍රිකට් ඇතුළුව) තම විධායක කමිටුවේ ස්ථිර එක් උපසභාපති තනතුරක් නිතරගයෙන් ලබාදී නිලවරණයේදී ඡන්ද හිමිකම අහිමි කර තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පසුගිය නිලවරණයේදීද (2019 වසරේ පැවැති) මෙය දැකගත හැකි විය.

හිටපු ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා යොමු කළ අදාළ ගැසට් පත්‍රයේ සඳහන් වනුයේ,

(අ)(i) වැනි අයිතමය ඉවත් කර පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

(i) සභාපතිවරයා සහ උපසභාපතිවරයන්, උපසභාපතිවරයන්ගෙන් එක් තැනැත්තකු, කමිටු රැස්වීම්වලදී ඡන්ද අයිතිය භාවිත කිරීමට අයිතිය නොමැති, අදාළ පාසල් සංගම්වල නියෝජිතයකු විය යුතුය' යන්නයි.

කෙසේ වෙතත් මෙහි කමිටු රැස්වීම් යන්න ක්‍රිකට් විධායක කමිටුවේ ඡන්ද අයිතිය බවත් මහසභා රැස්වීමේ ඡන්ද අයිතිය නොවන බවත් පාසල් ක්‍රිකට් සංගමයේ නිලධාරියෙකු 'අද'ට පැවසීය. එහෙයින් ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයට මෙවර ක්‍රිකට් නිලවරණයේදී ඡන්ද 02ක් අනිවාර්යෙන් හිමිවිය යුතු බව හෙතෙම දැඩිව අවධාරණය කර සිටියේය.

මේ අනුව බොහෝදුරට මෙවර ක්‍රිකට් නිලවරණය සඳහා ඡන්ද අයිතිය හිමිවනු ඇතැයි පාසල් ක්‍රිකට් සංගමය තර්ක කරයි.

එහෙත් මෙහි අවසාන තීන්දුව ගැනීමට බොහෝවිට මෙම කරුණ ක්‍රීඩා අමාත්‍යවරයා දක්වා දිග්ගැස්සෙනු ඇතැයි වාර්තා වේ.

# 'එස්. ආර්.' ද. පළාත් කාන්තා, පිරිමි විවෘත මේසපන්දු තරගාවලියට පෙබ. 01 දක්වා අයදුම්පත් භාරගැනේ

● කරන්දෙණිය එම්. සුසිල් ප්‍රියන්ත

එස්. ආර්. මේස පන්දු ඇකඩමිය පළමු වරට සංවිධානය කරනු ලබන දකුණු පළාත් කාන්තා, පිරිමි විවෘත ශ්‍රේණිගත කිරීමේ මේසපන්දු තරගාවලිය සඳහා අයදුම්පත් පෙබරවාරි මස 01වැනිදා දක්වා භාරගැනේ.

අයදුම්පත් ප්‍රධාන පුහුණුකරු, එස්.ආර්. සමීර රාජා මහතා, එස්.ආර්. මේසපන්දු ඇකඩමිය, අංක 117සී, ආඳදොළ පාර, වතුගෙදර යන ලිපිනයට යොමු කළ යුතුය.

අයදුම්පත් ලැබීමෙන් පසු තරගාවලි ක්‍රීඩක, ක්‍රීඩිකා සටහන සැකසීම (Draw) පෙබරවාරි මස 02වැනිදා වතුගෙදර පිහිටි එස්. ආර්. මේසපන්දු ඇකඩමියේදී සිදු කෙරේ.

තරගාවලිය පෙබරවාරි මස 6, 7 යන දෙදින තුළ බළපිටිය රේවත ජාතික පාසල් ස්වර්ණ ජයන්ති ශාලාවේදී පැවැත්වේ.

කෝවිඩ්-19 ව්‍යසනයෙන් පසුව දකුණු පළාතේ ආරම්භ කෙරෙන පළමු විවෘත ශ්‍රේණිගත කිරීමේ මේසපන්දු තරගාවලිය මෙය වන අතර, මේ තරගාවලියට සහභාගි විය හැක්කේ ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුනට අයත් දකුණු පළාතේ මේසපන්දු ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ට පමණි.

වයස 08න් පහළ, 10න් පහළ, 12න් පහළ, 15න් පහළ, 18න් පහළ, 21න් පහළ 40න් පහළ, විවෘත, කාන්තා, පිරිමි ඒකල ලෙස හා වයස 15න් පහළ යුගල, පිරිමි, කාන්තා ලෙස හා වයස 8න් පහළ ආධුනික පිරිමි, කාන්තා ඒකල ලෙස තරගාවලිය පැවැත්වේ.

මේ තරගාවලිය සඳහා වැඩි විස්තර තරග සංවිධායක සමීර රාජා මහතා (0775013619 හෝ 0770232377) ඇමතීමෙන් ලබාගත හැකිය.




# ඔස්ට්‍රේලියානු විවෘත ටෙනිස් තරගාවලිය නැරඹීමට තිස්දහසකට අවසර



● ඕෂිත වරකපිටිය

එළඹෙන පෙබරවාරි මසදී ආරම්භ වන ඔස්ට්‍රේලියානු විවෘත ටෙනිස් තරගාවලිය නැරඹීමට දිනකට තිස්දහසක ප්‍රේක්ෂක සංඛ්‍යාවක් වෙනුවෙන් අවසර ලබාදීමට ඔස්ට්‍රේලියානු බලධාරීන් තීරණය කර ඇත.

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියානු ආණ්ඩුකාරවරයා විසින් මෙම තීරණය ප්‍රකාශයට පත් කොට ඇත. මෙහිදී තරගාවලියේ මුල් දින 8දී නැරඹීම වෙනුවෙන් ප්‍රේක්ෂකයන් තිස්දහසකට අවසර ලැබෙන අතර, ඔවුන්ට දිවා හා රාත්‍රී තරග සඳහා වෙන් වෙන් වශයෙන් නැරඹීමට අවස්ථාව ලබාදීමට නියමිතය.

අනතුරුව අවසන් පූර්ව වටයේ සිට එම සංඛ්‍යාව විසිපන්දහස දක්වා අඩු කිරීමට නියමිතය. මෙය පසුගිය වර්ෂයේ තරගාවලිය නැරඹීමට දිනකදී පැමිණි ප්‍රේක්ෂක සංඛ්‍යාවේ සාමාන්‍යයෙන් අඩක් පමණ වේ.


වසරේ පැවැත්වෙන ප්‍රධානම ටෙනිස් තරගාවලි හෙවත් ග්‍රෑන්ඩ්ස්ලෑම් ටෙනිස් තරගාවලි හතරෙන් පළමුවැන්න වන මෙය එළඹෙන පෙබරවාරි 8වැනිදා සිට 21 වැනිදා දක්වා ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න්හිදී පැවැත්වීමට නියමිතය.

කෙසේ වෙතත් තරගාවලිය පැවැත්වෙන දින 14 තුළදී ලක්ෂ 4කට ආසන්න ප්‍රේක්ෂක සංඛ්‍යාවක් තරගාවලිය නැරඹීමට පැමිණෙනු ඇතැයි බලධාරීන් විශ්වාසය පළ කරයි. එය පසුගිය වර්ෂයේ තරගාවලිය නැරඹීමට පැමිණි සංඛ්‍යාවෙන් හරි අඩක් පමණ වේ.

මේ අතර මෙවර තරගාවලිය වෙනුවෙන් ක්‍රීඩකයන්, නිලධාරීන් හා සේවකයන් එක්දහස් හත්සියයකට අධික සංඛ්‍යාවක් ඔස්ට්‍රේලියාව බලා මේ වනවිට පැමිණ ඇත. ඔවුන් සියලු දෙනා නවාතැන්වල නිරෝධායනයට ලක්වන බව ඔස්ට්‍රේලියානු බලධාරීහු පවසා සිටිති. ඔස්ට්‍රේලියාව මේ වනවිට කෝවිඩ් -19 ව්‍යාප්තිය හොඳින් පාලනය කර ඇති අතර, මෙම වර්ෂය ආරම්භයේ සිට ඔස්ට්‍රේලියාවේ තවමත් කෝවිඩ්-19 මරණයක් වාර්තා වී නොමැත.

## බර ඉසිලීමේ සුපිරි සංචිතයේ දක්ෂතා ඇගයීමේ තරගාවලිය

# ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 07ක් ශ්‍රී ලංකා වාර්තා 17ක් අලුත් කරයි



● සංජීව ධර්මසේන

ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය මගින් සංවිධානය කරනු ලැබූ බර ඉසිලීමේ සුපිරි සංචිතයේ දක්ෂතා ඇගයීමේ තරගාවලියේදී ශ්‍රී ලංකා වාර්තා 17ක් අලුත් කිරීමට ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 07 දෙනෙක් සමත් වූහ. මෙම තරගාවලිය පොළොන්නරුව, ගල්ලෑල්ල ක්‍රීඩා සංකීර්ණයේදී පසුගියදා (28දා) අවසන් විය.

මෙහිදී කි.ග්‍රෑ 55 බර පන්තියේ දිලංක ඉසුරු, කි.ග්‍රෑ. 67 බර පන්තියේ තිලංක පළගසිංහ, කි.ග්‍රෑ. 102 බර පන්තියේ ශානක පීටර්ස් හා සුපිරි බර පන්තියේ තිමාලි හපුතැන්න ශ්‍රී ලංකා වාර්තා තුන බැගින් අලුත් කිරීමට සමත් වූහ. එමෙන්ම මෙහිදී තිමාලි හපුතැන්නගේ දක්ෂතා සුවිශේෂී වූ අතර, ඇය ස්නැච් හා ක්ලීන් ඇන්ඩ් ජර්ක් යන අංශ දෙකෙන්ම කි.ග්‍රෑ. 200ක බරක් එසවීමට සමත් වූවාය. එය බර ඉසිලීමේ අංශයෙන් මෙරට කාන්තාවක් කි.ග්‍රෑ. 200 සීමාවට ළඟා වූ පළමු අවස්ථාව ලෙස සැලකෙයි.

මෙම තරගාවලිය එළඹෙන අප්‍රේල් මාසයේදී උස්බෙකිස්තානයේ පැවැත්වීමට නියමිත ආසියානු බර ඉසලීමේ ශූරතාවලියට තේරීම් තරගයක් ලෙස පැවැති අතර, බර ඉසිලීමේ සුපිරි සංචිතය නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් 13ක් මේ සඳහා සහභාගි වූහ. කෝවිඩ්-19 වෛරසය හේතුවෙන් බර ඉසලීමේ ක්‍රීඩකයන්ටද නිසි පරිදි සිය පුහුණුවීම් කටයුතු සිදුකිරීමට නොහැකි වූ හෙයින් ඔවුන් සිය සුපුරුදු දක්ෂතා අතර සිටින බව තහවුරු කිරීමද මෙම තරගාවලිය පැවැත්වීමේ එක් අරමුණක් විය. මෙවර ආසියානු බර ඉසිලීමේ ශූරතාවලිය එළඹෙන ටෝකියෝ ඔලිම්පික් ක්‍රීඩා උළෙලට තේරීම් තරගාවලියක් ලෙසද මෙවර පැවැත්වේ.

### ශ්‍රී ලංකා වාර්තා පිහිට වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්

**1 දිලංක ඉසුරු (කි.ග්‍රෑ. 55 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 111, ක්ලීන් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 140, එකතුව කි.ග්‍රෑ. 251 (ශ්‍රී ලංකා වාර්තා 03)**

**2 තිලංක පළගසිංහ (කි.ග්‍රෑ. 67 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 119, ක්ලීන් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 146, එකතුව කි.ග්‍රෑ. 265 (ශ්‍රී ලංකා වාර්තා 03)**

**3 ඉන්දික දිසානයක (කි.ග්‍රෑ. 81 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 132 (ශ්‍රී ලංකා වාර්තාවක්), ක්ලීන් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 161**

**4 චින්තන විදානගේ (කි.ග්‍රෑ. 81 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 132, ක්ලීන් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 171 (ශ්‍රී ලංකා වාර්තාවක්)**

**5 තිමාලි හපුතැන්න (සුපිරි බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 88, ක්ලීන් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 112, එකතුව කි.ග්‍රෑ. 200 (ශ්‍රී ලංකා වාර්තා 03)**

**6 ශානක පීටර්ස් (කි.ග්‍රෑ. 102 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 134, ක්ලීන් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 170, එකතුව කි.ග්‍රෑ. 304 (ශ්‍රී වාර්තා 03)**

**7 චතුරිකා වීරසිංහ (කි.ග්‍රෑ. 81 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 85, ක්ලීන් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 110, එකතුව කි.ග්‍රෑ. 195 (ශ්‍රී ලංකා වාර්තා 03)**

# ක්‍රිකට් නංවන්න කරුණු 07ක යෝජනාවලියක්



● පැතුම් ශ්‍රී විජේරත්න

මෙරට ක්‍රිකට් ක්‍රීඩාවේ අභිවෘද්ධිය සඳහා ජාතික ක්‍රීඩා සභාව සහ ක්‍රීඩා අමාත්‍යාංශය එක්ව නව වැඩපිළිවෙළක් සහ ඒ හා සම්බන්ධ යෝජනාවලියක් සකස් කර තිබේ.

කරුණු 07කින් සමන්විත මෙම යෝජනාවලිය ක්‍රීඩා අමාත්‍යාංශය පසුගියදා (29දා) නිල වශයෙන් ප්‍රකාශයට පත් කළේය.

මෙම සාකච්ඡාවේදී ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ වත්මන් ක්‍රියාකාරීත්වය, ක්‍රීඩකයන්ගේ කළමනාකරණ කටයුතු සහ විධිමත්ව කණ්ඩායමට ක්‍රීඩකයන් තෝරා ගැනීමේ දී ක්‍රීඩකයන්ගේ දක්ෂතා විශ්ලේෂණය කිරීම සහ එහි පවතින යාන්ත්‍රණය පිළිබඳ සමාලෝචනය කර තිබේ.

ඊට අදාළව සැකසුණු නව යෝජනා 07 වන්නේ,

01. දැනට පවතින තේරීම් කමිටුව පිළිබඳ සළකා බැලීමත්, නව තේරීම් කමිටුවක් පත් කිරීමත්,

02. දැනට පවතින ප්‍රථම පන්තියේ ක්‍රිකට් තරගාවලිය සම්බන්ධයෙන් සළකා බලා එහි ව්‍යුහය අවම වශයෙන් කණ්ඩායම් 08ක් සහ උපරිම කණ්ඩායම් 14ක් ලෙස පළමු පෙළ තත්ත්වය (Tier-I) ලබාදීම, 'ටියර් බී' කණ්ඩායම් (Tier-II) සඳහා පළමු පෙළ තත්ත්වය ලබා නොදීම,

03. නව සුපිරි පළාත් තරගාවලියක් සංවිධානය කිරීම. කණ්ඩායම් 05ක් එයට එක්කිරීම මෙන්ම කණ්ඩායම් සඳහා ප්‍රිමියර් ('ටියර් ඒ' සහ 'ටියර් බී') ක්‍රීඩා සමාජ සහ අනෙක් ක්‍රීඩා සමාජ ක්‍රීඩකයන් නියෝජනය වන ලෙස කණ්ඩායම් සකස් කිරීම,

04. ජාතික කණ්ඩායමට පත් කළ යුතු ඉහළ හැකියාවන් සහ සුදුසුකම්ලත් නිලධාරීන් හඳුනා ගැනීම (කණ්ඩායම් උපදේශක, ක්‍රිකට් අධ්‍යක්ෂ, පූර්ණකාලීන කළමනාකරු පත් කිරීම),

05. ක්‍රීඩකයන්ගේ සහ පුහුණුකරුවන්ගේ ගිවිසුම් සැලසුම් කිරීමේදී දිරිගැන්වීමේ පටිපාටිය පිළිබඳව සලකා බැලීම. මෙහිදී ඔවුන්ගේ පෞද්ගලික දක්ෂතා සහ අඛණ්ඩව විනය පවත්වා ගැනීම පිළිබඳ වැඩි අවධානය යොමු කෙරේ,

06. ශ්‍රී ලංකා ක්‍රිකට් කළමනාකරුවන් මගින් ක්‍රීඩකයන්ගේ සහ සහායකයන්ගේ Contracted Staff) ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීමේදී ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතාව සහ විනය පිළිබඳව වඩාත් සැලකිලිමත් වීම,

07. තවදුරටත් ජාතික සහ අන්තර්ජාතික ක්‍රිකට් ව්‍යුහය සකස් කිරීමේදී ඒ සඳහා නිර්දේශිත ක්‍රිකට් කමිටුවක් (ක්‍රියාකාරී හා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක්) නම් කිරීම වේ.

## මහීපාල හේරත් අභියෝග ශූරතා මේසපන්දු තරගාවලිය-2021

# කාන්තා ඒකල ශූරතාව මුතුමාලි ප්‍රියදර්ශනීට





මුතුමාලි ප්‍රියදර්ශනී විසින් වරාය අධිකාරියේ ඉෂාරා මධුරංග තරග වට 3-2 (7/11,11/9,11/6,9/11,12/10)ක් ලෙසින් පරාජයට පත් කරන ලදී.

● ඕෂිත වරකපිටිය

ශ්‍රී ලංකා මේසපන්දු සම්මේලනයේ මෙහෙයවීමෙන් පැවැත්වෙන මහීපාල හේරත් අභියෝග ශූරතා සමස්ත ලංකා මේසපන්දු තරගාවලියේ කාන්තා ඒකල ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මුතුමාලි ප්‍රියදර්ශනී සමත් වූවාය.

ඒ අවසන් මහා තරගයේදී කොළඹ කාන්තා විදුහලේ ජිතාරා වර්ණකුලසූරිය තියුණු තරගයකින් පසු තරග වට 3-2ක් ලෙසින් පරාජයට පත් කරමිනි. මෙහි අවසන් ලකුණු තත්ත්වය දැක්වුණේ 8/11, 11/8,7/11, 11/9,11/2ක් ලෙසිනි.

මෙම තරගාවලිය පසුගියදා (30දා) කෑගල්ල නගර සභා ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.මෙහිදී අවසන් පූර්ව වටයන්හිදී ජිතාරා වර්ණකුලසූරිය විසින් මහනුවර හිල්වුඩ් විදුහලේ බිමන්දි බණ්ඩාර තරග වට 3-0 (11/9,11/9,11/6)ක් ලෙසින් පරාජයට පත් කළ අතර,

තරගාවලියේ ජයග්‍රාහකයන්ට ත්‍යාග ප්‍රදානය කිරීම වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය කනක හෙරත් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. මෙහි පිරිමි අංශයේ අවසන් තරග ඊයේ (31දා) පැවැත්වීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් නිරෝධායන පූර්වෝපායයක් ලෙසින් තරගාවලියේ යුගල තරග මෙවර නොපැවැත්වීමට සංවිධායකයන් මෙවර පියවර ගෙන තිබිණි.

# ලොතරැයි ප්‍රතිඵල



| | |
|---|---|
| මහජන සම්පත - 4383 | W 4 7 4 5 2 0 |
| ධන නිධානය - 0420 | J 16 27 39 41 |
| ගොවිසෙත - 2678 | J 16 43 52 66 |
| සුපිරි වාසනා - 1569 | 9 12 13 47 51 |
| වාසනා සම්පත - 1658 | X 23 25 48 70 |
| ජාතික සම්පත - 1092 | O 3 8 0 3 6 5 |
| නිරෝගා - 717 | වෘෂ්චික 14 59 63 68 |
| සෙවණ - 313 | G 12 28 34 51 |
| මෙගා පවර් - 750 | G 21 1 34 39 66 |
| දරු දිරි සම්පත - 21 | M 01 12 34 61 |
| ශනිදා වාසනාව - 3509 | 46 62 73 74 O |
| ජයෝදා - 1728 | 04 27 40 60 W |
| අද කෝටිපති - 1179 | C 01 23 48 74 |
| සංවර්ධන වාසනාව - 406 | 11 21 69 01 W |
| ලග්න වාසනාව - 3060 | 01 07 36 60 මිථුන |
| සුපර් බෝල් - 1353 | Y 19 45 55 61 |
| දෙලක්ෂපති - 103 | 03 04 63 L |
| කෝටිපති කප්රුක - 683 | 09 40 53 79 F |

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 08 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 පෙබරවාරි මස 01වැනි සඳුදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.

අද
2021-02-01
සඳුදා
010 / 021
RS.20/=

# නැ. ජැටියේ තීරණාත්මක දිනය අද

● ඉන්දික හේවාවිතාරණ

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය 100%ක් වරාය අධිකාරිය යටතේ පවත්වාගැනීම පිළිබඳව තීරණාත්මක සාකච්ඡාවක් කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සුරැකීමේ වෘත්තීය සමිති එකමුතුව සහ අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමග අද (01දා) පැවැත්වෙයි.

වරායේ නැ.පර්යන්තය පිළිබඳව ජනාධිපතිවරයා විසින් ධනාත්මක ප්‍රතිචාරයක් දක්වා ඇතැයි ද ඒ අනුව අදාළ තීරණය අගමැතිවරයා සමග පැවැත්වෙන සාකච්ඡාවේ දී ප්‍රකාශ වීමට නියමිත බවද වාර්තා වෙයි.

කෙසේ වෙතත් අගමැතිවරයා සමග අද පැවැත්වෙන සාකච්ඡාවලදී නැ.පර්යන්තයේ හිමිකාරීත්වය පිළිබඳව නිසි පිළිතුරක් නොලැබුණහොත් වරාය සේවකයන් වැඩ වර්ජනයක් සිදු කිරීමට තීරණය කර ඇතැයි කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සුරැකීමේ වෘත්තීය සමිති එකමුතුව සඳහන් කරයි.

නැගෙනහිර පර්යන්තයේ කොටස්වලින් ප්‍රමාණයක් ආයෝජකයෙකුට ලබාදීමට ගෙන තිබෙන තීරණය අහෝසි කර, එය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන බවට ආණ්ඩුවෙන් ලිඛිත පොරොන්දුවක් අවශ්‍ය බවද එම සංගමයේ සභාපති සංජය කුමාර වැලිගම මහතා සඳහන් කළේය.

නැගෙනහිර පර්යන්තයේ කොටස්වලින් 49%ක් ආයෝජකයෙකුට ලබාදීමට සැලසුම් කිරීමට එරෙහිව 29වැනිදා සවස 1.00 සිට ආරම්භ කළ අකුරට වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය අඛණ්ඩව සිදුකරන බවද ඔහු සඳහන් කළේය.

අදාළ ගැටලුව පිළිබඳ අද (01දා) අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ වෘත්තීය සමිති අතර සාකච්ඡාවක් පැවැත්වෙන බවත්, අකුරට වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය දිගටම පවත්වාගෙන යමින් මෙම සාකච්ඡාවලට සහභාගි වන බවත් කියා සිටියේය.

අදාළ ගැටලුවට නිසි පිළිතුරක් නොලැබුණහොත් සේවයෙන් ඉවත්ව සිටීමේ වෘත්තීය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට තීරණය කර තිබෙන බවද ඔහු පවසා සිටියේය.

අකුරට වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගය නිසා වරායවල බහාලුම් මෙහෙයුම් සිදුවන්නේ දෛනිකව 35% - 45%ත් අතර ප්‍රමාණයක් පමණක් බවද හෙතෙම සඳහන් කළේය.

## ආණ්ඩුවෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබෙන ලකුණු

### සාකච්ඡා අසාර්ථක වුණොත් වෘත්තීය සමිති වැඩවර්ජනයකට සූදානමින්



## "නැ. ජැටිය විකිණීම හෝ බදුදීම කිසිවිටෙකත් කරන්නේ නෑ" - අගමැති මහින්ද රාජපක්ෂ

>>P2



## "නැ.පර්යන්තයේ පූර්ණ හිමිකාරීත්වය අහිමිවන පියවරකට පක්ෂ 10ක් විරුද්ධයි" - ජානිපෙ නායක අමාත්‍ය විමල් වීරවංශ

>>P2



## "වරාය නැගෙනහිර පර්යන්තයේ තත්ත්වය සුබවාදීව විසඳේවි" - වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක

>>P2

# වරාය රැකගැනීමට දිස්ත්‍රික්ක 14කදී විරෝධතා

● එච්.අයි. තුෂාර

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ කොටස් ආයෝජකයෙකුට ලබාදීමට එරෙහිව අද (01දා) රට පුරා දිස්ත්‍රික්ක දාහතරකදී විරෝධතා ව්‍යාපාර පවත්වන බව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය සඳහන් කරයි.

දහවල් 12.00ට මෙම විරෝධතා ව්‍යාපාර ආරම්භ කරන බවත්, ආණ්ඩුව ගෙන තිබෙන තීරණය වෙනස් කර 100%ක්ම නැගෙනහිර පර්යන්තයේ අයිතිය ශ්‍රී ලංකා වරාය අධිකාරියට සතුකර දිය යුතු බවත් එම සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ මහතා සඳහන් කළේය.

>>P2




## සැෂේ පැකට් හා ප්ලාස්ටික් තහනම මාර්තු 31දා සිට



>>P3

## ව්‍යවස්ථා කමිටුවට මැතිවරණ කොමිෂන් සභාවෙන් කරුණු 8ක්

>>P3

## නිදහස් දින සැමරුම TNA වර්ජනය කරයි

>>P3

## ඊයේත් භූකම්පන

## මඩොල්සිම හා ඒ අවට ගම්මාන කිහිපයකට දින 10ක පමණ කාලයක් ඇතුළත භූ කම්පන 04ක් සිදුවෙලා - ගම්වාසීහු කියති

>>P7

## බන්ධනාගාර, පැලියගොඩ හා දිවුලපිටිය කෝවිඩ් පොකුර 60,174ක්

>>P2

සමස්ත ආසාදිත සංඛ්‍යාව 64,157ක් දක්වා ඉහළට, සුව වූ පිරිස 57,159ක්, මරණ සංඛ්‍යාව 313කි

## බස් හිමියෝ සහන ඉල්ලති

හෙට සිට වෘත්තීය ක්‍රියාමාර්ග, විසඳුම් නොලැබුණොත් 03දා සිට සේවයෙන් ඉවතට



● ඉන්දික හේවාවිතාරණ

ඉන්දියාවෙන් ලැබුණු කෝවිඩ් - 19 එන්නත යුද හමුදා සමාජිකයන් තිස් එක්දහසකට එන්නත් කිරීම් සිදුකරන බව යුද හමුදා මූලස්ථානය සඳහන් කරයි.

>>P2

## කෝවිඩ් රෝගීන්ගෙන් 23,360ක් කොළඹ දිස්ත්‍රික්කයෙන්

'කෝවිඩ්-19' රෝගීන් වාර්තා වීම යටතේ ඊයේ (31දා) උදෑසන 10.00 පමණ වනවිට රට තුළින් වාර්තා වූ සමස්ත කෝවිඩ් රෝගීන්ගෙන් 23,360දෙනෙකු කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී තිබේ.

>>P2

## යුද හමුදාවේ 31,000කට කෝවිඩ් එන්නත විදිනවා

- යුද හමුදා මූලස්ථානය

>>P3

## කෝවිඩ්-19 වෛරසයේ බලපෑම

2021 ජන.31 වැනිදා රාත්‍රී 09.00 වනවිට තත්ත්වය

මෙරටින් වාර්තා වූ ප්‍රමාණයන්

| ආසාදිතයන් | මරණ | පූර්ණ සුවය ලැබූ |
|---|---|---|
| 64,157 | 313 | 57,159 |

ලෝකයේ වාර්තා වූ ප්‍රමාණයන්

| ආසාදිතයන් | මරණ | පූර්ණ සුවය ලැබූ |
|---|---|---|
| 102,059,807 | 2,201,428 | 73,910,664 |

මෙම QR CODS මගින් ගෲප් වෙත පිවිසිය හැකිය

TELEGRAM VIBER WHATSAPP

නවතම තත්ත්වය දැන ගැනීමට www.ada.lk සහ FB පිටුව වෙත පිවිසෙන්න.

## කාලගුණය

උපරිම උෂ්ණත්වය 34°C රත්නපුරය

අවම උෂ්ණත්වය 11°C නුවරඑළිය

### වැසි තත්ත්වය

උතුර/ උතුරුමැද/ නැගෙනහිර/ ඌව/ වයඹ/ සබරගමුව/ බස්නාහිර පළාත් හා මාතලේ/මාතර/ නුවරඑළිය/ ගාල්ල/ මහනුවර දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවල වැසි ඇතිවිය හැකිය.

### සුළං තත්ත්වය

ගිගුරුම් සහිත වැසි සමග තාවකාලික තද සුළං ඇතිවිය හැකිය.

### මුහුද

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය හා මඩකලපුව හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

බළපිටිය සිට කොළඹ, පුත්තලම හරහා මන්නාරම දක්වා හා හම්බන්තොට සිට පොතුවිල් දක්වා මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැකිය. සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැකිය.

අද

## කර්තෘ මණ්ඩලය

ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන:
2479670, 2479671

ෆැක්ස්:
2479668

විද්‍යුත් තැපෑල:
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830

බෙදාහැරීමේ අංශය:
011 2479 625

දායකත්ව අංශය:
011-2479 626

අද

## පාඨක අයිතීන් සුරැකීම

**අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.**

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති.
පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තියක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, **ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම** වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.




ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka

96, කිරුළ පාර, කොළඹ 05.

| | |
|---|---|
| දුරකතනය | 5353635 |
| ෆැක්ස් | 5335500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |

FOLLOW US
facebook.com/ada.daily/
twitter.com/adha_news
instagram.com/adanewspaper/

## අද CARTOON




# "නැ. ජැටිය විකිණීම හෝ බදුදීම කිසිවිටෙකත් කරන්නේ නෑ" – අගමැති මහින්ද රාජපක්ෂ

● අනීෂා මානගේ

කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකිණීම හෝ බදුදීම කිසිවිටෙකත් සිදුනොකරන බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා පැවසීය.



අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා මේ බව පැවසුයේ, ඊයේ (31දා) තංගල්ල කාර්ල්ටන් නිවෙසේදී මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් අග්‍රාමාත්‍යවරයා,

"කොළඹ වරායේ නැගෙනහිර ජැටිය සම්බන්ධයෙන් ඇති වී තිබෙන ප්‍රශ්නයට ඇත්ත වශයෙන්ම විපක්ෂය අපට චෝදනා කරන්න දෙයක් නැහැ. අපි වරාය කාටවත් දෙන්නෙත් නැහැ. විකුණන්නෙත් නැහැ. බදු දෙන්නෙත් නැහැ. එය අපේ පාලනය යටතේ තිබෙනවා. මම හිතන්නේ වෘත්තීය සමිති ඒක දන්නවා. අපි බොහොම පැහැදිලිව වෘත්තීය සමිතිවලට කියන්නේ අපි මේ පිළිබඳ සාකච්ඡාවක්වත් කරලා නැහැ එහෙම දෙනවද කියලා. ඒ නිසා මේ ගැන ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. අපි කීයටවත් දෙන්නෙත් නැහැ.

වැඩවර්ජන කරන්න දෙයක් නැහැ. මට ඇවිත් කිව්වා නම් මම ඇත්ත පැහැදිලි කරලා දෙනවා. කැබිනට් මණ්ඩලයේ බහුතරයක් ඉන්නේ විකුණන්න ඕනෑ නැහැ කියන පදනමේ. ජනාධිපතිතුමා ඉන්නෙත් ඒ මතයේ. දේපළ විකිණීම අපේ ප්‍රතිපත්තිය නෙවෙයි. ඒ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙනියන්න නෙවෙයි අපට බලයදී තිබෙන්නේ" යනුවෙන් පැවසීය.

# "නැ.පර්යන්තයේ පූර්ණ හිමිකාරිත්වය අහිමිවන පියවරකට පක්ෂ 10ක් විරුද්ධයි" – ජානිපෙ නායක අමාත්‍ය විමල් වීරවංශ

● නවෝද්‍යා පවනි

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් වරාය අධිකාරියට ඇති පූර්ණ හිමිකාරීත්වය අහිමි වන ආකාරයේ කවර පියවරකට හෝ ආණ්ඩුව ගමන් කරන්නේ නම් තම පක්ෂයද ඇතුළු ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින පක්ෂ 10ක් එයට විරුද්ධව කටයුතු කරන බව ජාතික නිදහස් පෙරමුණේ නායක, කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතා පැවසීය.

ආණ්ඩුවේ පක්ෂ 10ක ඒකමතික ස්ථාවරය ප්‍රකාශයට පත් කරමින විමල් වීරවංශ මහතා මේ බවද පවසා සිටියේය.

කොළඹ පිහිටි තම නිල නිවසේදී ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින දේශපාලන පක්ෂ 10ක නායකයන්ගේ සහභාගිත්වයෙන් පැවති සාකච්ඡාවෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ වීරවංශ මහතා,

"කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය



සුරැකීම වෙනුවෙන් වරාය වෘත්තීය සමිති, ජාතික සංවිධාන එක්ව ගෙනයන සටන පිළිබඳ සාකච්ඡා කිරීමට ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින පක්ෂ 10ක් මෙම ස්ථානයට පැමිණියා. එම පක්ෂ නියෝජනය කරන කැබිනට් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු පක්ෂ නායකයන් ඒ අතර සිටිනවා. එම පක්ෂ 10ට අමතරව අපි තවත් පක්ෂ 04කට ඇරයුම් කළා. ඉන් තුනක් ප්‍රායෝගික හේතූන් මත එන්න බැහැ" කියා දැනුම් දුන්නා.

අපි මෙහිදී මූලිකවම, 'නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් වරාය අධිකාරියට ඇති පූර්ණ හිමිකාරීත්වය අහිමි වන ආකාරයේ යම් පියවරකට ආණ්ඩුව ගමන් කරනවා නම් එයට විරුද්ධ විය යුතුයි' කියන ස්ථාවරයට ආවා. ඒ අනුව ආණ්ඩුව අභ්‍යන්තරයේ සිටින දේශපාලන පක්ෂ 10ක් ඒකමතිකව 'කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය පූර්ණ වශයෙන් වරාය අධිකාරිය සතුව තිබිය යුතුයි' යන ස්ථාවරයේ තමයි ඉන්නේ. 'නැගෙනහිර පර්යන්තයේ කිසිම කොටසක් කවර හෝ පාර්ශ්වයකට ලබා නොදිය යුතුයි, එය වරාය අධිකාරියට පමණක් සතු විය යුතුයි' යන ස්ථාවරයේ සිට අපේ පක්ෂ 10 ක්‍රියා කරනවා. ඉදිරියේදීත් අපේ පක්ෂ 10 ආණ්ඩුවේ මෙන්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආරක්ෂාව වෙනුවෙනුත් රටේ සුබ සිද්ධිය වෙනුවෙනුත් එකට එකතු වී කටයුතු කිරීමටත් මේ අවස්ථාවේදී එකඟතාවකට ආවා.

අපේ ජනබල පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී පූජ්‍ය අතුරලියේ රතන හිමි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්, රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර, පිවිතුරු හෙළ උරුමයේ නායක, බලශක්ති අමාත්‍ය උදය ගම්මන්පිල, නව ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ නායක, රාජ්‍ය අමාත්‍ය වාසුදේව නානායක්කාර, ලංකා සම සමාජ පක්ෂය ප්‍රධාන ලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ, ජාතික නිදහස් පෙරමුණේ ජාතික සංවිධායක, රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ, ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී අසංක නවරත්න, පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග යන පිරිස මෙම සාකච්ඡාවට එක්ව සිටියහ.

# පැය 4ක දී රථවාහන නඩු 5,514ක්

● ඉන්දික හේවාවිතාරණ

පැය හතරක කාලයක් සමස්ත ලංකාවම ආවරණය වන ආකාරයට සිදුකළ විශේෂ පොලිස් මෙහෙයුමකදී රථවාහන වැරදි සම්බන්ධ නඩු 5,514ක් ලබාගෙන ඇතැයි පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

අදාළ මෙහෙයුම සිදුකළ කාලය තුළදී රථවාහන 43,596ක් පරීක්ෂා කර තිබෙන අතර, මෙහිදී බීමත් රියැදුරන් 195ක් අත්අඩංගුවට ගෙන තිබේ.

වරෙන්තුකරුවන් 243දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙන අතර, මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් පුද්ගලයන් 172ක්, බඳින තුවක්කු සමග තිදෙනෙකු, සැකපිට පොලීසියට අවශ්‍ය කර සිටින සැකකරුවන් හතළිහක් හා සැකපිට 201දෙනෙකු අත්අඩංගුවට ගෙන තිබෙන බවද පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

මෙම මෙහෙයුමේදී පුද්ගලයන් 80,985ක් පරීක්ෂා කළ බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා සඳහන් කළේය.

මෙම මෙහෙයුමේදී බඳින තුවක්කු තුනක්, නීති විරෝධී මත්පැන් ලීටර් 8942ක්, කංසා කිලෝග්‍රෑම් 07 ග්‍රෑම් 331ක්, හෙරොයින් ග්‍රෑම් 27ක්, වෙනත් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 337ක් අත්අඩංගුවට ගෙන තිබේ.

පසුගිය 30වැනිදා සවස 2.00 සිට සවස 6.00 දක්වා කාලය තුළදී මෙම මෙහෙයුම් සිදුකර තිබෙන අතර, මේ සඳහා පොලිස් නිලධාරීන් 14,420ක් සහභාගි වී තිබේ. මාර්ග බාධක 1964 යොදා සිදු කළ මෙම මෙහෙයුමේදී අත්අඩංගුවට ගත් පුද්ගල ප්‍රමාණය 611කි.

## පළමු පිටුවෙන්...

### කෝවිඩ් රෝගීන්ගෙන් 23,360ක්...

මීට අමතරව ගම්පහ දිස්ත්‍රික්කයෙන් කෝවිඩ් රෝගීන් 12,820ක්, පුත්තලම දිස්ත්‍රික්කයෙන් රෝගීන් 681ක්, කළුතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 4,321ක්, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 215ක්, මහනුවර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 2,427ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1,191ක්, පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් රෝගීන් 149ක්, යාපනය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 192ක්, රත්නපුර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1206ක්, කෑගල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1067ක්, මොනරාගල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 255ක්, අම්පාර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1211ක්, මාතලේ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 486ක් වාර්තා වේ.

එමෙන්ම ගාල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 1,357ක්, බදුල්ල දිස්ත්‍රික්කයෙන් රෝගීන් 342ක්, මාතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 853ක්, මඩකලපුව දිස්ත්‍රික්කයෙන් රෝගීන් 332ක්, හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් රෝගීන් 333ක්, වවුනියාව දිස්ත්‍රික්කයෙන් රෝගීන් 317ක්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 404ක්, නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 742ක්, කිලිනොච්චිය දිස්ත්‍රික්කයෙන් රෝගීන් 35ක්, මන්නාරම දිස්ත්‍රික්කයෙන් රෝගීන් 136ක්, මුලතිව් දිස්ත්‍රික්කයෙන් රෝගීන් 15ක් වශයෙන් ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකින්ම කෝවිඩ් රෝගීන් වාර්තා වී තිබෙන බව වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි.

මීට අමතරව කෝවිඩ්-19 රෝගීන් බවට සැකකරන පුද්ගලයන් 767දෙනෙක් වෛද්‍ය අධීක්ෂණය යටතේ ප්‍රතිකාර ලබා ගනිමින් සිටිති.

විදේශ රටවල සිට පැමිණි ශ්‍රී ලාංකිකයන් 1892දෙනෙකුට ඊයේ (31දා) දිනය වනවිට 'කෝවිඩ්-19' වෛරසය ආසාදනය වී ඇතැයි තහවුරු වී තිබෙන අතර, මෙරටට පැමිණි විදේශිකයන් 150දෙනෙකුටද 'කෝවිඩ්-19' වෛරසය ආසාදනය වී තිබෙන බවට තහවුරු වී ඇත.

ශ්‍රී ලංකාවේ ජනගහනය සැලකීමේදී මිලියනයකට රෝගීන් 2903ක් වාර්තා වන අතර, මරණ ප්‍රමාණය මිලියනයකට 13ක් ලෙස වාර්තා වේ.

### බස් හිමියෝ සහන ඉල්ලති...

පසුගිය 29 වැනි දින යුද හමුදා සාමාජිකයන් දහසකට එන්නත් ලබාදීම සිදුකළ බවත්, ඉන් පසුව සෑම දිනකම හත්දහස් පන්සීයකට එන්නත් ලබාදීම සිදුකල බවත් යුද හමුදා මාධ්‍ය අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් නිලන්ත ප්‍රේමරත්න මහතා සඳහන් කළේය.



මේ අනුව අදාළ එන්නතේ පළමු මාත්‍රාව ලබාදීම හෙට (02දා) දිනයෙන් අවසන් වන බවත්, නාරාහේන්පිට යුද හමුදා රෝහල, පනාගොඩ යුද හමුදා රෝහල යන රෝහල් තුළ සේවය කරන යුද හමුදා වෛද්‍යවරුන්ට හා අනෙකුත් සෞඛ්‍ය කාර්යමණ්ඩලවලට සහ කෝවිඩ් 19 මර්දන කටයුතුවල නිරත හමුදා සාමාජිකයන්ට අදාළ එන්නත ලබාදීම සිදුකරන බවත් ඒ මහතා කියා සිටියේය. කෝවිඩ් - 19 එන්නත ලබාදීම පසුගිය 29 වැනි දින නාරාහේන්පිට යුද හමුදා රෝහලේදී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

### වරාය රැකගැනීමට දිස්ත්‍රික්ක...

මේ අනුව අද දහවල් 12.00ට අම්පාර විදුලි බලමණ්ඩලය ඉදිරිපිට, මොනරාගල මැදගම නගරය, ගාල්ල නගරය, වරාය ඉදිරිපිට, හබරාදූව සහ බද්දේගම නගරවල, හලාවත රෝහල ඉදිරිපිට, පුත්තලම නගරය, වෙන්නප්පුව හා ආණමඩුව නගරවල, අනුරාධපුර DS වටරවුම අසල යන ස්ථානවලදී විරෝධතා පැවැත්වෙන බවද ඔහු පවසා සිටියේය.

මීට අමතරව ගම්පහ දුම්රියපොළ ඉදිරිපිටදී, පොළොන්නරුව හා මැදිරිගිරිය නගරවලදී, ත්‍රිකුණාමල වරාය ඉදිරිපිටදී, කුරුණෑගල හා කුලියාපිටිය නගරවලදී, රත්නපුර හා ඇඹිලිපිටිය නගරවලදී, හම්බන්තොට, බෙලිඅත්ත, අම්බලන්තොට නගරවලදී, කඹුරුපිටිය නගරයේදී, මාතලේ නගරයේදී හා නුවරඑළිය රාගල නගරයේදී ද මෙම උද්ඝෝෂණ පවත්වන බවද හෙතෙම සඳහන් කළේය.

# "වරාය නැගෙනහිර පර්යන්තයේ තත්ත්වය සුබවාදීව විසදේවි" – වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර පර්යන්තය පිළිබඳ මතුව ඇති ආන්දෝලනාත්මක තත්ත්වය සුභවාදීව විසඳෙනු ඇතැයි බලාපොරොත්තු වන බව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා පැවසීය.



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්මන් තත්ත්වය පිළිබඳ දැනුම්දීම සඳහා පෙරේදා (30දා) පැවැති මාධ්‍ය හමුවක් අමතමින් ඔහු මේ බව කීය.

නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලු වෘත්තීය සංගම් ඇතුළු පාර්ශ්වවල අදහස් යෝජනා පදනම් කරගනිමින් රජය වෙත ඉදිරිපත් කළ වාර්තාව රජය විසින් අනුමත කරනු ඇතැයි විශ්වාස කරන බවද ඒ මහතා සඳහන් කළේය.

පසුගිය රජය ඇති කළ තත්ත්වයක් මත නිර්මාණය වූ මෙම තත්ත්වය, ජාත්‍යන්තරය හා සම්බන්ධ අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් පසු විසඳ ගැනීමේ යම් යම් ගැටලු අවස්ථා උද්ගත වන බවත්, ඒ සඳහා නිසි ක්‍රමවේද ඔස්සේ පියවර ගන්නා බවත් හෙතෙම සඳහන් කළේය.

ඒ අනුව නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේම මෙහෙයුම් කටයුතු සිදු කිරීමට අවකාශය හිමිවනු ඇති බවට විශ්වාස කරන බවත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය, සියලු සේවක මහත්ම මහත්මීන් හා සියලු වෘත්තීය සමිති මේ සඳහා එක්සත්ව කටයුතු කරමින් නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පවත්වාගැනීමට නොපසුබට උත්සාහයෙන් කටයුතු කළ බවත් රත්නායක මහතා තවදුරටත් කියා සිටියේය.

# බන්ධනාගාර, පෑලියගොඩ හා දිවුලපිටිය කෝවිඩ් පොකුර 60,174ක්

**සමස්ත ආසාදිත සංඛ්‍යාව 64,157ක් දක්වා ඉහළට, සුව වූ පිරිස 57,159ක්, මරණ සංඛ්‍යාව 313කි**

● ඉන්දික හේවාවිතාරණ

බන්ධනාගාර, පෑලියගොඩ හා දිවුලපිටිය 'කෝවිඩ්-19' පොකුර තුළින් ඊයේ (31දා) දිනයේදී රෝගීන් 837ක් වාර්තා වීමත් සමග එම පොකුරු තුළින් වාර්තා වන සමස්ත රෝගීන්ගේ සංඛ්‍යාව 60,174ක් දක්වා ඉහළ ගොස් ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත 'කෝවිඩ්-19' රෝගීන්ගේ සංඛ්‍යාවද 64,157ක් දක්වා ඉහළ ගොස් තිබෙන අතර, 'කෝවිඩ්-19' හේතුවෙන් සිදුව ඇති මරණ සංඛ්‍යාව 313කි. සුවය ලැබූ සමස්ත රෝගීන්ගේ ප්‍රමාණය 57,159කි.

# නිදහස් දින සැමරුම TNA වර්ජනය කරයි

● වවුනියාව මධුෂංඛ අමරසිංහ

මෙවර 73 වැනි ජාතික නිදහස් දිනය හා ජාතික නිදහස් දින සැමරුම වර්ජනය කිරීමට දෙමළ ජාතික සන්ධානය තීරණය කර ඇතැයි දෙමළ ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා පැවසීය.

ඉලංගෙයි තමිල් අරසුකච්චි පක්ෂයේ ඊයේ (31දා) පැවැති දේශපාලන මණ්ඩල සාකච්ඡාවෙන් පසුව මාධ්‍ය හමුවක් පවත්වමින් සුමන්තිරන් මහතා මේ බව කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා පවසා සිටියේ,

"දෙමළ ජනතාවට සිදුවන අඛණ්ඩ මර්දනයන් හේතුවෙන් මෙවර ජාතික නිදහස් දිනය වර්ජනය කිරීමට තීරණය කළා. ඒ වගේම මෙරට සිදු වූ බව කියන මානව හිමිකම් කඩවීම් හා ජිනීවා මානව හිමිකම් කවුන්සලයේ මීළඟ සැසිවාරය සඳහා වන නිර්දේශ ඉදිරිපත් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් පත් කර ඇති ත්‍රිපුද්ගල විශේෂ කමිටුව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රතික්ෂේප කළ යුතුයි.

උතුරු නැගෙනහිර පළාත්වල ජීවත්වන දෙමළ ජනතාවට එරෙහිව ආණ්ඩුව විසින් සිදු කරනු ලබන මර්දනයන් පිළිබඳ අප සාකච්ඡා කරනු ලැබුවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුව වැනි රජයේ ආයතන අප ජනතාවගේ ඉඩම් අත්පත් කර ගැනීම් ආරම්භ කර තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හින්දු ආගමික සිද්ධස්ථාන වෙනස් කිරීමේ සැලසුමක් ක්‍රියාත්මක කරන ආකාරයක්ද වර්තමානයේ දැක ගන්න පුළුවන්.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මීළඟ සැසිවාරය සඳහා සියලු දෙමළ දේශපාලන පක්ෂවල එකඟතාව එම කවුන්සිලයේ සියලු සාමාජික රටවල තනාපතිවරුන් වෙත යැවීමට හැකිවීම පිළිබඳ සතුටු වෙනවා.

මේ අතර වත්මන් ආණ්ඩුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වෙනුවෙන් කමිටුවක් පත් කර තිබෙනවා. එයට අපගේ අදහස් යෝජනා දැනටමත් අප යවා අවසන්. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්නේ නම් එහි ජාතික ගැටලුව සඳහා වන විසඳුමක් අඩංගු විය යුතුමයි. ජාතික ගැටලුවට විසඳුමක් නොමැති නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් කිසිදු ඵලයක් අත් නොවන බව අප පෙන්වා දී තිබෙනවා.

එම කමිටුව එළඹෙන 20 වැනිදා අප පක්ෂය හමුවීමට සූදානම්ව සිටිනවා. එම අවස්ථාවේදීත් අපි අපගේ ස්ථාවරය දැනුම්දීමට කටයුතු කරනු ලබනවා.

ශ්‍රී ලංකාවේ ජාතික නිදහස් දින සැමරුම දෙමළ ජනතාව අඛණ්ඩව වර්ජනය කර තිබෙනවා. ශ්‍රී ලංකාවේ නිදහස් දිනය අපි සමරන්නේ නැහැ. නමුත් පසුගිය ආණ්ඩුව කාලයේදී ලබාදුන් පොරොන්දු හේතුවෙන් ජාතික නිදහස් දින සැමරුමට මමත් සම්බන්ධන් මහතාත් සහභාගි වුණා. එහෙත් එම ආණ්ඩුවත් අපට ලබාදුන් පොරොන්දු ඉටු කිරීම අමතක කළා. එබැවින් මෙවරත් අපි ජාතික නිදහස් දිනය වර්ජනය කරනු ලබනවා" යනුවෙනි.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ශ්‍රීධරන්, ඉලංගෙයි තමිල් අරුසකච්චි පක්ෂ නායක මාවෙයි සේනාධිරාජා මහත්වරුන් ඇතුළු පිරිසක්ද සහභාගි වූහ.

# ව්‍යවස්ථා කමිටුවට මැතිවරණ කොමිෂන් සභාවෙන් කරුණු 8ක්

● ඉන්දික හේවාවිතාරණ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිරීම සඳහා පත් කර ඇති කමිටුව වෙත මැතිවරණ ක්‍රියාවලියට අදාළව හා මන්ත්‍රීවරුන් සම්බන්ධ කරුණු අටකින් යුත් යෝජනාවක් භාරදීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර තිබේ.

මේ අනුව පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ඉදිරිපත් කරන ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූර ඡන්ද විමසීමෙන් පසු දින 07ක් තුළ නම් කළ යුතු බවත්, එසේ නොකරන අවස්ථාවලදී අදාළ පක්ෂය නාමයෝජනා ලබාදෙන විට භාරදෙන ජාතික ලැයිස්තු නාමලේඛනයේ අනුපිළිවෙළට මන්ත්‍රී ධූර ගැසට් කිරීමට අදාළ යෝජනාව ඉදිරිපත් කිරීමට තීරණය කර ඇත.

මීට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බවට පත් වී පළමු වසර දෙක තුළදී රෝගී තත්ත්වයක් හෝ වෙනත් විශේෂ හේතුවක් නොමැතිව අදාළ කාලය තුළ පවත්වන පාර්ලිමේන්තු දින ගණනින් තුනෙන් එකක්වත් සහභාගී නොවන මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රී ධූර අහෝසි කරන ලෙසත් යෝජනාවක් සකස් කර තිබේ.

මීට අමතරව පුරවැසියන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සෘජුවම මූලික අයිතිවාසිකමක් ලෙසට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමේ යෝජනාව හා මැතිවරණයට තරග කරන සෑම අපේක්ෂකයෙකුම ප්‍රතිඵල නිකුත් කර දින 30ක කාලයක් තුළ මැතිවරණ වියදම් හා ආදායම් මූලාශ්‍ර කොමිසමට ලබාදීමේ යෝජනාව හා නියමිත කාලය තුළ අදාළ වාර්තා ලබානොදෙන පිරිස් හා දෝෂ සහිතව වාර්තා ඉදිරිපත් වන පිරිස්වලට මන්ත්‍රී ධූර අහෝසි කිරීම හා පරාජිත අපේක්ෂකයෙකු නම් ඔහුට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට අදාළ බලය මැතිවරණ කොමිසමට ලබාගැනීමේ යෝජනාව පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරයෙකු වරදක් සිදු කර අධිකරණයෙන් වරදකරුවෙකු ලෙස පසු ඔහු මන්ත්‍රී ධූරයක් දැරීමට නුසුදුස්සෙකු වන්නේ නම්, ඒ පිළිබඳ විමර්ශනය කර මන්ත්‍රී ධූරයෙන් හෝ සභික ධූරයෙන් එම තැනැත්තා ඉවත් කිරීමේ බලය මැතිවරණ කොමිසමට ලබාදීම.

මීට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින්ම තරුණ හා කාන්තා නියෝජනය ප්‍රතිශතයක් ඇති කිරීමට අදාළ යෝජනාවත් ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

ජනමත විචාරණයකදී දැනට පවතින එක් නිශ්චිත කරුණක් පිළිබඳ ජනමත විමසීම පමණක් වන නිසා යම් විධානයක් හෝ විධාන කිහිපයක් සඳහා ජනතා අදහස් ලබා ගැනීමට හැකිවන පරිදි සංශෝධන ඉදිරිපත් කිරීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීමට තීරණය කර තිබේ.

# සැෂේ පැකට් හා ප්ලාස්ටික් තහනම මාර්තු 31දා සිට

● නිදර්ශනී වික්‍රමසිංහ

තනි භාවිත සහ කෙටිකාලීන භාවිත ප්ලාස්ටික් තහනම එළඹෙන මාර්තු 31වැනිදා සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඒ අනුව ශුද්ධ පරිමාව මිලිලීටර 20ට/ශුද්ධ බර ග්‍රෑම් 20ට සමාන හෝ ඊට අඩු සැෂේ (ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීමට භාවිත කිරීම සඳහා හැර), හුළංවලින් පිරවිය හැකි සෙල්ලම් බඩු (බැලුන්, බෝල, දියමත පාවෙන/පිහිනුම් තටාකවලදී භාවිත කරන සෙල්ලම් බඩු සහ ජල ක්‍රීඩා උපකරණ හැර), ප්ලාස්ටික් කූර (Stem) සහිත කොටන් බඩ්ස් (Cotton Buds) (වෛද්‍ය/සායනික ප්‍රතිකාර සඳහා භාවිත කරන ප්ලාස්ටික් කොටන් බඩ්ස් හැර) භාවිතය තහනම් කර ඇත.

ජාතික පාරිසරික පනතින් පරිසර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ප්ලාස්ටික් නියාමනයට අදාළ ගැසට් පත්‍ර 02ක් නිකුත් කිරීමට පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා කටයුතු කර ඇති අතර, ඊට අදාළ නියාමන කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

එහිදී අංක 2211/51-2021 ජනවාරි මස 21 වැනි දින දරණ ගැසට් පත්‍රයට අනුව ඉහත සඳහන් කරන ලද නිෂ්පාදිතවලට අමතරව යම් ක්‍රියාවලියක්, වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා භාවිත කරනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍ය ඇසුරුම් කිරීම සඳහා පොලිඑතිලීන් ටෙරප්තැලේට් (PET) හෝ පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (PVC) ද්‍රව්‍ය භාවිතයද තහනම් කර තිබේ.

මීට අමතරව අංක 2211/50- 2020 ජනවාරි මස 21වැනි දින දරණ ගැසට් පත්‍රය යටතේ එක් එක් ප්ලාස්ටික් වර්ගය හඳුනාගැනීම සඳහා යෙදිය යුතු ජාත්‍යන්තරව භාවිත කරනු ලබන සංකේත ක්‍රමයක් හඳුන්වා දී තිබේ.

ප්ලාස්ටික් අයිතම භාවිතය මගින් සිදුවන පරිසර දූෂණය වැළැක්වීම මෙම තහනම හරහා අපේක්ෂා කෙරෙන අතර, මාර්තු මස 31වැනි දිනට පසු අදාළ ප්ලාස්ටික් නිෂ්පාදනය සහ වෙළෙඳාම් කරන පුද්ගලයන්ට එරෙහිව ජාතික පාරිසරික පනතට අනුව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවද මධ්‍යම පරිසර අධිකාරිය අවධාරණය කරයි.

# ශ්‍රී ලංකා ක්‍රිකට් හා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කෝප් හමුවට

● නිදර්ශනී වික්‍රමසිංහ

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම මසදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) හමුවට කැඳවීමට එම කාරක සභාව තීරණය කර තිබි.

ඒ අනුව එළඹෙන 11වැනිදා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කෝප් කමිටුවට කැඳවීමට නියමිතය. එසේම 12වැනිදා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය කැඳවීමට නියමිත අතර, එහිදී ළමා අපයෝජන සම්බන්ධයෙන් වන විශේෂ විගණන වාර්තාව සැලකිල්ලට ගනු ඇත.

මීට අමතරව මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධිඅවදානම් කලාපවල ජීවත්වන ජනතාව නැවත පදිංචි කිරීමට අදාළ ව්‍යාපෘතියේ ප්‍රගතිය විමසා බැලීම 24වැනිදා සිදු කිරීමට කෝප් කමිටුව තීරණය කර තිබේ.

අනතුරුව ශ්‍රී ලංකාවට ප්ලාස්ටික් ආනයනය කළමනාකරණය කිරීම සහ ඒවා මෙරට තුළ භාවිතය පිළිබඳ විශේෂ විගණන වාර්තාවක් 26වැනිදා සැලකිල්ලට ගැනීමට නියමිත බවද සඳහන්ය.

# මුස්ලිම් නීතිය සංශෝධනය කිරීමට වෙනම කමිටුවක්

● නිදර්ශනී වික්‍රමසිංහ

මුස්ලිම් නීතිය සංශෝධනය කිරීම සඳහා වෙනම කමිටුවක් පත්කර ඇති බව අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා ප්‍රකාශ කළේය.

හෙතෙම සඳහන් කර සිටියේ නීති සංශෝධනය සම්බන්ධයෙන් වූ ක්‍රියාවලිය ආප්ප බාන්නා සේ සිදු කළ නොහැකි බවයි.

කෙසේ වුවද කමිටු 11ක් පත්කර නීතිය පිළිබඳ සංශෝධන මේ වනවිට සිදු කරමින් පවතින බවද අමාත්‍යවරයා පැවසීය.

කොළඹදී පැවැති උත්සවයක් අමතමින් පෙරේදා (30දා) මේ පිළිබඳ වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා,

"මේ වනවිට අපි කමිටු 11ක් දාලා නීතිය පිළිබඳ සංශෝධන කරගෙන යනවා. මේක ආප්ප බානවා වගේ එක දවසින් කරන්නට බැහැ, මට ඕන දේවල්. මුස්ලිම් නීතිය සංශෝධනය කිරීම සඳහාත් මම වෙනම කමිටුවක් දාලා තියෙනවා. ඒක මට අමතක වෙලා නැහැ." යැයි පැවසීය.

# වරාය කොටස් ලබාදීමට එරෙහිව කොළඹදී අද සත්‍යග්‍රහ ව්‍යාපාරයක්

● එච්.අයි. තුෂාර

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ කොටස් ඉන්දීය ආයෝජකයෙකුට ලබාදීමට ගෙන තිබෙන තීරණය අහෝසි කරන ලෙස ඉල්ලා කොළඹදී අද (01දා) සත්‍යග්‍රහ ව්‍යාපාරයක් පවත්වන බව ජාතික භික්ෂු පෙරමුණ සඳහන් කරයි.

ස්වාමීන් වහන්සේලා පිරිසක් කොළඹ පිටකොටුව ඓතිහාසික බෝධිය අබියසදී මෙම සත්‍යග්‍රහය පවත්වන බවද එම සංගමයේ ප්‍රධාන ලේකම් වකමුල්ලේ උදිත හිමියෝ අවධාරණය කළහ.

නැගෙනහිර ජැටියේ කොටස්වලින් 49%ක් ඉන්දීය ආයෝජකයෙකුට ලබාදීමට අදාළ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට ආණ්ඩුව සැලසුම් කර තිබෙන බවත්, එම තීරණය අහෝසි කර නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ක්‍රියාත්මක විය යුතු බවත් උන්වහන්සේ පවසා සිටියහ.

පර්යන්තයේ කොටස් ආයෝජකයෙකුට ලබාදීමට අදාළව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළහොත් එය පරාජය කිරීමට වෘත්තීය සමිති සමඟ ඒකාබද්ධ වී ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවද එහිමියෝ කියා සිටියහ.

# යුද හමුදාවේ 31,000කට කෝවිඩ් එන්නත විදිනවා

## - යුද හමුදා මූලස්ථානය

● ඉන්දික හේවාවිතාරණ

ඉන්දියාවෙන් ලැබුණු කෝවිඩ් - 19 එන්නත යුද හමුදා සාමාජිකයන් තිස් එක්දහසකට එන්නත් කිරීම් සිදුකරන බව යුද හමුදා මූලස්ථානය සඳහන් කරයි.

පසුගිය 29වැනි දින යුද හමුදා සාමාජිකයන් දහසකට එන්නත් ලබාදීම සිදු කළ බවත්, ඉන් පසුව සෑම දිනකම හත්දහස් පන්සීයකට එන්නත් ලබාදීම සිදු කළ බවත් යුද හමුදා මාධ්‍ය අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් නිලන්ත ප්‍රේමරත්න මහතා සඳහන් කළේය.

මේ අනුව අදාළ එන්නතේ පළමු මාත්‍රාව ලබාදීම හෙට (02දා) දිනයෙන් අවසන් වන බවත්, නාරාහේන්පිට යුද හමුදා රෝහල, පනාගොඩ යුද හමුදා රෝහල යන රෝහල් තුළ සේවය කරන යුද හමුදා වෛද්‍යවරුන්ට හා අනෙකුත් සෞඛ්‍ය කාර්යමණ්ඩලවලට සහ කෝවිඩ් 19 මර්දන කටයුතුවල නිරත හමුදා සාමාජිකයන්ට අදාළ එන්නත ලබාදීම සිදුකරන බවත් ඒ මහතා කියා සිටියේය.

කෝවිඩ් - 19 එන්නත ලබාදීම පසුගිය 29 වැනි දින නාරාහේන්පිට යුද හමුදා රෝහලේදී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

# හුදෙකලා තත්ත්වයෙන් ඉවත්වන ප්‍රදේශ

● එච්.අයි. තුෂාර

කෝවිඩ්-19 තත්ත්වය තුළ හුදෙකලා තත්ත්වයට පත්කර තිබූ ප්‍රදේශ කිහිපයක් අද (01දා) උදෑසන 5.00 සිට හුදෙකලා තත්ත්වයෙන් මුදාහැර තිබේ. මේ අනුව නාරාහේන්පිට පොලිස් වසමේ 100 වත්ත, වරාය පොලිස් වසමේ පහළ ශාන්ත ඇන්ඩෘස් පෙදෙස, ඉහළ ශාන්ත ඇන්ඩෘස් පෙදෙස සහ ඇන්ඩෘස් පාර හුදෙකලා තත්ත්වයෙන් මුදාහැර ඇත. මීට අමතරව පෑලියගොඩ පොලිස් වසමේ ගඟබඩ ග්‍රාම නිලධාරී වසමේ 90 වත්තද හුදෙකලා තත්ත්වයෙන් නිදහස් කර තිබේ.

# ඉඩම් ඔප්පු 17,000කට ජනාධිපති අත්සන් තබයි

● නිදර්ශනී වික්‍රමසිංහ

ගැටලු නිරාකරණය කොට අවසන් වරට සැකසූ ඉඩම් ඔප්පු 17,000ක් සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මේ වනවිට අත්සන් තබා තිබේ.

ඒ අනුව එම ඔප්පු මෙම මස තුළදී ජනතාවට බෙදා දීම සඳහා කටයුතු කෙරෙනු ඇති බව සඳහන්ය.

එසේම පාරම්පරිකව කෘෂිකර්මාන්තය සඳහා උපයෝගී කරගත් ඉඩම්වල අඛණ්ඩව වගා කිරීමට ගොවීන්ට අවස්ථාව සැලසෙන ලෙස නව නීතිරීති ක්‍රියාත්මක කිරීමත් සමග පැරණි චක්‍රලේඛ යටතේ පවරා ඇති නඩු ඉල්ලා අස් කර ගන්නා ලෙස ජනාධිපතිවරයා නිලධාරීන්ට උපදෙස් දී ඇත.

හෙතෙම සඳහන් කර ඇත්තේ ගම සමග පිළිසඳර වැඩසටහනේදී ජනතාවගෙන් ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් වනජීවී, වන සංරක්ෂණ, පරිසර, ඉඩම් ඇතුළු සියලු දෙපාර්තමේන්තු හා ආයතනවලට ජනතා යහපතට ඉවහල්වන අයුරින් නව නීති සැකසීමට පියවර ගන්නා ලෙසයි.

ඒ අනුව පවතින ගැටලු නිරාකරණය කරමින් නව නීති කඩිනමින් සකස් කෙරෙන බවත්, වසර ගණනාවක සිට රාජ්‍ය ආයතන සමග නඩු කියමින් පීඩාවට පත්ව සිටින ජනතාවට සහන සලසනු පිණිස මෙම තීරණයට එළඹි බවත් ජනාධිපති කාර්යාලය සඳහන් කළේය.

# 'ඉසුරුමත් හෙට දිනක් සෞභාග්‍යමත් මවුබිමක්'

# 73වැනි ජාතික නිදහස් දින සැමරුම පෙබරවාරි 04දා



නිදහස් දින සැමරුම් පෙරහුරුවේ අවස්ථා

● ඉන්දික හේවාවිතාරණ/ ඡායාරූප: ලහිරු හර්ෂණ

ඉසුරුමත් හෙට දිනක් සෞභාග්‍යමත් මවුබිමක් තේමා යටතේ 73වැනි ජාතික නිදහස් දින සැමරුම සෞඛ්‍ය මාර්ග උපදේශවලට අනුව සිදුකිරීමට රජය තීරණය කර තිබේ.

පෙබරවාරි 04වැනිදාට යෙදී තිබෙන ජාතික නිදහස් උත්සවය නිදහස් චතුරස්‍රයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

නිදහස් දින සැමරුම පෙළපාලිය ආරක්ෂක අංශ සාමාජිකයන් අටදහස් තිස්පහක හා ශිෂ්‍යභට සාමාජිකයන් තුන්සිය පනස්පහක සහභාගිත්වයෙන් පැවැත්වීමට නියමිතව තිබේ.

මේ අනුව යුද හමුදා සාමාජිකයන් හාරදහස් තුන්සිය විසිපහක් හා නාවික හමුදා සාමාජිකයන් අටසිය හැටඅටක් ගුවන් හමුදා සාමාජිකයන් නවසිය හතළිස් පහක් පොලිස් නිලධාරීන් එක්දහස් තුන්සිය අසූදෙකක් සිවිල් ආරක්ෂක බළකා නිලධාරීන් පන්සිය පහළොවක් ශිෂ්‍ය භටයන් තුන්සිය පනස්පහක් සහභාගිත්වයෙන් සැමරුම් උත්සවය පැවැත්වේ.

73වැනි ජාතික නිදහස් දින සැමරුමට සමගාමීව දිවයින පුරා රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති අතර, සියලු ජාතීන් නියෝජනය කරමින් සම්ප්‍රදායික සංස්කෘතික අංගවලට මුල්තැනක් ලබාදෙමින් මෙම වැඩපිළිවෙළ සිදුකිරීමට නියමිතව තිබේ.

# "ස්වයං නිරෝධායනය වන අය නිවසේ නොසිටියොත් නීති මගින් කටයුතු කරනවා"

## - පොලිස් මූලස්ථානය

● ඉන්දික හේවාවිතාරණ

කෝවිඩ්-19 තත්ත්වය තුළ ස්වයං නිරෝධායනයට ලක් කරන පිරිස් අදාළ නිවෙස්වලින් හා පරිශ්‍රවලින් විවිධ අවස්ථාවල පිටතට ගමන් කරන බවට වාර්තා වන බවත්, එසේ සිදුකළහොත් නීති මගින් කටයුතු කරන බවත් පොලිස් මූලස්ථානය සඳහන් කරයි.

නීති උල්ලංඝනය කරමින් නිවෙස්වලින් හා අදාළ පරිශ්‍රවලින් එළියට පැමිණෙන පිරිස් හඳුනා ගැනීම සඳහා ස්වයං නිරෝධායන කටයුතු සිදුකර පරිශ්‍ර හා නිවෙස් අවට සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් ඊයේ (31දා) සිට යොදවා තිබෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය. මීට අමතරව අදාළ නිවෙස්වලට හා පරිශ්‍ර තුළට පිටස්තර පුද්ගලයන් ඇතුළුවීමත් වරදක් බවත්, ඔවුන්ට එරෙහිවත් නීතිය ක්‍රියාත්මක කරන බවත් ඒ මහතා පවසා සිටියේය.

ස්වයං නිරෝධායනයට ලක් කරන පිරිස් සෞඛ්‍ය බලධාරීන් ලබාදෙන උපදෙස්වලට අනුව අදාළ කාලයම නිවෙස් තුළ හෝ පරිශ්‍ර තුළම රැඳීසිටිය යුතු බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

# සත්වෝද්‍යාන අද සිට විවෘතයි

● දෙහිවල - එච්.එම්. ධර්මපාල

ජාතික සත්ත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ඇති දෙහිවල සත්ත්වෝද්‍යානය, පින්නවල සත්ත්වෝද්‍යානය හා හම්බන්තොට සෆාරි සත්ත්වෝද්‍යානය කෝවිඩ්-19 වසංගතයෙන් පසු නරඹන්නන් සඳහා පෙබරවාරි මස 01වැනිදා සිට විවෘත කිරීමට නියමිත බව දෙහිවල සත්ත්වෝද්‍යාන නියෝජ්‍ය අධ්‍යක්ෂිකා අනෝමා ප්‍රියදර්ශනී මහත්මිය පවසා සිටියාය.

මේ අනුව දිනපතා උදෑසන 8.30 සිට ප.ව. 6.00 දක්වා විවෘතව තැබෙන අතර, නරඹන්නන් මුඛ ආවරණ පැලඳ නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමයට අනුව ඇතුළු වී නරඹන ලෙසත් සතුන් සඳහා කිසිදු ආහාරපාන වර්ග ලබාදීමෙන් වැළකී සිටින ලෙසත් විශේෂ ඉල්ලීමක්ද කර සිටියි.



# අන්තර්ජාල දැන්වීම් දමා මුදල් වංචා කළ අයෙක් අත්අඩංගුවට

● ඉන්දික හේවාවිතාරණ

සංගීත භාණ්ඩ හා පරිගණක අඩු මුදලකට ලබාදෙන බව පවසා අන්තර් ජාලයේ දැන්වීම් පළ කර අත්තිකාරම් මුදල් ලබාගෙන ජනතාවට වංචා සිදුකළ පුද්ගලයෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

භාණ්ඩ අඩු මුදලකට ලබාදෙන බව පවසා මෙම පුද්ගලයා අන්තර්ජාලය හරහා අත්තිකාරම් මුදල් ලබාගෙන තිබෙන බවත්, මෙවැනි වංචනික ක්‍රියාවට හසුව තිබෙනවා නම්, ඒ පිළිබඳ 071-8591753 දුරකථන අංකය මගින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දෙන ලෙසද පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති, නීතිඥ අජිත් රෝහණ මහතා සඳහන් කළේය.

අන්තර්ජාලය හරහා ගිණුම්ගත කරන මුදල් සොරකම් කර ඇති අතර, ජාතික හැඳුනුම්පත් උපයෝගී කරගෙන ලබාගෙන තිබෙන බවත්, මේ පිළිබඳ ලැබුණු පැමිණිලිවලට අනුව සිදුකළ පරීක්ෂණවලට අනුව 29 හැවිරිදි නාත්තණ්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වැලිගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බවත් ඒ මහතා පවසා සිටියේය.

අදාළ පුද්ගලයා අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදීත් විවිධ පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් හයක් සන්තකයේ තිබූ බවත්, මේ පිළිබඳ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තවදුරටත් පරීක්ෂණ පවත්වන බවත් අජිත් රෝහණ මහතා පැවසීය.

මේ පුද්ගලයාගේ වංචාවට හසු වී තිබෙනවා නම්, අදාළ දුරකථන අංකයට ඇමතුමක් ලබාදී පැමිණිල්ලක් කිරීමට හැකියාව තිබෙන බවද හෙතෙම සඳහන් කර සිටියේය.

# කෝවිඩ් එන්නත ලබාදීමේදී ගුරු පරපුරට ප්‍රමුඛතාවක් ලබාදීම සාධාරණ කරුණක්

## – අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස්

● නවෝද්‍යා පවනි



දරුවන් සමග දිනපතා ගැටෙන පිරිසක් ලෙස කෝවිඩ්-19 එන්නත ලබාදීමේදී ගුරු පරපුරට ප්‍රමුඛතාවක් ලබාදීම ඉතා සාධාරණ කරුණක් බවත්, ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් තමා රජයෙන් ඉල්ලීමක් කරන බවත් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පැවසීය.

බස්නාහිර පළාතේ පාසල් සියලු ශ්‍රේණි සඳහා පාසල් විවෘත කිරීමට ඇති හැකියාව පිළිබඳ පෙබරවාරි මස 15වැනි දිනට පෙර සොයා බලන බවද අමාත්‍යවරයා සඳහන් කළේය.

අමාත්‍යවරයා මේ බව පැවසුවේ, එක් එක් පාසල්වල අධ්‍යයන කටයුතු සිදුවන ආකාරය, අන්තර්ජාල අධ්‍යයන ක්‍රමවේදයේ සාර්ථකත්වය, සෞඛ්‍ය විධිවිධාන ආදිය පිළිබඳ විදුහල්පතිවරුන්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ දූ දරුවන්ගෙන් තොරතුරු සොයා විමසා බැලීම සඳහා පාසල් කිහිපයක සිදු කළ නිරීක්ෂණ චාරිකාවකින් අනතුරුව මාධ්‍ය අමතමිනි.

දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීමෙන් සිදුවන පාඩුව වෙනත් දේ මෙන් පියවාගත නොහැකි බවද, රට තුළ අවදානමක් පවතින නමුත් පාසල් දිගින් දිගටම වසා තැබීම ප්‍රායෝගික නොවන බවද, සෞඛ්‍ය, ප්‍රවාහන, ආරක්ෂක ඇතුළු සියලු අංශවල පූර්ණ සහයෝගය යටතේ සමස්ත ක්‍රියාවලීන් සාර්ථකව යථා තත්ත්වයට පත් කරගැනීමට හැකිවනු ඇතැයි තමා විශ්වාස කරන බවද අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

බස්නාහිර පළාතට අයත් කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල පාසල් ආරම්භ කිරීම සඳහා පියවර ගැනීමට ඒ ඒ පාසල්වලට බලය පවරා ඇති බවද, චක්‍රලේඛවල ගැටලු වෙතොත් ඒ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම්දීමටද අවස්ථාව ලබා දී ඇති බව කී අමාත්‍යවරයා, ඒ නිසාම පෙබරවාරි 15වැනි දිනට පෙර ආරම්භ කිරීමට හැකි පාසල් මොනවාද යන්න මේ වනවිට සොයා බලමින් සිටින බවද පැවසීය.

සෞඛ්‍යාරක්ෂාව තහවුරු කරමින් පාසල් පවත්වාගෙන යාම වෙනුවෙන් ඒ ඒ පාසල්වලට අවශ්‍ය පහසුකම්, මූල්‍ය ප්‍රතිපාදන ආදිය ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර ඇති බවද අමාත්‍යවරයා පැවසීය.

බස්නාහිර පළාතේ පෙරපාසල් ආරම්භ කිරීම සඳහාද අවශ්‍ය කටයුතු සූදානම් කරමින් තිබෙන බවත්, කුඩා දරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී සමාජ දුරස්ථභාවය ආරක්ෂා කරගැනීම පිළිබඳ කරුණ ප්‍රායෝගිකව ගැටලුකාරී තත්ත්වයක් වන නමුත් පෙරපාසල් වසා තැබීමද දරුවන්ට, දෙමාපියන්ට මෙන්ම පෙරපාසල් ගුරුවරුන්ටද ගැටලුවක් වන බව අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. එමෙන්ම බස්නාහිර පළාතේ 1 සිට 5 දක්වා ශ්‍රේණි විවෘත කිරීමට ඇති ප්‍රායෝගික හැකියාවද මේ වනවිට සොයා බලමින් සිටින බවත්, හැකි ඉක්මනින් එම ශ්‍රේණි සඳහාද පාසල් ආරම්භ කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන බවත් අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

# වරායේ නැ. පර්යන්තය විකිණීමට නොහැකි වුණොත් බටහිර පර්යන්තය හෝ ලබාදීමේ සේයාවක් යටි අරමුණුවලින් පේනවා

## – ආචාර්ය ඕමල්පේ සෝභිත හිමි

● අජිත්ලාල් ශාන්තඋදය/ කොළොන්න- ජේ. නානායක්කාර



වරායේ නැගෙනහිර පර්යන්තය විකිණීමට නොහැකි වුණොත් බටහිර පර්යන්තය හෝ ලබාදීමේ සේයාවක් යටි අරමුණුවලින් පෙනෙන්නේ යයිද, නැගෙනහිර පර්යන්තය වෙනුවෙන් උතුර, දකුණ, බටහිර පර්යන්ත හෝ රටේ වෙනත් සම්පත් ලබාදීම නොකළ යුතු බවත්, රටේ අනාගත ජාතිය වෙනුවෙන් ඒවා ආරක්ෂා කරගත යුතු හා රැකගත යුතු අතර, ඒ සඳහා ඇති කරගත් මේ සමගිය බිඳ නොගත යුතු යැයි රාමඤ්ඤ මහා නිකායේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝනායක ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියෝ පැවසූහ.

ඇඹිලිපිටියේදී ඊයේ (31දා) පැවැති මාධ්‍ය හමුවකදී අදහස් දැක්වූ උන්වහන්සේ මේ බව පවසා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ එහිමියෝ,

"වත්මන් ආණ්ඩුව කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකිණීමට උත්සාහ ගන්නා මේ අවස්ථාවේ මහා සංඝරත්නය, වෘත්තීය සමිති, විද්වත් කමිටු, සමිති සමාගම්, එකට එකතු වෙලා සමගියෙන් මැනවින් සංවිධානගත වෙලා තියෙනවා. ඒවා ආරක්ෂා කර ගන්නට. මේ ඇති කර ගත් එකමුතුව විවිධ කොන්දේසි නිසා පාවා දෙන්නට එපා කියලා වෘත්තීය සමිතිවලින් ඉල්ලා සිටින්නේ.

මේ ආරම්භ කළ ගමන ජයග්‍රහණයෙන් අවසන් කළ යුතුයි. ආගමික, නායකයන්, විද්වතුන්, සමාජ බලවේග එක්ව නගන හඬට රජය කන් දිය යුතුයි. ඒ අනුව වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට හෝ පිටරටකට, බදු දීම, විකිණීම, කොටස් දීම, පවරා දීම නවතා දැමිය යුතුයි. මෙහි අධිකාරිය, වරාය අධිකාරියට හිමිවිය යුතුයි කියන බලපෑමයි මේ සියලු දෙනා එකව ඉල්ලා සිටින බව තේරුම්ගත යුතුයි. රටේ දේපොළ විකිණීමට යහපාලන ආණ්ඩුව දැමූ මුට්ටියයි මේ ක්‍රියාත්මක වෙන්නේ. හම්බන්තොට වරායට මුලින් මුට්ටිය දැම්මේ. නමුත් මුට්ටිය අසාර්ථකයි. දේශපාලනඥයන් නමැති ඉන්ද්‍රජාලිකයන්ගේ බොරු පොරොන්දු හමුවේ ජනතාව මුළාවට පත් වෙලා තියනවා. මුට්ටිය දැම්මම ජනතාව දැනගත්තා හොරා කියලා. ඒ ගමන කිව්වා නෑ නෑ බය වෙන්න එපා ඒ හොරා නෙමෙයි කියලා. හොරාගෙන් ගේ බේරා ගන්නවා කියපු නිසයි ජනතාව ඊළඟ පියවරක් තැබුවේ.

රට විකුණා ඉන් ලැබෙන කොමිස් සහ තානාන්තර ලබන කල්ලි කණ්ඩායමකට අපි අහුවෙලා තියෙනවා. ඒ ජනතාවගේ වරදකට නෙවෙයි. දේශපාලනඥයන් දුන් බොරු පොරොන්දු නිසා. ඒ මුළාව දැන් තේරුම් අරන් තියන නිසයි ජනතාව මේ තරම් ඒකරාශී වෙන්නේ" යනුවෙන් පවසා සිටියහ.

එසේම අන්තවාදය, ජාතිවාදය පරාජයට පත් කිරීම සඳහා වූ මේ එකමුතුව ජයග්‍රහණය දක්වාම මෙහෙය විය යුතු බව පැවසූ සෝභිත හිමියෝ, ගම්මන්පිල, විමල් වීරවංශ, වාසුදේව නානායක්කාර යන ඇමතිවරුන්ද වරාය අධිකාරියට නැගෙනහිර පර්යන්තය දිය යුතුය යන එකඟතාවකට පැමිණ ඇති බව අපි ජනමාධ්‍ය මගින් දුටු බවද එහිමියෝ පැවසූහ.

ඒ ඇමතිවරුන් පහුවෙලා හරි එවන් තීරණයක් ගැනීම ගැන අපි සතුටු වන අතර, සත්‍ය තියෙන්නේ එතන යැයිද සෝභිත හිමියෝ සඳහන් කර සිටියහ.

තවදුරටත් අදහස් දැක්වූ එහිමියෝ,

"රජය මේ සම්බන්ධයෙන් ගන්නට යන තීරණය සම්බන්ධයෙන් ඒ ඇත්තෝ වගකිව යුතුයි. ඉන් මිදීමට ඔවුන්ට බෑ. ජනමාධ්‍ය මගින් ඔවුන් කළ ප්‍රකාශ සම්බන්ධයෙන් ඔවුන් පියවරගත යුතුයි. නැගෙනහිර පර්යන්තයේ, වරායේ වෙනත් සම්පත්වල ආරක්ෂාව වෙනුවෙන් ඒවායේ අයිතිය වරාය අධිකාරියට ලැබෙන තෙක් ආණ්ඩුව තුළ සිටිමින් හෝ පෙනී සිටිය යුතුයි. ඔවුන් එළඹුන තීරණය ඉටුකරන්නට ශක්තිය ලැබේවායි කියලා අපි ඔවුන්ට ආශීර්වාද කරනවා" යැයිද පවසා සිටියහ.

# දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට විශේෂ ජනාධිපති කොමිසම සම්පූර්ණයෙන් ප්‍රතිපත්ති මට්ටමෙන්ම ප්‍රතික්ෂේප කළ යුතුයි

## – සමගි ජන බලවේගයේ පා.ම. ඉරාන් වික්‍රමරත්න

● දිනේෂ් සමරකෝන්



දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීමට පත් කළ කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට විශේෂ ජනාධිපති කොමිසමත් පත් කර ඇති බවත්, එය සම්පූර්ණයෙන් ප්‍රත්පත්ති මට්ටමෙන්ම ප්‍රතික්ෂේප කළ යුතු බවත් සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මහතා පැවසීය.

කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (31දා) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම් පිළිබඳ කටයුතු කිරීමට මෙරට තුළ ව්‍යවස්ථාමය අධිකරණයක් නොමැති බැවින් ඒ පිළිබඳ නඩු ඇසීම ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරෙන බවත්, ඒ අනුව කොමිසම් සභා පත් කරමින් විධායකය යටතේ අදාළ නඩු ඇසීම සිදු කළ නොහැකි බවත් සඳහන් කළ ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීවරයා,

"ජනාධිපති කොමිසමේ වැඩ අවසන් කරලා ජනාධිපතිවරයාට භාර දීලා තිබෙනවා. ඒ කොමිසමේ විශේෂයෙන්ම සාකච්ඡා කරලා තියෙන්නේ දේශපාලන පළිගැනීම් පිළිබඳ. ඒ කොමිසමේ වාර්තාව පදනම් කර ගෙන කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් දාලා ඒක අනුමත කර ගෙන තිබෙනවා. මම මුලින්ම සඳහන් කරන්න ඕන ඇයි මේ දේශපාලන කොමිසම තියෙන්නේ කියන එක. ඇත්තටම යමක සත්‍යතාව සොයා ගැනීමට තමයි දේශපාලන කොමිසමක් පත් කරන්නේ. ඒ අනුව මේ සත්‍යතාව දැනගන්න ක්‍රමවේදයක් යොදවනවා. ඒ ක්‍රමවේදය ඇවිල්ලා විනිසුරුවරයා විමර්ශකයෙකු හැටියට කටයුතු කරනවා. ඇත්තටම ඒ විනිසුරුවරයා අධිකරණයක ඉද්දි ඒක නෙවෙයි කරන්නේ. අධිකරණයේදී විනිසුරුවරයා ස්වාධීනයි. විනිසුරුවරයා පාර්ශ්වයන් ඉදිරිපත් කරන කරුණුත් තර්ක කරලා තමයි තීන්දුවකට එන්නේ. කොමිසමක සත්‍යතාව හොයාගෙන යන්න ඕන. නමුත් අපට පේනවා සත්‍යතාව හොයන වැඩපිළිවෙළක් මෙතන වෙලා නැහැ කියලා. අතීතයේ සිටිය ඒ චූදිතයන් එහෙමත් නැත්නම් එක එක නඩු ගෙනාපු අයව ඔවුන්ට සැකකාර චූදිතයන් කියන්න පුළුවන්. ඒ අය නිදහස් කරලා අතීත චෝදනාවන් අරගෙන වර්තමාන චූදිතයන් එතන ඇති කරලා තියෙනවා. උදාහරණයක් විදියට නම් කරලා තියෙනවා රනිල් වික්‍රමසිංහ මහතාව, චම්පික රණවක මහතාව, මංගල සමරවීර මහතාව, සුමන්තිරන් මහතාව, සරත් ෆොන්සේකා මහතාව, අනුර කුමාර දිසානායක වැනි දේශපාලඥයන්ව නම් කරලා ඊට අමතරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකරව, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන තුසිත මුදලිගේ සහ තවත් රාජ්‍ය නිලධාරීන් පිරිසක්ම නම් කරලා මේ කොමිසන් සභාවෙන් ඒ අයව හරියට චූදිතයන් ලෙස නම් කරලා තියෙනවා. ඉතින් ඔය වාර්තාව අරගෙන ගිහින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අරගෙන තිබෙනවා. දැන් මේ රටේ ප්‍රශ්නය ඇවිල්ලා නීතියේ අඩුපාඩු ප්‍රශ්නයක් නෑ. ලංකාවේ දිගින් දිගටම තිබිලා තියෙන්නේ පාලනයේ අඩුපාඩු. ඉතින් මේ අය මොනවාද කරලා තියෙන්නේ. මේ කොමිෂන් සභාව හරහා අධිකරණයේ වැඩපිළිවෙළ විධායකය අරගෙන තිබෙන්නේ. මෙන්න මේක බොහොම භයානක දෙයක්. රටට භයානක දෙයක්. මොකද මේ රටේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවය වෙනස් ක්‍රමවේදයක්. දැන් අපි දැකලා තිබෙන භයානකම දේ ඇවිල්ලා මේ මාස 15 තුළදී ප්‍රජාතන්ත්‍රවාදයට පහරක් වදින එකයි මේකෙන් පේන්නේ අපට. මේකේ එක එක දේවල් තියෙනවා. හමුදා කරණය සිදු වී ගෙන යනවා. ඉන්පසු අධිකරණයේ ක්‍රියාවලියන් විධායකය ගන්නවා මේ කොමිෂන් සභා හරහා. මේවා තමයි භයානකම දේ. ඉතින් මේවාවලින් නිදහස් කරලා තියෙන අයත් ඉන්නවා. ඒ තමයි බැසිල් රාජපක්ෂ, උදය ගම්මන්පිල, යෝෂිත රාජපක්ෂ, නාලක ගොඩහේවා, පිල්ලෙයාන්, ජාලිය වික්‍රමසූරිය වගේ ගොඩක් දෙනෙක් ඉන්නවා. ඒ අයවත් විවිධ ක්‍රමවලට නිදහස් කරලා තියෙනවා. ඇත්තටම කොමිෂන් සභාවක වගකීම ඇවිල්ලා සැකකරුවෙක් හෝ චූදිතයෙක් නිදහස් කරන එකවත් අලුත් අයව චූදියන් කියලා නම් කරන එකවත් නෙවෙයි. කොමිෂන් සභාවකින් වෙන්න ඕන සත්‍යතාව සොයාගෙන ගිහින් ඉන්පසු ඒවා අධිකරණ මාර්ගවලට යන්න ඕන. හරි අපි හිටපු ආණ්ඩුව කාලේ දේශපාලන පළිගැනීමක් තිබුණා කියමු. ඒක අධිකරණයට ගිහින් තිබෙනවා නම් ඒක ගිහින් තියෙන්නේ නීතිපති දෙපාර්තමේන්තුව හරහා. ඒ අනුව ඒ නිලධාරීනුත් වගකියන්න ඕන. නීතිපති දෙපාර්තමේන්තුවට ගියා කියමු. ඒ ගිහින් කවුරු හරි වරදක් කරලා නැත්නම් ඒ අය නිර්දෝෂී නම් අධිකරණයෙන් නිදහස් කරන්න ඕන. මම නම් කරපු අය ව්‍යවස්ථාව උල්ලංඝනය කලා වගේ කතාවක්නේ මෙතන හදලා තියෙන්නේ. ඒ අනුව ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තියෙනවා නම්, අපේ රටේ ව්‍යවස්ථාමය අධිකරණයක් නෑ. ඉතින් ව්‍යවස්ථාමය අධිකරණයක් නැති නිසා සඳහන් කරනවා තවත් ජනාධිපති කොමිසමක් නැතිනම් කමිටුවක් පත් කරන්න කියලා. ඒ අනුව මේ ගැන සොයා බලා තීරණය කරලා දඬුවම් දෙන්න කියනවා. සම්පූර්ණයෙන්ම ප්‍රතිපත්ති මට්ටමෙන්ම අපි ඒක ප්‍රතික්ෂේප කරන්න ඕන. හේතුව තමයි ව්‍යවස්ථාමය අධිකරණයක් නැත්නම් රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉබේටම ඒ නඩුව අහන්න ඕන. මේ වෙන වෙන අය පත් කරලා විධායකය යටතේ ඒවා කරන්න බෑ" යැයිද පැවසීය.

# ලොව දියුණු රටවල් 49%ක් නොව 100%ක ආයෝජන අවස්ථා පෞද්ගලික අංශයට ලබා දීලා

## – රාජ්‍ය අමාත්‍ය නිමල් ලන්සා

● නිදර්ශනි වික්‍රමසිංහ



ලොව දියුණු රටවල් 49%ක් නොව 100%ක ආයෝජන අවස්ථා පෞද්ගලික අංශයට ලබා දී ඇතැයි ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලන්සා මහතා පැවසීය.

හෙතෙම පෙන්වා දුන්නේ සිංගප්පූරුව, මැලේසියාව, ඩුබායි වැනි රටවල් ආයෝජකයන්ට අවස්ථාව ලබාදීම හේතුවෙන් එම තත්ත්වයට පත්ව ඇති බවයි.

ඒ අනුව සංචාරක කර්මාන්තයට, දෛනික කටයුතුවලට රට විවෘත කරමින් ආයෝජනයට ඉඩ සැලසිය යුතු බව රාජ්‍ය අමාත්‍යවරයා සඳහන් කර සිටියේ, මිනුවන්ගොඩ ප්‍රදේශයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ අවස්ථාවකට එක් වෙමිනි.

ඒ අනුව එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍ය නිමල් ලන්සා මහතා,

"කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් ඉන්දියාවෙන් ආයෝජනයක් ඇවිල්ලා තියෙනවා. මේකට සමහර සංවිධාන විරෝධතාවය පළ කරනවා. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැහැදිලිව කියලා තියෙනවා අපේ රටේ සම්පත් විකුණන්නෙත් නැහැ, බදු දෙන්නෙත් නැහැ කියලා. සියයට 49ක් ආයෝජනයට දෙන එකටත් විරුද්ධයි. සංචාරකයො එන්නේ නැතිනම්, ආයෝජන එන්නේ නැතිනම් රුපියල අවප්‍රමාණය වෙනවා. ඩොලරය ඉහළ යනවා. භාණ්ඩ හා සේවා මිල ඉහළ යනවා.

සිංගප්පූරුව, මැලේසියාව, ඩුබායි වැනි රටවල් දියුණු වුණා කියලා කතා කරනවා. එයාලා ආයෝජකයන්ට අවස්ථාව දීලා තියෙනවා. ලෝකයේ සියලු රටවල් ආයෝජනයට අවස්ථාව දීලා තියෙනවා. සියයට 49 නෙමේ සියයට 100 දක්වා දීලා තියෙනවා. ඒකයි ඒ රටවල් දියුණු වෙලා තියෙන්නේ. මෙහෙ ඉන්න විපක්ෂය, ඇතැම් පිරිස් මිලියන 22ක් අපේ රටේ ජනතාව අමාරුවේ දාන්න හදන්නේ. පසුගිය අවුරුදු 70ක් හිටපු නායකයන්ට බණිනවා මුකුත් කළේ නැහැ කියලා. ඒ එක නායකයකුටවත් මේ සමහර සංවිධාන වැඩ කරන්න දුන්නේ නැහැ. ඒ නිසා රට ආපස්සට ගියා" යැයිද පැවසීය.

# නැ.පර්යන්තය කොටස් වෙළෙඳ පොළට ගෙනැවිත් මුදල් එකතු කිරීමට සූදානම්

## – බලශක්ති අමාත්‍ය නීතිඥ උදය ගම්මන්පිල

● නවෝද්‍යා පවනි



කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සාදා නිම කිරීමේ කටයුතු සිදු කිරීමට වරාය අධිකාරියට මුදල් නොමැති නම් හෝ ණය ලබාදීමට බැංකුවක් ඉදිරිපත් නොවේ නම් එය කොටස් වෙළෙඳ පොළට ගෙනැවිත් මෙරට දේශප්‍රේමී ජනතාවගේ මුදල්වලින් අවශ්‍ය අරමුදල් එකතු කිරීමට සූදානම් බව පිවිතුරු හෙළ උරුමයේ නායක බලශක්ති අමාත්‍ය නීතිඥ උදය ගම්මන්පිල මහතා පවසයි.

නැගෙනහිර පර්යන්තය ලබා නොදුන්නේ යැයි ඉන්දියාව කිසිදු ලෙසකින් අමනාප නොවන බවත්, මෙරට අපනයන වෙළෙඳ පොළට ඉන් කිසිදු හානියක් නොවන බවත් ඒ මහතා ප්‍රකාශ කළේය.

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් ජාතික නිදහස් පෙරමුණේ නායක, කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ නිල නිවසේ පැවැති පක්ෂ නායක රැස්වීමෙන් අනතුරුව පිවිතුරු හෙළ උරුමය නායක බලශක්ති අමාත්‍ය නීතිඥ උදය ගම්මන්පිල මහතා මේ බව සඳහන් කළේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා,

"කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවටම ලබාදිය යුතු යැයි ප්‍රධාන තර්ක දෙකක් ගෙන ආවා. ඉන් එකක් තමයි අපට මේක හදාගන්නට සල්ලි නැහැ කියන එක. මීටර 1320ක දිගින් යුතු මෙහි මීටර 440ක් අප හදාගත්තේ සමස්තය හැදීමේ ඉලක්කය ඇතුවයි. පසුගිය ආණ්ඩුව මේක නතර කළේ නැත්නම් මේ වනවිටත් වරාය අධිකාරියේ අරමුදල්වලින්ම මෙම පර්යන්තය හදලා ඉවරයි. වරාය අධිකාරියට මුදලුත් නැත්නම් ණයක් දෙන්න බැංකුවකුත් නැත්නම් අපි ලෑස්තියි ඒක කොටස් වෙළෙඳ පොළට ගෙනල්ලා මේ රටේ දේශප්‍රේමී ජනතාවගේ සල්ලිවලින් අවශ්‍ය අරමුදල් ටික එකතු කරගන්න.

තවත් සමහරෙක් තර්කයක් විදිහට ගේනවා අපේ කොළඹ වරායේ සමස්ත වෙළෙඳාමෙන් 55%ක් එහෙමත් නැත්නම් ප්‍රතිඅපනයන වෙළෙඳාමෙන් තුනෙන් දෙකක් කරන්නේ ඉන්දියාව, ඒ නිසා ඉන්දියාව තරහ වුණොත් අපේ අපනයන වෙළෙඳ පොළ අහිමි වෙයි කියලා. ඇත්ත කතන්දරය ඉන්දියාව කොළඹ වරායේ ප්‍රතිඅපනයන වෙළඳාම කරන්නේ ලංකාවට තියෙන ආදරයක් හන්දා නෙවෙයි. ඉන්දියාවේ කිසිදු වරායකට දැවැන්ත නැව් යන්න බැරි ආකාරයෙන් වැලි පිරෙන නිසයි. ඒ නිසා ඉන්දියාවට අපිත් එක්ක තරහ වෙලා මේ ප්‍රතිඅපනයන වෙළෙඳාම ගෙනයන්න ඉන්දියාවේ වරායක් නෑ කියන එක ඉතාම වගකීමෙන් කියනවා. මේ වනවිටත් ඉන්දියාව ඉදිකරමින් පවතින විසින්ජම් වරාය හෝ නිකබෝ වරාය වැලි පිරෙන එකෙන් වළකාගෙන සාර්ථක වුවහොත් ඔවුන් ප්‍රතිඅපනයන වෙළෙඳාම කොහොමත් රැගෙන යනවා. ඒ හැරුණුකොට නැගෙනහිර පර්යන්තය ලබා නොදුන්නා කියන පදනමින් නම් ඉන්දියාවට කොහොමවත් සිය වෙළෙඳාම ගෙනයන්නට වෙනත් තැනක් නැහැයි කියන එක අපි ඉතාම වගකීමෙන් ප්‍රකාශ කරනවා" යැයිද සඳහන් කළේය.

# නැ.පර්යන්තයේ කොටස් ඉන්දියාවට දුන්නොත් වරාය ශ්‍රේණිගත කිරීමේ ස්ථානය වෙනත් අයෙකුට පැවරෙනවා

## – ඉංජිනේරු සේවා වෘත්තීයවේදීන්ගේ සංගමය

● ඉන්දික හේවාවිතාරණ

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ කොටස්වලින් කොටසක් ඉන්දීය සමාගමට ලබාදීමට කටයුතු කළහොත් වරායන් ශ්‍රේණිගත කිරීම යටතේ අප රටට හිමිව තිබෙන 24වැනි ස්ථානය වෙනත් පාර්ශ්වයක් වෙත පැවරෙන බව ඉංජිනේරු සේවා වෘත්තීයවේදීන්ගේ සංගමය සඳහන් කරයි.

වරායන් ශ්‍රේණිගත කිරීම්වලට අනුව 24වැනි ස්ථානය කොළඹ වරායටත්, 29වැනි ස්ථානය ඉන්දියාවේ ජවහල්ලාල්නේරු වරායටත්, ඉන්දියාවේ මන්ද්‍රා වරායට 34වැනි ස්ථානයෙත් පසුවන බවද එම සංගමයේ කමිටු සාමාජික ඉංජිනේරු දිනේෂ් යසවර්ධන මහතා පැවසීය.

වරායෙන් කොටසක් ඉන්දීය සමාගමකට පැවරීමත් සමග ශ්‍රී ලංකාව හිමි ස්ථානය අහිමි වී යන බවද ඒ මහතා පවසා සිටියේය.

නැගෙනහිර පර්යන්තය තුළ ඇති පැරණි යන්ත්‍ර සූත්‍ර උපයෝගී කර ගෙන පවා වාර්ෂිකව ඩොලර් මිලියන පනහක ආදායමක් උපයා ගැනීමට හැකියාව තිබෙන බවත්, අදාළ පර්යන්තය අංගසම්පූර්ණ කිරීම සඳහා වරාය අධිකාරියේ ඉංජිනේරුවන්ට හැකි බවත් හෙතෙම සඳහන් කළේය.

එසේම රජය විසින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම හරහා මෙම පර්යන්තය තුළින් රටට වාර්ෂිකව අතිවිශාල මුදලක් උපයා ගැනීමට හැකියාව තිබෙන බවත්, මේ නිසා ඉන්දීය සමාගමකට වරායේ නැගෙනහිර පර්යන්තයේ කොටස් ලබාදීමට ගෙන තිබෙන තීරණය වහාම අහෝසි කිරීමට ආණ්ඩුව කටයුතු කළ යුතු බවත් දිනේෂ් යසවර්ධන මහතා පැවසීය.

# රටේ සම්පත් ගැන හැඟීමක් තිබෙනවා නම් වෘත්තීය සමිති පිළිබඳ පමණක් විශ්වාසය තබන්න

## – හිටපු පා. ම. හිරුණිකා ප්‍රේමචන්ද්‍ර

● දිනේෂ් සමරකෝන්



කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට ලබාදීමට විරුද්ධව ආණ්ඩුවේ දේශපාලන පක්ෂ විරෝධය පළ කරන්නේ මේ සම්බන්ධයෙන් වන වෘත්තීය සමිති විරෝධතාව අඩපණ කිරීමට බව හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය පැවසීය.

ඒ අනුව මේ අවස්ථාවේ රටේ සම්පත් පිළිබඳ යම්කිසි හැඟීමක් තිබෙනවා නම්, වෘත්තීය සමිති පිළිබඳ පමණක් විශ්වාසය තබන ලෙස ජනතාවගෙන් ඉල්ලීම් කරන බව කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ ඊයේ (31දා) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් ඒ මහත්මිය සඳහන් කළාය.

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ විරෝධය 20වැනි සංශෝධනයට පෙරද දක්නට ලැබුණු බවත්, අවසානයේ එලෙස විරෝධය පළ කළ සියලු දෙනා එම සංශෝධනයට සහාය පළ කළ බවත්, සඳහන් කළ හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,

"නැගෙනහිර පර්යන්තය ගැන කතා කරද්දී මම ඊයේ දැක්කා ආණ්ඩු පක්ෂයට සම්බන්ධ අමාත්‍යවරුන් 10-12 එළියට බැහැලා මේ පිළිබඳ ඔවුන්ගේ මතය ප්‍රකාශ කරලා නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට ලබාදීමට විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඊට රටේ ප්‍රසිද්ධම අමාත්‍යවරුන් කිහිපදෙනෙක් සහා පක්ෂවල නායකයන් කිහිප දෙනෙක් ඉන්නවා දැක්කා. මම මේ රටේ ජනතාවගෙන් ඉල්ලනවා මේ දෙවැනි රඟපෑමට රැවටෙන්න එපා. මේ විදියටම මේ කණ්ඩායම 20වැනි සංශෝධනයට විරුද්ධ වෙනවා කියලා රැස්වීම්වල පන්සල්වල ප්‍රබලව තමන්ගේ මතය ප්‍රකාශ කළා. අන්තිමට එක දවසයි ගෝඨාභය රාජපක්ෂ මහතා එන්න කියලා සංවේදී වුණේ. මම දන්නේ නෑ එතුමා සංවේදී වුණාද නැත්නම් මේ අයව සංවේදී කළාද කියලා. ඉතින් සංවේදී වුණා කියලා ඔවුන්ගේ මතය වෙනස් කළා. මේක තනිකර දේශපාලන නාටකයක්. මේ අවස්ථාවේ ජනතාවට රටේ සම්පත් පිළිබඳ යම්කිසි හැඟීමක් තිබෙනවා නම් වෘත්තීය සමිති පිළිබඳ පමණක් විශ්වාසය තබන්න. ඒ වෘත්තීය සමිති පක්ෂ විපක්ෂ භේදයකින් තොරව පොදු කාරණාවක් සඳහා වගේම රටේ අනාගතය පරපුරට අයිති දෙයක් විකිණීම වැළැක්වීම සඳහා එළියට බැහැල තියෙනවා. මේක ඉතාමත් වැදගත් කාරණාවක්. අපි දැකලා තියෙනවා සෑම ආණ්ඩුවකදීම යම් යම් දේශපාලන අවශ්‍යතාවන් මත පක්ෂ නියෝජනය කරන වෘත්තීය සමිති එක එක කාලයට එළියට බහිනවා. ඒත් මෙතනදී විශේෂයෙන්ම කියන්න ඕන ජනතා විමුක්ති පෙරමුණ සම්බන්ධ කරගෙන හෝ සමගි ජන බලවේගය සම්බන්ධ කරගෙන හෝ එහෙමත් නැත්නම් පොදුජන පෙරමුණ සම්බන්ධ කර ගෙන වෙන් වෙන් වශයෙන් එළියට බැහැලා නෑ. ඔවුන් සහෝදරයෝ වගේ එළියට බැහැලා එක් කාරණයක් වෙනුවෙන් තමන්ගේ සියලු මතිමතාන්තර පැත්තකට දාලා සටන් කරනවා. මේ සටන අඩපණ කරන්න තමයි දැන් මේ උත්සාහ කරන්නේ අනිත් පාර්ශ්වයන්. මේ සම්බන්ධයෙන් ආණ්ඩු පාර්ශ්ව එළියට බැහැලා කරන්නේ ආණ්ඩුවේ නාට්‍යයේ තවත් කොටසක්" යැයිද සඳහන් කළාය.

සාරවිට.lk
සතුටේ මන්පෙත
www.saaravita.lk

# කොවැක්ස් සංවිධානයෙන් එන්නත් ලබාගැනීම ගැන තොරතුරු ආණ්ඩුව ජනතාවට හෙළිකළ යුතුයි

## එජාප නායක, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ

● නවෝද්‍යා පවනි



කොවැක්ස් සංවිධානයෙන් එන්නත් ලබාගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කර තිබේද? එම එන්නත් මෙරටට ලැබෙන්නේ කවදාද? යන්න ඇතුළු එම ගිවිසුම පිළිබඳ සියලු තොරතුරු ආණ්ඩුව විසින් ජනතාවට හෙළි කළ යුතු බව එක්සත් ජාතික පක්ෂ නායක, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

මෙරට තුළ වෛරස් පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇති කිරීමට මෙතැන් පටන් කටයුතු සැලසුම් කළ යුතු බව ද වික්‍රමසිංහ මහතා කියා සිටියේය.

ඒ මහතා මේ බව පැවසුවේ ඊයේ (31දා) නුගේගොඩ ප්‍රදේශයේ පැවැති විශේෂ සංවාදශීලී හමුවකට එක්වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා,

"කොවැක්ස් සංවිධානයෙන් මෙරට 3%ක ප්‍රමාණයකට එන්නත් ලැබෙන්නට නියමිතව තිබෙනවා. ආණ්ඩුව එන්නත් ලබා ගැනීම වෙනුවෙන් අත්සන් කර තිබෙන ගිවිසුම කුමක්ද? ඒ එන්නත ලැබෙන්නේ කවදාදැයි තවම කියා නැහැ. දැනට ලැබිලා තියෙන එන්නත් ලබාදෙන්න පුළුවන් 20%ක පිරිසකට පමණයි. ඉතිරි 80% සඳහා එන්නත් නිෂ්පාදන ගිවිසුමක් අප අත්සන් කර තිබේද? මේ කරුණු සම්බන්ධයෙන් ආණ්ඩුව ජනතාවට කරුණු හෙළි කළ යුතුයි.

එමෙන්ම කොරෝනා පාලනය වෛද්‍ය විද්‍යාව දන්නා අයට භාර දෙන්න. අප සෑම විටම වෛද්‍ය උපදෙස් අනුව ක්‍රියා කළ යුතුව තිබෙනවා. එසේ නොකරනවා නම් අපට විශාල ප්‍රශ්නයක් ඇතිවෙනවා.

එමෙන්ම අප අනාගතය ගැනත් සිතිය යුතුයි. පළමුවෙන්ම එච්.අයි.වී, ඉන්පසුව ඉබෝලා ආදී වෛරස් ඇතිවුණා. ඒ සියල්ලටම වඩා වේගයෙන් කොරෝනා වෛරසය පැතිරෙමින් තිබෙනවා. එය මර්දනය කරන්නට කොපමණ කලක් ගත වේ දැයි කියන්නට බැහැ.

උදාහරණයක් ලෙස ගතහොත් මීළඟ වසර 60 ඇතුළත ඇති වෙන වෛරස් මොනවාදැයි කියන්නට බැහැ. අප ඒ සඳහා සූදානම් විය යුතුව තිබෙනවා. වෛරස් යුද්ධයකට සූදානම් වීමත් ජාතික ආරක්ෂාව යටතට ගෙන සලකන්නට හැකියාව තිබෙනවා. අපට ඉන්නේ වෛරස විද්‍යාඥයන් ස්වල්පයක් පමණයි. ඒ සංඛ්‍යාව අනාගතයේ දී වැඩි කරගත යුතුයි. ඒ අතර දැනට සිටින විශේෂඥයන්ගෙන් ප්‍රයෝජන ගත යුතුයි.

මේ රටේ වෛරස රෝග පර්යේෂණ ආයතනයක් නැහැ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඩෙංගු පර්යේෂණායතනයක් තිබෙනවා. ඒ අය ඔක්ස්ෆර්ඩ් පර්යේෂණයටත් උදව් කරනවා. වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ මාස හයක හෝ අවුරුද්දක වෛරස පිළිබඳ පාඨමාලාවක් තිබෙනවා. මේ ක්ෂෙත්‍රය දියුණු නොකළහොත් ඊළඟ වසර 60 වනවිට අපට විවිධ වෛරස්වලට යට වෙන්නට සිදුවෙනවා. ඒ නිසා වෛරස පර්යේෂණ මධ්‍යස්ථානයක් ඇති කරන ලෙස අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. විශ්වවිද්‍යාල මෙන්ම වෛද්‍ය අංශයත් එකතු කොට දැන් සිටම එය ආරම්භ කරන්න" යැයිද සඳහන් කළේය.




# ශිෂ්‍යත්ව කඩයිම් ලකුණු පහළ දැමීම ගැන ජනපති අද තීන්දුවක් දිය යුතුයි

## – ලංකා ගුරු සේවා සංගමය

● එච්.අයි. තුෂාර

ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ පදනම මත පාසල්වලට සිසුන් බඳවාගැනීම සඳහා නිකුත් කර තිබෙන කඩයිම් ලකුණු පහළ දැමීම පිළිබඳ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අද (01දා) තීන්දුවක් ලබාදිය යුතු බව ලංකා ගුරු සේවා සංගමය සඳහන් කරයි.

අදාළ ගැටලුව විසඳීමට අධ්‍යාපන බලධාරීන් කටයුතු නොකරන නිසා කොටුව දුම්රිය පොළ ඉදිරිපිට සිට ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා අද (01දා) විරෝධතා පාගමනක් පවත්වන බවද එම සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ මහතා සඳහන් කළේය.

පාසල් සුරැකීමේ ජනතා ව්‍යාපාරය හා අසාධාරණයට පත් ශිෂ්‍යයන්ගේ දෙමාපියන් ඒකාබද්ධ කරගනිමින් මෙම විරෝධතා පාගමන පවත්වන බවද ඔහු පවසා සිටියේය.

පාසල්වලට බඳවාගන්නා ලකුණු ප්‍රමාණය අධික ලෙස ඉහළ දැමීම නිසා ග්‍රාමීය පාසල්වල හා දුෂ්කර පාසල්වල ඉගෙනුම ලබා ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වූ බොහෝ පිරිසකට පහසුකම් සහිත පාසලකට ඇතුළත් වීමේ අවස්ථාව අහිමි වී තිබෙන බවද ඒ මහතා සඳහන් කළේය.

මෙම ගැටලුව විසඳගැනීම සඳහා අධ්‍යාපන බලධාරීන් සමග සිදුකළ සාකච්ඡා අසාර්ථක වී තිබෙන බවත්, මේ නිසා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මෙම ගැටලුවට විසඳුම් ලබාදිය යුතු බවත් හෙතෙම පවසා සිටියේය.

# 'සදාචාර විරෝධී අන්‍යාගමික පනත් කෙටුම්පත' සම්මත කරගැනීමට ජනපතිගේ අවධානය ඕනෑ

## – 'හෙළ බොදු සවිය' සංවිධානය

● නිදර්ශනි වික්‍රමසිංහ

ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත නාහිමියන් විසින් 2004 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 'සදාචාර විරෝධී අන්‍යාගමික පනත් කෙටුම්පත' පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට ජනාධිපතිවරයාගේ අවධානය යොමුවිය යුතු යැයි 'හෙළ බොදු සවිය' සංවිධානය අවධාරණය කරයි.

එම සංවිධානය පෙන්වා දෙන්නේ, පක්ෂ විපක්ෂ දේශපාලනඥයන් ඇතුළු රටේ බෞද්ධ ජනතාව අන්‍යාගම්වලට හරවා ගැනීමේ දැවැන්ත කුමන්ත්‍රණයක් රට පුරා ක්‍රියාත්මක වෙමින් පවතින බවත්, ඒ අනුව ඒ පිළිබඳ ජනාධිපතිවරයාගේ දැඩි අවධානය යොමුවිය යුතු බවත්ය.

එසේම වත්මන් ආණ්ඩුව බහුතර සිංහල බෞද්ධයන්ගේ ඡන්දයෙන් තේරී පත් වූ ආණ්ඩුවක් බව ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇති බව පෙන්වා දෙන 'හෙළ බොදු සවිය' සංවිධානය, 2/3 බහුතර ආණ්ඩුවක් තිබියදීත් සිංහල බෞද්ධයන් අන්‍යාගම්වලට හරවා ගැනීම ඉතාමත් කනගාටුදායක බවද ප්‍රකාශ කරයි.

මේ සම්බන්ධයෙන් 'අද' පුවත්පතට අදහස් දක්වමින් එම සංවිධානයේ සභාපති පූජ්‍ය බුදුගල ජිනවංශ හිමියන් සඳහන් කර සිටියේ, ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත නාහිමියන් විසින් 2004 වසරේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 'සදාචාර විරෝධී අන්‍යාගමික පනත් කෙටුම්පත' සම්මත වීමට සියලු කටයුතු එවකට සිදුවෙමින් පැවතියද විදෙස් බලපෑමක් මත එය එසේ සිදු නොවූ බවට කරුණු අනාවරණ වූ බවයි.

ඒ අනුව අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නැවත රජයේ අවධානය යොමු විය යුතු බවද අවධාරණය කළ උන්වහන්සේ, මේ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා දැනුම්වත් කරමින් වූ ලිපියක් යොමු කිරීමට කටයුතු කර ඇති බවද පැවසූහ.



එහිදී වැඩිදුරටත් සිය අදහස් දැක්වූ පූජ්‍ය බුදුගල ජිනවංශ හිමියෝ,

"2004දී ජාතික හෙළ උරුමයෙන් පාර්ලිමේන්තුවට වඩින ස්වාමීන් වහන්සේලාගේ ප්‍රධානම වගකීම වූයේ සිංහල බෞද්ධයන් සදාචාර විරෝධී ලෙස අන්‍යාගම්වලට හරවා ගැනීම වැළැක්වීමේ පනතක් ඉදිරිපත් කිරීමයි. එම පනතෙ මුඛය පරමාර්ථය වන්නේ, අහිංසක බෞද්ධයන් ක්‍රිස්තියානි ආගමට හැරවීම වැළැක්වීමයි. මුල් කාලයේ දුප්පත් ගම්මානවලට ගොස් බෞද්ධයන්ට විවිධ ගෘහ උපකරණ ලබාදී ආගමට හරවා ගත්තා. බෞද්ධ රෝගී ජනතාව සොයා ගොස් බුද්ධ ප්‍රතිමා පොළොවේ ගසා බුදු හාමුදුරුවෝ යක්ෂයෙක් ලෙස හඳුන්වා ආගමට හැරවීම සිදු කළා. අද වනවිට විශාල බෞද්ධ ව්‍යාපාරිකයන්, දේශපාලන නායකයන්, සමාජයේ ගරු කරන පුද්ගලයන්ගේ දුරුවලතා උපයෝගී කරගෙන අන්‍යාගම්වලට හරවා ගෙන තිබෙනවා.

ලෝකයේ රටවල්වල ජනතාව බෞද්ධ දර්ශනය වැලඳ ගන්නා විට ලංකාවේ බෞද්ධයන් විවිධ හේතු හා දුරුවලතා නිසා ආගමට හැරවීමේ විශාල කුමන්ත්‍රණයක් රට තුළ ක්‍රියාත්මක වන බව පැහැදිලියි. අද වනවිට වතුකරයේ හා උතුරුකරයේ සිටින ද්‍රවිඩ හින්දු ජනතාව විශාල වශයෙන් මෙම කතෝලික නොවන පිරිස් ඇමෙරිකන් ආගමට හරවා ගෙන අවසන්. මේ සියල්ල සිදු කරන්නේ රාජ්‍ය නොවන ආයතන හරහා සිදුකරන ව්‍යාපාරවලින්. මේ පිළිබඳ වරින් වර සිදු කරන ලද බෞද්ධ කොමිසම් වාර්තා මගින් ඇති තරම් තොරතුරු හෙළි කර තිබෙනවා.

අද වනවිට ආණ්ඩු පක්ෂයෙත් විපක්ෂයෙත් පිරිස් මෙම ආගම්වලට හසු වී අවසන්.

වත්මන් ආණ්ඩුව බහුතර සිංහල බෞද්ධයන්ගේ ඡන්දයෙන් පත් වන ආණ්ඩුවක් බව ගරු ජනාධිපතිතුමා විසින්ම දෙවරක්ම සිදුකරන රාජාසන කතාවලදී පැහැදිලි කර තිබෙනවා. 2/3 බහුතර ආණ්ඩුවක් තිබියදී සිංහල බෞද්ධයන් අන්‍යාගම්වලට හරවා ගැනීම ඉතාමත් කනගාටුදායකයි. එම නිසා සිංහල බෞද්ධයන් ආරක්ෂා කරනවා නම්, හැකි ඉක්මනින් ආචාර්ය පූජ්‍ය ඕමල්පේ සෝභිත නාහිමියන් ඉදිරිපත් කරන ලද සදාචාර විරෝධී අන්‍යාගමික පනත සම්මත කර සිංහල බෞද්ධයන් හා ද්‍රවිඩ හින්දු ජනතාව මෙම මර උගුලින් බේරාගැනීමට අවශ්‍ය නීතිමය පසුබිම සකස් කළ යුතුයි. ඒ සඳහා මැදිහත් වන ලෙස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමගෙන් ඉල්ලා සිටිනවා" යැයිද පැවසූහ.

# ශ්‍රමිකයන් 60,000ක් යළි පැමිණීමේ අපේක්ෂාවෙන්

● එච්.අයි. තුෂාර

කෝවිඩ් - 19 තත්ත්වය තුළ විදේශගත ශ්‍රමිකයන් හැට දහසකට අධික ප්‍රමාණයක් මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින බව විදේශගත ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ ජාත්‍යන්තර සංවිධානය සඳහන් කරයි.

පසුගිය වසරේ මාර්තු මාසයේ සිට මෙම පිරිස් ලංකාවට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින බවත්, ගෙවී ගිය කාලය තුළ හැටදහසකට ආසන්න ප්‍රමාණයක් ලංකාවට පැමිණ තිබෙන බවත් එම සංවිධානයේ ලේකම් සුභාෂණ සත්‍යජිත් මහතා සඳහන් කළේය.

මෙලෙස පැමිණි පිරිස්වලින් ගුවන් ටිකට්පත්වල සාමාන්‍ය මිලට වඩා දෙගුණයක් මුදල් ගෙවීමට සිදුවූ බවත්, මීට අමතරව හෝටල්වල නිරෝධායනයට ලක්වූ පිරිස්වලින් හෝටල් ගාස්තු ලෙස දිනකට හත්දහස් පන්සීයක මුදලක් අය කරගත් බවත් හෙතෙම කියා සිටියේය.

මේ නිසා විදේශගත ශ්‍රමිකයන් කඩිනමින් ලංකාවට ගෙන්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කරන ලෙසට හා ගුවන් ටිකට්පතට අදාළ මුදල පමණක් අයකර එලෙස පැමිණෙන සියලුමදෙනා නිවෙස්වල නිරෝධායනයකට ලක්කරන ලෙසට විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලිඛිතව ඉල්ලා සිටි බවද ඒ මහතා සඳහන් කළේය.

පසුගිය අප්‍රේල් මාසයේදී කුවේට් රටේ වීසා නොමැතිව රැඳී සිටි පිරිස් ලංකාවට ගෙන්වා ගැනීමට කුවේට් රට සහන කාලයක් ලබාදුන් බවත්, එම සහන කාලය තුළ අදාළ පිරිස් ගෙන්වා ගැනීමට කටයුතු නොකළ බවත් ඒ මහතා පවසා සිටියේය.

මේ නිසා පන්දහසකට ආසන්න පිරිසක් දැඩි අසරණ තත්ත්වයකට පත්ව සිටින බවත්, එම පිරිස් ලංකාවට ගෙන්වා ගැනීමටද කඩිනම් වැඩපිළිවෙළක් සකස් කළ යුතු බවත් සුභාෂණ සත්‍යජිත් මහතා සඳහන් කළේය.

මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටින බොහෝ දෙනෙකුට මේ වනවිට රැකියා අහිමි වී තිබෙන බවත්, මේ නිසා මෙම පිරිස්වලින් යැපුණු පිරිස් පවා මෙරට තුළ අසරණ වී සිටින බවත් ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේය.

# 2016 වසරේ සිට රාජ්‍ය සේවයට එක්වූ 160,000කට විශ්‍රාම වැටුප් අසාධාරණයක්

## – ඒකාබද්ධ සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානය

● ඉන්දික හේවාවිතාරණ

යහපාලන ආණ්ඩුව විසින් රාජ්‍ය සේවකයන්ගේ පූර්ණ විශ්‍රාම වැටුප අහිමි කිරීම නිසා 2016 වසරේ සිට මේ දක්වා කාලය තුළ රාජ්‍ය සේවයට එක්වූ එක්ලක්ෂ හැටදහසකට අධික පිරිසකට දැඩි අසාධාරණයක් සිදුව තිබෙන බව ඒකාබද්ධ සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානය සඳහන් කරයි.

මෙලෙස රාජ්‍ය සේවයට එක් වූ පිරිසෙන් සැලකිය යුතු පිරිසක් සංවර්ධන නිලධාරී සේවාවට අයත් බවද එම සංගමයේ ලේකම් ධම්මික මුණසිංහ මහතා පැවසීය.

යහපාලන ආණ්ඩු සමයේදී ඉවත් කළ පූර්ණ විශ්‍රාම වැටුප් ක්‍රමය නැවත ඇති කරන බවට වර්තමාන ආණ්ඩුව මැතිවරණ වේදිකාවල පොරොන්දු පිට පොරොන්දු ලබාදී තිබුණද, මෙතෙක් ඊට අදාළ වැඩපිළිවෙළ සකස් කර නොමැති බවද ඒ මහතා පවසා සිටියේය.

2016 වසරින් පසු රාජ්‍ය සේවයට බඳවා ගන්නා සෑම කෙනෙකුටම ලබාදෙන පත්වීම් ලිපියේ සඳහන් වන්නේ, රජය විසින් ඉදිරියේ තීරණය කරන විශ්‍රාම වැටුපකට යටත්වන බවට සඳහන් කර විශ්‍රාම වැටුප් අයිතිය කප්පාදු කර තිබෙන බවද ලේකම්වරයා පැවසීය. මේ නිසා අයිතීන් දිනාගැනීම සඳහා සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානයක් ඇති කර මෙම ගැටලු විසඳ ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවද ධම්මික මුණසිංහ මහතා පවසා සිටියේය.

යහපාලන ආණ්ඩු සමයේදී සිදුකළ මෙම ක්‍රියාව නිසා ත්‍රිවිධ හමුදාව පොලීසිය ගුරු විදුහල්පති සේවය ඇතුළු සමස්ත රාජ්‍ය සේවයටම එක්වන පිරිස්වලට පූර්ණ විශ්‍රාම වැටුප අහිමි වී තිබෙන බවද හෙතෙම පැවසීය.



# ජාවාරම්කාරයන් කිහිපදෙනෙකු වත්මන් ආණ්ඩුව මෙහෙයවන බවට පෙනෙන්න තිබෙනවා

## – සිංහල රාවය සංවිධානයේ පූජ්‍ය අක්මීමන දයාරතන හිමි

● දිනේෂ් සමරකෝන්

ජාවාරම්කාරයන් කිහිපදෙනෙකු වත්මන් ආණ්ඩුව මෙහෙයවන බවට පෙනෙන්න තිබෙන බවත්, එලෙස සිදුවන්නේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ දැනුවත්භාවයෙන්ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් තිබෙන බවත් සිංහල රාවය සංවිධානයේ පූජ්‍ය අක්මීමන දයාරතන හිමියෝ පැවසූහ.

ඊයේ (31දා) කොළඹ පැවති මාධ්‍ය හමුවකට එක්වෙමින් උන්වහන්සේ මේ බව සඳහන් කළේය.

මෙරට ජනතාවට වෙනත් විකල්පයක් නොමැති බැවින් ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති ලෙස පත් කරගත් බවත්, ඒ අනුව මන්දබුද්ධිකභාවය ඇති කරගත් පිරිස ඉවත් කර සබුද්ධික පිරිසක් සමග කටයුතු කරන්නේ නම් රට ඉදිරියට ගෙන යාමට හැකි බවත් සඳහන් කළ පූජ්‍ය අක්මීමන දයාරතන හිමියෝ,

"ආණ්ඩුවට කිසිසේත්ම අයිතියක් නෑ රටේ රාජ්‍ය සම්පත් විජාතීකරණය කරන්න. අනිත් එක රටේ අභ්‍යන්තරයේ තිබෙන ටයර් කර්මාන්තශාලාවක් හෝ කුරුඳු කර්මාන්තශාලාවක් හෝ වෙනත් නිෂ්පාදන කර්මාන්තශාලාවක් වත් විජාතිකයෙකුට බදු දීම ආණ්ඩුවට කරන්න බෑ. රටේ ජනතාවගේ කැමැත්ත තියෙනවා නම් බදු ක්‍රමයකට ගියාට ආයෝජකයන්ට දුන්නට කමක් නෑ. නමුත් මේ දෙක රටේ මර්මස්ථාන දෙකෙන් එකක්. ඒ අනුව අපිට නැගෙනහිර පර්යන්තය අහිමි වුණා කියන්නේ විශාල වශයෙන් හානියට පත්වෙන අවස්ථාවක්.

මොකද ආර්ථික වශයෙන් බිඳ වැටීමක්. රටේ ස්වෛරීභාවයට හා ස්වාධීනත්වයට ඇතිවන විශාල මරු පහරක්. ඒ වගේම තමයි රටේ විරැකියාවෙන් පෙළෙන ජනතාව තවත් අගාධයට ඇද දැමීමක්. අපි මේ අයට ආණ්ඩුව ලබා දුන්නේ වැරදිවලින් තොර රටක් හදන්න කියන කාරණාවට.

රටේ දේශීය සම්පත් සකස්කරගෙන ,දේශීය නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කරලා වගේ ක්‍රමවේදයක් තමයි අපි බලාපොරොත්තු වුණේ.ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති වුණාට පස්සේ ඔහු ගත්ත ක්‍රියාදාමයන් සමූහය සාර්ථකයි. ඔහු කුළුබඩු ගේන එක නැවැත්වුවා. අපි හිතනවා අපේ රටේ තරුණයෝ පවා සෑම බිම් අඟලක්ම වගා කරන්න පටන් ගත්තා. නමුත් ඒ සියල්ල බිඳ වට්ටමින් අද වනවිට ජාවාරම්කාරයෝ කිහිපදෙනෙක් විසින් මේ ආණ්ඩුව මෙහෙයවන තත්ත්වයක් තමයි දකින්නට ලැබෙන්නේ.

මේ වරාය දීම හරහා ඒ ජාවාරම්කාරයන්ට විශාල ලාබයක් හිමිවෙනවා ඇති. ඒ නිසා ආණ්ඩුව ජනාධිපතිවරයා නොමග යවමින් මේ ජාවාරම්කාරයේ මේ වැඩ කටයුත්ත කරන්නේ. එහෙම නැත්නම් ජනාධිපතිවරයා දැනුවත්වද කියන ප්‍රශ්නයකුත් අපිට තිබෙනවා. ඒ නිසා ජනාධිපතිවරයාට අපි කියන්නේ මේ බලය නැති වුණාට පස්සේ රනිල් වික්‍රමසිංහ වගේ කල්පනා කරාට වැඩක් වෙන්නේ නෑ. ඒ නිසා බලය තිබෙන අවස්ථාවේ මොළය පාවිච්චි කරලා වැඩ කරන්න ගියොත් තමයි සාර්ථක ආණ්ඩුවක් අපිට දකින්න ලැබෙන්නේ. මේ රටේ ජනතාවට වෙන විකල්ප නෑ. විකල්පයක් නැති නිසා තමයි ගෝඨාභය බලය ශක්තියක් බවට පත් කරලා ජනාධිපතිවරයෙක් බවට පත් කළේ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා ඔබතුමා මේ මන්දබුද්ධිකභාවය ඇතිකරගත් පිරිස ඉවත් කරලා සබුද්ධික පිරිසක් සමග මේ කටයුත්ත කළොත් යහපත් දැක්මෙන් යුක්තව රට ඉදිරියට ගෙන යන්න පුළුවන්." යැයිද පැවසූහ.

# පළාත් කීපයකට අද වැසි වාර කීපයක්

● එච්.අයි. තුෂාර

උතුර, උතුරු මැද, නැගෙනහිර සහ ඌව පළාත්වලත්, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කවලත් අද (01දා) දිනයේදී වැසි වාර කිහිපයක් ඇතිවිය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

සවස 1.00න් පසු බස්නාහිර, සබරගමුව, වයඹ පළාත්වලත් ගාල්ල, මාතර හා මහනුවර දිස්ත්‍රික්කවලත් තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත්, සමහර ස්ථානවලට මිලිමීටර් 100 තරම් වූ තද වැසි ඇතිවිය හැකි බවත් කාර්යයේ නියුක්ත කාලගුණ විද්‍යාඥ ශානිකා දිසානායක මහත්මිය සඳහන් කළාය.

බස්නාහිර, මධ්‍යම, සබරගමුව, දකුණු පළාත්වල උදෑසන කාලයේ මීදුම් තත්ත්වයත් ඇතිවිය හැකි බවද ඇය පවසා සිටියාය.

ගිගුරුම් සහිත වැසි ඇතිවන විට එම ප්‍රදේශවල සුළඟෙහි වේගය තාවකාලිකව ඉහළ යා හැකි බවත්, මේ නිසා තද සුළං මගින් සිදුවන අනතුරු හා අකුණු අනතුරු වළක්වාගැනීමට ජනතාව කටයුතු කළ යුතු බවත් ඒ මහත්මිය සඳහන් කළාය.

# නැ. පර්යන්තය ඉන්දියානු සමාගමක් සමග එක් වී සංවර්ධනය කිරීම හොඳ දෙයක් ලෙස සලකනවා

## – හිටපු අමාත්‍ය නුවරඑළිය පා.ම පලනි දිගම්බරම්

● හැටන් - රංජිත් රාජපක්ෂ

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියානු සමාගමක් සමග එක් වී සංවර්ධනය කිරීම තමන් හොඳ දෙයක් ලෙස සලකන බවත්, ඒ සඳහා තම පූර්ණ සහයෝගය ලබාදෙන බවත් හිටපු අමාත්‍ය නුවරඑළිය දිස්ත්‍රික් පා.ම පලනි දිගම්බරම් මහතා පැවසීය.

ඒ මහතා මේ බව කියා සිටියේ පෙරේදා (30දා) ජාතික කම්කරු සංගමය සහ කම්කරු ජාතික පෙරමුණේ සමාජිකයන් හමුවීමේ රැස්වීමක් හැටන් ඩී.කේ. ඩබ්ලිව් සංස්කෘතික ශාලාවේ පැවති අවස්ථාවේදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක් වු පලනි දිගම්බරම් මහතා,



"කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ගැන කතා කරනකොට , යහපාලන ආණ්ඩුව මෙවැනි හවුල් ව්‍යාපාර සිදු කරනකොට පොහොට්ටුවේ කට්ටිය කිව්වා වරාය , ඉඩම් , ගුවන්තොටුපලවල් විකුණනවා කියලා චෝදනා කරා. දැන් මේ ආණ්ඩුව ඇවිල්ලත් ඒකම කරන්න යනවා, මම පටු දේශපාලනය කරන්න කැමති නැ.

මම ගිය ආණ්ඩුවේ ඉන්නකොට ඒකට සහයෝගය දුන්නා, අපේ රටේ ජාතික සම්පත් විකුණනවාට කවුරුත් කැමති නෑ. නමුත් ආයෝජකයෙක් ඇවිල්ලා ඒක සංවර්ධනය කරනවා නම් ඒකට ඉඩ දෙන්න ඕනි. මොකද අපේ රටට දැන් සල්ලි නෑ , ණය බර වැඩි වෙලා තියෙන්නේ. ආයෝජකයෙක් ඇවිල්ලා ඒක සංවර්ධනය කරලා අපිට ඒකෙන් 51' ලාභයක් එනවානම් අපි සතුටු වෙන්න ඕනි.

විමල් වීරවංශ , උදය ගම්මන්පිල මහතා ගිය ආණ්ඩු තියෙනකොට මොනවද කිව්වේ අරක විකුණනවා, මේක විකුණනවා කියලා , දැන් කට වහගෙන ඉන්නවා. අපි මේ ආණ්ඩුවට කියනවා මේක ආයෝජකයෙකුට ලබා දීලා සංවර්ධනය කරලා ලාභ උපයනවා නම් අපි ඒකට පූර්ණ සහයෝගය දෙනවා." යනුවෙන් පැවසීය.

# මීගමුව, කටාන ජල යෝජනා ක්‍රමය මාර්තුවේදී විවෘත වෙයි

● නිදර්ශනි වික්‍රමසිංහ

රුපියල් මිලියන 13000ක් පිරිවැයක් දරමින් ඉදි කෙරෙන මීගමුව, කටාන ජල යෝජනා ක්‍රමය එළඹෙන මාර්තු මස විවෘත කිරීමට රජය අපේක්ෂා කරයි.

මෙම ජල යෝජනා ක්‍රමය යටතේ ග්‍රාම සේවා වසම් 45ක් ආවරණය වන පරිදි උතුරු කුලුන බම්බුකුලිය ග්‍රාමයේදීත්, මධ්‍යම කුලුන තිඹිරිගස්කටුව ප්‍රදේශයේදීත් එසේම දකුණු කුලුන ආඩිඅම්බලම ප්‍රදේශයේත් යනාදී ලෙස ප්‍රධාන ජල කුලුනු 03ක් ඉදි කෙරේ. ඒ අනුව එම එක් කුලුනක ජල මීටර් කියුබ් 2000ක ධාරිතාවයකින් යුක්ත වන අතර සමස්ත ධාරිතාව ජල මීටර් කියුබ් 6000කි. කුලුනු සඳහා ජල සම්ප්‍රේෂණය කිලෝ මීටර් 12ක් වන අතර ජලය බෙදාහැරීම කිලෝ මීටර් 240ක ප්‍රදේශයක් ආවරණය කෙරේ. මෙමගින් ප්‍රදේශයේ පවුල් 55100කට සෙත සැලසීමට අපේක්ෂිතය. මේ අතර බම්බුකුලිය ප්‍රදේශයේ ස්ථාපිත ජල කුලුන නිරීක්ෂණය සඳහා ප්‍රදේශයේ දේශපාලන නියෝජිතවරියක වන රාජ්‍ය ඇමතිනී සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පසුගියදා එක්ව සිටියාය. ඒ අනුව එහිදී නව ජල සැපයුම් සම්බන්ධතා ලබාදීම සඳහා නිකුත් කෙරෙන අයදුම්පත් සංකේතාත්මකව බෙදාදීම රාජ්‍ය අමාත්‍යවරිය අතින් සිදු කෙරිණි.

# අස්වැන්න විකුණා ගැනීමට නොහැකි වීමෙන් පට්ටිවෙල ඉන්නල ගොවීන් අපහසුතාවට





◀ මාතලේ ▶

■ එස්. කරුණාරත්න

ගලේවෙල පට්ටිවෙල ප්‍රදේශයේ ඉන්නල (රටල) සහ ඉඟුරු වගා කළ ගොවීන් සිය අස්වැන්න විකුණා ගැනීමට නොහැකි වීම නිසා අසරණ තත්ත්වයට පත්ව සිටිති. මේ නිසා ඔවුහු සිය අස්වැන්න නෙළීමෙන් පවා ඉවත්ව සිටිති.

ප්‍රදේශයේ මහා පරිමාණයෙන් කාබනික පොහොර යොදාගෙන වගා කරන එස්.ඒ. රතනපාල මහතා අක්කර 15ක ඉන්නල (රටල) වගා කොට තිබේ. එමෙන්ම ඉඟුරු කිලෝ ලක්ෂයකට අධික ප්‍රමාණයක් ඔහුගේ ගොවිපොළේ තවමත් ගැලවීමකින් තොරව පවතී.

ඉන්නල අස්වැන්න නෙළීම සිදු කරමින් සිටින අවස්ථාවේ එහි ගිය අපට දැක ගැනීමට හැකි වූයේ අස්වැන්න නෙළීම අතහැර දමා ඇති විශාල භූමියක් බවයි.

එමෙන්ම දැනට කාන්තාවන් යොදා අස්වැන්න ලබා ගැනීම සිදු කළ ද ඒවාට කිලෝ එකක් සඳහා රුපියල් 40 -50 දක්වා මිලත් පවතින බවද රත්නපාල මහතා පැවසීය. රටල අස්වැන්න සාර්ථකව මෙවර ලැබී තිබෙන බවත් ඒ සඳහා සාධාරණ මිලක් ලැබෙන්නේ නම් තමාට පාඩු නොවන බවද ගොවීහු පෙන්වා දෙති.





කෙසේ වෙතත් අස්වැන්න නෙළන කම්කරුවන්ට වැටුප් ලබා දීමට නොහැකි වීම නිසා අස්වැන්න නෙළීම අත්හැර දමා ඇති බවද රතනපාල මහතා පැවසීය.

කාබනික වගා ක්‍රමය යටතේ තමන් වගා කළ අක්කර 15ක ඉන්නල (රටල) ගොවිපොළ අවශ්‍ය අයෙකුට ලබාදීමට හැකි බවත් අවශ්‍ය කෙනෙක් වෙතොත් ගොවිපළටම පැමිණ මිලදී ගැනීමට හැකි බවද හෙතෙම පවසා සිටියේය.

එමෙන්ම රජයේ ඉල්ලීම මත දේශීය ආහාර නිෂ්පාදනයට තමා වැඩි දායකත්වයක් ලබා දුන් බව පවසන ඒ මහතා ඉඟුරු වගා කොට මේ වනවිට අස්වැන්න නෙළීම අතහැර දමා ඇති ආකාරය පෙන්වා දුන්නේය. තමන් වගා කළ ඉඟුරු මිලදී ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර දෙන්නැයි ඒ මහතා රජයෙන් ඉල්ලා සිටියේය.

තමන් පත්ව ඇති තත්ත්වය පිළිබඳ අදහස් දැක්වූ එස් .ඒ . රතනපාල මහතා මෙසේ පැවසීය.



"මම විශාල වශයෙන් ගොවිතැන් කරන කෙනෙක්. ලොකු බලාපොරොත්තුවක් තිබුණා මේ ජනාධිපතිතුමා පත් වෙනකොට අපේ දේශීය ගොවිතැනට තැනක් එයි කියලා ලැබේවි කියලා. ඒ නිසාම තමයි අපි කහ, ඉඟුරු, ඉන්නල වගේ විශාල වශයෙන් දේශීය ගොවිතැන වැඩි වශයෙන් කරන්න ගත්තේ. පනහකට වැඩිය පිරිසක් මගේ ගාව වැඩ කරනවා. හැබැයි අද සිද්ධ වෙලා තියෙන්නෙ දේශීය වගා කරපු අපට අස්වැන්න නෙළීම පවා අතහැරලා දාන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැටුප් ලබන ඕනෑ තරම් මිනිස්සු ඉන්නවා. ඒ අය ඇහැක් ඇරලා බලන්නේ නැහැ මේ වගේ විශාල ගොවිපළවල් පිළිබඳව. අපි දන්නවා ජනාධිපතිතුමාට මේවා මිලදී ගන්න වගාබිම්වලට යන්න බැහැ. හැබැයි රජයේ නිලධාරීන් මේ පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. මේ වගේ ගොවිපොළවල් කිහිපයක් වහලා දැම්මොත් මේ රටට වෙන පාඩුව කොපමණද කියලා සොයලා බලා කටයුතු කළ යුතුයි. අපි ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ කරුණාකරලා මේ අපේ අස්වැන්න මහපොළොව නැවත පස් වෙන්න දෙන්න එපා රටේ මිනිස්සුන්ට කන්න දෙන්න වැඩපිළිවෙළක් හදන්න කියලයි."

◀ නුවරඑළිය ▶

# නුවරඑළිය නගරය කේන්ද්‍ර කොට ගත් සංචාරක කලාපයක් ඉදිරියේදී ඇති කරනවා

## – සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග

■ ශාන් හුලංනුගේ



නුවරඑළිය නගරය කේන්ද්‍ර කොට ගත් සංචාරක කලාපයක් ඇති කිරීමට ඉදිරියේදී පියවර ගන්නා බව සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවැසීය.

නුවරඑළිය දිස්ත්‍රික් ජීවනෝපාය සංවර්ධන කමිටු රැස්වීමේදී ඒ මහතා එසේ පවසා සිටියේය.

දිවයින පුරා නව සංචාරක ස්ථාන 6059ක් හඳුනාගෙන ඇති බවත් ඉන් 318ක් නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් බවත් ඒ මහතා පැවසීය. මෙම සංචාරක ස්ථාන දෙස් විදෙස් සංචාරකයන් අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ලබන බවත් ඒ මහතා කීය. නානුඔය නගරයේ සිට නුවරඑළිය නගරය දක්වා කේබල් කාර් ව්‍යාපෘතියට අදාළ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරනු ලබන බවත් මේ සඳහා රජය යූරෝ මිලයන 52ක ආයෝජනයක් සිදු කිරීමට නියමිතව ඇති බවත් අමාත්‍යවරයා මෙහෙදී වැඩිදුරටත් පවසා සිටියේය.

◀ පොළොන්නරුව ▶

# විදුලිසැර වැදී වනඅලියෙක් මරුට

## අනවසර විදුලි සැර වැදීම සම්බන්ධයෙන් පුද්ගලයෙක් අත්අඩංගුවට



■ පොළොන්නරුව - තුෂාර තෙන්නකෝන්

පොළොන්නරුව වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලිතැන්න ප්‍රදේශයේ විදුලි සැර වැදී මියගිය වනඅලියෙකුගේ සිරුරක් ඊයේ (31දා) උදෑසන සොයාගත් බව වැලිකන්ද වනජීවී කාර්යාලය පවසයි.

උසින් අඩි අටයි අඟල් නවයක් පමණ වන මෙම පිරිමි වනඅලියාගේ වයස අවුරුදු 35ක් පමණ වන බව එම වනජීවී නිලධාරියා ප්‍රකාශ කර සිටියේය.

මෙම වසරේ පළමුවැනි මස ජනවාරි මාසයේ අවසාන දිනය අද වනවිට වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වනඅලි - මිනිස් ගැටුම හේතුවෙන් වනඅලි හයදෙනෙකුගේ ජීවිත ස්වභාවධර්මයාට අහිමි වී ගොස් ඇති අතර ඊට ආසන්නතම සිදුවීම වන මෙම වනඅලි මරණය හයවැනි මරණය වීම කණගාටුදායක කරුණකි.

ප්‍රදේශවාසීන් පවසන අන්දමට මෙම වනඅලියා ප්‍රදේශයේ මිනිස් ජීවිත රැසක්ද හානි කර ඇති බවත් වගාබිම් රැසක්ද විනාශ කර දමා ඇති බවද අප හමුවේ පැවසීය.

කෙසේ නමුත් වනඅලියා මියගොස් සිටි කුඹුරු ඉඩමේ අයිතිකරු මේ වනවිට වැලිකන්ද වනජීවී බීට්ටු කාර්යාලය මගින් අත්අඩංගුවට ගෙන ඇති අතර මෙ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන කටයුතු වනජීවී නිලධාරීන්ගේ මෙහෙයවීම මත සිදු කෙරේ.

# කුඩු රජවරුන්ට සෙල්ලම කරන්න ඉඩ තබන්නේ නැහැ



## – ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න

■ වාරණ - ආනන්ද ඉ ජයකොඩි

"ඉදිරියේදී කුඩු තොග අත්අඩංගුවට ගත්තු සැණින් විනිශ්චයකාරවරයෙකුගේ නිරීක්ෂණයට ලක් කොට සුළු ප්‍රමාණයක් සාම්පල වශයෙන් තබා ගෙන ඉතිරි සියල්ල විනාශ කිරීමේ වැඩපිළිවෙළක් හදනවා" යැයි ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න මහතා පැවසීය

අත්තනගල්ල රජමහා විහාරස්ථානයේ විහාරාධිපති ආචාර්ය පන්විල ශ්‍රී ආනන්ද නාහිමියන්ගේ රුපියල් මිලියන හයක පමණ වියදමකින් උඟරාපොල නවදිගන්තයේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන භූමියේ ඉදි කරන ලද නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි වෙමින් හෙතෙම එසේ කියා සිටියේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ආරක්ෂක ලේකම්වරයා,

" වර්තමානයේ පවතින ක්‍රමය තමයි කුඩු තොග අත්අඩංගුවට ගෙන රස පරීක්ෂක වාර්තා එන තෙක් ගබඩා කර තැබීම. මේ ක්‍රමයේ දූෂණ සිදුවෙනවා. එසේ අත්අඩංගුවට ගෙන ගබඩා කර තබන කුඩුවලින් කොටසක් නැවත වෙළෙඳ පොළට යනවා. මේ ක්‍රමය අපි වහාම නැවැත්විය යුතුයි. ඉදිරියේදී අත්අඩංගුවට ගන්නා කුඩු තොග වහාම විනිශ්චයකාරවරයෙකුගේ නිරීක්ෂණයට ලක් කොට සුළු ප්‍රමාණයක් පමණක් සාම්පල වශයෙන් තබා ඉතිරි සියල්ල විනාශ කිරීමේ වැඩපිළිවෙළක් හදනවා. තමුන්නාන්සේලා දන්නවා කුඩු රජවරු හිර ගෙදර ඉඳගෙන තමයි කුඩු ජාවාරම මෙහෙය වන්නේ කියල. කුඩු රජවරුයි පාතාලයයි දෙකක් නොව එකක් එහෙම නම් අපි කුමක්ද කළ යුත්තේ මේ මහා විනාශය වහාම නැවැත්විය යුතුයි. හිර ගෙවල් ඇතුළේ සිට කර ගෙන යන මේ සෙල්ලම දුෂ්කර වුවත් අපි කෙසේ හෝ මර්දනය



කරනවා. බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහත්මයාගේ මූලිකත්වයෙන් ඒ ක්‍රමය නැවැත්වීමේ වැඩපිළිවෙළක් දැන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අනෙක් පැත්තෙන් කුඩුවලට ගොදුරු වන අහිංසක දරුවන් එයින් මුදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක්ද සකස් කළ යුතු වෙනවා. එය දැනටමත් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කර ගෙන යනවා.

දරුවො බන්ධනාගාරගත කළාම ඔවුන් එළියට එන්නේ කුඩු රජවරු බවට පත් වෙලා. එක් තමයි සත්‍යය. එහෙමනම් මේ ක්‍රමයත් නැවැත්විය යුතුයි. දරුවො බන්ධනාගාරගත කිරීමකින් තොරව කළ යුත්තේ කුමක්ද. එවැනි දරුවො අත්අඩංගුවට ගත්තු සැණින් විනිශ්චයකාරවරයෙකුට ඉදිරිපත් කර බන්ධනාගාරගත කිරීමකින් තොරව විනිශ්චයකාරවරයාගේ නියෝග පරිදි මෙවැනි ආයතනවලට යොමු කිරීමේ වැඩපිළිවෙළක්ද ඉදිරියේදී සකස් කරනවා. අද මේ අපේ නායක හාමුදුරුවෝ එයට ආරම්භ පියවරක් තැබුවා. නායක හාමුදුරුවන්ගේ රුපියල් මිලියන හයක වියදමකින් තනා නිම කොට අද බාරදුන් මේ ගොඩනැගිල්ල තුළ දරුවො හැට දෙනෙකුට පහසුකම් තිබෙනවා. මේ කරපු සත්කාර්යය අපේ නායක හාමුදුරුවන්ට ගෞරව පූර්වක ස්තුතිය පුද කරනවා. ඒ වගේම මේ ගොඩනැගිල්ල තැනීමේ තාක්ෂණ දායකත්වය හා ශ්‍රම දායකත්වය නාවික හමුදාව ලබා දී තිබෙනවා. නාවික හමුදාවේ ඒ සියලු නිලයන්ටද ස්තුතිය පුදකරනවා. මේ ස්ථානයට තවත් ගොඩනැගිලි හතක් අවශ්‍යතාව තිබෙනවා." යැයිද පවසා සිටියේය

අත්තනගල්ල රජමහා විහාරස්ථානයේ විහාරාධිපති ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමියෝද මෙහිදී අදහස් දැක්වූහ.

ආරක්ෂක ලේකම්වරයා විසින් ආචාර්ය පන්නිල ශ්‍රී ආනන්ද නාහිමියන් වෙත සමරු තිළිණයක්ද පිළිගන්වන ලදී. මෙහිදී පෞද්ගලික ආයතනක අධිපතිවරයෙකු වන චන්දික විරාජ් තාඹුගල මහතා විසින් තවත් ගොඩනැගිල්ලක් තැනීමට මූල්‍ය පරිත්‍යාගයක් කළේය. සිමෙන්ති සමාගමක් විසින් තවත් පරිත්‍යාගයක් හා ඇමරිකාවේ නිව්යෝක් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මංගලිකා ද සිල්වා මහත්මිය විසින් නව ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ පරිත්‍යාගයක්ද කළාය. මෙහිදී අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නව වෙබ් අඩවියක්ද ආරම්භ කරනු ලැබීය. මේ අවස්ථාවට මේජර් ජෙනරාල් ජගත් අල්විස්, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය, ආරක්ෂක අමාත්‍යාංශයේ සහකාර ලේකම් සමන්ති වීරසිංහ, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති වෛද්‍ය ලක්නාත් වෙළගෙදර ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# ගුරුකැලේ ගම්මානයට අලුතින් සුරාසැලක් විවෘත කිරීමට එරෙහි විරෝධතාවක්

"ජනතාවට පානීය ජලය වෙනුවට මත් පැන් හලක් ලබාදීම ජනතාව පත් කරගත් රජයකින් අනුමත කරන්න බෑ"

## – දොළුව ශ්‍රී බිම්බාරාම විහාරාධිපති උඩපළාත අධිකරණ සංඝනායක ශාස්ත්‍රපති උඩගම ඥානිස්සර නාහිමි



■ ගම්පොළ - සුරංග දිල්හාන්

ගම්පොළ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගුරුකැලේ ගම්මානය තුළ සුරා සැලක් විවෘත කිරීමට සැලසුම් සකස් කරමින් සිටිනවාට එරෙහිව ප්‍රදේශයේ මහ සංඝරත්නය ඇතුළු ගම්වාසීන් එම ප්‍රදේශය තුළ ඊයේ (31දා) උද්ඝෝෂණයක නිරත වූහ.

විහාරස්ථාන 16ක විහාරාධිපති නාහිමිවරු ඇතුළු මහ සංඝරත්නයත්, ගම්මාන 26ක් නියෝජනය කරමින් ප්‍රදේශවාසීනුත් මේ සඳහා සහභාගී වූහ.

1995 වසරෙන් පසු දොළුව ගුරුකැලේ ගම්මානය තුළ විවෘත කර තිබූ මෙම සුරාසැල නිසා ප්‍රදේශයේ තරුණයන් ඇතුළු වැඩිහිටියන් මත් වතුරට ඇබ්බැහිවී විනාශ වූ බවත් සෑම නිවසකම අඬදබර වැඩිවී දුප්පත්කම හා අසමගිය පිරුණු ගම්මානයක් ඇතිවූ බවත් විරෝධතාකරුවෝ පෙන්වා දුන්හ. මෙම තත්ත්වය සමග ඇතිවූ ජනතා විරෝධය නිසා පසුගිය රජය සමයේදී මෙම සුරාසැල වසා දැමුවද නැවතත් මෙම රජය තුළදී එහි හිමිකරුවන් එය විවෘත කිරීමට පියවර ගෙන ඇති බවද සඳහන් කළහ.

මෙම විරෝධතාකරුවන් ගුරුකැලේ බෝධිය අසලට එක්වී එහිදී ආගමික වතාවත් පවත්වා අනතුරුව පෙළපාලියකින් ගුරුකැලේ හන්දිය දක්වා පැමිණියේ විරෝධතා පාඨද පවසමිනි.

◀ මහනුවර ▶

මෙහිදී අදහස් දැක්වූ දොළුව ශ්‍රී බිම්බාරාම විහාරාධිපති උඩපළාත අධිකරණ සංඝනායක ශාස්ත්‍රපති උඩගම ඥානිස්සර නාහිමියන් රැස්ව සිටි ජනතාව අමතා ප්‍රකාශ කළේ, ජනතාව හා මහ සංඝරත්නය එක්ව පත්කළ මේ රජය තුළින් මෙවැනි දෙයක් බලාපොරොත්තු නොවූ බවත්, ප්‍රදේශයේ ජනතාවට ජලය නොමැතිව ඉල්ලීම් කරද්දි ඔවුන්ට මත්වතුර ලබාදෙන්න කටයුතු කිරීම අනුමත කළ නොහැකි බවත්ය.

මෙම උද්ඝෝෂකයන් අතරට හිටපු මධ්‍යම පළාත් සභා මන්ත්‍රී හා වත්මන් ග්‍රාමීය කුඹුරු වැව් හා වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යවරයාගේ ලේකම් නිශ්ශංක හේරත් මහතා පැමිණි අතර තමා හා රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න මහතා මෙම සුරාසැල නැවත විවෘත කිරීමට නොදෙන බව ප්‍රකාශ කිරීම සමග උණුසුම් තත්ත්වයක්ද ඇතිවිය.

එහිදී මහා සංඝරත්නය හා විරෝධතාකරුවන් එම ප්‍රකාශය ලිඛිතව දෙන ලෙසත් ලබාදී ඇති සුරාසැල් අවසර පත්‍රය දොළුව ප්‍රාදේශීය ලේකම්වරිය වෙත ලබාදෙන ලෙසත් ඉල්ලා සිටියහ.

මේ පිළිබඳව සුරාසැල් හිමියන් හා මහා සංඝරත්නය සමග සාකච්ඡා කිරීම සඳහා අද (01දා) දින දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පැමිණීමට තීරණය කිරීමෙන් පසු උද්ඝෝෂකයෝ විසිර ගියහ.

# සිරදඬුවම් නියම වූ රන්ජන් රාමනායකට සාධාරණයක් ඉටුකරන ලෙස ඉල්ලමින් විරෝධතා




■ මීරිගම - කාන්ති/මුල්කිරිගල - හඳුගල ගුණරත්න

සිරගතකර සිටින පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මහතාට සාධාරණයක් ඉටුකරන ලෙස ඉල්ලමින් සමගි ජන බලවේගය විසිවන් සංවිධානය කරන ලද විරෝධතාවන් ද්විත්වයක් ඊයේ (31දා) දහවල් දිවුලපිටිය හා බෙලිඅත්තර නගරවලදී පැවැත්විණි.

සමගි ජන බලවේගය පක්ෂයේ දිවුලපිටිය ආසන සංවිධායක හසිත විජේසිංහ මහතාගේ සංවිධානය කළ විරෝධතාවට ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන හර්ෂණ රාජකරුණා සහ හිටපු ඇමති එඩ්වඩ් ගුණසේකර මහත්වරුන් සමග ප්‍රාදේශීය සභා නියෝජිතයන් ඇතුළු පාක්ෂිකයන් පිරිසක් එක්ව සිටි අතර, හිටපු දකුණු පළාත් සභා මන්ත්‍රී බෙලිඅත්ත ආසන සංවිධායක නිහාල් වෙදආරච්චි මහතා විසින් සංවිධානය කරනු ලැබූ උද්ඝෝෂණයට සමගි ජන බලවේගයේ හිටපු ඇමති හා හම්බන්තොට පාර්ලිමේන්තු මන්ත්‍රී දිලිප් වෙඩආරච්චි මහතා ඇතුළු පාක්ෂිකයන් රැසක් එක්ව සිටියහ.

ආණ්ඩුවේ දේශපාලඥයෝ මරණීය දණ්ඩනයට නියමවූවන්ට පවා පාර්ලිමේන්තුවට පැමිණීමේ අවස්ථාව සලසාදී තිබෙන වකවානුවක කථානායකවරයා රන්ජන් රාමනායක මහතාටද පාර්ලිමේන්තුවට පැමිණීමේ අවස්ථාව සලසා දිය යුතු බව විරෝධතාකරුවෝ ඉල්ලා සිටියහ.

◀ බදුල්ල ▶

# එල්.ටී.ටී.ඊයට අයත් බව කියන විදේශීයක නිෂ්පාදිත ගිනිඅවියක්, මැගසිනයක් සහ උණ්ඩ 30ක් සොයාගැනේ



■ බදුල්ල - පාලිත ආරියවංශ

එල්.ටී.ටී.ඊ සංවිධානයට අයත් යැයි සැකකරන පිස්තෝලයක්, මැගසිනයක් සහ උණ්ඩ 30ක් පෙරේදා (30දා) රාත්‍රියේ බදුල්ල, වේවැස්ස වත්ත ප්‍රදේශයේදී සොයාගත් බව බදුල්ල පොලිස් කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය පවසයි.

බදුල්ල පොලිස් කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය සිදු කළ මෙහෙයුමකදී බදුල්ල වේවැස්ස වත්තේ ජල ටැංකියක් අසල ගල්වලට සගවා තිබියදී උණ්ඩ සොයා ගත් අතර, පිස්තෝලය වැලිකන්ද වඩුමුනේ ලදු කැලෑවක දොළක් අයිනේ වලලා තිබියදී සොයාගෙන තිබේ.

මනාලෙස ඇසුරුම් කර තිබූ මෙම පිස්තෝල අඩි දෙකහමාරක් පමණ කැණීම් කිරීමේදී සොයාගෙන තිබෙන අතර, එම පිස්තෝලය විදේශීයක නිෂ්පාදනය කරන ලද්දක් බවත් පරීක්ෂණවලදී අනාවරණය විය.

සිද්ධිය සම්බන්ධයෙන් බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වසන්ත කන්දෙවත්ත හා සහකාර පොලිස් අධිකාරී ප්‍රදීප් වීරසේකර යන මහත්වරුන්ගේ උපදෙස් මත බදුල්ල මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක වේහිත රාජපක්ෂ සහ, බදුල්ල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චානක චිරංජීව විජේරත්න යන මහත්වරුන් ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# වැලිකඩ බන්ධනාගාරය මිල්ලෑව ප්‍රදේශයට ගෙන ඒමට එරෙහිව විරෝධතාවක්

■ පාදුක්ක - ඩී.එන්.රෙක්සි

මිල්ලෑව ප්‍රදේශයේ අක්කර 250ක පමණ ඉඩමක රුපියල් කෝටි 50ක් පමණ මුදලක් වැයකර ඉදිකිරීමට යෝජිත නව බන්ධනාගාර සංකීර්ණයට එරෙහිව මිල්ලෑව එකමුතු සංවර්ධන පදනම සංවිධානය කළ විරෝධතාවක් මිල්ලෑව නාගස් හන්දියේදී ඊයේ (31දා) පැවැත්විණි. විවිධ විරෝධතා පුවරු රැගෙන සටන් පාඨ කියමින්



විරෝධතාවට එක්ව සිටි පිරිස් පැයකට ආසන්න කාලයක් විරෝධතාවේ නිරත වූහ. මෙම බන්ධනාගාරය ඉදිවුවහොත් පාදුක්ක, හොරණ නගර අවට ප්‍රදේශවාසීන්ට අනාගතයේදී අතිවිශාල සමාජීය අර්බුද රාශියකට මුහුණ දීමට සිදුවිය හැකි බවත්, මෙම යෝජනාව මුළු ප්‍රදේශයටම කොඩිවිනයක් බවද විරෝධතාකරුවෝ පෙන්වා දුන්හ..

# මඩොල්සිම හා ඒ අවට ගම්මාන කිහිපයකට දින 10ක පමණ කාලයක් ඇතුළත භූ කම්පන 04ක් සිදුවෙලා - ගම්වාසීහු

## භූ කම්පන සම්බන්ධයෙන් සෙවීමට භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ විශේෂ කණ්ඩායමක් ඇකිරිය ගම්මානයට යෑමට නියමිතයි

**- බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂ ඊ.එල්.එම්. උදය කුමාර**

● මීගහකිවුල - එන්.කේ. නිශ්ශංක

දින 10ක පමණ කාලයක් ඇතුළත සිදුවූ සිවුවන භූ කම්පනය වාර්තා කරමින් මඩොල්සිම පොලිස් වසමට අයත් ඇකිරිය හා ඒ අවට ගම්මාන කිහිපයක ඊයේ (31) අලුයම 2.56 ට පමණ භූ කම්පනයක් සිදුවූ බව ගම්වාසීහු පිරිසක් පැවැසූහ.

භූ කම්පනය තත්පර 30කට පමණ කාලයක් පැවැති බවත්, දැවැන්ත හඬක් කණ වැකුණු අතර ඇතැම් නිවාස සෙලවී ගිය අතර, එම භූ කම්පනවලින් කිසිදු ජීවිත හෝ දේපළ හානියක් සිදුවී නොමැති බවද ඔවුහු වැඩිදුරටත් පවසා සිටියහ.

"ඊයේ (31) පාන්දර නිදාගෙන සිටි වේලාවක පොළව යටින් විශාල වාහනයක් යනවා වගේ දැනුණා. වහලෙත් හෙල්ලුණා. ඒ සද්දෙට අවදිවෙලා බලද්දිත් පොලව යටින් ඒ සද්දේ දිගටම ආවා. විනාඩියක් තරම් මේ සද්දේ තියෙන්න ඇති. වේලාව බලද්දි අලුයම තුනට ඇති" යැයි මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ඇකිරිය ප්‍රදේශයේ ත්‍රිරෝද රථ රියැදුරෙකු වන ප්‍රියන්ත දිසානායක මහතා පැවැසීය.

මඩොල්සිම පොලිස් වසමට අයත් ඇකිරිය හා ඒ අවට ගම්මාන කීපයක ඉකුත් 22 දිනයේදීද අලුයම 3.30, 3.38ට හා අලුයම 3.56ට මෙවැනිම භූ කම්පන තුනක් සිදුවිය.

මේ සම්බන්ධයෙන් බදුල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂ ඊ.එල්.එම්. උදය කුමාර මහතාගෙන්ද විමසීමේදී මෙසේ පැවසීය.

"ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඇකිරිය ගම්මානයෙන් ඉකුත් 22 දින හා ඊයේ (31) දින භූ කම්පන කීපයක් වාර්තා වුණා. මෙහි රික්ටර් මාපකාංග අගය සම්බන්ධයෙන් විවිධ වෙනස්කම් ඇතිවීම නිසා මට ඒ සම්බන්ධයෙන් තවමත් නිශ්චිත අගයක් ප්‍රකාශ කරන්න බැහැ. කොහොම වුණත් වාසනාවකට මෙන් කිසිම අයෙකුට හෝ දේපළකට හානි සිදුව නැහැ. ආසන්න වශයෙන් මේ අයුරින් භූ කම්පන සිදුවීම පිළිබඳව අපේ අවධානය යොමුව තිබෙනවා. අප මේ වනවිටත් ඒ සම්බන්ධයෙන් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය දැනුවත් කිරීමක් සිදුකර තිබෙනවා. ඒ අනුව විශේෂ කණ්ඩායමක් මේ වනවිට එම ප්‍රදේශය වෙත යාමට පිටත්වී තිබෙනවා.

කොහොම වුණත් භූ කම්පන සම්බන්ධයෙන් කලින් දැන ගැනීමේ හැකියාවක් අපට නැහැ. ඒ වගේම ජනතාවටත් ඒ සම්බන්ධ දැනුමක් නැහැ. එම නිසා අප ඉක්මනින්ම දිනකදී මෙම ගම්මානයට ගිහින් ඒ සම්බන්ධයෙන් ගම්වාසීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කිරීමටත් බලාපොරොත්තු වෙනවා."

ඊයේ (31) භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නිලධාරියෙකු සම්බන්ධ කරගැනීමට උත්සාහ කළද එය ව්‍යවර්ථ විය.

◀ මාතර ▶

# කැස්බෑ බිත්තර 600ක් සමගින් සැකකරුවන් සිවුදෙනෙක් අත්අඩංගුවට



● දික්වැල්ල - නිමල් ලන්දගේ

ලුණුකලපුව හා කළුකැටිය ප්‍රදේශවලදී ඊයේ (31දා) අලුයම සිදුකළ වැටලීමකදී කැස්බෑ බිත්තර 600කට අධික ප්‍රමාණයක් සමග සැකකරුවන් සිවුදෙනෙකු දූෂණ මර්දන අංශය විසින් අත්අඩංගුවට ගත් බව දික්වැල්ල පොලීසිය පවසයි.

23 හා 62 හැවිරිදි වයස්වල පසුවන සැකකරුවන් බෙලිඅත්ත, ලුණුකලපුව, කළුකැටිය ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

නාවික හමුදාව විසින් ලබාදුන් තොරතුරක් මත දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක ගාමිණි ශාන්ත මහතා ඇතුළු නිලධාරීන් සිදුකළ වැටලීමේදී අදාළ සැකකරුවන් කැස්බෑ බිත්තර සමගින් අත්අඩංගුවට ගෙන තිබේ.

රාත්‍රියේදී ගොඩගන්නා ලද බිත්තර තැන් තැන්වල සඟවා තබා අලුයම් කාලයේ පොදු ප්‍රවාහන සේවා මගින් බෙලිඅත්ත ඇතුළු ප්‍රදේශවලට ප්‍රවාහනය කර ඇති බවද පරීක්ෂණවලදී අනාවරණය විය.

සැකරුවන් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

සිද්ධිය සම්බන්ධයෙන් දික්වැල්ල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ජී.පී.ටී. ඉෂාන් මහතාගේ උපදෙස් පරිදි අපරාධ අංශයේ ස්ථානාධිපති උපපොලිස් පරීක්ෂක ගාමිණී ශාන්ත මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

◀ බදුල්ල ▶

# රු.1000ක දෛනික වැටුප ඉල්ලා වතු කම්කරුවෝ විරෝධතාවයක



● හාලිඇල- විජේරත්න රත්නායක

රජය අය වැයෙන් පොරොන්දුවූ පරිදි වතු කම්කරුවන්ට රුපියල් දහසක දෛනික වැටුප වහා ලබාදෙන ලෙස ඉල්ලා ඊයේ (31) දහවල් පස්සර නගරයේදී විරෝධතාවක් පැවැත්විණි.

අය වැයෙන් පොරොන්දුවූ රුපියල් 1000 වහා ලබාදෙනු යන මැයෙන් සමස්ත ලංකා වතු කම්කරු සංගමය මෙම උද්ඝෝෂණය සංවිධානය කොට තිබූ අතර පස්සර, ලුණුගල, මඩොල්සීම යන ප්‍රදේශයන්හි වතු කම්කරු නියෝජිතයන් පිරිසක් ඊට එක්ව සිටියහ.

විවිධ විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් විරෝධතා පාඨ කියමින් ඔවුහු පැයක පමණ කාලයක් සිය විරෝධතාවේ නිරත වූහ.

සමස්ථ ලංකා වතු කම්කරු සංගමයේ සභාපති කිට්නන් සෙල්වරාජ් හා එම සංගමයේ ලේකම් ජේ.එම්.ඒ. ප්‍රේමරත්න යන මහත්වරුන්ගේ මෙහෙයවීමෙන් මෙම උද්ඝෝෂණය සිදුකෙරිණි.



# ප්‍රදේශ දෙකක අනතුරු දෙකකින් පුද්ගලයන් 5ක් මරුට



● ගම්පහ ටෝනි කරුණානායක/ කඳාන - රුක්මන්/ ජා-ඇල ප්‍රසංග පෙරේරා/ හැටන් - රංජිත් රාජපක්ෂ/ ශාන් හුලංනුගේ

ඒකල හා නියංගම්දොර නගර ආශ්‍රිතව ඊයේ (31දා) උදෑසන සිදුවූ රිය අනතුරු දෙකකින් පුද්ගලයන් 5දෙනෙකු ජීවිතක්ෂයට පත්ව ඇති බව ජාඇල හා පුඩළුඔය පොලීසි පවසයි.

කොළඹ මිනුවන්ගොඩ ප්‍රධාන මාර්ග යේ ඒකල ගුවන් හමුදා කඳවුර ඉදිරියේ දී ඊයේ (31) උදෑසන වෑන් රථයක් පාරෙන් ඉවතට පැන බස් නැවතුම්පොළ තාප්පයේ ගැටීමෙන් එම වෑන් රථයේ ගමන් කළ තිදෙනකු ජීවිතක්ෂයට පත්ව ඇති බව ජා-ඇල පොලීසිය පවසයි. මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ රද්දොළුවේ සහ පමුණුගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වන වෑන් රථයේ රියැදුරු වූ සුමින්ද නිශාන්ත තිලකරත්න (අවු. 48) සහ ටිරෝන් එරල් හාඩි (අවු.64) සහ තුෂාර චාමින්ද (අවු.49) තිදෙනාය.

මේ අතර පුඩළුඔය තලවන්තැන්න ප්‍රධාන මාර්ගයේ කොත්මලේ නියංගම්දොර ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්තශාලාවක් අසලදී යතුරුපැදියක් සහ ටිපර් රථයක ඊයේ (31දා) උදෑසන ගැටීමෙන් යතුරුපැදියේ ගමන් ගත් තරුණයන් දෙදෙනෙකු එම ස්ථානයේම ජීවිතක්ෂයට පත්වී ඇති බව පුඩළුඔය පොලීසිය පවසයි.

එලෙස මියගොස් තිබුණේ කරගස්තලාව කටුකිතුල ප්‍රදේශයේ පදිංචිව සිටි එල්.එන්.කේ.ජී. දිනේෂ් (අවු. 19) සහ කලපිටිය ප්‍රදේශයේ පදිංචිව සිටි විමුක්ති සඳරුවන් (අවු.19) නමැත්තන්ය.

සිද්ධි සම්බන්ධයෙන් ජා-ඇල හා පුඩළුඔය පොලීසි වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# වළවේ ගඟේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත සිසුන් පිරිසකගෙන් සිසුවියක් දියේ ගිලී මරුට

## මෙම ක්ෂේත්‍ර චාරිකාව බලන්ගොඩ අධ්‍යාපනය කාර්යාලය දැනුම්වත් නොකර පෞද්ගලිකව සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවක්

**- බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක පී.ජී. ආරිපාල**

● රාස්සගල - එන්. සම්පත් / රත්නපුර - ලසන්ත නිරෝෂණ පෙරේරා/ බුදුගල - සෝමරතන හිමි/ බලන්ගොඩ - රෝහණ වසන්ත

බලන්ගොඩ කල්තොට වළවේ ගඟ ආශ්‍රිතව ක්ෂේත්‍ර පුහුණු චාරිකාවකට සහභාගී වූ පාසල් සිසුන් පිරිසක් වළවේ ගඟේ කල්තොට බටකොළ ඇල්ල ප්‍රදේශයේ දිය නාමින් සිටියදී සිසුවියක් දියේ ගිලී පෙරේදා (30දා) පස්වරුවේ ජීවිතක්ෂයට පත්ව ඇති බව කල්තොට පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්වූයේ, බලන්ගොඩ, කූරගල, තැන්න පදිංචිව සිටි ජී.එම්. නිරෝෂිකා කුමාරි (අවු. 16) නමැති පාසල් සිසුවියකි.

ඇය සහ මවුපියන් මීට පෙර හොරණ ප්‍රදේශයේ පදිංචිව සිට ඇති අතර, පසුව දැනට මාස තුනකට පමණ පෙර බලන්ගොඩ කූරගල, තැන්න ප්‍රදේශයට පදිංචියට



මියගිය සිසුවිය

පැමිණී තිබෙන බවත්, බලන්ගොඩ අධ්‍යාපන කලාපයට අයත් ර/ තැන්න විදුහලේ 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිට තිබේ. එම විදුහලේ 11 ශ්‍රේණියේ සිසුන් 12දෙනෙකු සහ ගුරුවරියක සමග මෙම ක්ෂේත්‍ර පුහුණු චාරිකාවට එක්වී ඇති අතර, එම ක්ෂේත්‍ර පුහුණු චාරිකාවට අයත් ක්‍රියාකාරකමක් ලෙස සිසුන් පිරිස වලවේ ගඟේ බටකොළ ඇල්ල කොටසේ දියනාමින් සිටියදී මෙලෙස අනතුර සිදුවී ඇති බවත් පරීක්ෂණවලදී අනාවරණය විණි.

ඇය දියේ ගිලුණු පසු ප්‍රදේශවාසීන් සහ කල්තොට පොලීසිය එක්ව සිදුකළ මෙහෙයුමකදී සිරුර ගොඩට ගෙන කල්තොට රෝහලට ඇතුළත් කර ඇති අතර, වැඩිදුර ප්‍රතිකාර සඳහා බලන්ගොඩ මූලික රෝහල වෙත මාරු කිරීමෙන් අනතුරුව ජීවිතක්ෂයට පත්ව තිබේ.

අදාළ සිද්ධිය සම්බන්ධයෙන් බලන්ගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක පී.ජී. ආරියපාල මහතාගෙන් කළ විමසීමකදී පැවැසුවේ, මෙම ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය දැනුවත් කර නිල වශයෙන් සංවිධානය කර ගිය වැඩසටහනක් නොවන බවත් අදාළ ගුරුවරිය සහ දරුවන් පිරිස පෞද්ගලිකව සංවිධානය වී ගොස් ඇති ක්ෂේත්‍ර පුහුණු චාරිකාවක් බවත්ය.

සිද්ධිය සම්බන්ධයෙන් කල්තොට පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක තරංග හපුගස්වත්ත මහතාගේ උපදෙස් පරිදි නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන 10කට නව සභාපතිවරු පත් කරනවා

**- නැගෙනහිර පළාත් ආණ්ඩුකාරිනී අනුරාධා යහම්පත්**

● ත්‍රිකුණාමලය - චමෝද්‍යා නේත්‍රාංජලී අමරජීව

ගැටලුකාරී තත්ත්ව ඇති වී ඇති නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන10ක් සඳහා ඉදිරියේදී නව සභාපතිවරු පත් කරන බව ආණ්ඩුකාරිනී අනුරාධා යහම්පත් මහත්මිය පැවසුවාය.

මහ නගර සභාවක්, නගර සභාවක් හා ප්‍රාදේශීය සභා අටක ඇති වී ඇති ගැටලුකාරී තත්ත්වය මත නව සභාපතිවරු මෙලෙස පත්කරන බව ආණ්ඩුකාරවරිය පෙන්වා දුන්නාය. සභාපතිවරු පත්කිරීමේදී බහුතර බලයක් ඇති පක්ෂයක් වේ නම් පක්ෂ මහ ලේකම්වරයා හරහා සභාපතිවරු පත් කරන අතර එසේ නොවන පළාත් පාලන ආයතනයක් නම් බහුතරයේ කැමැත්ත මත ඡන්ද විමසීමකින් මෙම පත්කිරීම් සිදු කිරීමට නියමිතය.

අම්පාර මහ නගර සභාව හා එරාවූර් නගර සභාව මෙන්ම පොතුවිල්, පදියතලාව, ඉරකාමම්, මන්මුණේ, කෝරළේපත්තු, කෝරළේ පත්තු උතුර, තඹලගමුව හා සේරුවිල යන ප්‍රාදේශීය සභා සඳහා මෙලෙස නව සභාපතිවරු පත් කිරීමට නියමිතය.

1989 අංක 12 දරන පළාත් සභා (අනු ශාංගික විධි විධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන නගර සභා / ප්‍රාදේශීය සභා නියමයන්ට අනුකූලව ආණ්ඩුකාර වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම කටයුතු සිදු කිරීමට නියමිතය.

◀ මන්නාරම ▶

# කෝටි 02ක කේරළ ගංජා තොගයක් මාන්තෙයි මුහුදු වෙරළින් හමුවෙයි





● වවුනියාව - මධුෂංඛ අමරසිංහ

මන්නාරම මාන්තෙයි ප්‍රදේශයේදී සඟවා තිබූ රුපියල් කෝටි දෙකකට ආසන්න වටිනාකමින් යුත් කේරළ ගංජා කිලෝග්‍රෑම් 67 ග්‍රෑම් 500ක් තිබී පෙරේදා (30දා) සොයාගත් බව නාවික හමුදාව පැවසීය.

උතුරුමැද නාවික විධානයේ නිලධාරීන් පිරිසක් විසින් මාන්තෙයි මුහුදු වෙරළේ සිදුකළ සෝදිසි මෙහෙයුමකදී කැළෑවේ ස්ථාන දෙකකදී ගෝනී තුළ සඟවා තිබූ අදාළ කේරළ ගංජා තොගය සොයා ගෙන තිබේ.

එහිදී ගෝනි දෙකක් තුළ පාර්සල් 32ක අදාළ කේරළ ගංජා තොගය හමුවී ඇති අතර සොයාගත් කේරළ ගංජා රැගෙන ආ පුද්ගලයන් කවුරුන්දැයි යන්න මෙතෙක් අනාවරණය වී නොමැත.

මෙම කේරළ ගංජා තොගය ඉන්දියාවේ සිට මුහුදු මගින් බෝට්ටුවලින් මාන්තෙයි මුහුදු වෙරළට රැගෙනවිත් මෙලෙස මුහුදු වෙරළේ සැඟවීමට ජාවාරම්කරුවන් පියවර ගෙන ඇති බවට නාවික හමුදාව සැක පළ කරයි.

සොයාගත් කෝරල ගංජා තොගය වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා වංකාලෙයි පොලීසිය වෙතට භාර දීමට නාවික හමුදාව පියවරගෙන තිබේ.

# පරිගණක හා සංගීත භාණ්ඩ විකුණ බවට අන්තර්ජාලයේ දැන්වීම් පළ කරමින් මුදල් වංචා කළ සැකකරුවෙක් අත්අඩංගුවට

● බිමල් ශ්‍යාමන් ජයසිංහ

උසස් තත්ත්වයේ සංගීත භාණ්ඩ සහ පරිගණක ඉතා ඉක්මනින් අඩු මුදලට විකුණන බවට අන්තර්ජාලයේ දැන්වීම් පළකර මුදල් වංචාව යෙදුණු පුද්ගලයෙකු පෙරේදා (30දා) කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වැලිගම ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පැවසීය.

29 හැවිරිදි සැකකරු නාත්තන්ඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී සැකකරු සන්තකයේ තිබී විවිධ පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් හයක් තිබී පොලිස් භාරයට ගෙන තිබේ.

එම භාණ්ඩ මිලදී ගැනීමට යම් අයෙකු කැමතිනම් ඒ සඳහා බැංකු ගිණුම් අංකයට මුදල් බැර කරන ලෙස දන්වා එලෙස බැර කරන ලද මුදල් කාඩ්පතක් උපයෝගී කරගෙන ලබා ගෙන එම ගිණුම අවසන් කිරීමට කටයුතු කර ඇති බවත්, රු.10,000, 20,000 ආදී වශයෙන් දිනපතා විශාල පිරිසකගේ මුදල් වංචා කර ඇති අතර, සැකකරු විසින් විවිධ පුද්ගලයන්ගේ හැඳුනුම්පත් සොරකම් කිරීමෙන් ගිණුම් ආරම්භ කර ඇති බවත් පරීක්ෂණවලදී හෙළිවී තිබේ

මේ සම්බන්ධයෙන් අදාළ ගිණුම් හිමිකරුවන් දුෂ්කරතාවන්ට ලක්ව ඇති බවත්, ඒ සම්බන්ධයෙන් සිදුකළ මෙහෙයුමකදී සැකකරු අත්අඩංගුවට ගෙන තිබෙන බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

ඔබත් මෙම පුද්ගලයාගේ වංචාවට අසුවී ඇත්නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂවරයාගේ 0718591753 දුරකථන අංකයට ඇමතුමක් ලබාදී පැමිණිල්ලක් ලබාදීමට කටයුතු කරන ලෙස මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් ඉල්ලා සිටියි.

◀ නුවරඑළිය ▶

# නොර්වුඩ් ප්‍රා.සභා සභාපතිට ඇප

● හැටන් - රංජිත් රාජපක්ෂ

පුද්ගලයෙකුට පහර දුන්නේ යැයි කියන සිද්ධියක් සම්බන්ධයෙන් සැකපිට බගවන්තලාව පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන පෙරේදා 30දා අධිකරණයට ඉදිරිපත් කළ නොර්වුඩ් ප්‍රාදේශීය සභාවේ සභාපති රවි කුලන්දවේල් මහතා රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුදාහරින ලෙස හැටන් දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත් ජේ.ට්‍රොස්කි මහතා නියම කළේය.

මෙම නඩුව එළඹෙන මාර්තු 30 දින කැඳවීමට ද මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරන ලදී.

නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී පලනි දිගම්බරම් මහතාගේ පෞද්ගලික ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරන සුප්පයියා කමලදාසන් නමැත්තාට නොර්වුඩ් ප්‍රාදේශීය සභාවේ සභාපති රවි කුලන්දවේල් මහතා විසින් පසුගිය 29දා පහර දී තුවාල සිදු කර බවට තුවාලකරු විසින් පොලීසියට කළ පැමිණිල්ලක් මත සැකකාර සභාපතිවරයා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

පහර කැමට ලක් වුවේ යැයි කියන පලනි දිගම්බරම් මහතාගේ පෞද්ගලික ලේකම්වරයා මේ වන විට දික්ඔය මූලික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

බගවන්තලාව පොලිස් වසමට අයත් මොරා වත්තේ පිහිටි 319 ජී ග්‍රාම සේවා කාර්යාලයට සේවාවක් ලබා ගැනීමට තමන් ගිය අවස්ථාවේ ඒ අසලට පැමිණි සභාපතිවරයා තමන්ට බැණ තර්ජනය කරමින් පහර දුන් බව පහර දීමට ලක් වූවේ යැයි කියන දැනට දික්ඔය මූලික රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන සුප්පයියා කමලදාසන් මහතා පැවසීය.

මේ අතර අදාළ සිද්ධිය සම්බන්ධයෙන් සභාපතිවරයා වහාම අත්අඩංගුවට ගන්නා ලෙස බල කරමින් බගවන්තලාව කර්කස්වොල් වත්තේ වතු කම්කරුවෝ පිරිසක් එම වතු යායේදී පසුගිය (30දා) උදෑසන උද්ඝෝෂණයකද නිරත වූහ.



# අපවත් වී වදාළ පනාමුරේ සුමනසිරි හිමියන්ගේ ආදාහන පූජෝත්සවය අද



● රත්නපුර - ලසන්ත නිරෝෂණ පෙරේරා

ඇඹිලිපිටිය ශ්‍රී සංඝාරාම විහාරාධිපති විචිත්‍රභානක පූජ්‍ය පනාමුරේ සුමනසිරි නාහිමියෝ අපවත් වූහ.

උන්වහන්සේ අපවත් වනවිට 55 හැවිරිදි වියේ පසු වූහ. ඇඹිලිපිටිය ප්‍රදේශයේ සමාජ ආගමික සහ ශාසනික ක්ෂේත්‍රවල පුළුල් මෙහෙවරක යෙදුණු භික්ෂූන් වහන්සේ නමක් ලෙස උන්වහන්සේ ප්‍රකටය.

පනාමුරේ සුමනසිරි නාහිමියන්ගේ ආදාහන පූජෝත්සවය අද පෙබරවාරි 01වැනිදා පස්වරුවේ ඇඹිලිපිටිය ගම් උදා ක්‍රීඩා පිටියේදී සිදු කිරීමට නියමිතය.




# කැබිතිගොල්ලෑව කෝවිඩ් මධ්‍යස්ථානයේ අපද්‍රව්‍ය ප්‍රාථමික පාසල හරහා ගලා යෑමෙන් ජීවිතවලට කෝවිඩ් අවදානමක්

## - පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර

◀ අනුරාධපුරය ▶

● හොරොව්පොතාන - සිඩ්නි රුවන් උබේපාල

කෝවිඩ් රෝගීන් සඳහා ප්‍රතිකාර කරනු ලබන කැබිතිගොල්ලෑව රෝහල් කැළි කසළ සහ අපද්‍රව්‍ය මිශ්‍ර කානු පද්ධතිය කැබිතිගොල්ලෑව ප්‍රාථමික පාසල හරහා ගලා යෑම එම පාසලේ ඉගෙනුම දරුවන් කෝවිඩ් රෝගයේ බිල්ලක් බවට පත් කිරීමක් බවත් එම නිසා මෙම අනාරක්ෂිත කානු පද්ධතිය වහාම ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බවත් අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ බණ්ඩාර මහතා පැවසීය

මැදවච්චිය නගරයේදී පෙරේදා (30දා) පැවැති මාධ්‍ය හමුවකදී මන්ත්‍රීවරයා එසේ පැවසීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා,

"කැබිතිගොල්ලෑව ප්‍රාථමික පාසල තියෙන්නේ කැබිතිගොල්ලෑව නගරයේ. කැබිතිගොල්ලෑව රෝහල ඊට ආසන්නවම තිබෙනවා. පහුගිය කාලයේ කෝවිඩ් රෝගීන් සඳහා වෙන් කළ රෝහලක් මේක. දිවයින පුරා කෝවිඩ් පොසිටිව් අය ගෙනත් නේවාසිකව ප්‍රතිකාර කරන්නේ මේ රෝහලේ. සෑම රෝගියෙක්ම රෝගීන් ලෙස සලකලා ආරක්ෂිත ක්‍රමයට මෙය පවත්වාගෙන යාවි කියන බලාපොරොත්තුවෙන් අපි නිහඬව බලන් හිටියා මේ රෝහල දෙස. අවසානයේදී මේ රෝහලේ ආරක්ෂිත පාලනය බිඳී ගියා. එහි ප්‍රතිඵලය ලෙස රෝහලේ සේවයේ යෙදුණ වෛද්‍යවරුන්ට පවා මෙම රෝහලේ සේවය කරමින් සිටියදී කෝවිඩ් පොසිටිව් වුණා. එහෙම පාලනයෙන් ගිලිහුණ රෝහලේ කැළි කසළ සහ අපද්‍රව්‍ය මිශ්‍ර ජලයේ කානු පද්ධතියක් අද වනවිට





කැබිතිගොල්ලෑව ප්‍රාථමික පාසල් භූමිය හරහා ගලා යනවා. මේ වන විට පාසල් ආරම්භ කරලා තියෙන්නේ.

හයක්, හතරක් නොතේරෙන දරුවන් දැන් මේ පාසලට එනවා. මේ අය මේ කානුව අසලින් ගමන් කරනවා. සමහර අය ඒ ජලය සමග සෙල්ලම් කරනවා. මේ දරුවන්ට කිසි දෙයක් තේරෙන්නේ නැහැ. අධ්‍යාපනයේ ප්‍රාථමික මට්ටමේ සිටින දරුවෝ මේ. මෙහෙම ගියොත් මේ අයට වෛරසය ඉක්මනින් ශරීරගත වෙන්න පුළුවන්. මේක ලොකු අවදානමක්. සුළුවෙන් සිතන්න බෑ. වහාම බලධාරීන් මේ පිළිබඳ අවධානය යොමු කළ යුතුයි. මේ අනාගතය බාරගන්න ඉන්න මල් කැකුලු කෝවිඩ් වෛරසයට බිලි දෙන්න එපා කියලා මම රජයෙන් ඉල්ලා සිටිනවා. ඒ නිසා කඩිනම් විසඳුමක් මෙයට ලබා දෙන්න කියලා නැවත වතාවක් මම බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවාත" යැයි ද පවසා සිටියේය.

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

SEYLAN BANK PLC

T & H

**සෙලාන් බැංකුව පීඑල්සී**
**නාවල ශාඛාව මඟින්**
**දෙහිවල, කළුබෝවිල පිහිටි නවීන මහල් නිවසක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි**

මෙම දේපළ වත්තල සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ සිය ලියාපදිංචි අංක පීවී 69089 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සෙරන්ඩිබ් ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දෙහිවල පදිංචි පරණවිදානලාගේ දිල්ශාන් එසිනාහත් බොතේජු යන අය බන්ධනදායි/ උකස්කරුවන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බංකුව වෙත සුරක්ෂිත කර ඇත.

**උපලේඛනය**

සහාධිපත්‍ය ඉඩම් කොටස එක්ස්/එෆ්ඕ/යූ 1
දෙහිවල, ස්කූල්, ලේන් වරිපනම් අංක 41 දරන එක්ස්/එෆ්ඕ/යූ 1 සහාධිපත්‍ය ඉඩම් කොටස පහත සඳහන් පරිදි සමන්විත වේ.
(අ) බිම් මහල එක්ස්/එෆ්ඕ/යූ 1 සහාධිපත්‍ය ඉඩම් කොටස
(ආ) සහාධිපත්‍ය ඉඩම් කොටස ඒජී 1 රථගාල
(අ) බිම් මහලෙහි එක්ස්/එෆ්ඕ/යූ 1 සහාධිපත්‍ය ඉඩම් කොටස පහත සඳහන් පරිදි මායිම් වේ.
උතුරට : සීඊ 1 නැගෙනහිරට : සීඊ 1 සහ සීඊ 3
දකුණට : අමතර ඉඩම් කොටස් ඒජී 1 සහ ඒජී 2 බස්නාහිරට : පාර
පත්ලෙන් : මෙම ඉඩම් කොටසේ කොන්ක්‍රීට් බිම මුදුනින් : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්/යූ 1
බිමෙහි වර්ග ප්‍රමාණය : වර්ග මීටර් 133කින් යුක්ත වේ
(ආ) සාහාධිපත්‍ය ඉඩම් කොටස බිම් මහල් ඒජී1 (රථගාල) පහත සඳහන් පරිදි මායිම් වේ.
උතුරට : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්ඕ/යූ 1 සහ සීඊ 1
නැගෙනහිරට : සීඊ 1
දකුණට : සීඊ1 සහ අමතර ඉඩම් කොටස ඒජී 2 බස්නාහිරට : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්ඕ/යූ 1
පත්ලෙන් : මෙම ඉඩම් කොටසේ කොන්ක්‍රීට් බිම මුදුනින් : බද්ධ නිවාස ඉඩම් කොටස එක්ස්/එෆ්1/යූ
බිමෙහි වර්ග ප්‍රමාණය: වර්ග මීටර් 14කින් යුක්ත වේ.

**සාහාධිපත්‍ය දේපළෙහි පොදු අංගයන් පහත සඳහන් පරිදි වේ.**
(අ) ගොඩනැඟිල්ල පිහිටි ඉඩම, සාහාධිපත්‍ය දේපළට අදාළ විවෘත ඉඩකඩ ඇතුළුව
(ආ) අත්තිවාරම, කුලුනු, බාල්ක, යට ලී, ආධාරක සහ ගොඩනැඟිල්ලේ වහල.
(ඇ) විදුලිය, දුරකතන, ගුවන්විදුලි, රෙඩිෆියුෂන්, රූපවාහිනී, ජල නළ, ජල ටැංකි, ජලය සඳහා සම්ප්, උඩ ජල ටැංකි, පොම්පාගාරය, නළ, ජලාපවහන මාර්ග, මෑන්හෝල්ස් සහ කැළි කසළ නිශ්කාශන වැනි ප්‍රධාන සේවා සඳහා සවිකිරීම.
(ඈ) දේපළෙහි සිය පැවැත්මට නඩත්තුවට සහ ආරක්ෂාවට සාමාන්‍යයෙන් පොදුවේ භාවිතයේ ඇති අත්‍යවශ්‍ය සහ යෝග්‍ය සියලු වෙනත් කොටස් සහ පහසුකම්.
බලයලත් මිනින්දෝරු ගාමිණි. බි. දොඩන්වෙල විසින් සාදන ලද 2013 ජූනි 24 දිනැති අංක 9623 දරන සහාධිපත්‍ය සැලැස්මේ නිරූපණය කර සහ විස්තර කර ඇති පොදු අංගයන්ගේ සහ ස්ථානවල නිර්වචනය සහ විස්තරය.
(අ) සීඊ (i) ස්ථානය - බිම් මහල (ii) විස්තරය - විවෘත ප්‍රදේශය
(iii) බද්ධ නිවාස කොටසට ප්‍රවේශය - බද්ධ නිවාස කොටස් ප්‍රවේශය එක්ස්/එෆ්ඕ/යූ 1 සහ එක්ස්/ එෆ්1/යූ 10
(ආ) සීඊ 2 (i) ස්ථානය - බිම් මහල (ii) විස්තරය - අහසට විවෘතව ඇත.
(ඇ) සීඊ 3 (i) ස්ථානය - බිම් මහල සහ ඉහළ මහල (ii) විස්තරය - තරප්පු පෙළ
(iii) බද්ධ නිවාස කොටසට ප්‍රවේශය - එක්ස්/එෆ්1/යූ 1 බද්ධ නිවාස කොටසට අතරමැදි ප්‍රවේශය.

**සහාධිපත්‍ය දේපළට ප්‍රවේශය**

බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2013 ජූනි මස 24 දිනැති අංක 9623 දරන එකී සහාධිපත්‍ය සැලැස්මේ බස්නහිර මායිම උඩින් සහ විස්තර කර ඇති සහ කියැවෙන පරිදි පාර දිගේ සහ උඩින් හා යටින් ප්‍රකාශකහට සහ සිය අනුප්‍රාප්තිකයන්ට සහ පැවරුම්ලාභීන්ට සේවකයින්ට කුලීකරුවන්ට ආරාධිතයන්ට ආගන්තුකයින්ට යාමට ඊමට සහ ප්‍රතිගමනයට පූර්ණ සහ නිදහස් අයිතිය නිදහස සහ බලපත්‍රය සහ සියලු වේලාවන්හි නිත්‍ය මාර්ග අයිතිය සහ ප්‍රකාශක විසින් බලය පවරන ලද සමාන අයිතිවාසිකම් ඇති සියලු වෙනත් පුද්ගලයින්ට සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් කුමන ආකාරයේ වුවද සියලු කාරණා සඳහා දහවල් හෝ රාත්‍රී කාලයේ සමාන අයිතිවාසිකම් ඇති වෙනත් අය සමඟ පොදුවේ විදුලි කේබල්, උඩු රැහැන් සහ ජලය ගෑස් ජලාපවහන පද්ධති සහ ජලාපවහන නළ සහ ප්‍රධාන නළ සහ වෙනත් කුමන ආකාරයේ වුවද මෙවලම් පහත විස්තර කරනු ලබන පාර තුළ දිගේ උඩින් සහ යටින් යෙදීමට අයිතිය සමඟ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අංක 10350 දෙහිවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හත්බෝධිවත්ත වෝර්ඩ් අංක 05 කළුබෝවිල පිහිටි බලයලත් මිනින්දෝරු එස්.එච්.බී. ජෝසප් විසින් සාදන ලද 1967 පෙබරවාරි 12 දිනැති අංක 77 සැලැස්මේ නිරූපණය වන ගොරකගහවත්ත නමැති ඉඩමේ අඩි 10ක් පළල පාරක් වන ලොට් 6 ලකුණු කළ ඉඩම් කොටසට මායිම් උතුරට: පාසල් මාවතද නැගෙනහිරට : ලොට්ස් 1 සහ 2 ද, දකුණට : ලොට්ස් 3 සහ 4 සහ බස්නාහිරට : ලොට් 5 ද යන මායිම් තුළ පර්චස් තුනක් (අ.0 රූ. 0 පර්. 03) විශාල ඉඩම.

**වර්ග මීටර් 133 කින් යුත් ඉහත සඳහන් මහල් නිවාසය ඊට අයත් සියලු පහසුකම් සහ අයිතිවාසිකම්ද සමඟ සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලතල අනුව 2021 පෙබරවාරි මස 22 වන දින පෙරවරු 10.00ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

**දේපළට පිවිසීම :-** දෙහිවල, ගාලු පාරේ, විලියම් මංසන්ධියේ සිට කළුබෝවිල රෝහල පාරේ කොහුවල දෙසට කි.මී. 1ක පමණ දුරක් ගොස් වම්පසට ඇති අල්විස් ඇවනිව් එකට හැරී තවත් මීටර් 100ක පමණ දුරක් ගොස් නැවතත් වම්පසට ඇති මාර්ගයට හැරී මීටර් 125ක පමණ දුරක් ගොස් වම්පසට ඇති පාසල් පටුමඟට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 100ක පමණ දුරක් ගිය විට අදාළ නිවාස ඒකකය මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කෝවිඩ් - 19 උපදෙස් සහ නීතිරීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පත්වනු ඇත.

**යෝජනා සම්මුති දැන්වීම :** රජයේ ගැසට් පත්‍රයේ 2019.10.18 වන දින පළවී ඇති අතර, ලංකාදීප, ඩේලිමිරර් සහ තිනකුරල් පුවත්පත්වල 2019.10.23 වන දින පළවී ඇත. විකිණීමේ නිවේදනය රජයේ ගැසට් පත්‍රයේ 2021.01.29 වන දින පළවී ඇත.

**ගෙවීමේ ක්‍රමය :-** සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.
1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්)
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්)
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3000/-
5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1500/-
6. සියලුම ප්‍රචාරක වියදම්
7. ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමඟ වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10%ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී අංක, 90 ගාලු පාර, කොළඹ 03 දු.ක. 0112456476, 2456480
ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

**තුසිත් කරුණාරත්න (සාම විනිසුරු)**
**බලයලත් වෙන්දේසිකරු**
**සහ උසාවි කොමසාරිස්**

**ටී.ඇන්ඩ්.එච්. ඔක්ෂන්**
**50/3, විහාර මාවත, කොලොන්නාව**
**දු.ක. 0113068185, 0112572940**

# තුඩැල්ලේ මාළු අපනයන සැකසුම් මධ්‍යස්ථානයක 88කට කෝවිඩ්

● ජා-ඇළ - ප්‍රසංග පෙරේරා

ජා-ඇළ සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී බලප්‍රදේශයට අයත් තුඩැල්ල පිහිටි මාළු අපනයන සැකසුම් මධ්‍යස්ථානයකින් කෝවිඩ් 19 ආසාදිතයන් 88දෙනෙකු ඊයේ (31දා) වනවිට හඳුනාගත් බව ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්.ඩබ්ලිව්.එම්.වයි. විජේසිංහ මහතා පැවසීය.

මෙම ආයතනයේ සේවකයන් 25දෙනෙකු පමණ ඒකල කොටුගොඩ ප්‍රදේශයේදී නිරෝධායන නීති උල්ලංඝනය කරමින් සාදයක් පවත්වා ඇති බවටද කරුණු අනාවරණය වූ බව විජේසිංහ මහතා පවසා සිටියේය.

ප්‍රථමයෙන් එම පිරිසට රෝග ලක්ෂණ පහළ වී ඇති අතර පසුව කරනු ලැබූ පී.සී.ආර්. පරීක්ෂණයේදී අදාළ පුද්ගලයන් ආසාදිතයන් ලෙස හඳුනාගෙන ඇත. එම ආසාදිතයන් මේ වනවිට රෝහල්ගත කිරීමට කටයුතු කරමින් සිටින බවද ඔවුන්ගේ ආශ්‍රිතයන් ස්වයං නිරෝධායනයට ලක් කර අදාළ ආයතනය විෂබීජහරණයට ලක්කළ බවද පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා පැවසීය.

◀ ගාල්ල ▶

# යතුරුපැදියක් හා ලංගම බස් රථයක් ගැටී යතුරුපැදියේ ගමන් ගත් යුවළ මරුට



● පිටිගල - ඩී.ජේ. විජේසිංහ

ඇල්පිටිය - අවිත්තාව ප්‍රධාන මාර්ගයේ නාලන්දා මහ විදුහල ආසන්නයේදී පෙරේදා (30දා) පෙරවරුවේ සිදුවූ යතුරුපැදි හා බස් අනතුරකින් යතුරුපැදියේ ගමන් ගත් යුවළ ජීවිතක්ෂයට පත්ව ඇති බව ඇල්පිටිය පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්වූයේ, අවිත්තාව ඕපාත පන්සල අසල පදිංචිව සිටි සහන් රෝහිත ජයසිංහ හා ඕපාතගම විදානලාගේ රමණී පුෂ්පලතා නමැති යුවළකි.

මරණයට පත් යුවළ යතුරුපැදියෙන් ඕපාත සිට ඇල්පිටිය දෙසට ගමන් කරමින් සිටියදී ඇල්පිටිය දෙස සිට අවිත්තාව බලා ධාවනය වූ ලංගම බස් රථයට ගැටීමෙන් අනතුර සිදුව ඇති බවත්, බස් රථය විරුද්ධ දිසාවට ගොස් විදුලි කණුවක ගැටී නතර වී තිබූ බවත් පරීක්ෂණවලදී අනාවරණය විය.

සිද්ධිය සම්බන්ධයෙන් ඇල්පිටිය පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.



# සංචරණ සීමා ලිහිල් කරන්නැයි මහියියාව ජනතාව විරෝධතාවක

● ෂෙන් සෙනෙවිරත්න

කෝවිඩ් වෛරස ව්‍යාප්තිය හේතුවෙන් දැනට මාස දෙකක් පමණ කාලයක් වසා තබා තිබෙන මහියියාව ගම්මානයේ සංචරණ සීමා ලිහිල් කරන්නැයි ඉල්ලමින් එම ගම්මානයේ ජනතාව පෙරේදා (30දා) සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සාමකාමී විරෝධතාවක නිරත වූහ.

එම ගම්මානයේ පදිංචි පවුල් 2000ක පමණ පිරිසක් සංචාරණ සීමා ඉවත් නොකිරීම නිසා දැඩි අපහසුතාවකට පත්ව සිටින බවත්, පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පවා මේ නිසා අඩාළ වී තිබෙන බව විරෝධතාකරුවෝ පැවසූහ.

අවස්ථා කිහිපයකදී පී.සී.ආර්. පරීක්ෂණ සිදු කළත් එහි ප්‍රතිඵල නිකුත් වීමේ ඇති ප්‍රමාදය නිසා මෙසේ ජනතාව අපහසුතාවට පත්වී සිටින බවද ඔවුහු පෙන්වා දුන්හ.

පවතින තත්ත්වය හේතුවෙන් මෙවර පළමු වසර සඳහා ළමුන් ඇතුළත් කිරීමට ඉල්ලුම්පත් යොමුකළ දරුවන්ගේ දෙමවුපියන්ට අභියාචනාවලට පවා යාමට නොහැකි වූ බව රිස්වාන් මවුලවිතුමන් පැවසීය.

මහනුවර නාගරික මන්ත්‍රී ආනන්ද සරත් කුමාර මහතා පවසා සිටියේ, මහියියාව ප්‍රදේශයේ පළමු කෝවිඩ් රෝගියා හඳුනා ගැනීමෙන් පසු ඔහුගේ ආශ්‍රිතයන් පිරිසක් රන්ටැඹේ නිරෝධායන කඳවුරට යොමුකළ බවත් ඉන් අනතුරුව ගමේ සෙසු පිරිසට එකවර පී.සී.ආර්. පරීක්ෂණවලට භාජනය නොකර කඩින්කඩ එය කිරීම නිසා මෙම ගැටලුව මතුව තිබෙන බවත්ය.

# අත්තනගල්ල කොට්ඨාසයේ කෝවිඩ් ආසාදිත ගණන 732ක්

● වාරණ - ආනන්ද ඉ. ජයකොඩි

අත්තනගල්ල කොට්ඨාසයේ ඊයේ (31දා) වනවිට කෝවිඩ් 19 වෛරස ආසාදිතයන් 732ක් වාර්තා වී ඇති බව අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

තිහාරිය මහජන සෞඛ්‍ය පරීක්ෂක කලාපයෙන් ආසාදිතයන් 154ක් වශයෙන් වැඩිම පිරිසක් වාර්තා වී ඇත.

මේ කාලය තුළ කෝවිඩ් ආසාදිත මරණ තුනක් අත්තනගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයෙන් වාර්තා වී තිබේ.

# ගනේපල්ලේ උත්සවයකට සහභාගී වූ 60ක් නිරෝධායනයට

◀ කෑගල්ල ▶

● යටියන්තොට - සමන් එස්. රත්නායක

යටියන්තොට ගනේපල්ලේ නිවසක පැවැති මල්වර වීමේ උත්සවයක දින කීපයක් වැඩ කළ කෝවිඩ් ආසාදිත පවුලේ ඥාතියෙකු හේතුවෙන් එම උත්සවයට සහභාගි වූ ගමේ පවුල් 60ක් නිරෝධායනයට ලක්කළ බව යටියන්තොට සෞඛ්‍ය නිලධාරී කාර්යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක කෝලිත ආරියදාස මහතා ඊයේ (31දා) පැවසීය.

ඒ මහතා ප්‍රකාශ කළේ, මෙවැනි උත්සව වත්මන් තත්ත්වය හමුවේ චාරිත්‍රවලට පමණක් සීමා කරමින් පවුලේ අය සමග සිදු කරන ලෙස උපදෙස් දුන්නද සෞඛ්‍ය උපදෙස් අනුගමනය නොකිරීම හේතුවෙන් මෙවන් තත්ත්වයක් ඇතිවන බවයි. තවද උත්සවයේ වැඩ කටයුතු කළ අය හා එයට සහභාගි වූවන් සමහරෙක් මුව ආවරණ පවා පැලඳ නොසිටි බවට වාර්තා වන බවත් ඒ මහතා මෙහිදී සඳහන් කළේය.

මේ හේතුවෙන් නිරෝධායනයට ලක්කළ පවුල්වල රජයේ සේවකයන්, වතු නිවාසවල පදිංචි වතුසේවකයන්, හමුදා නිලධාරීන්, පාසල් සිසුන් ගුරුවරුන් ඇතුළු විශාල පිරිසක් සිටින බව සෞඛ්‍ය අංශ පවසයි.

පසුගිය 25වැනිදා පැවැති මෙම උත්සවයට සහභාගි වූ කෝවිඩ් ආසාදිතය පුද්ගලයා ජා-ඇළ ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක සේවකයෙකු වන අතර සේවා ස්ථානයෙන් පී.සී.ආර්. පරීක්ෂණය සිදු කිරීමේදී කෝවිඩ් ආසාදිත බවට තහවුරු වී ඇති බව පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා තවදුරටත් සඳහන් කළේය.

◀ පුත්තලම ▶

# පුත්තලමින් කෝවිඩ් ආසාදිතයන් 44ක් සොයා ගැනේ

● ආරච්චිකට්ටුව - ලලිත් නවරත්න

පුත්තලම දිස්ත්‍රික්කයේ එක් දිනයක් තුළ හඳුනාගත් වැඩිම කෝවිඩ් ආසාදිතයන් ප්‍රමාණය වන ආසාදිතයන් 44ක් පෙරේදා (30දා) වාර්තා වූ බව සෞඛ්‍ය අංශ බලධාරීහු සඳහන් කරති.

එම ආසාදිතයන් වෙන්නප්පුව, මහවැව, ආරච්චිකට්ටුව, මුන්දලම, පුත්තලම, මාරවිල, ආණමඩුව යන සෞඛ්‍ය බලප්‍රදේශවලින් වාර්තා වී ඇති බව සෞඛ්‍ය අංශ සඳහන් කරයි.

සියලුම ආසාදිතයන් දිවයින තුළ ස්ථාපිත කර ඇති විශේෂ කෝවිඩ් ප්‍රතිකාරක මධ්‍යස්ථාන වෙත ප්‍රතිකාර සඳහා ඇතුළත් කර ඇති අතර එම ආසාදිතයන්ගේ ආශ්‍රිතයන් 1800ට අධික සංඛ්‍යාවක් තම නිවෙස්වලම ස්වයං නිරෝධායනයට යොමුකර ඇති බව එම සෞඛ්‍ය බලධාරීහු පවසති. එම පිරිස් සඳහා පී. සී. ආර් පරීක්ෂණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාස වශයෙන් සිදු කරන බව පවසන පුත්තලම දිස්ත්‍රික් පරිපාලන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ආර්.පී. අබේරත්න මහතා, නියමිත නිරෝධායන නීතිවලට අනුව තම නිවෙස්වලම රැඳී සිටිමින් සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව කටයුතු කරන ලෙස එම නිරෝධායකයන්ගෙන් ඉල්ලා සිටියි.

# බලන්ගොඩින් නව ආසාදිතයන් 09ක්

## බලන්ගොඩ රෝහලේ පිරිමි ශල්‍ය වාට්ටුව තාවකාලිකව වසා දැමේ

◀ රත්නපුර ▶

● රාස්සගල - එන්. සම්පත්/ බෙලිහුල්ඔය - එස්. රත්නායක

බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසයේ නව කෝවිඩ් වෛරස ආසාදිතයන් 09දෙනෙකු ඊයේ (31දා) හඳුනාගෙන ඇති බව බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය පවසයි.

කිරිමැටිතැන්න ප්‍රදේශයේ පුද්ගලයන් 06දෙනෙකු, දෙහිගස්තලාව ප්‍රදේශයේ පුද්ගලයන් 02දෙනෙකු සහ රාස්සගල, හල්වතුර කන්ද ප්‍රදේශයේ පදිංචි පොලිස් විශේෂ කාර්ය බළකායේ අයෙකුට මෙලෙස කෝවිඩ් -19 වෛරස වී ආසාදනය වී ඇති බවට තහවුරු වි ඇතැයි බලන්ගොඩ මහජන සෞඛ්‍ය පරීක්‍ෂක නිලධාරීහු පැවැසූහ.

ඔවුන්ට ඉකුත් 27වැනිදා සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණවල වාර්තා ලැබීමෙන් පසු මෙලෙස තහවුරු වූ බවද මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීහු වැඩිදුරටත් පැවසූහ.

මේ අතර, බලන්ගොඩ මූලික රෝහලේ රෝහලේ ශල්‍ය වෛද්‍ය පිරිමි වාට්ටුව ඊයේ (31දා) තාවකාලිකව වසා දැමීමට පියවර ගත් බව එම රෝහලේ ප්‍රකාශකයෙක් පැවසීය.

ශල්‍යකර්මයක් සඳහා රෝහලේ 8 වාට්ටුවේ නේවාසිකව සිටි රෝගියෙකු ශල්‍යකර්මයට ප්‍රථම කළ පී.සී.ආර් පරීක්ෂණයවලින් කෝවිඩ් ආසාදනය වී ඇති බවට තහවුරු වීමෙන් පසු මෙම වාට්ටුව තාවකාලිකව වසා දැමීමට පියවර ගත් බව එම ප්‍රකාශකයා පැවසීය.

මෙම රෝගියා මේ වනවිට රෝහලේ වෙන්ව ඇති වෙනම වාට්ටුවක් සඳහා යොමු කර ඇති අතර කෝවිඩ් ප්‍රතිකාර සඳහා යොමු කිරීමට නියමිතව ඇති බවද රෝහල් ප්‍රකාශකවරයා වැඩිදුරටත් පවසා සිටියේය.

# ඉදිරියේදී සැමට ලැබෙන කෝවිඩ් එන්නත් ගැන දැනුවත්ද?



**covid-19 වෛරසය සඳහා මේ වන විට ලෝකයේ එන්නත් කිහිපයක්ම භාවිත කිරීම ඇරඹුණු අතර, පසුගියදා ලංකාවටද Oxford AstraZeneca ආයතනය මගින් නිර්මාණය කළ සීරම් ඉන්ස්ටිටියුට්හි නිෂ්පාදනය කරන ලද Covishield එන්නත ලැබුණි. එම එන්නත භාවිත කිරීම සහ ඒ වටා ඇති ඔබ දැනුම්වත් විය යුතු කරුණු සහ ඉදිරියේදී ලැබෙන එන්නත් පිළිබඳව මෙම ලිපියෙන් ආවරණය කිරීමට අප උත්සාහ ගත්තෙමු.**

● කැළුම් දේවින්ද / නදීශානි පතිරණ


## covid-19 සඳහා එන්නත්කරණය යනු කුමක්ද?

covid-19 වෛරසයෙන් ආරක්ෂා වීමට ඇති සරල ආරක්ෂාකාරී ඵලදායී ක්‍රමයකි. මෙහිදී ඔබේ ශරීරයේ පවතින ස්වාභාවික ප්‍රතිශක්තීකරණය covid-19 වෛරසයට විරුද්ධව ක්‍රියාකාරී වීමට සලස්වයි. වෛරසයට එරෙහිව තමාගේ සිරුරේ ඇති ප්‍රතිශක්තීකරණය ශක්තිමත් කරයි. එන්නත ලබාගත් පුද්ගලයෙකුට නැවත වෛරසය ඇතුළු වූ විට ප්‍රතිශක්තීකරණ පද්ධතියේ මතක තබාගැනීමේ සෛල එය හඳුනා ගනී. එවිට ප්‍රතිශක්තීකරණ පද්ධතිය ක්‍රියාත්මක වීමෙන් ඔබ රෝගී වීමට ප්‍රථම වෛරසය විනාශ කර දමයි.


## එන්නතක ඇති වැදගත්කම

ඖෂධීය නොවන රෝග වැළැක්වීමේ ක්‍රමවේදයන් covid-19 මැඩපැවැත්වීමට වැදගත් වුවද එමගින් තවදුරටත් රෝගය පාලනය කිරීම අපහසු වී ඇත. එම නිසා එන්නත්කරණය මගින් covid-19 වෛරසයෙන් සිදුවිය හැකි රෝගී තත්ත්වයන් සහ සංකූලතා මගින් සිදුවන මරණ වැළැක්වීමට බලාපොරොත්තු වේ. ලෝකයේ සියලු ජනතාව මෙන්ම ශ්‍රී ලාංකිකයන්ද මෙම වසංගත තත්ත්වය නිසා වසංගත තෙහෙට්ටුවෙන් (Pandemic fatigue) පෙළේ. එබැවින් ඔවුන් හට පුද්ගල දුරස්ථභාවය, අවම සමාජ සංසරණය හා එදිනෙදා අනුගමනය කළ යුතු නිසි සෞඛ්‍ය පුරුදු පවත්වාගෙන යාමේ අපහසුවක් තිබේ. මේ තත්ත්ව යටතේ වසංගතය පිටුදැකිය හැකි එකම ක්‍රමවේදය එන්නත්කරණය සමග රෝගය වැළැක්වීමේ නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීම බව පෙනේ.





වර්තමානයේ භාවිත වන එන්නත්





## එන්නත ලබාගැනීමේ ඇති වැදගත්කම

covid-19 වෛරසය ඉතා ඉක්මනින් පැතිරෙන ව්‍යාධිජනක වෛරසයකි. covid-19 වෛරසය මගින් අධික ලෙස රෝගී වීම, රෝහල්ගත ප්‍රතිකාර අවශ්‍ය වීම, දිගුකාලීන සංකූලතා ඇතිවීම මගින් මරණයට පත්වීම පවා සිදුවිය හැකිය. ඔබ එන්නත ලබාගැනීම මගින් ඔබේ ආරක්ෂාවද, ඔබේ පවුල සහ ඔබ අවට සිටින අයගේ ආරක්ෂාවද වැඩි වීමේ හැකියාව වැඩි වේ. හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් සිටීම covid -19 වැලඳීමේ හා එය පැතිරවීමේ අවදානම අඩු නොකරයි. වෛරසය ආසාදනය වී ඇති අවස්ථාවක ඔබට ඉතා සුළු රෝග ලක්ෂණ හෝ කිසිදු රෝග ලක්ෂණයක් නොතිබුණත්, ඔබගේ ආදරණීයන්ව සහ ඔබ අවට සිටින අයව ආසාදනය කිරීමේ හැකියාවක් ඇත. එන්නත ලබාගැනීම මගින් අප හා සමාජය ආරක්ෂා වීමක් සිදුවන අතර, එය අප සතු සමාජ වගකීම ඉටුකිරීමක්ද වේ.

## ලංකාවේ ආරම්භක එන්නත?

Oxford AstraZeneca ආයතනය මගින් නිර්මාණය කර, සීරම් ඉන්ස්ටිටියුට්හි නිෂ්පාදනය කරන ලද Covishield එන්නත ශ්‍රී ලංකාවේ covid -19 රෝගය සඳහා භාවිත කරන ආරම්භක එන්නතයි. මෙම එන්නත අඩපණ කරන ලද ( එම්.එම්.ආර්, පැපොල වැනි) එන්නත් වර්ගවලට සමානය. මෙම එන්නතෙහි covid -19 ප්‍රතිදේහජනකයට සමාන ජානයක් ඇතුළත් කර ඇත. (SARS-Cov 2 නැතහොත් COVID 19හි ඇති spike ප්‍රෝටීනය) මෙම එන්නත ශරීරයේ ප්‍රතිශක්තීකරණ පද්ධතියේ ඇති වැදගත් සෛල දෙවර්ගයක් වන B සහ T සෛල සක්‍රිය කරන අතර, එමගින් ප්‍රබල ප්‍රතිශක්තීකරණයක් සහ මතකයක් ඇති කරයි.

## එන්නත් ක්‍රියාවලියට පෙර

එන්නත ලබාගැනීම සඳහා ලියාපදිංචි වීමේදී ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය, ඔබගේ දුරකථන අංකය, ඔබගේ වර්තමාන ලිපිනය සහ ඔබගේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශය යන තොරතුරු නිවැරදිව ලබාදිය යුතුය.

## එන්නතෙන් පසු

එන්නත 100% ඵලදායී නොවිය හැකි නමුත්, එය සැලකිය යුතු ආරක්ෂාවක් ලබාදෙයි. එන්නතෙහි පූර්ණ සඵලතාව ලබාගත හැක්කේ මාත්‍රාවන් දෙකම ලබාගැනීමෙන් පසුව පමණි. අදාළ එන්නත් මාත්‍රා දෙක සම්පූර්ණ කිරීමෙන් පසු ඇතිවන ප්‍රතිශක්තීකරණයෙන් ලැබෙන ආරක්ෂාව පවතින කාලය පිළිබඳව මෙතෙක් තහවුරු කර නොමැත. එන්නත ලබාගැනීමෙන් පසු වෛරසය ඔබගෙන් තවත් අයෙකුට බෝ නොවන බවට තවමත් නිශ්චිතව හඳුනාගෙන නැත.

## Covishield එන්නත ක්‍රියාත්මක වන ආකාරය

මෙම එන්නත වෛරස් දෛශික එන්නතක් වේ. එහි ඇති අඩපණ කරන ලද එනම් හානියක් නොවන ලෙස සකස් කරන ලද වෛරසයෙහි ප්‍රතිදේහජනයක් ලෙස ක්‍රියාකරන ජානය ඇතුළත්ව ඇත. එනම් covid -19 වෛරසයට ආවේණික වූ spike ප්‍රෝටීනයට හෝ එහි කොටසකට ප්‍රතිචාර දැක්වීමක් සිදු වේ. පුද්ගලයෙකුට එන්නත ලැබුණු විට ප්‍රතිශක්තීකරණ පද්ධතිය සහ එහි මතක සෛල ක්‍රියාකාරී වීම ආරම්භ වේ. එන්නත් ලබාගත් පුද්ගලයෙකුට පසුකාලීනව වෛරසය ආසාදනය වූ විට ප්‍රතිශක්තීකරණ පද්ධතිය ඒ වනවිටත් වෛරසය හඳුනාගෙන ඇති බැවින් වෛරසයට ඉක්මනින් පහර දීමට පටන් ගෙන එය විනාශ කරනු ලබයි.


## එන්නත ලබාදෙන්නේ කා හටද?

Covishield එන්නතෙහි සැපයුම ඉතා සීමිත බැවින් එය වැඩිපුරම අවශ්‍ය පුද්ගලයන්ට හෝ ප්‍රමුඛතා කණ්ඩායම්වලට පළමුව ලබාදෙයි. ඒ අනුව covid -19 වසංගතය මැඩලීමට ප්‍රමුඛව ක්‍රියාකරන සෞඛ්‍ය සේවා කාර්යමණ්ඩලයට සහ අනෙකුත් පළමු පෙළ නිලධාරීන් වන ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට සහ පොලිස් නිලධාරීන්ට මුල් අදියරයේදී ලබාදෙයි. එමෙන්ම වයස අවුරුදු 60ට හෝ ඊට වැඩි වැඩිහිටි පුද්ගලයන්ට සහ ඉහළ වයස් සීමාවන්ගේ සිට පහළ වයස් සීමාවන් දක්වා වන (වයස අවුරුදු 18ට වැඩි) පුද්ගලයන්ටද මෙම එන්නත ලබාදෙයි. මෙහිදී සුදුසුකම් ලත් ජනගහනයෙන් 80%ක් ආවරණය වනු ඇතැයි අපේක්ෂා කරයි. මෙහිදී එන්නත්කරණය සඳහා ප්‍රමුඛතාවය ලබාදීමේ නිර්ණායකයන් වන්නේ covid - 19 වෛරසයට නිරාවරණය වීමට බොහෝදුරට ඉඩ ඇති පුද්ගලයන් (දෛනික රාජකාරී තුළින් ඔවුන් රෝගී පුද්ගලයන් සමග කටයුතු කරන ආකාරය සහ covid-19 අර්බුදය කළමනාකරණය කිරීමේදී අත්‍යවශ්‍ය සේවාවන්හි යෙදෙන) සහ රෝගය වැලඳීමට හා එහි සංකූලතා ඇතිවීමේ වැඩි අවදානමක් ඇති අය වීමයි. සෞඛ්‍ය සේවා සහ ඉදිරිපෙළ සේවකයන්ට ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කර ඇත්තේ ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරී ඉටුකිරීමේදී වෛරසයට නිරාවරණය වීමට ඇති ඉහළ අවදානම නිසාය. එමෙන්ම




අත්‍යවශ්‍ය සේවා සැපයීමේදී ඔවුන්ගේ කාර්යභාරය තීරණාත්මකය. එන්නත් ලබාදීමෙන් පළමු පෙළ සේවකයන්ගෙන් ප්‍රජාවට වෛරසය සම්ප්‍රේෂණය වීමේ අවදානම අවම කරගත හැකි අතර, සෞඛ්‍ය, නිරෝධායන සහ නීතිය හා සාමය පවත්වාගෙන යාමේ අත්‍යවශ්‍ය සේවාවන් අඛණ්ඩව සැපයිය හැකි වේ. අන් අය එන්නත ලබාගැනීමේදී ඔවුන්ටද ඉහළ පෙළ සේවකයන් උපදේශකයන් විය හැකි අතර, ප්‍රජාව සඳහා වටිනා හා විශ්වාසදායක තොරතුරු ප්‍රභවයන් වනු ඇත. එමෙන්ම විශ්වාසදායී ප්‍රජා සම්පත්දායකයන් ලෙස තමන්ගේම එන්නත් කිරීමේ අත්දැකීම් බෙදාහදා ගැනීමෙන් ඔවුන්ට සාමාන්‍ය ජනතාවට විශ්වාසයක් ලබාදිය හැක.

වයස අවුරුදු 50 සහ ඊට වැඩි පුද්ගලයන්ට මෙම වෛරසය වැලඳීමේ වැඩි අවදානමක් තිබෙන බව වෙසරය ආරම්භයේ සිටම ඔබ සියලුදෙනා දන්නා කරුණකි. පුද්ගලයෙකුගේ වයස වැඩිවීමත් සමගම වෛරසය බෝ වීමේ අවදානමද වැඩිවේ. එන්නත ලබාදෙන වැඩිහිටි කණ්ඩායමට නිධන්ගත රෝගාබාධ හෝ බෝ නොවන රෝග හෝ රෝග වැලඳීමට ඇති අවදානම් තත්ත්ව ඇති අතර, එය covid - 19 වෛරසයේ ආසාදන අවදානම, රෝහල්ගත කිරීම, සංකූලතා ඇති වී එමගින් මරණය සිදුවීම වැනි අවස්ථා වැඩි කරයි.



### එන්නත ලබාගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම

මෙම වයස් කණ්ඩායමේ පුද්ගලයන්ට ආසාදනය වුවහොත් රෝහල්ගත වී සිටිය යුතු කාලය දිගු නිසා සෞඛ්‍ය සේවා සම්පත් භාවිතයද දීර්ඝ කාලයකට අවශ්‍ය වේ.

## එන්නත්කරණයේ වැරදීම් හේතුවෙන් ඇති විය හැකි ප්‍රතික්‍රියා

ප්‍රතිනිර්මාණය (Reconstitution) කිරීමේ දෝෂ සිදුවීම (වැරදි තනුකකාරක යොදා ගැනීම, අත්වැරදීමකින් තනුකකාරකය වෙනුවට වෙනත් ඖෂධයක් ආදේශ කිරීම, එන්නත හා සිරින්ජය අපවිත්‍ර වීම, එන්නත් කටුව හෝ එහි වැස්ම අතින් හෝ වෙනත් වස්තුවකින් ස්පර්ශ කිරීම, උපරිම නිර්දේශිත කාලයෙන් පසු ප්‍රතිනිර්මාණය කරන ලද එන්නත් භාවිත කිරීම) මෙම වැරදි මගින් දරුණු ප්‍රතික්‍රියා ඇති කළ හැකි අතර, එමගින් බරපතළ අතුරු ආබාධ හෝ ඇතැම් විට මරණය පවා සිදුවිය හැකිය. එමෙන්ම මෙම වැරදි වළක්වාගත හැකි අතර, මේවා වැළැක්වීම තුළින් ප්‍රතිශක්තීකරණ වැඩසටහන පිළිබඳව ඇති විශ්වාසය තහවුරු කළ යුතුය.

## covid -19 එන්නත පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ පැවසීම

2020 දෙසැම්බර් මැද වනවිට covid -19 වෛරසයට එරෙහිව එන්නත් සායනික ඇගයීම් සඳහා යොමු වී තිබුණි. තවත් එන්නත් 166ක් පූර්ව රසායනික ඇගයීම් සඳහා යොමු වී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් 2021.01.24 දින වනවිට Pfizer එන්නත සඳහා පමණක් හදිසි වලංගුතාවය (emergency validation) ලැබී ඇත. කෙසේ වෙතත් එක් එක් රටෙහි ජාතික ඖෂධ නියාමන අධිකාරියට තම රටෙහි ජාතික මට්ටමේ භාවිතය සඳහා එන්නත් අනුමත කළ හැකිය.

## එන්නත්කරණය සේම මතක තබාගත යුතු වැදගත් කරුණු

මුලදී ලබාගත හැකිවන්නේ එන්නතෙහි සීමිත ප්‍රමාණයක් පමණි. එහි සැපයුම වැඩි කිරීමට එන්නත් නිපදවන රටවලින් එන්නත් වර්ග කිහිපයක් ලබාගැනීමට අවශ්‍ය වේ. ඒ අනුව නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාවට එන්නත් කිහිපයක් ලැබීමේ හැකියාව ඇත. සීමිත එන්නත් සැපයුමක් තුළ covid -19 රෝගය සම්ප්‍රේෂණය වීම වැළැක්වීමට එන්නතටම පමණක් හැකිවන්නේ නැත. එන්නත ලබාගැනීම මගින් පමණක් කෙනෙකු ආසාදිතයකු වීම වළක්වා ගත නොහැකි අතර, පුද්ගල දුරස්ථභාවය, මුඛ ආවරණ පැලඳීම, දෑත් නිරන්තරයෙන් සේදීම, විෂබීජනාශක දියර භාවිතය ඇතුළු covid -19ට එරෙහි සෞඛ්‍ය උපදෙස් සියල්ල නිරන්තරයෙන් පිළිපැදිය යුතුය. එමෙන්ම මෙම එන්නතෙහි ආරක්ෂණ කාලසීමාව තවමත් ඇත්තේ අවිනිශ්චිත තත්ත්වයක බැවින්ද සෞඛ්‍ය උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍යය.

## "එන්නත ලබාගත් පසු කාඩ්පතෙහි නිවැරදිව දිනය සටහන් වී ඇත්දැයි බලන්න"



Covishield එන්නතෙන් ඇති විය හැකි සංකූලතා පිළිබඳව පැවසූ **සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ ප්‍රජා වෛද්‍ය විශේෂඥ උත්පලා අමරසිංහ මහත්මිය,**

" ඕනෑම ඖෂධයක් හෝ එන්නතක් ලබාගැනීමෙන් අනතුරුව අතුරු ආබාධ ඇතිවෙන්න පුළුවන්. මේවා බොහෝවිට තාවකාලික ආබාධයි. සාමාන්‍යයෙන් මෙම එන්නත විද පැය කිහිපයකට පසුව බහුලව ඇතිවන අපහසුතා කිහිපයක් තිබෙනවා.

- **එන්නත විදින ස්ථානයේ රතු පැහැ වීම, කැසීම, සුළු ඉදිමීම් හා වේදනාවක්.**
- **ඇඟ සීතල කරවමින් ඇතිවන උණ ගතිය. මෙහිදී වෙව්ලීමක් වුවද ඇතිවිය හැකියි.**
- **හිසරදය.**
- **ඔක්කාරය, වමනය හා බඩ පෙරළීම**
- **මාංසපේශී සහ සන්ධිවල වේදනාව (ඇඟපත වේදනාව)**


මෙම අතුරු ආබාධ ඇති වුවහොත් ඒ සඳහා පැරසිටමෝල් නියමිත මාත්‍රාවෙන් (පැය හයෙන් හයට) ලබාගන්න. සාමාන්‍යයෙන් මෙම ලක්ෂණ එන්නත විදීමෙන් දින කිහිපයකට පසුව පහව යනු ඇති. යම් හෙයකින් මෙම සංකූලතා වැඩි වුවහොත් හෝ දිගටම පැවතුණහොත් වෛද්‍ය අවවාද ලබාගන්න. එසේ නැතිනම් 1999, වසංගතවේද අංශය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ ප්‍රදේශයේ වෛද්‍යවරයෙකුගෙන් උපදෙස් ලබාගන්න පුළුවන්.

තමන්ට වෙනත් රෝගී තත්ත්වයන් තිබෙනවා නම් ඒ පිළිබඳව වෛද්‍ය උපදෙස් ලබාදීම සඳහා එන්නත්කරණ ස්ථානවල වෛද්‍යවරු ඉන්නවා. පුද්ගලයෙකුට එවැනි ආකාරයේ වෙනත් රෝග තිබෙනවා නම් ඔහු පිළිබඳ තීරණය ඒ අදාළ වෛද්‍යවරු ගන්නවා. ඒ නිසා එවැනි රෝග පිළිබඳව අනිවාර්යෙන්ම ඔවුන් වෛද්‍යවරුන් දැනුම්වත් කළ යුතුයි. එහිදී අවශ්‍ය පර්යේෂණ කිරීමෙන් අනතුරුවයි විශේෂිත රෝගාබාධ තිබෙන කෙනෙකුට එන්නත ලබාදෙන්නේ.

පළමු මාත්‍රාව ලබා දී හරියටම මාසයකින් තමයි දෙවැනි මාත්‍රාව ලබාදෙන්නේ. පළවෙනි මාත්‍රාව එන්නත් කිරීමේදී අදාළ තැනැත්තාට එන්නත් කාඩ්පතක් නිකුත් කරනවා. එම එන්නත් කාඩ්පතෙහි නිවැරදිව දිනය සටහන් වී තිබෙනවාද කියලා පරීක්ෂා කළ යුතුයි. නැවත දෙවැනි මාත්‍රාව ලබාගැනීමට පැමිණෙන විට එම එන්නත් කාඩ්පත රැගෙන ඒම අනිවාර්යයි. මාසයක් යන විට තවත් එන්නත් වර්ග කිහිපයක් අපට ලැබෙනවානේ. එතකොට පළමු මාත්‍රාවේදී ලබාගත් එන්නතම දෙවැනි මාත්‍රාවේදීත් ලබාගත යුතුයි. දෙවැනි මාත්‍රාවේදීද යම් යම් සංකූලතා හෝ අතුරු ආබාධ යම් පමණකින් ඇතිවෙන්න පුළුවන්.

අවුරුදු 18ට අඩු දරුවන්ට සහ ගර්භිණී මවුවරුන්ට එන්නත ලබාදීමට තවම නිර්දේශ කරලා නැහැ. ඔවුන් සඳහා එන්නත ලබාදීමට අවශ්‍ය පර්යේෂණවලට මෙම එන්නත තවම යොදාගෙන නැහැ. එම නිසා මේ අවස්ථාවේදී ඔවුන්ට එන්නත ලැබෙන්නේ නැහැ. නමුත් එයින් අදහස් කරන්නේ ඒ අයට මේ එන්නත සුදුසු නැහැ කියන එක නොවෙයි."

## "එන්නත ලබාගත් ඇතැම් පුද්ගලයන්ට රෝගය වැලඳීමේ අවදානමක් ඇත"




ලෝක සෞඛ්‍ය සංවිධානයද ජනතාවට නැගෙන ප්‍රධාන ගැටලු කිහිපයක් වෙනුවෙන් පිළිතුරු මෙලෙස ඉදිරිපත් කර ඇත.

### කෝවිඩ් 19 එන්නත ලබාගත් පුද්ගලයෙකුට කෝවිඩ් 19 වෛරසය ආසාදනය විය හැකිද?

එන්නත ලබාදීමෙන් පසු ශරීරයට ප්‍රතිශක්තිය (කෝවිඩ් 19 රෝගයට හේතු වන වෛරසයෙන් ආරක්ෂා වීම) ගොඩනැගීමට සාමාන්‍යයෙන් සති කිහිපයක් ගත වේ. ඒ කියන්නේ පුද්ගලයෙකුට එන්නත ලැබීමට පෙර හෝ පසුව කෝවිඩ් -19 ඇති කරන වෛරසය ආසාදනය වී රෝගාතුර විය හැකි බවයි. මෙයට හේතුව එන්නත සඳහා ආරක්ෂාව සැපයීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම මිස එන්නත අකාර්යක්ෂම වීම නිසා නොවේ. තවද කිසිදු එන්නතකට 100%ක කාර්යක්ෂමතාවයක් නොමැති හෙයින් කෝවිඩ් 19 එන්නත් ලබාගන්නා සමහර පුද්ගලයන්ට රෝගයට එරෙහිව ප්‍රමාණවත් ප්‍රතිශක්තියක් වර්ධනය නොවිය හැකි අතර, එම නිසා රෝගය වැලඳීමේ අවදානමක් පවතී.

### යම් පුද්ගලයෙකුට කෝවිඩ් 19 වෛරසය වැලඳී සුවය ලබා ඇත්නම්, ඔවුන්ට කෝවිඩ් 19 එන්නත ලබාගත හැකිද?

කෝවිඩ් 19 හා සම්බන්ධ දරුණු සෞඛ්‍ය අවදානම් සහ කෝවිඩ් 19 සමග නැවත ප්‍රතිනිර්මාණය කළ හැකි නිසා, කෝවිඩ් 19 දැනටමත් තිබේද යන්න නොසලකා සියලුම පුද්ගලයන්ට එන්නත් ලබාදිය යුතුය. එන්නත පිළිබඳ තීරණ ගැනීමේ අරමුණින් පූර්ව ආසාදනය සඳහා වෛරස් හෝ Serological පරීක්ෂණ නිර්දේශ නොකරයි. ස්වාභාවික ප්‍රතිශක්තිය ලෙස හැඳින්වෙන ආසාදනයකින් යමෙකු ලබාගන්නා ප්‍රතිශක්තිය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ. ස්වාභාවික ප්‍රතිශක්තිය සහ එන්නත මගින් ඇතිකරන ප්‍රතිශක්තිය යන දෙකම කෝවිඩ් 19හි වැදගත් අංගයන් වන අතර, විශේෂඥයන් වැඩි විස්තර දැන ගැනීමට විවිධ පරීක්ෂණ හරහා උත්සාහ කරයි. මෙම අවස්ථාවේදී ඔබට කෝවිඩ් 19 තිබුණත්, නැතත් ආසාදන වැළැක්විය හැකි හොඳම ක්‍රමය වන්නේ පොදු ස්ථානවලදී මුව ආවරණ පැලඳීම, අනෙක් පුද්ගලයන්ගෙන් අවම වශයෙන් අඩි හයක් ඈතින් සිටීම, අවම වශයෙන් තත්පර 20ක්වත් සබන් හා වතුරෙන් අත් සේදීම සහ සෙනග සිටින ස්ථාන සහ සීමිත අවකාශයන්ට යාමෙන් වළකින්න.

### එක් එන්නතක් වෙනත් එන්නතක් සමග හුවමාරු කර එන්නත් කර ගත හැකිද?

කෝවිඩ් 19 එන්නත් මාත්‍රා දෙකක් විද ගැනීමට සිදුවන අතර, පළමු මාත්‍රාව ගත් කාණ්ඩයෙන් තොරව වෙනත් එන්නතක් සමග හුවමාරු කර ගැනීමෙන් ඇතිවන ප්‍රතිඵල පිළිබඳ හෝ හැකියාව පිළිබඳ දත්ත මේ වනතුරු නොමැත. එකම නිෂ්පාදිතයක මාත්‍රාවන් දෙකක් භාවිත කරන ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය දැනට නිර්දේශ කරයි. විවිධ කෝවිඩ් 19 එන්නත් නිෂ්පාදන නොදැනුවත්වම මාත්‍රා දෙකෙන් විඳගෙන ඇති විටෙක එන්නතෙහි අතිරේක මාත්‍රාවක් නිර්දේශ නොකරයි. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ ඉදිරිපත් කරන විට ඉදිරියේදී යාවත්කාලීන කළ හැකිය.

### කෝවිඩ් 19 එන්නත් මගින් දිගුකාලීන ප්‍රතිශක්තියක් ලබාදෙයිද?

මෙම එන්නත් නව එන්නතක් වන බැවින් ඒවා කෝවිඩ් 19ට එරෙහිව අඛණ්ඩව හා දීර්ඝකාලීන ප්‍රතිශක්තියක් ලබාදෙයි දැයි අපි තවමත් නොදනිමු.

### එන්නත මගින් පුද්ගලයෙකුට කෝවිඩ් 19 වෛරසය ආසාදනය විය හැකිද?

බලයලත් සහ නිර්දේශිත කෝවිඩ් 19 එන්නත් හෝ දැනට සංවර්ධනය වෙමින් පවතින කෝවිඩ් 19 එන්නත් කිසිවක කෝවිඩ් 19 වෛරසයට හේතු වන සජීවී වෛරසය අඩංගු නොවේ. මෙයින් අදහස් කරන්නේ කෝවිඩ් 19 එන්නත මගින් රෝගය ඇති විය නොහැකි බවයි. කෝවිඩ් 19ට හේතු වන වෛරසය හඳුනාගෙන සටන් කළ යුතු ආකාරය සියලුම එන්නත් මගින් අපගේ ප්‍රතිශක්තීකරණ පද්ධතියට උගන්වයි. සමහර විට මෙම ක්‍රියාවලිය නිසා උණ වැනි රෝග ලක්ෂණ ඇති කරයි. මෙම රෝග ලක්ෂණ සාමාන්‍ය වන අතර, ඉන් ඔබේ ශරීරය කෝවිඩ් 19ට හේතු වන වෛරසයෙන් ආරක්ෂා වන බවට ලකුණක් පෙන්නුම් කරයි.

### තුන්වන අදියර අත්හදා බැලීම් සම්පූර්ණ කර ඇති කෝවිඩ් 19 එන්නත් කීයක් තිබේද? ඒවා මොනවාද?

තුන්වන අදියර අත්හදා බැලීම් අවසන් කර ඇති කෝවිඩ් 19 එන්නත් හයක් මේ වන විට පවතියි. ඒවා නම් ෆයිසර් බයෝඑන්ටෙක්, මෝඩර්නා, ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනෙකා, ස්පුට්නික් V, සිනොෆාර්ම් සහ සිනොවැක්ය. මෙම නිෂ්පාදන හයේ කාර්යක්ෂමතා ප්‍රතිඵල ලෝක සෞඛ්‍ය සංවිධානයට ලැබී තිබේ. කෙසේ වෙතත්, සම-සමාලෝචනය කළ කාර්යක්ෂමතා ප්‍රතිඵල ලැබී ඇත්තේ එන්නත් ද්විත්වයක පමණි. ඒ ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනෙකා සහ ෆයිසර් බයෝඑන්ටෙක් යන එන්නත්ය.

# නැගෙනහිර පර්යන්තයෙන් 51%ක් වරාය අධිකාරියට අයිති වෙනවා කියලා ආණ්ඩුව කියන්නෙ බොරුවක්

## - නැගෙනහිර පර්යන්තය සුරැකීමේ එකමුතුවේ සමකැඳවුම්කරු සංජය කුමාර වැලිගම

● චාමර සම්පත්

කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය සම්බන්ධයෙන් කතාබහ මේ වන විට උග්‍ර මට්ටමකට පැමිණ ඇති අතර, මේ සම්බන්ධයෙන් අද (01දා) කැබිනට් පත්‍රිකාවක්ද ඉදිරිපත් වීමට නියමිතය. මේ අතර නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට ලබාදීමට විරුද්ධව වරාය සේවකයන් අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලියක්ද ආරම්භකර ඇත. මතුව ඇති තත්ත්වය සම්බන්ධයෙන් නැගෙනහිර පර්යන්තය සුරැකීමේ එකමුතුවේ සමකැඳවුම්කරු සංජය කුමාර වැලිගම මහතා සමග අපි සාකච්ඡා කළෙමු.



**රජය පවසන ආකාරයට කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තයේ ආයෝජනයට ඔබලා විරුද්ධ වන හේතුව කුමක්ද?**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නැගෙනහිර පර්යන්තය සියයට සියයක් මෙහෙයවිය යුතුයි කියන යෝජනාවලිය කැබිනට් අනුකාරක සභාව වෙත අපි භාරදී තිබෙනවා. මේ අවස්ථාව වන විට නැගෙනහිර පර්යන්තය 51%ක් සහ 49%ක් ලෙස ආයෝජය කිරීමක් යැයි පවසමින් රජය මුසාවක් පවසන බව පැහැදිලියි. ඒ නිසා තමයි අපි පසුගිය සතියේ සිට අකුරට වැඩ කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළේ.

ආණ්ඩුව පවසන ආකාරයට නැගෙනහිර පර්යන්තයේ 51%ක් සහ 49%ක් ලෙස ආයෝජනය කරනවා කියන යෝජනාව අපි තරයේ ප්‍රතික්ෂේප කරනවා. මොකද අපි සොයාගත් කරුණු අනුව එහෙම දෙයක් නැහැ. මෙම ආයෝජනය නිසා ශ්‍රී ලංකාවට ලැබෙන්නේ 15%යි කියලා තිබෙනවා. ඉතිරිය කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන්න ආණ්ඩුව සූදානම් වෙනවා. මේ ක්‍රියාවලියට අපි විරුද්ධයි.

අපේ වැඩපිළිවෙළට සහයෝගය දෙන්න සිවිල් සංවිධාන, වෘත්තීය සමිති, පූජ්‍ය පක්ෂය, කැබිනට් ඇමතිවරු පවා ඉදිරිපත්වෙලා ඉන්නවා. මේ නිසා අපි රජයට බලකරනවා රට පුරා විරෝධයක් නැගෙන්නට පෙර මේ යෝජනාව වහාම ඉවත් කරගන්න කියලා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 100%ම මෙහෙයවන අපගේ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා අපි කියන්න කැමතියි. අපේ රටේ සම්පත් පාවා දෙන්න අවශ්‍ය නැහැ .

ශ්‍රී ලංකා වාරාය අධිකාරිය රැකගැනීමට අපි දිවි හිමියෙන් කටයුතු කරනවා. නැගෙනහිර පර්යන්තයේ ආයෝජන මුවාවෙන් කරන හොර ජාවාරම, රටේ ජාතික සම්පත් කුණුකොල්ලයට පවා දීම වහාම නවත්වන්න කියල අපි ආණ්ඩුවට කියනවා.

නැගෙනහිර පර්යන්තය ඉන්දීය සමාගමකට දීලා ඉන්දියාව සතුටු කරන ගමන්, වරාය අධිකාරියේ දූෂිත නිලධාරීන් සහ ජනාධිපතිතුමා වටේ ඉන්න දූෂිත නිලධාරීන් කිහිපදෙනෙක් ඩීල් දාන බව පැහැදිලියි. ඒ නිසා තමයි 51%ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමිවෙන්නේ නැත්තෙ.

**නැගෙනහිර පර්යන්තය ශ්‍රී ලංකාවට හිමි වීමේ වාසිය ගැන කතා කළොත්?**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මේ පර්යන්තයේ මෙහෙයුම් කළ යුතුයි කියලා අපි මෙතරම්ම කියන්නේ ඇයි කියලා හැමෝම දැනගත යුතුයි. ඒ මොකද ඉන්දියානු මහද්වීපය තුළ ඇති විශාලතම සහ කාර්යක්ෂම වරාය බවට කොළඹ වරාය මේ වෙද්දි පත්වෙලා තිබෙනවා. එය ජාතික ආර්ථිකයට වගේම ජාතික ආරක්ෂාවට වැදගත් වෙන තැනක්. කලාපයේ භූගෝලීය පිහිටීම තුළ උනත් කොළඹ වරාය අතිසුවිශේෂී තැනක පිහිටලා තිබෙනවා. කොළඹ වරාය කියන මේ ඩොලර් උල්පත අපි ආරක්ෂා කරගත යුතුයි කියන්නේ ඒ හේතුව නිසයි.

එස්ඒජීටී(SAGT) සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග එකතුවෙලා ඇතිකරගත්තු ගිවිසුම 2029දී අහෝසි වෙනවා. එමගින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට එස්ඒජීටී(SAGT) ජැටිය හිමිවෙනවා. ලෝකයේ දැනට තිබෙන කාර්යක්ෂම වරායවල් අතරින් සියලුම මෙහෙයුම් සිදුවන වරායන් තුනක් පමණයි තිබෙන්නේ. එස්ඒජීටී(SAGT) ජැටිය වරාය අධිකාරියට හිමිවීමත් සමගම කාර්යක්ෂම ජැටියක් ලෙස මේ දෙකේම මෙහෙයුම් කරන්න අපිට පුළුවන් වෙනවා. ඒ වගේම මීටර් 18ක් ගැඹුරු පර්යන්තයක් ඉන්දියාවෙ වත් නැහැ. ඒ අනුව විශාල ප්‍රමාණයේ නැව් 06ක් සහ සාමාන්‍ය නැව් 04ක මෙහෙයුම් එකවිට කරන්න පුළුවන්. අන්තර් බහාලුම් ප්‍රවාහනය තුළ සිදුවන අමතර වියදම් අවම කර ගනිමින් අපේ කාර්යක්ෂමතාව වැඩිකරලා සමාගම්වලට ලාබදායී තත්ත්වයට ලබාදෙන්න පුළුවන් වෙනවා. ඒ අනුව නැව් සමාගම් විශාල වශයෙන් කොළඹ වරායට ඇද ගැනීමට අවස්ථාව අපිට හිමිවෙනවා. නැගෙනහිර පර්යන්තය සියයට සීයක් වරාය අධිකරිය යටතේ තිබිය යුතුයි කියලා අපි කියන්නේ ඒ නිසයි.

ඒ වගේම තවත් හේතුවක් තිබෙනවා. ඒ තමයි ජයබහලු පර්යන්තයේ පස්වන අදියර කියලා හඳපු නැති පර්යන්තයකට ගෙන ආපු දොඹකර තුනක් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකින් නැගෙනහිර පර්යන්තයේ ස්ථාපිත කරන්න අපිට අවස්ථාව ලැබුණා. ඊට පසුවත් මෙය ක්‍රියාත්මක නොකරන තැනකට නිලධාරීන් සහ ආණ්ඩුවේ බලධාරීන් ක්‍රියා කළා. අපි නැවත වතාවක් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් පටන් අරගෙන අගමැතිතුමා සමග සිදුකළ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස තමයි මේ දොඹකර තුන යොදවලා නැගෙනහිර ජැටියේ මෙහෙයුම් ආරම්භ කරන්න පුළුවන් වුණේ. මේ නිසා 2020.10.27දා මෙහෙයුම් ආරම්භ කරපු නැගෙනහිර පර්යන්තයත් අද වන විට කෝටි 60කට වැඩි මුදලක් උපයලා තිබෙනවා. ඒ කියන්නේ මාස දෙකකට ආසන්න කාලය තුළ එපමණ මුදලක් උපයාගන්න අපිට හැකියාව ලැබුණා.

**නැව් ගෙන්වා ගැනීමේ මෙහෙයුමත් දුෂ්කර වූ බව වරෙක ඔබ පවසා තිබුණා?**

මේ මෙහෙයුම්වලදී නැව් ගෙන්වා ගන්නත් වෘත්තීය සමිති විදිහට අපිට ලොකු සටනක් කරන්න සිදුවුණා. මොකද මේ මෙහෙයුම් අලාභයි කියලා මේ නිලධාරීන් සෑම අවස්ථාවකදීම පෙන්නන්න හදනවා. ඒ නිසා බලහත්කාරයෙන් අපේ දැඩි බලපෑම මත නැව් නැගෙනහිර පර්යන්තයට යොමුකරලා තමයි මේ ලාභය ලබාගෙන තිබෙන්නේ. ඒ වගේම නැගෙනහිර පර්යන්තයේ දොඹකර හතරක් සහ ජංගම දොඹකර කිහිපයක් මිලදී ගන්න 2020/2021 කාලය සඳහා රුපියල් මිලියන 13728ක් වෙන්කර තිබෙනවා. මේ ඇණවුම සිදුකළා නම් මාස 12කට අඩු කාලයකදී මේ දොඹකර වරාය අධිකාරියට ලැබෙනවා. ඒ විදිහට දොඹකර ක්‍රියාත්මක කළොත් මෙගා ප්‍රමාණයේ නැවක් සහ ප්‍රීඩම් ප්‍රමාණයේ නැවකුත් එකවිට මෙහෙයවන්න අපිට හැකියාව ලැබෙනවා. ඒ කියන්නේ වසකරට ඩොලර් බිලියන 50ක් උපයන්න අපිට හැකියාව ලැබෙනවා. දොඹකර සියල්ල ස්ථාපිත කළ පසුව වාර්ෂික ඩොලර් බිලියන 100ට වැඩි මුදලක් උපයන්න පුළුවන් එකම සහ කාර්යක්ෂම පර්යන්තය බවට නැගෙනහිර පර්යන්තය පත්කරන්න අපිට පුළුවන්. අපි මෙච්චර කෑ ගහල කියන්නේ මේ වටිනාකම ගැනයි.

**ආයෝජනය සිදුකිරීමට යන අදානි සමාගම ගැනත් ඉන්දියාවේ මෙන්ම ලංකාවෙත් ප්‍රශ්න මතුවී තිබෙනවා. මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?**

නැගෙනහිර ජැටිය සම්බන්ධ කැබිනට් පත්‍රිකාවට ජාත්‍යන්තර ටෙන්ඩර් පටිපාටියෙන් බැහැර ගිහින් අදානි කියන නාමය ඇතුළත් වුණේ කොහොමද කියන එක ගැන විශාල ගැටලුවක් තිබෙනවා. මේ තුළ දූෂණයක් සිදුවෙලා තියෙනවා කියලා අපි කියන්නේ ඒ නිසයි. මොකද කොළඹ වරායේ සී.අයි.සී.ටී (CICT) පර්යන්තය හදන්න ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීමක් කළ විට ඒ සඳහා ආයතන 07ක් ඉල්ලුම් කළා. එතැනදී ඩුබායි රාජ්‍යයෙන් සහ සිංගප්පූරු රාජ්‍යයෙනුත් ඉල්ලීම් කර තිබුණා. එවකට ජනාධිපති වුණේ මහින්ද රාජපක්ෂ මහත්තයා. මේ ටෙන්ඩර් කැඳවීමේදී ප්‍රතිනැවිගත කිරීම් ක්‍රියාවලියේදී කොළඹ වරායට තරගයක් දෙන රටක් එකතු කරගන්නේ නැහැ කියන දේ ගැන ඔහු පැහැදිලි එකඟතාවකට ආවා. ඒ අනුව තමයි චීන සමාගමක් වන සී.අයි.සී.ටී (CICT)ට ලබාදුන්නේ. එහෙම නැතිව සිංගප්පූරු රාජ්‍යයට ඉල්ලුම් කරන්න දුන්නා නම් මේ වනවිට ශ්‍රී ලංකාවේ බහාලුම් ක්‍රියාවලිය 20%ක් දක්වා අඩුවෙන්න තිබුණා. නාවික මෙහෙයුම් ක්ෂේත්‍රය තුළදී තරගකාරී ආයතන සමග ගැටෙන්න යන්නේ නැහැ. අදානි සමූහ ව්‍යාපාරය ඉන්දියාව තුළ වරායන් 11ක් මෙහෙයවනවා. ඉන්දියාවට අයිති එකම වරායත් ඔවුන්ට ලබාදෙන්න කියලා ඉන්දීය ආණ්ඩුවට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වගේම අදානි සමාගමට ඉන්දියාවේ විශාල විරෝධයක් තිබෙනවා. අදානි සමාගම නිසා ඉන්දියාවේ රජයේ වරාය වන ජවහල්ලාර්නේරු වරාය පාඩු ලබන තත්ත්වයට පත්කරන්න ඉන්දියාවේ අගමැතිවරයා කටයුතු කර තිබෙනවා. ඉන්දීය රටේ සම්පත් අදානි සමාගමට පැවරීමට එරෙහිව එරට වැසියෝ කරන අරගලය නිසා මේ වන විට ජීවිත 150ක් පමණ අහිමි වෙලා තිබෙනවා. මෙහෙම තියෙද්දි ඉන්දියාවේ කොලනියක් නැගෙනහිර පර්යන්තයේ හදන්න යනවාද කියන බරපතළ ගැටලුව අපිට තිබෙනවා. රෝහිත අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබෙන කැබිනට් පත්‍රිකාවේ අදානි සමාගමේ නම සම්බන්ධයෙන් අපිට ගැටලුවක් ඇතිවී තිබෙන්නෙත් ඒ නිසයි. ඒ වගේම එම කැබිනට් පත්‍රිකාවේ අදානි සමාගම ගැන පිටු දෙකක විස්තරයක් තිබෙනවා. නමුත් කොළඹ වරාය ගැන තිබෙන්නේ වචන කිහිපයක විස්තරයක් පමණයි. ජාත්‍යන්තර ටෙන්ඩර් කොන්දේසිවලට පටහැණිව සමාගමක් ඉදිරිපත් කිරීම වගේම ජපානයේ ක්‍රියාවලිය මේ තුළ සඟවා තැබීම බරපතළ කරුණක්. රටේ ජාතික සම්පත් විනාශ කරන මෙම අදානි සමාගම අපිට ලොකු හිසරදයක් වෙයි කියලා අපි හිතනවා. එහෙම තත්ත්වයක් තියෙද්දි රටේ සම්පත්, සේවක අයිතිවාසිකම් රකින්න ආපු ගෝඨාභය මහත්තයත් ඒකමද කරන්නේ කියලා අපිට බරපතළ ගැටලුවක් තිබෙනවා. මේ ප්‍රශ්නය අපි අගමැතිවරයාට යොමුකර තිබෙනවා. එතුමාගේ මැදිහත්වීම මතයි මේ ප්‍රශ්නය තාවකාලිකව විසඳලා තිබුණේ. අගමැතිතුමා ගැන අපිට විශ්වාසයක් තිබෙනවා. මහින්ද රාජපක්ෂ කියන ජාතික නායකයාගේ ආරක්ෂාව තුළ නැගෙනහිර පර්යන්තය රැකගත යුතුයි. මොකද එතුමා තමයි මේ පර්යන්තය ගොඩනැගුවේ. ඒ නිසා මහින්ද රාජපක්ෂ අගමැතිවරයා නැගෙනහිර පර්යන්තය සියයට සීයක් අපිට ආරක්ෂා කරලා දෙයි කියලා අපි විශ්වාස කරනවා.

**කවුරු කෑ ගැහුවත් ආණ්ඩුව ගත් තීරණය ක්‍රියාත්මක කරන බව ඇතැම් ඇමතිවරු මේ වනවිට පවසනවා . ඔබලාගේ ඉදිරි ක්‍රියාමාර්ග කෙසේ වේවිද?**

හැටනව ලක්ෂයකගේ ඡන්ද අරගෙන බලයට පැමිණිලා ඉන්න සමහර දේශපාලුවෝ අදහස් දක්නවා 'කවුරු විරුද්ධ උනත් මේක දෙනවා' කියලා. එහෙම කතා කරන්න එයාලට සදාචාරාත්මක අයිතියක් නැහැ. රටේ ජනතාවගේ අයිතීන් ඇමතිවරුන්ගේ ප්‍රකාශ මත විකුණන්න දෙන්න බැහැ. මේ ජාතික සම්පත රැකගන්න වරාය සේවකයෝ දිවිහිමියෙන් කැපවෙලා ඉන්නේ. ඔය කෑගහන ඇමතිවරු මට්ටු වෙන්නේ මේ නැගෙනහිර පර්යන්තයෙන් තමයි. තමන් කවුද කියලා දන්නෙ නැති ඇමතිවරුන් ගැන ජනතාව තීන්දුවක් ගනියි. රටේ සම්පත් ආරක්ෂා කරගෙන රට සංවර්ධනය කරනවාද නැත්නම් මේ කියන විදිහට කටයුතු කරනවාද කියන තීරණය ඉක්මනින්ම ගැනීම ජනාධිපතිතුමාට පැවරෙන වගකීමක්.

අද පැවැත්වෙන කැබනට් මණ්ඩලයට නැගෙනහිර ජැටිය ගැන කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්න කටයුතු කරනවා කියලා අපිට දැනගන්න ලැබුණා. රටට ආදරය කරන කැබිනට් ඇමතිවරු ඒකට විරුද්ධ වෙනවා කියලා අපිට පොරොන්දුවෙලා තිබෙන්නේ. ඒ නිසා රටේ අගමැතිවරයා ගැන අපිට ලොකු විශ්වාසයක් තිබෙනවා. එතුමත් අපිට බොරු කළොත් අපේ මළසිරුරු මතින් තමයි මේ හොර මගඩි ගනුදෙනුව සිදුකරන්න වෙන්නේ. නැගෙනහිර පර්යන්තය රැකගන්න අපි දිවිහිමියෙන් කැපවෙලා ඉන්නේ. නැගෙනහිර පර්යන්තය කියන්නේ වරාය අධිකාරියේ අවසාන හුස්ම පොද. අපි එකා පිට එකා මැරිල වැටුණත් මේ පර්යන්තය දෙන්නෙ නැහැ. ඒ සඳහා රටේ ජනතාව සියලුදෙනා අපි සමග එකතුවෙලා ඉන්නේ.

## දෙහිවල සත්තු වත්ත

සතුන් කූඩු කර හෝ කොටුකර ප්‍රදර්ශනයට තබා ඇති ස්ථානයට 'සත්තු වත්ත' යැයි ව්‍යවහාර කෙරේ. දෙහිවල පිහිටා ඇත්තේ එවැනි තැනකි. එහෙත් මෙතැනට 'සත්තු වත්ත' යනුවෙන් ව්‍යවහාර කිරීම සුදුසු ද යන්න සලකා බැලිය යුතුය.

'වත්ත' යන විශේෂ්‍ය පදයට තබා ඇත්තේ 'සත්තු' යන විශේෂණයයි. 'වත්ත' යන්න වෙන්කර හඳුනා ගැනීමට 'සත්තු' විශේෂණ පදය යොදා ඇත. විශේෂණ හෝ සමාස පද ප්‍රකෘති ස්වරූපයෙන්ම සිටිය යුතු යැයි පිළිගත් සම්ප්‍රදායක් ඇත.

'සත්තු' යන පදයේ මුල 'සත්' යන පදය වේ. මෙහිදී 'වත්තට' විශේෂණය වී ඇත්තේ 'සත්' යන්නය. එහෙත් 'සත්වත්ත' යැයි ව්‍යවහාර නොකරන නිසා එය අනුක්ත බහුවචන රූපයෙන් තැබීම යෝග්‍ය වේ. ඒ 'සතුන්' යන පදයයි. ඒ අනුව 'වත්ත' යන විශේෂ්‍ය පදයට 'සතුන්' යන්න විශේෂණය කර 'සතුන් වත්ත' යනුවෙන් ව්‍යවහාර කිරීම වඩාත් සුදුසු මෙන්ම නිවැරදි ද වේ. ඒ නිසා දෙහිවල ඇත්තේ 'සත්තු වත්තක්' නොව 'සතුන් වත්ත'කි.

මෙතැනට 'සත්ත්වෝද්‍යානය" යනුවෙන් එය සංස්කෘතික වචනයකි. මුවන් තැන්න, අලින් බැඳි ගස ආදිය තවත් උදාහරණ වේ.

**යසවර්ධන රුද්‍රිගු**



# ජනවාරි උද්ධමනය 3%ක් දක්වා පහළට

## - පෞද්ගලික රෝහල් ගාස්තු ඉහළ යෑමක්

● ෂමිල පෙරේරා

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති 4.2% සිට 2021 ජනවාරි මාසයේදී 3.0% දක්වා පහළ ගොස් තිබේ.

2020 ජනවාරි මාසයේ පැවති ඉහළ පදනම් අගය මගින් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා හේතු වී ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි. මේ අතර ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති 9.2% සිට 2021 ජනවාරි මාසයේදී 6.8%ක් දක්වා පහළ ගොස් ඇත. එමෙන්ම ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2020 දෙසැම්බර් මාසයේ පැවති 2.0% සිට 2021 ජනවාරි මාසයේදී 1.4%ක් දක්වා පහළ ගොස් තිබේ.

2021 ජනවාරි මාසයේදී ආහාර කාණ්ඩයෙහි රතු ළූණු, පොල් සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ ගියද, මාසය තුළ ලොකු ළූණු මිල ගණන්හි පහළ යෑමක් වාර්තා විය. මේ අතර ප්‍රධාන වශයෙන් සෞඛ්‍යය (පෞදග්ලික රෝහල් ගාස්තු) උපකාණ්ඩයේ දක්නට ලැබුණු මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි ඉහළ යෑමක් 2021 ජනවාරි මාසයේදී දක්නට ලැබුණු බව ශ්‍රී ලංකා මහ බැංකුව වැඩිදුරටත් පවසයි.

# කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරමු, මේ මඟපෙන්වීම ඔබ සඳහායි

● ෂමිල පෙරේරා




කොළඹ කොටස් වෙළෙඳ පොළ ආයෝජකයන් වෙත හඳුන්වාදුන් නව පහසුකම් කිහිපයක් සම්බන්ධ තොරතුරු පසුගිය සති කිහිපයේ කතාබහ කළ අපි, එම නව පහසුකම් භුක්ති විඳින ආයෝජකයකු අත්හළ යුතු තවත් කරුණක් 'අද ව්‍යාපාරික පිටුව' ඔස්සේ මෙසේ ඔබ හමුවෙහි තබමු.

ඔබ නිසි පරිදි තේරුම් නොගත් සමාගම්වල කොටස් මිලදී ගැනීමට උත්සාහ නොකළ යුතුයි

බොහෝ ආයෝජකයන් පොදුවේ කරන තවත් වැරැද්දක් වන්නේ තමාට එතරම් දැනුමක් නොමැති අවබෝධයක් නොමැති සමාගම්වල කොටස් ආයෝජනය කිරීමට උත්සාහ කිරීමය. උදාහරණයක් ලෙස ඔබ අවන්හලක් පවත්වාගෙන යන්නෙක් නම් එම ව්‍යාපාරය පිළිබඳව මනා වූ දැනුමක් තිබිය යුතුය.

කොටස් වෙළෙඳ පොළ ආයෝජනය සම්බන්ධයෙන් සලකා බලන විට, සමහර ආයෝජකයන්ට ආයෝජන වටපිටාව ගැන දැනුම ඇත්තේම නැත. ඔවුන් සිතනුයේ වාසි සහ ප්‍රතිලාභ ගෙනදෙන කොටස් ගැන පමණි. සමාගම අයත් වන්නේ කුමන ව්‍යාපාර ක්ෂේත්‍රයකටද, නිෂ්පාදනය කරනුයේ කුමන වර්ගයේ භාණ්ඩ හා සේවාද යන්න ගැන ඔවුන් සොයා බැලීමක් නොකරයි. එමෙන්ම වෙළෙඳ පොළ හැසිරීම පිළිබඳ අවබෝධයක් තිබීමද වැදගත්ය. එනම් ක්‍රමයෙන් ඉහළ යන වෙළෙඳ පොළක්ද, මන්දගාමී වෙළෙඳ පොළක්ද, පහළ බසින වෙළෙඳ පොළක්ද යනාදී වශයෙන් වෙළෙඳ පොළ ගමන් කරන දිශාව පිළිබඳ යම් හෝ අවබෝධයක් ඇතිව කොටස් ගනුදෙනුවල නිරතවීම ආයෝජකයෙකු වශයෙන් ඉතා වැදගත්ය.

කොටස් වෙළෙඳ පොළ ආයෝජනයේදී ආයෝජකයකුට ඕනෑම අවස්ථාවක ඉහළ වාසි ලබාගැනීමට අවස්ථාව ඇත. එම වාසි ලබාගැනීමට එම ආයෝජනයේ ස්වභාවය හොඳින් තේරුම්ගෙන තිබීම වැදගත්ය. ඔබ නීතීඥයෙකු නම් ඉන් ඉහළ ආදායමක් උපයා ගැනීමට එම වෘත්තීය පිළිබඳව හොඳින් අධ්‍යයනය කර තිබිය යුතුවේ. ඔබ ශල්‍ය වෛද්‍යවරයෙකු නම් ශල්‍යකර්මය මුල සිට අවසානය දක්වා නිසියාකාරව සිදුකර එහි සාර්ථකත්වයක් ලබාගත යුතුය. ආයෝජනයටද එය එසේමය. සාර්ථක ආයෝජකයෙකු වීමට ඔබ මුදල් යොමුකරන ආයෝජන ක්‍රමය ගැන හොඳ අවබෝධයක් තිබීම වැදගත් යයි පවසනුයේ එහෙයිනි.

තවත් මඟපෙන්වීමක් බලාපොරොත්තු වන්න...

# LANKAQR ගෙවීම් පහසුකම ලබාදීම සඳහා මහජන බැංකුව හා සෙලින්කෝ ලයිෆ් එක්වේ




මහජන බැංකුවේ LANKAQR ගෙවීම් පහසුකම ලබාදීමට කේතය ඔස්සේ සෙලින්කෝ ලයිෆ් රක්ෂණ හිමියන්ට ගෙවීමේ පහසුකම් සලසාදීම සඳහා මහජන බැංකුව සහ සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්වැල් බැඳගෙන තිබේ.

මේ සඳහා වන ගිවිසුම් හුවමාරු කරගැනීම මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ සහ සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් විධායක සභාපති ආර්.රෙන්ගනාදන් යන මහත්වරුන් අතර පසුගියදා සෙලින්කෝ ලයිෆ් ප්‍රධාන කාර්යාලයේදී සිදුකෙරිණි.

# SLTC සහ Deakin University බැඳීම් නැංවූ, Centre for Global Education



ඉංජිනේරු හා තාක්ෂණික ආධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වන Sri Lanka Technological Campus (SLTC), මෑතකදී කොළඹ SLTC Trace Expert City හි අතථ්‍ය ක්‍රමයට පවත්වන ලද විශේෂ උත්සවයකදී ඔස්ට්‍රේලියාවේ Deakin University සමග පවතින හවුල්කාරීත්වය තවදුරටත් දීර්ඝ කිරීම සඳහා වූ ගිවිසුමට අත්සන් තැබීය.

මෙම අවස්ථාවට සමගාමීව, Centre forGlobal Education ආයතනය නිල වශයෙන් ආරම්භ කිරීමද සිදුවූ අතර, මෙම ආයතනය, දේශීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ජාත්‍යන්තර තලයේ අධ්‍යාපනයක් සහ ඒ සඳහා අවශ්‍ය සම්පත් පිරිනමන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

හවුල්කාරීත්වය අලුත් කිරීමේ ගිවිසුම සඳහා Deakin University වෙනුවෙන් එහි නියෝජ්‍ය උපකුලපති (ජාත්‍යන්තර සම්බන්ධතා) මහාචාර්ය ගැරී ස්මිත් විසින්ද, SLTC ආයතනය වෙනුවෙන් එහි නිර්මාතෘ-සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ඉංජිනේරු රංජිත් ජී. රුබසිංහ මහතා විසින්ද අත්සන් තබන ලදී.

මෙම එකඟතාවේ විශේෂත්වයක් නම් Bachelor of Artificial Intelligence පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා SLTC ආයතනයට මේ යටතේ අවසර ලබාදී තිබීමයි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතනයකට මෙම ක්ෂේත්‍රයේ උපාධියක් පිරිනැමීම සඳහා අවස්ථාව ලැබෙන ප්‍රථම අවස්ථාව මෙය බව Deakin University හි විද්‍යා, ඉංජිනේරු සහ ඉදිකිරීම් පීඨයේ සහකාර පීඨාධිපති මහාචාර්ය බාස්කරන් මහතා පැවසීය.

මෙම හවුල්කාරීත්වය යටතේ කෘත්‍රිම බුද්ධිය, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය සහ මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව යන විෂයන්ට අදාළව Bachelor of Artificial Intelligence, Bachelor of Computer Science, Bachelor of Information Technology සහ Bachelor of Software Engineering උපාධි පාඨමාලා 4 හැදෑරීමේ අවස්ථාව SLTC මගින් ශ්‍රී ලාංකේය ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ලබාදෙනු ඇත.

# OPPO A15 ශ්‍රී ලාංකේය වෙළෙඳ පොළට




OPPO නවතම දුරකථන මාදිලිය වන A15 මෙරටට හඳුන්වා දීමට OPPO Sri Lanka කටයුතු කර තිබේ. මෙහි AI Triple Camera පද්ධතිය සුපැහැදිලි ඡායාරූප ලබාදෙන අතර, 6.52" විශාල දර්ශන තිරය වඩාත් සුවිශේෂී විනෝදාස්වාද අත්දැකීමක් ලබාදෙයි. ආරෝපණය දිගුකල් රඳවා ගන්නා බැටරියක් සහ විශාල මතක ධාරිතාවක් සහිත OPPO A15 කෙනෙකුට සිය සම්බන්ධතා සියල්ල සිත් සේ පවත්වා ගැනීමට උපකාරී වනු ඇත.

මෙම නව හඳුන්වා දීම සම්බන්ධයෙන් Xinda Lanka (OPPO Sri Lanka) හි ප්‍රධාන විධායක නිලධාරී බොබි ලී මහතා අදහස් දක්වමින්, "පාරිභෝගිකයන්ගේ ජංගම ජීවන රටාවන්ට අතිශයින් වැදගත් වන විශේෂාංග රැසක් සමග OPPO A15 මාදිලිය හඳුන්වා දීමට ලැබීම අපට මහත් සතුටක්. AI Triple Camera පද්ධතිය මගින් විශිෂ්ට මට්ටමේ ඡායාරූප ගනිමින්, මෙහි විශාල දර්ශන තිරයේ සතුට විඳගන්නා අතරම පවුලේ අය සහ හිතමිතුරන් සමග සිත් සේ සම්බන්ධ වීමට මින් අවස්ථාව සලසා දෙනවා." යැයි සඳහන් කළේය.

OPPO A15 හි AI Triple Camera පද්ධතියට 13MP ප්‍රධාන කැමරාවක්, සෙ.මී.4ක තරම් සමීප දර්ශන සඳහා 2MP Macro Lens එකක් සහ Portrait ඡායාරූපවලට වැඩි depth එකක් සමග පසුබිමට ස්වාභාවික Bokeh Effect එක්කිරීමට 2MP Depth Camera එකක් ඇතුළත් කර තිබේ. ස්වාභාවික සුන්දරත්වය වැඩිදියුණු කරන විශේෂාංග මෙහි ඉදිරිපස කැමරාවට යොදා තිබේ. විවිධාකාරයේ ඡවි වර්ණ සහ මුහුණුවල හැඩයන්, අදාළ පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂභාවය, වයස සහ ජාතිකත්වය අනුව වඩාත් අලංකාර කිරීමට මෙම විශේෂාංගවලට හැකියාව ඇත. OPPO A15 මාදිලිය ජනවාරි 16දා සිට 3GB RAM සහ 32GB Storage සමග, Dynamic Black සහ Mystery Blue යන වර්ණ දෙකෙන් රු.29,900කට මිලදීගත හැකිය.

# ශ්‍රී ලංකාවේ අංක එකේ ටයර් සන්නාමය ලෙස DSI Tyres



DSI Tyres සමාගම SLIM Brand Excellence 2020 සම්මාන උළෙලේදී Product Brand of the Year කාණ්ඩයේ ලෝකඩ සම්මානයද, Local Brand of The Year කාණ්ඩයේ ලෝකඩ සම්මානයද, SLIM DIGI's 2.0 රිදී සම්මානයද ඇතුළු සම්මාන ත්‍රිත්වයකින් පිදුම් ලබමින් ඓතිහාසික ජයග්‍රහණයක් සනිටුහන් කර තිබේ.

DSI Tyres මීට පෙර වසරේ SLIM Turnaround Brand of the Year රන් සම්මානයෙන්ද පිදුම් ලැබීය. සාමාන්‍ය විකුණුම් ක්‍රියාවලිය අතික්‍රමණය කරමින් පාරිභෝගිකයන්ගේ පහසුව වෙනුවෙන් අන්තර්ජාල ඇණවුම් ඔස්සේ ටයර් නිවසටම ගොස් සවිකිරීම සේම, ආකර්ෂණීය ප්‍රවර්ධනයන් තුළ ඔවුන් ජනප්‍රිය වී ඇති බව ඔවුන් වැඩිදුරටත් පවසයි.

# උපතින් ගෙනෙන රෝග හා මරණය වන හැටි පෙන්වන ග්‍රහ යෝග

● නදීශානි පතිරණ

යමෙක් මෙලොව උපදින විටම ඔහුගේ හෝ ඇයගේ මරණය නළලේ කොටාගෙන පැමිණෙන බවට වූ කියමනක් ඈත අතීතයේ විසූ පැරැන්නන් අතර විය. පැරණි ඉසිවරුන්ද ඒහා සමානව ග්‍රහයෝග පිහිටන ආකාරයට ශාරීරික දුබලතා සහිත රෝගාබාධ ඇතිවන ආකාරය හා මරණය සිදුවන ආකාරය පිළිබඳව සඳහන් කර ඇත. ප්‍රවීණ ජෝතිර්වේදී, වාස්තුවිද්‍යා උපදේශක ලත්පදුරේ දොන් දිශාන්ත මහතා මෙවර 'අද'ට ගෙන එනු ලබන්නේ උපතින් ගෙනෙනා රෝග හා මරණය වන හැටි පෙන්වන ග්‍රහ යෝග පිළිබඳ තතුයි.



සෑම කෙනෙක්ම පෙර ආත්මයන් වලදී කළා වූ අකුසල කර්ම මූලික කොටගෙන මෙම ආත්මයේදී කිසියම් රෝගයක් හෝ රෝග කීපයක් රැගෙන ජන්මය ලබයි. එය උපතේදී වන රෝග මෙන්ම ජීවත්ව සිටිනා විට යම් යම් වයස්වලදී වැලඳෙන්නා වූ රෝග වේ. සමහරෙක් එම රෝගය තුළින්ම මරණයට පත්වෙති.

එය උපදින විටම මරණයට පත්වීම, කෙටි දිනකින් මරණයට පත්වීම, සති, මාස, වසර කිහිපයකින් මරණයට පත්වන අල්පායුෂ යෝග මෙන්ම, මධ්‍යම ආයුෂ යෝග, දීර්ඝායුෂ යෝග ලෙස දක්නට ඇත. (ආයු බල පිළිබඳ ඉදිරියේදී වෙනත් ලිපියකින් අදහස් දක්වන්නට බලාපොරොත්තු වෙමි.) අද මෙහි සඳහන් කරන්නේ ජන්මයත් සමග ගෙනෙන ශාරීරික දුබලතා සහිත රෝග කීපයක් හා මරණය වන හැටි පෙන්වන රෝග හා අවස්ථා කීපයකි. පුරාණ ඉසිවරුන් ප්‍රකාශ කර ඇති පරිදි සෑම මනුෂ්‍යයෙකුටම හටගන්නා වූ රෝග හා මිය යන හැටි පෙන්වන ග්‍රහ යෝග පොත්පත්වල සඳහන් වේ.

ක්‍රි.ව. 505ත් 585ත් අතර කාලයේ ඉන්දියාවේ සිටියා යැයි අනුමාන කරන 'මිහිර' නමැති ආචාර්යතුමා විසින් රචිත 'වෘහජ්ජාතකය' නම් වූ මාහැඟි ග්‍රන්ථයේ සඳහන් පරිදි ශ්ලෝක අනුසාරයෙන්ද මෙහි සිද්ධීන් සඳහන් කරමි.

මාතෘකාව පිළිබඳ සඳහන් කිරීමට පෙර මිහිර ආචාර්යතුමා ගැන යම් සඳහනක් කිරීම වැදගත් යැයි සිතමි. වරාමිහිර නමින් ප්‍රචලිතව ඇත්තේ මිහිර ආචාර්යතුමාය. එකල මොහු රජුගේ උපදේශකයෙකි. අනාවැකි කියන්නාය. රජුගේ අග මෙහෙසින් වහන්සේට පුත් කුමරෙකු උපන්නාය. කුමරාගේ ජන්මපත්‍රය සාදා අනාගතය විමසා සිටීමට රජතුමා මිහිර ආචාර්යතුමා හමු විය.

අග මෙහෙසින් වහන්සේට පුත් කුමරෙකු ලැබී ඇති බවත් වැඩිපුර බලාපොරොත්තු තබා නොගන්නා ලෙසත් මිහිර විසින් ප්‍රකාශකර ඇත. ඔබ ඇයි එසේ කියන්නේ. ආචාර්ය කාරණාව හරියටම කියන්න යැයි රජතුමා ප්‍රකාශ කර ඇත. රජතුමනි පුත් කුමරාගේ ආයුෂ වර්ෂ පහයි. ඌරකු පහරදී මිය යනවා යැයි ප්‍රකාශ කර ඇත.

එම අනාවැකිය සමග දින, සති, මාස ගෙවී වසර 5කට ආසන්න විය. කුමක්ද ආචාර්ය ඔබේ අදහස. පුත් කුමරා වසර පහමද ජීවත් වන්නේ යැයි විමසා ඇත. එසේය රජතුමනි. පස් වසරයි යළිත් පවසා ඇත.

මෙම අනාවැකිය බොරු කිරීම සඳහා රජතුමා උපායක් යෙදීය. සත්මහල් ප්‍රාසාදයක් තනවා කුමරා එහි රැඳවීය. සත්මහල් ප්‍රාසාදය වටා මුරහටයින්ද අඟල් 7ක් ස්ථානගත කළේය. දැන් නම් ඌරකු තබා කූඹියෙකුට වත් යුද හටයන්ගෙන් මිදී කුමරා සිටිනා තැනට යා නොහැක.

කුමරාගේ පස්වන උපන් දින දිනය උදාවිය. මිහිර ආචාර්යතුමා රජු සමග රාජ සභාවේය. උත්පත්තිය ලැබූ හෝරාව උදාවිය. ආචාර්ය ඔබතුමන් කියන්නේද දැන්වත් අනාවැකිය බොරු බව පිළිගන්නේද යැයි විමසා ඇත.

නැත රජතුමනි. අනාවැකිය එසේමයි. මේ මොහොතේ කුමරා ලේ විලක් මැද වැටී මියගොස් තිබිය යුතුයි පවසා ඇත.

වහා කලබල වූ රජතුමා ආරක්ෂකයන්, අමාත්‍යවරුන් පිරිවරා සත්මහල් ප්‍රාසාදය වෙත ගොස් ඇත.

පළමු මහලේ සේවිකාවන්ගෙන් විමසූ කුමරා සෙල්ලම් කරමින් සිට හෝරා දෙකකට පමණ පෙර ඉහළට ගිය බව පවසා ඇත. එසේ මහලින් මහල විමසමින් සය වන මහලට පැමිණි කල සේවිකාවන් කියා ඇත්තේ මීට සුළු වෙලාවකට පෙර කුමරා සත්වන මහලට ගිය බවය.

එකල ඌරා ඉන්දියාවේ ගෞරව සතෙකි. සත්වන මහලේ ඉහළ යෝධ ඌරකුගේ රූපයක් නිමවා සවිකර ඇත. කුමරා මරණය කරා ගොස් ඇත. මාරක අවස්ථාවේ ඉහළ ඇති යෝධ ඌරු රූපය (පාෂාණවලින් නිම වූ) කඩා වැටී ඌරාගේ දළ දරුවාගේ පපුව කිඳ බැස මියගොස් ඇත. රජතුමාට කියන්න කිසිත් නැත.

ඌරට කියන තවත් නමක් වන්නේ 'වරාහ' යි. ඒ අනුව එතැන් සිට මිහිර ආචාර්ය වරා මිහිර නම් විය.

දැන් අපි මාතෘකාවට යොමු වෙමු.

**පාපලොකිතයෙඃ සීතාවනි ජයො රස්තස්ථයොර්වාවයරුක්**

**කෙන්ද්‍රෙ කර්කට වෘශ්චිකාංශක ගතෙ පාපෙර්යුතෙ ශුනයාරුක්**

**ශ්විත්‍රෘථ ධනස්ථයොර ශුභ යොග්වත් ද්‍රෙදයෙස්ංකරවො**


**උපදින විටම මරණයට පත්වීම, කෙටි දිනකින් මරණයට පත්වීම, සති, මාස, වසර කිහිපයකින් මරණයට පත්වන අල්පායුෂ යෝග මෙන්ම, මධ්‍යම ආයුෂ යෝග, දීර්ඝායුෂ යෝග ලෙස දක්නට ඇත. ආයු බල පිළිබඳ ඉදිරියේදී වෙනත් ලිපියකින් අදහස් දක්වන්නට බලාපොරොත්තු වෙමි. අද මෙහි සඳහන් කරන්නේ ජන්මයත් සමග ගෙනෙන ශාරීරික දුබලතා සහිත රෝග කීපයක් හා මරණය වන හැටි පෙන්වන රෝග හා අවස්ථා කීපයකි. පුරාණ ඉසිවරුන් ප්‍රකාශ කර ඇති පරිදි සෑම මනුෂ්‍යයෙකුටම හටගන්නා වූ රෝග හා මිය යන හැටි පෙන්වන ග්‍රහ යෝග පොත්පත්වල සඳහන් වේ.**


**චන්ද්‍රෙබෙ වතිංජස්ත ගෙව විකලො යද්‍යාර්කජොවෙගිගං**

ලග්නයෙන් සත්වැන්නේ සිටි සිකුරු කුජ දෙදෙනා කිසි පාපයෙක් විසින් දුටු කල්හි වාධ්‍ය රෝගී වේ. එනම් ඉදිමුම් බරවා ආදී රෝග ඇත්තෙක් වෙයි.

වෘශ්චික නවාංශකයට හෝ කටක නවාංශකයට ගිය චන්ද්‍ර තෙම කිසි පාපයෙකු හා යුක්ත විද එකල්හි උපන්නේ ගුහ්‍ය රෝගී අයෙක් වේ. ශනි කුජ දෙදෙනා දොළොස් වැන්නේ හා දෙවැන්නේ සිටි කල්හී චන්ද්‍රයා ලග්නයේද රවි සත් වැන්නේද වී නම් උපන් තැනැත්තා ශ්වේත කුෂ්ට රෝගය (සුදු කබර) ඇත්තෙක් වේ.

**අංක ශශිත්‍ය ශුභයෝර්මෘගගෙ පතංහෙ**
**ස්වාසක්ෂය පලිහ කවින්ද්‍රධිගුල්ම භාජඃ**
**ශොෂි පරසාර ගෘහාංශ ගයොවේද්වොඃ**
**ක්ෂෙත්‍ර ස්වා යුගපදෙ කගයොඃ කෘශොවා**

චන්ද්‍රයා ශනි කුජ දෙදෙන මැද සිටිනා කල සූර්යා මකර රාශියේ ගත කල උපන්නේ නම් ශ්වාසය, ක්ෂයය, ප්ලීහය, විද්‍රධිය, ගුල්මය යන මේ යම් රෝග ඇත්තෙක් වේ.

හිරු සඳු දෙදෙන රාශි මාරුකරගෙන නවාංශකයේ විද එකල උපන්නේ ක්ෂය රෝගියෙකි.

**චන්ද්‍රෙශ් විමධ්‍යකධෂකර්ති මෘගාජභාගෙ**
**කුෂ්ටි සමන්ද රුධිරෙ තද වෙක්ෂිංතවා**
**යාතෙස්ත්‍රිකොණ මලිකර්කි වෘෂෙර්මාගෙව**
**කුෂ්ටිව පාප සහිකෙ රවලොකිතෙරේවා**

ධනු රාශියේ පස්වැනි නවාංශකයේ හෝ මීන කටක මකර මේෂ යන නවාංශකයක හෝ චන්ද්‍රයා සිටියේද එහි ශනි හෝ කුජද යුක්ත වුවහොත් හෝ දක්නාවේ නම් එකල්හි උපන්නේ කුෂ්ඨ රෝගියෙකි.

මෙම යෝගයේ චන්ද්‍රයා සුබ ග්‍රහයෙකු විසින් දකිනු ලැබුවහොත් කංශසිකාරි හෙවත් සොරි රෝගියෙක් වේ.

පස්වැන්නට හෝ නමවැන්නට ගිය වෘශ්චිකය කටකය වෘෂභය මකරය යන මින් එකක ශනි හෝ කුජගෙන් යුක්ත වේද කුෂ්ට රෝගියෙක් වේ.

**නිධනාර් ධනව්‍යාස්ථිතා රවි චන්ද්‍රාරය මායථා තථා**

**බලවද ග්‍රහ දොෂකාර පෙණර් මනුජාතාඃ ජනයංත්‍ය නෙත්‍රතාම්**

රවි,සඳු, කුජ ශනි අටවැන්නේ, සයවැන්නේ දොළොස් වැන්නේ දෙවැන්නේ කොයි ආකාරයකින් හෝ සිටියහොත් එකල උපන් මිනිසුන් අන්ධ වන්නේය.

මෙම හතර දෙනාගෙන් බලවත් වන ග්‍රහයා චන්ද්‍රයා වී නම් සෙම් හේතුවෙන් අන්ධ වේ. කුජ නම් පිත හේතුවෙන් අන්ධ වේ. රවි නම් ඌෂ්ණය හේතුවෙන් අන්ධ වේ. ශනි නම් වාතයෙන් හෝ ගල් පහරක් වැදී අන්ධ වේ.

**නවමාය තෘතියධියුතා නව සොමේය රශුභානිරික්ෂිතාඃ**

**නියමාච් ප්‍රවණෙපත්‍යාන්ද්‍ර රදවෙකෘත්‍ය කරාශ්වසප්තවෙ**

රවි චන්ද්‍ර කුජ, ශනි නවවැනි එකොළොස්වැනි, තුන්වැනි, පස්වැනි ස්ථානවල යුක්ත වේද එය සුබ ග්‍රහයන් විසින් දකිනු නොලබන්නේද එකල උපත් තැනැත්තා බිහිරි වේ. එම ග්‍රහයන් සප්තම ස්ථානයේ වේද සුබ ග්‍රහයන් විසින් දකිනු නොලබන්නේද ඇද වූ දත් ඇත්තෙක් වේ.

**සංස්පෘෂ්ටඃ පවනෙන මන්දගයුතෙ දසුනෙ විලග්නෙ ශුණො**

**සොතමාදො වනිජෙස්ථිතෙස්ත භවනෙ පීවෙ විලග්නා ශ්‍රිතෙ**

**තද්වත්සූර්ය සුතොදයෙවති සුකෙ ධර්මාත්වස් දසුනගෙ**

**ජාතෙවා සසහසුර්ශ්මිතනයෙ ක්ෂිතෙව්‍යයෙ ශිතගො**

ලග්නයේ බ්‍රහස්පතිද සත්වැන්නේ සෙනසුරුද යුක්ත වූ කල වාත රෝගී වේ. අඟහරු සත්වැන්නේ බ්‍රහස්පති ලග්නයේද වී උපන්නේ නම් උන්මාද වේ.

අඟහරු නමවැනි, පස්වන, සත්වන තැනක වේද සෙනසුරු ලග්නගත වේද එකල උපන් තැනැත්තා උන්මාද වේ. සෙනසුරු සමග අව චන්ද්‍රයා දොළොස් වැන්නට ගිය කල උපන් තැනැත්තා චිත්ත විකල වේ.

**විවෘතදශනඃ පාපෙර්දෘෂ්ටෙ වෘෂාජභයොදයෙ**
**රවලතිරහෙක්ෂෙත්‍රෙ ලග්නෙ භයෙ වෘෂහෙපිටා**
**නව මසුකගෙ පාපෙර්දෘෂ්ටෙ රවාවදෘධෙක්ෂණො**
**දිනකර සුතෙ නෙකව්‍යාධිඃ කුජේවිකලඃ ප්‍රමානි**

මේෂ වෘෂභ ධනු යන මෙයින් යම් රාශියක් ලග්නය වූද ලග්නය පාපින් දකීද විරූප දත් ඇත්තෙක් වේ.

මේෂ සිංහ වෘශ්චික, මකර, කුම්භ යන අසුභක් ක්ෂේත්‍රයක් හෝ ධනුට හෝ වෘෂභය ලග්නය වීද ලග්නය අසුබයන් විසින් දකින්නේද කට්ට සිතක් ඇත්තෙක් වේ. නව වැන්නට හෝ පස්වැන්නට ගිය රවි පාපයෝ දකින්ද දුර්වල ඇස් ඇත්තෙක් වේ. සෙනසුරු නව වැන්නට හෝ පස්වැන්නට ගිය කල අසුබයන් විසින් දකිනු ලැබුවේ නම් නොයෙක් ව්‍යාධි ඇත්තෙක් වේ. අඟහරු නව වැන්නට හෝ පස්වැන්නට ගිය කල අසුබයන් විසින් දකිනු ලැබුවේ නම් අබ්බගාතයෙක් වේ.

## මරණය

අටවැන්න ශූන්‍ය නම් එය දක්නා වූ බලවත් ග්‍රහයාගේ ධාතු කෝපයෙන් උපන් රෝගයකින් මරණයට පත්වේ.

සූර්යාට පිත - චන්ද්‍රයාට වා සෙම් - කුජට පිත - බුධට වා පිත් සෙම් - බ්‍රහස්පතිට සෙම් - සිකුරුට වා සෙම් - සෙනසුරුට වා - ද වේ.

ඒ අටවැන්න රාශිය කාල පුරුෂයාගේ යම් අවයවයකට වැටෙන්නේද එම අවයවයේ හටගන්නා වූ රෝගයකින් මරණය වේ.

අටවැන්න මේෂය නම් හිසේ රෝගයක්. වෘෂභය නම් මුහුණේ රෝගයක්. ආදී ලෙස වේ.

ශූන්‍ය වූ අටවැන්න බලවත් වූ බොහෝ දෙනෙක් විසින් දක්නා ලැබුවහොත් එම බොහෝ දෙනාට අයිති ධාතු කිපීමෙන් අටවැන්නට අයිති ශරීර කොටසේ හටගන්නා වූ රෝගයකින් මරණයට පත්වේ.


**අට වැන්නේ රවි සිටීමෙන්, ගින්නෙන් සඳු සිටීමෙන් ජලයෙන්, කුජ සිටී නම් ආයුධයකින්, බුධ සිටී නම් උණ රෝගයෙන් ගුරු සිටීමෙන්, ආම රෝගයකින් සිකුරු සිටීමෙන්, ඌෂ්ණ රෝගයකින් ශනි සිටීමෙන් ක්ෂුධාවෙන් මරණය වේ. අටවැන්න චර රාශියක් නම් විදේශයකදී මරණය වේ. තිර රාශියක් නම් තමන්ගේ රටේදී මරණයට පත්වේ. උභය රාශියක් නම් මාර්ගයේදී මරණයට පත්වේ.**


එම ග්‍රහයන් අටේ සිටීමෙන් මෙසේද මරණයට පත්වේ. අට වැන්නේ රවි සිටීමෙන්, ගින්නෙන් සඳු සිටීමෙන් ජලයෙන්, කුජ සිටී නම් ආයුධයකින්, බුධ සිටී නම් උණ රෝගයෙන් ගුරු සිටීමෙන්, ආම රෝගයකින් සිකුරු සිටීමෙන්, ඌෂ්ණ රෝගයකින් ශනි සිටීමෙන් ක්ෂුධාවෙන් මරණය වේ. අටවැන්න චර රාශියක් නම් විදේශයකදී මරණය වේ. තිර රාශියක් නම් තමන්ගේ රටේදී මරණයට පත්වේ. උභය රාශියක් නම් මාර්ගයේදී මරණයට පත්වේ.

රවි කුජ දෙදෙන දසවැන්නේ සතර වැන්නේ සිටියේද ගල් ගැසීමෙන් මරණය වේ. ශනි, චන්ද්‍ර, කුජ සතර වැන්නේ සත්වැන්නේ, දසවැන්නේ සිටි කල ළිඳක වැටී මිය යයි. හිරු සඳු දෙදෙනා කන්‍යා රාශියේ සිට පාප ග්‍රහයෝ විසින් දකිනු ලබතොත් නෑයන්ගෙන් මරණය වේ. උභය රාශියක් ලග්නය වේද එහි හිරු සඳු දෙදෙනා සිටියේ නම් දියේ ගිලී මරණයට පත්වේ.

සෙනසුරු කටකයේ සඳු මකරයේ සිටි කල උපන් තැනැත්තා දිය උදරයෙන් මරණයට පත්වේ. චන්ද්‍රයා පාපයන්ගේ මධ්‍යයෙහි කුජගේ රාශියක නම් ආයුධයකින් හෝ ගින්නෙන් මරණය වේ.

චන්ද්‍රයා පාපයන් දෙදෙනෙකුගේ මධ්‍යයෙහි කන්‍යා රාශියේ සිටියේද ලේ විෂ වීමෙන් හෝ වේළීමෙන් මරණය වේ.

චන්ද්‍රයා මකරයේ හෝ කුම්භයේ පාපයන් දෙදෙනාට මැදිව සිටියේ නම් රැහැනින් එල්ලී හෝ වැටී හෝ ගින්නෙන් මරණයට පත්වේ.

අටවැන්න, දසවැන්න, සතරවැන්න යන තැන්හි සඳු, රවි, කුජ, ශනි යන ග්‍රහයෝ වේද එනම් 8 වැන්නේ හීන සඳුත් දසවැන්නේ කුජත් ලග්නයේ ශනිත් 4 වැන්නේ රවිත් වේද එකල උපන් තැනැත්තා පොලු, මුගුරු පහරකින් මරණයට පත්වේ.

කුජ, රවි, ශනි ග්‍රහයෝ 4-7-10 යන තැනක සිටි කල ආයුධයකින් ගින්නෙන් රාජ කෝපයෙන් මරණය වේ.

2වැන්නේ ශනි 4වැන්නේ සඳු 10 වැන්නේ කුජ සිටි කල උපන් තොමෝ පණුවන් හටගෙන මරණයට පත්වේ.

රවි 10 කුජ 4 සිටි කල උපන් අය යානවාහන වල ගැටී මිය යන්නේය. කුජ 7 ශනි සඳු රවි ලග්නයට සිටි කල උපන් අය යන්ත්‍රයකට හසුවී මිය යයි. කුජ, ශනි, සඳු, තුලා, මේෂ, මකර, කුම්භ රාශිවල සිටි කල අසූචි මධ්‍යයෙහි මැරේ.

මෙසේ සඳහන් කළේ පාප ග්‍රහ යෝග කීපයක් පමණි. හෘදරෝග, පිළිකා රෝග, අතපය විසන්ධි වීම් නහර පිපිරීම් විෂ ශරීරගතවීම් වැනි වූ කරුණු වලින් මිය යන අය පවා පහසුවෙන් හඳුනාගත හැක.

එසේම හිසේ සිට පාදාන්තය දක්වා සියලු ආකාරයේ අභ්‍යන්තර, බාහිර රෝග පහසුවෙන් හඳුනාගත හැක. ඉදිරියේදී ඒ ගැන ලිවීමට බලාපොරොත්තු වෙමි.


තෙරුවන් සරණයි.



**ජ්‍යෝතිෂවේදී, වාස්තුවිද්‍යා උපදේශක**
**ලත්පදුරේ දොන් දිශාන්ත**

# මහපොළොවේ ආරක්ෂකයා සඳු

**ජ්‍යෝතිර්වේදය අනුව සඳු ඉතාම සුවිශේෂීය. මේ සඳු ගැන ප්‍රවීණ ජ්‍යෝතිර්වේදී කේ.සී.ජේ. රත්නායක සැකෙවින් ගෙනෙන විස්තරයකි**





සඳු මහපොළොවේ අසමසම ආරක්ෂකයාය. බාහිර අජටාකාශයෙන් පෘථිවිය කරා ඇදී එන සියලු ශක්ති පදාර්ථ තමා වෙත ඇදගන්නා සඳු ඒවා හැකිතාක් පවිත්‍රකොට මහපොළොවට මුදාහරින ෆිල්ටරයක් ලෙස ක්‍රියාකරයි. දෙවනුව පෘථිවිය සහ අනෙක් ග්‍රහ ලෝක අතර ප්‍රධාන සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියාකරන සඳු මහපොළොවේ සම්බරතාව කෙරෙහි තීරණාත්මක වේ. සඳුගේ මේ ක්‍රියාකාරීත්වය නොවන්නට මහපොළොවේ ශාක සහ ජෛව විවිධත්වය මෙතරම් සරුසාර වන්නේ නැත. ජෝතිෂය අනුව සඳු ග්‍රහලොව මවු ලෙස සැලකෙන අතර, පෘථිවියේ ජීවය සඳු මත රඳා පවතින බැව් එයින් නිවේදනය කෙරේ.

ඕනෑම පුද්ගලයකු උපදින ජන්ම නැකත තීරණය කෙරෙනුයේ ඒ වන විට සඳු තැන්පත්ව සිටින නැකැත සහ නැකැත් පාදය පදනම් කරගෙනය. ඔහුගේ හෝ ඇයගේ ලග්නයට වඩා සඳු තැන්පත්ව සිටි රාශිය සහ නැකැත් පාදය ප්‍රමුඛකොට ගැනීම සම්භාව්‍ය උසස් ජ්‍යොතිෂ ගණිතයේ රහසකි. කේන්ද්‍රයේ සඳු සහ අනෙක් ග්‍රහයන් අතර පිහිටන සමීපස්ථ සහ දුරස්ථ න්‍යාය මෙන්ම සඳු මූලික කොට ගත් ජ්‍යාමිතික සිතියම මත පුද්ගලයාගේ මෙලොව ගමන් මග තීරණය කෙරේ.

මේ අනුව බලන කල මහපොළොවට මෙන්ම එහි පවතින සමස්ත ජෛව පද්ධතීන්ටම සඳු සහ සඳුගේ ක්‍රියාකාරීත්වය තීරණාත්මක වන බව පෙනී යයි. සඳු යහපත් ලෙස ක්‍රියාකරන තාක් මහපොළොව සහ ජීවය සුරක්ෂිතය. යම් හෙයකින් සඳු අයහපත් ලෙස ක්‍රියාකරන්නේ නම් එවිට මහපොළොව සහ ජීවය අනාරක්ෂිතය.

සඳු මහපොළොවට සතුරු ලෙසින් ක්‍රියාකරන ප්‍රධාන අවස්ථා කිහිපයකි.

**1.** චන්ද්‍රග්‍රහණ අවස්ථාව

**2.** සූර්යග්‍රහණ අවස්ථාව

**3.** අමාවක - පුරපසළොස්වක සහ අව අටවක - පුර අටවක යන හතර පොහොය

**4.** සුපිරි සඳු උදාවන අවස්ථාව

**5.** සඳු සහ රාහු සංයෝගවන අවස්ථාව

මේ අවස්ථාවලදී සඳුට තම ප්‍රකෘති ස්වරූපය සහ ක්‍රියාකාරීත්වය අහිමිවන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් මහපොළොව අනාරක්ෂිත වේ. එවිට මහපොළොවේ සමතුලනය බිඳී යෑම මෙන්ම අජටාකාශයෙන් නිකුත් වන අතිමහත් විෂකුරු ශක්ති පදාර්ථ එක එල්ලේම පොළොව කරා ඇදී ඒම නිසා මිහිතලය දැඩි අවදානම්සහගත තත්ත්වයකට පත්වේ. බිහිසුණු භූ චලන හටගැනීම සහ සඳුගේ පිහිටීම අතර පවතින්නේ වෙන් කළ නොහැකි සම්බන්ධයකි. පුරපසළොස්වක පෝයදාට අහස ලස්සනය. එහෙත් ඒ ලස්සන යටින් සැඟවී තිබෙන්නේ බියකරු අවදානමකි. 2004 වසරේ දෙසැම්බර් 26දා පුරපසළොස්වක පෝයදා හටගත් සුනාමිය මේ සඳහා එක් නිදසුනකි. අන් සියලු දිනයන්ට වඩා පුරපසළොස්වක පෝයදා බියකරුය. ඒ මොහොතේ සුපිරි සඳු උදා වූයේ නම් ඒ දවස අතිබියකරුය.

හතර පොහොය මෙතරම් නපුරු වන්නේ කෙසේදැයි කෙනෙකු විසින් විමසනු ලැබීම සාධාරණය.

**1.** අමාවක පෝය දා රෑ අහස කට්ට කළුවරය. ජ්‍යෝතිෂය අනුව මේ දවස කිසිදු සුබ කටයුත්තකට යොදා නොගනී. මන්ද සඳු මුළුමනින්ම පාහේ හිරුගෙන් වැසී යන හෙයිනි. එනම් සඳු සහ හිරු එකම අංශකයේ පිහිටයි. මෙදින මළවුන්ගේ දිනය ලෙස සැලකීම ඉතා යුක්ති යුක්තය. එහෙත් හිරුගේ ග්‍රහණයෙන් නිදැස්ව එන නව සඳු බටහිර ජ්‍යෝතිෂ සිද්ධාන්ත අනුව සුවිශේෂී අවස්ථාවකි.

**2.** පුර අටවක පොහොය යනු සඳු හිරුගෙන් අංශක 90ක් දුරස්ථ වූ අවස්ථාවය. එය අසුබ දෘෂ්ටියකි.

**3.** පුරපසළොස්වක පොහොය යනු සඳු හිරුගෙන් අංශක 180ක් දුරස්ථ වූ අවස්ථාවය. මෙය බටහිර සහ පෙරදිග යන භේදයක් නැතිව ඉතා අසුබ දෘෂ්ටියක් ලෙස සැලකේ.

**4.** අව අටවක පොහොය යනු අව සඳු අංශක 90කින් හිරුට සමීප වූ අවස්ථාවය. මේ අව සඳුගේ චතුරශ්‍ර දෘෂ්ටියද අසුබ වේ.

( හිරු සහ සඳු අතර හටගන්නා දුරස්ථ සහ සමීපස්ථ සිද්ධාන්තය මත හතර පොහොය නිර්මාණය වන අතර, ඉහත දැක්වූයේ ඒ පිළිබඳ ලුහුඬු සටහනක් පමණි. මේ නිසා මහපොළොවට ඇති කෙරෙන පීඩනය අනෙක් ග්‍රහයන්ගේ පිහිටීම අනුව උග්‍ර විය හැකිය. ඒවා වෙන් වෙන්ව අධ්‍යයනය කළ යුතුය.)

මේ අතරින් වඩාත්ම වැඩි අවදානම ගෙන දෙන්නේ පුරපසළොස්වක පොහොය දිනයයි. මෙදින සඳු හිරුගෙන් ඈත් විය හැකි උපරිම දුර වූ අංශක 180කින් ඉවතට යන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් මහපොළොව හිරු සහ අනෙක් ග්‍රහයන් වෙත පුළුල්ව නිරාවරණය වේ. යම් හෙයකින් සඳුට සමීපව හෝ දුරස්ථව ග්‍රහ පොකුරක් නිර්මාණය වී තිබුණේ නම් පොළොවේ සමතුලනය බිඳවැටීමෙන් බිහිසුණු භූ චලන හටගැනීමේ අවදානමක් නිර්මාණය වේ. අනෙක් අතින් පුරපසළොස්වක සඳු විසින් පොළොවේ ඇති සියල්ලම තමා දෙසට ඇද ගැනීමට තැත් කිරීම නිසා එයින්ද මහපොළොවට ඇති කෙරෙන්නේ පීඩනයකි. මේ පුරපසළොස්වක සඳු යම් හෙයකින් සුපිරි සඳු බවට පත්වූයේ නම් පෙර කී පීඩනය දෙගුණ වේ.

හතර පොහොයට සිල් ගැනීම සිංහල බෞද්ධයන් අතර පවතින ජනප්‍රිය කතාවකි. හතර පොහොය කෙසේ වෙතත් පුරපසළොස්වක පොහොයට නම් ඇතැම්හු සිල් සමාදන් වෙති. එහෙත් මේ සිරිත සහ ජ්‍යෝතිෂය අතර ඇති සම්බන්ධය බොහෝ දෙනෙක් නොදනිති. සඳුගෙන් පොළොවට ආරක්ෂාවක් නොලැබෙන දිනයේදී කළයුතු හොඳම ක්‍රියාව වන්නේ හැකිතාක් සිත කය දෙක සංවර කරගෙන සිටීමය. පොහොය දාට සුබ නැකැත් නැත. එහෙයින් මංගල කටයුතු, ඉදිකිරීම්, ව්‍යාපාර ආරම්භය ආදී කිසිවකට පොහොය දිනය යොදා නොගන්නා අතර, ජ්‍යෝතිෂය පිළිබඳව දැනුම ඇති පැරණි වෛද්‍යවරුන් මෙදින වෙද හෙදකම් පවා නොකෙළේය. පොහොය දාට හේනට කුඹුරට නොයන ගොවියා එසේ කෙළේ පොහොය දවසේ ඇති අනතුරුදායක බව අත්දැකීමෙන් පසක් කරගත් නිසාය.

# ඔබට අයිති කේන්ද්‍රය ඔබම නිවැරදිව බලාගන්න



උපත ලත් මොහොතටම අලලා සෑදෙන කේන්ද්‍ර සටහන භාව කේන්ද්‍ර සටහනයි. මෙසේ කේන්ද්‍ර සෑදීම ක්‍රිෂ්ණමූර්ති ක්‍රමය යැයි ඇතැම්හු කියති. නමුත් භාව කුතුහලය, ශුම්භ හෝරා ප්‍රකාශය යනාදී ඉපැරණි ග්‍රන්ථවල ප්‍රකාශන තත්කාල නිමිති ශාස්ත්‍රයේද දැක්වේ. ශ්‍රීමත් කල්‍යාණවර්ම් රජතුමන් විසින් රචිත සාරාවලියේද යම් යම් ස්ථානවල භාව සටහන් ගැන කරුණු විස්තර කෙරේ. විශ්වයේ පවතින්නා වූ සියලුම (ග්‍රහ) වස්තූන් විවිධාකාර වේගයන්ගෙන් හා ඕලාකාර හැඩතලවලින් යුක්තව මොහොතින් මොහොත වෙනස් වෙමින් භ්‍රමණය වේ. ඒ හේතුව මත ග්‍රහලෝකයන්හි භ්‍රමණය වීම එකිනෙකා කෙරෙහි ඇති කරන ආකර්ෂණ හා විකර්ෂණ මෙන්ම විහිදුවන ආලෝක ශක්ති ප්‍රභවයන්ද වෙනස් වේ.

භාවානුරූපව ඔබගේ කේන්ද්‍ර සටහනේ දුක්වෙන ග්‍රහ පිහිටීම සලකමින් තමාට අනාගතයේදී ඇති කරන ඵල තමන්ම දැනගන්න, පහත සඳහන් කරුණු උපයෝගී කරගන්න.

උපත ලබන වෙලාවට අයත් වන ලග්නභාවයේ එක් එක් ග්‍රහ පිහිටීම ගැන මුලින්ම විමසා බලමු. ලග්නභාවයෙන් හොවා දක්වන කරුණු අතර ප්‍රධාන වන්නේ උපත ලත් අයගේ හැඩරුව, ගතිගුණ, පැහැය, ආත්මශක්තිය, කීර්ති ප්‍රශංසා, ශරීර ලප කැළැල්, දුකසැප හෙවත් ධනවත් බව, මවුපිය උරුම ගති හා තම හිස යනාදී තවත් බොහෝ කරුණු එළිදැක්වේ. එම භාවයට පත්වන අවස්ථාවේ ග්‍රහයන්ගේ ග්‍රහස්ඵුට මෙන්ම දෘෂ්ටි සංයෝගද ඵලාපල කෙරෙහි සුබාසුබ බලපානු ඇත. ග්‍රහයෙක් උච්ච හෝ ක්ෂේත්‍ර අංශක ඉදිරියට හෝ පසුකරමින් ගමන් කරන අවස්ථාවලදීද ක්‍රියාකාරී ශක්තීන් එකිනෙකට වෙනස් වේ. මිත්‍ර, සතුරු, නීච, සම, මුඩ යන අවස්ථාවලදීද ඵල වෙනස් වේ. ලග්නභාවයේ දෙපස සිටින ග්‍රහයන්ගේ එම ගතිගුණද බලපානු ඇත. මෙවැනි කරුණුද සැලකිල්ලට ගෙන ඵල තීරණය කරගැනීම ප්‍රඥගෝචර වෙයි.

ඔබට අයත් වන ලග්නයට හිමි ග්‍රහයා පළමුවෙන් හඳුනා ගනිමු. උදාවන ලග්න, පිළිවෙළින් මේෂ, වෘෂභ, මිථුන, කටක, සිංහ, කන්‍ය, තුලා, වෘශ්චික, ධනු, මකර,කුම්භ, මීන වශයෙන් දැක්වේ. මෙම රාශීන්ට ආවේණික අධිපති හා ක්ෂේත්‍ර ග්‍රහයන් පිළිවෙළින් කුජ, සිකුරු, බුධ, සඳු, රවි, බුධ, සිකුරු, කුජ, ගුරු, ශනි, ශනි, ගුරු යනුවෙනි. මෙහිදී රවිහා සඳුට එක එක රාශිය බැගින්ද අනෙක් සියලු ග්‍රහයන්ට රාශි දෙක දෙක බැගින්ද අයත් වේ. තවද මේෂ, වෘෂභ, කටක, කන්‍ය, තුලා, මකර, මීන යන රාශිවලට උච්ච ග්‍රහයන් වන්නේ රවි, සඳු, ගුරු, බුධ, ශනි, කුජ, සිකුරු වේ. මේවා පිළිවෙළින් අංශක 10, 03, 05, 15, 20, 28, 27 වශයෙන් ඇතුළත්ය. මේවාට 7වන රාශිය නීච රාශිය වේ.

ඉහත සඳහන් රාශිවල උච්ච හෝ අධිපතියන් එම රාශියේම සිටී නම් ආවේණික සුභ ඵල ගෙන දේ . නීච නම් උදාසීනවද, සතුරු නම් අසුබ ඵලද ගෙනෙන අතර සුබ ග්‍රහයන් ගුරු, (සඳු, සිකුරු හා බුධ) සංයෝග හෝ දෘෂ්ටි සහිත නම්ද අසුබ ඵල ගෙන නොදෙනු ඇත. මේ නිසා ඉදිරියේදී කරන ප්‍රකාශයන් නිවැරදිව වටහා ගන්න උත්සාහ කරන්න.

මේෂ රාශිය ලග්නභාවය වී එහි කුජ හෝ රවි ඉහත කී ආකාරයෙන් සිටීමෙන් රුචක යෝගය පිහිටයි. මේ අය කාර්යශූර, උනන්දුවෙන් ඕනෑම වැඩක් කිරීමට ඉදිරිපත් වේ. යන්ත්‍ර මන්ත්‍ර කටයුතු මෙන්ම අවි දරන යුද කටයුතුද, ආරක්ෂක උසස් නිලතල භාරව සිටීමට කැමති කැපී පෙනෙන කෙනෙකි. හැඩහුරුකමින් තේජවන්ත, වැඩුණු ශරීරයද කලු වුවත් රත් පැහැයට හුරු, සුදුම පාට ශක්තිමත් දත් හිමිය. බෙල්ල දැඩි හා වටකුරුය, හොඳ පෞරුෂත්වයකින් යුක්තයි. මෙවැනි යෝග කේන්ද්‍රයේ 10වැනි භාවයේ නම් අනිවාර්යෙන්ම රාජ්‍ය හෝ පෞද්ගලික උසස් තනතුරු දරනු ඇත. ස්ත්‍රී පුරුෂ බේදයකින් තොරව තම පරම්පරාවේ දියුණුව උදෙසා කැපවීමෙන් කටයුතු කරයි. සාමය හෝ දරුණු බව ස්ථානෝචිතව ක්‍රියාත්මක කරයි. අනෙකුත් සුබ ග්‍රහයන්ගේ බලපෑම් සහිත නම් ධාර්මිකත්වය අගය කරයි. පාප ග්‍රහ සංයෝගතා නම් ඉතා දරුණු වේ.

ඔබගේ ලග්නභාවය වෘෂභ නම් එහි ඉහත කී පරිදි සඳුහෝ සිකුරු සිටීමෙන් මාලව්‍ය යෝගය පිහිටයි. මේ අය පිරිපුන් හා දැකුම්කලු රත් පැහැයෙන් යුක්ත වේ. ස්ත්‍රියක් නම් හස්තිනී ගණයේය. පංච කල්‍යාණයෙන් යුක්තයි. මහත්ම නොවන සිහින් හැඩවැඩ සහිත ශරීරයකි. කලා කටයුතුවලට දක්ෂයි. ස්වභාවධර්මයට ඉතා ඇලුම් කරයි. මවට ඉතා ලැදිවේ. සුබ ගුරු හෝ බුධ නැකැත් සංයෝගතා අනුව දැහැමි රාජ්‍ය පාලකයෙක්ද වේ.

මේ කරුණු ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරයි. පළමු කී පරිදි අසුබ සංයෝග හෝ දෘෂ්ටි මත වෙනස් විය හැකියි . නමුත් මේ අයට යහමග කුඩා කල සිටම කියා දී හුරුකර ගැනීම කළ යුතුයි.

මිථුන ලග්නභාවයේ බුධ සිටින අතර, ගුරු ශනි යෝග සහිත නම් ඕනෑම කාර්යක් ඉක්මනින් ඉගෙන ගනී. දක්ෂතා සහිතයි. එකම ධනය බුද්ධියයි. විස්තරාත්මක දේශනයට දක්ෂයි. පවුලේ ප්‍රධානියා වශයෙන් තම පරම්පරාව ඉදිරියට ගෙන යයි. දෙමාපියන්ට මෙන්ම වැඩිහිටියන්ට ගෞරව සහිත කෙනෙකු වේ. ඇසූපිරූ තැන් බහුල කරගන්නා අතර, විශ්ලේෂණාත්මක දේශනවලට ඉතා දක්ෂයි. කලාවට මෙන්ම ස්වභාවධර්මයට ඇලුම් කරයි. යමක් දුටු පමණින් එය වටහාගෙන ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් උපතින්ම ලබා ඇත. දහමට ඉතා ළැදිය. දානමාන දීමට ඉතා කැමතිය. සඳු, ගුරු සම්බන්ධතාව අනුව යමක් වහා වටහා ගැනීමේ නුවණක් උපතින්ම ලබා ඇත. සැමවිට සාධාරණත්වය අගය කරයි. සාමයට කැමතියි. ශනි දුබල නම් කේන්තිකාරයෙකි. දිගටි අත් පා, වටකුරු හැඩය, දෙඅතේ දිග තරමට උස, පුරුෂ නම් තරමක් රළු වූද, ස්ත්‍රී නම් පියුමක මෙන් මොළොක් ශරීරයද, පිරුණු ළමැදක් යන ලක්ෂණ පෙන්නුම් කරයි. වාසනාවන්ත ගුණයෙන් යුක්තයි. මේ කරුණු වෙනස් වන්නේ ග්‍රහයන්ගේ දුබලතා පැවැතියහොත් පමණි.

කටක ලග්නභාවය හිමිකම් සහිතව සඳු හෝ සඳු ගුරු සංයෝගව උපත ලබා ඇත්නම් ඉතා වාසනාවන්තයි. නමුත් කටහඬ ටිකක් සැරයි. මිථුන ලග්නයේ භාව ඵලවලට ගොඩාක් සමීපව ක්‍රියා කරයි. ප්‍රසන්න පෙනුමකින් යුක්ත වේ. පැහැපත්, ශක්තිමත් ශරීරයකි. ලොව ධර්මතාවය හොඳින් වැටහේ. ඒ අනුව අනුන්ගේ දුක් වේදනා තමාට මෙන් දැනේ. හැකි උපකාර නොපිරිහෙළා ඉටුකරයි. අසල්වැසි කවුරුත් සමග කුලුපඟව විසීම එකම බලාපොරොත්තුවයි. ඉගෙනීමට ඉතා දක්ෂයි. වර්ණවත් පියකරු මුහුණක් හා සිනහමුසු බවක් නිතර දක්නට ලැබේ. හරිම සංවේදී කෙනෙකි. ස්ත්‍රී පුරුෂ භේද මේ විස්තරයට අදාළ නොවේ.

රවි ග්‍රහයා ලග්නභාවයේ වූ සිංහය නම් කුජ සිකුරු සංයෝග නම් ඔබ සිතන දෝෂය නැත. ආත්ම ශක්තිය උදෙසා හැකි සෑම උත්සාහයක්ම නොපසුබටව ක්‍රියාවේ යොදන කෙනෙකි. අන් අය පරදවා තමන්ගේ සිතැඟි අරමුණ ඉටුකර ගැනීම පෙරටුකොට ක්‍රියාත්මක වෙයි. බාධක මායිම් නොකරයි. දැඩි උත්සාහවන්තයි. පියාට ඉතා ළැදි අතර, රජයට පක්ෂපාතී වුවත්, කිසිවෙකුට යටත් වීම සිතිය නොහැකි තරම්ය. තේජවන්ත නෙත් සහිත ගාම්භීර පෙනුමක් හොවා දක්වයි. මෙහි දුබලතා ඉහත කී ආකාරයේ ග්‍රහ සංයෝග දෘෂ්ටි මත පවතී.

ලග්නභාවය කන්‍යාව වී එහි බුධ වක්‍ර නොවී කෙසේ සිටියත් භද්‍ර යෝගයයි. මෙය ඒකශැත යෝගයකි. එහි තීව්‍රතතාවය සඳු, ගුරු හෝ කුජ, ගුරු සංයෝගතා අනුව ක්‍රියාත්මකයි. වෙළෙඳම් ව්‍යාපාර, ඛනිජ සම්පත්, වගාකටයුතු, ග්‍රන්ථකරණය, දේශක යන තනතුරු යනාදිය ප්‍රමුඛස්ථානයේ ලා සැලකේ. බොහෝ නිහතමානී මිත්‍රතාවයට කැමැති වේ. ආධිත්‍ය යෝගයකට රවි යොමු වේ නම් පාලන තන්ත්‍රයේ මහත් පෙරළිකාරී කෙනෙකු වෙයි. පරම්පරාව ඉදිරියට ගෙන යනවාට වඩා ධනය රැස්කිරීමට සියලු ශක්තීන් යොමු කරනු ඇත.

ඉහත සඳහන් විස්තරය බොහෝදුරට ජ්‍යෝතිෂ ශාස්ත්‍ර කරුණුවලට ආවේණික වන අතර, මේ පොදු කරුණු වේ. තමාගේ උපන් ලග්නභාවය හා බලවත් ග්‍රහ පිහිටීම තම ශක්ති ප්‍රමාණ යම් තරමකට හෝ වටහා ගැනීමට මහෝපකාරී වන බව සත්‍ය වේ. ඉතිරි ලග්න සඳහා මෙවැනි විස්තර ඉදිරියේදී පැවසීමට බලාපොරොත්තු වෙමි.



**ජ්‍යෝතිෂ හා වාස්තු ශාස්ත්‍ර උපදේශක උත්තමාචාරයෙන් පිදුම් ලත් ඩබ්.එස් රාජපක්ෂ, ගම්පහ**



# සතිය ඔබට කොහොමද?

**සතිය ඔබට කොහොමද ? (පෙබරවාරි - 01 - සඳුදා සිට 07 ඉරිදා )**

මේ සතියේ ධනය, දේපළ, ඉපැයීම් මාර්ග මෙන්ම උරුම හිමිකම්, අයිතිවාසිකම් හා කිසියම් ලාභ ප්‍රයෝජනාදියක් හිමිවන තම භාග්‍ය සම්පත් උදාවන, එසේම ජීවනෝපාය මාර්ගයන්, රැකියා ව්‍යාපාර යනාදියත් හා තම දෛනික ජීවන ගමනේ බොහෝ අත්‍යවශ්‍ය කාර්යන්හි ප්‍රගතියක්, සාර්ථකත්වයක්, ස්ථාවරභාවයක් සතිය පුරා ගෙනදෙන, ගොඩනගන සතියේ ශුභඵලදායී ලග්න වනුයේ **මේෂ, වෘෂභ, කටක, සිංහ, කන්‍යා, ධනු, මකර** වැනි ලග්නයන්ය.

එබැවින් මෙවැනි ලග්නයකින් උපන් ඔබට මෙම සතිය තුළ සතුට ප්‍රීතිය ඇති වේ. වැඩකටයුතු සාර්ථක වේ. ඥාති මිත්‍රයන් සමගත්, උසස් අය සමගත් ආශ්‍රය ඇති වේ. යම් යම් ලාභ ප්‍රයෝජන ලැබෙන සතියක් වන්නේය. මිල මුදල් හා වෙනත් ද්‍රව්‍යමය ලාභයක් ලැබෙන සතියකි. දෛනික මූල්‍ය අවශ්‍යතාවය සැලසුම් කළ පරිදි සපුරාගත හැකි වන්නේය. රැකියා අංශවල නිරත අයට නොසිතූ වාසිදායක තත්ත්වයක් ඇති වේ. ආයතනය තුළ අමනාපව සිටි අය යළි හිතවත් කර ගැනීමට දැරූ උත්සාහය ඵල දරයි. විදෙස් රැකියාවක් පිළිබඳ අදහස් ඉටුකර ගත හැකි වේ. හවුල් හෝ ස්වයං ව්‍යාපාර කරන ඔබගේ අපේක්ෂිත ව්‍යාපාර ඉලක්ක සපුරාගත හැකි වන්නේය. අධ්‍යාපනය ලබන අයගේ අධ්‍යාපනයට අදාළ සැලසුම් බොහොමයක් ඉටුවන සතියක් වන අතර, ශාස්ත්‍රීය කටයුතුවලට වැඩිපුර යොමුවන්නන්ට ඉන් සාර්ථක ඵල අත්කරගත හැක. යුග දිවියේ හා ප්‍රේම දිවියේ වැඩකටයුතුවල නව මුහුණුවරක් ඇති වීමෙන් සිතට සතුටක් ගෙන දේ. ගෙදරදොර විවාහයට සම්බන්ධ ප්‍රීතිමත් අවස්ථාවකට කටයුතු පිළියෙල වේ.

මේ සතියේ තම අධ්‍යාපන කටයුතු දැනුම කුසලතාවයට සම්බන්ධ සියලු කාර්යන් මෙන්ම ඊට සම්බන්ධ අරමුණු, සැලසුම්, ගමන් බිමන්වලට අදාළ කාර්යන් මෙන්ම තම දෛනික ජීවන ගමනේ බොහෝ අත්‍යවශ්‍ය කාර්යන්ට අවහිර බාධා ප්‍රමාදවීම් ඇති කිරීමට හේතු ගෙනෙන ලග්න වනුයේ **වෘශ්චික, කුම්භ, මීන** වැනි ලග්නයන්ය.

එබැවින් මෙවැනි ලග්නයකින් උපන් ඔබ ඉගෙනීම් කටයුතු වලට ගතවූ දිනවල පැවැති ස්වභාවයට වඩා උනන්දුව, උද්‍යෝයෝගය බෙහෙවින් අඩු වී යයි. ගතවූ සතියට සාපේක්ෂව ඉගෙනීම් කටයුතු වලට තිබූ උද්යෝගය කාර්යශූරත්වය හීන කරයි. ඔබ තුළ පොතපත කියවීමටත්, දැනුම බුද්ධිය වර්ධනය කර ගැනීමටත් ආශාව ඇති වුවත් විනෝදයටද බර වීම නිසා ඉගෙනීම් කටයුතු මගහැරීම්ද සිදුවෙයි. මෙවැනි දෙයට නතු නොවී උනන්දුවෙන් උද්‍යෝගයෙන් ඉගෙනීම් කටයුතුවල නිරත වන්න. මිල මුදල් අතමිට ගැවසුණත් විශේෂයෙන් විනෝදාස්වාදයට හා ගමන්බිමන් වලට වැඩිපුර මුදල් වැය වේ. ආදායම් වියදම් සම තත්ත්වයේ පවත්වා ගැනීමට අසීරු වෙයි. ආදායම් මාර්ග යහපත් වුවද අනවශ්‍ය වියපැහැදම් නිසා යමක් ඉතිරි කර ගැනීමට නොහැකි වේ. ප්‍රමාණයට වඩා තම තත්ත්වය පෙනෙන ලෙස වියදම් කිරීමටත් සිත් දෙන බැවින් ඊට නතු නොවන්න.

මේ සතියේ ආදර සබඳතා හා යුගදිවියේ මෙන්ම ගෘහ ජීවිතයේ කාර්යන්ට අදාළව යම් යම් ප්‍රශ්නකාරී, ගැටලුකාරී ස්වභාවයන් මතුවන, පැනනගින ලග්න වනුයේ **මිථුන, සිංහ, තුලා** වැනි ලග්නයන්ය.


එබැවින් මෙවැනි ලග්නයකින් උපන් ඔබට මෙම සතියේදී නව ආදර සබඳතාවකට හා විවාහ යෝජනාවකට පසුබිම සැකසුණත් කියූ දේ අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වීම හා පොරොන්දුවක් කඩ කිරීම මත ප්‍රේමවන්තයා / ප්‍රේමවන්තිය අමනාප වීමට ඉඩ ඇත. ඔහු හෝ ඇය වෙනුවෙන් යම් යම් ආකාරයේ වියදම්ද යෙදේ. ප්‍රේමවන්තයා හෝ ප්‍රේමවන්තිය දුන් පොරොන්දුවක් පිළිබඳ විටින් විට සිතට සැක සංකා වැනි දෙයක් හට ගනී. සන්නිවේදන මාර්ග ඔස්සේ විරුද්ධ ලිංගිකයා සමග වැඩිපුර සම්බන්ධ වීමට හැකි වන්නේය. පහසුවෙන් විරුද්ධ ලිංගික සබඳතා ගොඩනැගුණත් හැඟීම්වලට මුල්තැන දී ඊට වහල් වී ක්‍රියා නොකරන්න. විටෙක මෙවැනි දෑ හේතුකොට ගෙන තමා ඇසුරු කරන විරුද්ධ ලිංගිකයාගේ විවේචනයට වුව ලක්විය හැක.

**බෙන්තොට-හේමන්ත.**
**www.isiwarajothisa.com**

**ග්‍රහ වස්තු ගෙනෙන අපල උපද්‍රව අතුරින් සෙනසුරු අපල භයානක තත්ත්වයන් ගෙන දෙන බව ඔබ දන්නවා ඇත. සෙනසුරු අපලයක් උදාවීමට පෙර ඒ පිළිබඳව දැනගැනීමට හැකි නම් එය ඔබට ඉන් මිදී ජීවිතය සාර්ථක කරගැනීමට හැකියාව ලැබේ. මේ සෙනසුරු අපල තිබෙනවාදැයි ගෙදරදීම දැනගැනීමට හැකි සරල ක්‍රමවේදයන් සහ ඉන් මිදීමට සිදු කළ හැකි පහසු ක්‍රියා පිළිබඳව කළුතර පයාගල ශ්‍රී රාවණ ජ්‍යෝතිර්වේද සහ වාස්තු සේවාවේ ජ්‍යෝතිර්වේදී කුමාර වෙත්තමුණි මහතා පැවසූ අදහස.**



# සෙනසුරු අපල තිබේ දැයි ගෙදරදීම දැනගන්න



● කැළුම් දේවින්ද

විශ්වය නිර්මාණය වී ඇත්තේ පංච මහා භූතයන්ට අනුවය. (ආපෝ හෙවත් ද්‍රව ගතියද, තේජෝ හෙවත් ඌෂ්ණ ගතියද, වායෝ හෙවත් වායු ගතියද, පඨවි හෙවත් ඝන බව සහ ආකාශ හෙවත් හිස් බව පදනම් කරගෙන) වායෝ හෙවත් වායු බවට අධිපති සෙනසුරු හෙවත් ශනි අලස වූ ගති ඇති, කපිල (රත්රන්) පාට ඇස් ඇති, කෘෂ වූ උස් ශරීර ඇති, මහත් වූ දත් ඇති, විරූප කර්කෂ ලොම් හා හිස කෙස් ඇති, වෘතාධික ශරීර ඇත්තෙකි. එසේ හෙයින් සෙනසුරු ග්‍රහ අපල පිළිබඳව බොහෝදෙනා දක්වන්නේ දැඩි බියක් හා අකමැත්තකි. පෙර ආත්මභවයන්හි කරන ලද කුසල් අකුසල් පිළිබඳවද පුද්ගලයෙකුගේ උත්පත්ති කේන්ද්‍රයේ ඔහු හෝ ඇය මවු කුසින් මෙලොවට බිහි වන මොහොතේම සෙනසුරු ශුභ අශුභභාවය සහ බල දුබල තත්ත්වයන් පිළිබඳවද සෙනසුරුට හිමි වන්නේ විශේෂ ස්ථානයකි.

එමෙන්ම ග්‍රහ අපල පිළිබඳව සාකච්ඡා කිරීමේදී සෙනසුරු හෙවත් ශනිට හිමිවන ප්‍රමුඛස්ථානය සහ ඒ පිළිබඳව දක්වන උනන්දුව අනෙකුත් ග්‍රහයන්ට සාපේක්ෂව වැඩි වේ. ග්‍රහ මණ්ඩලයේ මහල්ලා, මෙහෙකරු, දුකට අධිපති, කර්මයට ඵල දෙන්නා ආදී විවිධ නම්වලින් ප්‍රචලිතය. යම් අයෙකුගේ උත්පත්ති හඳහනේ සෙනසුරු ශුභව පිහිටා තිබීම හෝ බලවත්ම රාශි වශයෙන් හෝ ස්ථාන වශයෙන් සිටීමෙන් ඕනෑම දුක් පීඩා වේදනා දරාගෙන තම අරමුණ හා අපේක්ෂාවන් මත කැපවීමෙන් අතිසාර්ථක ප්‍රතිඵල ළඟා කර ගැනීමට හැකිවනවා සේම සෙනසුරු අශුභව පිහිටීමෙන් ශරීරයේ නහර පද්ධතීන් සහ ස්නායු පද්ධතියට බලපෑම් ඇති වේ. එමෙන්ම ශරීරයට දුක් දෙන දීර්ඝකාලීන රෝගයන්, අනපේක්ෂිත බලවත් ධන හානි, ලෝබකම, කම්මැලිකම, අවිශ්වාසය, බලාපොරොත්තු සුන් වීම, හදිසි අනතුරු, වාත වේදනා, කැක්කුම්, වැටීම් තැළීම්, ඇට බිඳුම්, කොර ගැසීම්, දත් දිරා යාම්, එක්තැන් වීම්, බන්ධනාගාරගත වීම්, නඩුහබවල පැටලීම්, රක්ෂා කටයුතුවලට බාධා ගෙන දීම් වැනි අයහපත් ප්‍රතිඵල ළඟා කර දෙන බව පිළිගත් මතයකි. සමාජය තුළ මහත් වූ බියක් දනවන ග්‍රහයෙකු ලෙස සෙනසුරු හැඳින්වුවත් යම් පුද්ගලයෙකු කුසලයේ කටයුතු කරන්නේ නම් බිය විය යුතු නොවේ. මන්ද අකුසලයේ යෙදෙන අයට අයහපත් ප්‍රතිඵලද, නිරන්තරයෙන්ම කුසල් වඩන පුද්ගලයන්ට කරදරයක් හිරිහැරයක් නොවන්නට වග බලාගන්නා ධර්මයට හිතැති ග්‍රහයෙකු බැවින් යම් අයෙකුට උප්පත්ති කේන්ද්‍රයේ අසුබව පිහිටා තිබුණද ඔහු හෝ ඇයට අපල තත්ත්වයන්ගෙන් මිදී සිටීමට අවස්ථාව ඇත.

එමෙන්ම සෙනසුරුගේ සුබ හෝ අසුබ තත්ත්වයන් ඇතිවීමට අනෙකුත් ග්‍රහයන්ගේ පිහිටීම් අනිවාර්යෙන්ම බලපානවා සේම අපල පිළිබඳව සාකච්ඡා කිරීමේදී සෙනසුරු ඒරාෂ්ටක පිළිබඳවද වැඩි අවධානයක් යොමු කළ යුතුය. ලග්න ඒරාෂ්ටකය යනු සෙනසුරු දොළොස්වැන්නේත්, ලග්නයෙන් දෙවැන්නේත් ගතකරන්නා වූ වසර හතහමාරක කාලයයි. ජන්ම ඒරාෂ්ටකය යනු සෙනසුරු සහ චන්ද්‍රයා එකට සිටියදී උපත ලැබීමයි. එහි කාලය තීරණය වන්නේ ග්‍රහස්ඵුටයේ ගමන් කර ඇති අංශක ගණනත්, ඊට කලින් ගෙවූ වසර තිහත් ජන්මයාට බලපෑමක් නොවන අතර, ජන්ම ඒරාෂ්ටකය වශයෙන් බලපාන්නේ චන්ද්‍රයා සිටින රාශියේ හෙවත් උපත ලබන විට සෙනසුරා සිටින රාශියේ ඉදිරි අංශක ප්‍රමාණයත් සහ ඊළඟ රාශියේ 30 අනුව ගණනය කරන කාලසීමාවය. අෂ්ටම ඒරාෂ්ටකය යනු සෙනසුරු ලග්නයෙන් අටවැන්නට පැමිණීමයි. එම කාලය වසර දෙකහමාරකි.

සෙනසුරු මහ දශා, අතුරු දශා ඇතුළු සෙනසුරුට අයත් කාලයන් තුළ යමෙකුට විනාශයද, තවත් අයෙකුට යසඉසුරු ළඟා කර ගැනීමටද හැකි බව මතක තබාගත යුතුය. එසේම ආධ්‍යාත්මිකව සිත දියුණු කරන භාවනායෝගී පුද්ගලයන්ද, මහා පින් ඇති බුද්ධ පුත්‍රයන් වහන්සේලාද බිහිකිරීමට සෙනසුරුගේ දායකත්වයේ බල දුබල තත්ත්වයන් මත රඳා පවතී.

සෙනසුරුගෙ අපලයක් ඇති බවට ගෙදරදීම සොයා ගැනීමට හැකියාව ඇත. සෙනසුරු අපල තත්ත්වයක් ඇති විට පුද්ගලයෙකුගේ පාදවල විලුඹ, දණහිස, තුනටිය ආශ්‍රිත ප්‍රදේශවල සුළු වේදනා තත්ත්වයන් ඇති වේ. එක දිගටම එම වේදනාව නොමැති අතර විටෙක නහර ඇදුම් කෑම්, හිරිවැටීම් වැනි රෝග ලක්ෂණද උරහිසේ සිට පහළට අත්වල ඇඟිලි දක්වා විටින් විට වේදනාවක් හෝ හිරිවැටීමක් මෙන්ම සුළැඟිල්ල ආශ්‍රිතව ප්‍රදේශයේ දැවිල්ලක් හෝ පිච්චෙන ස්වභාවයක්ද ඇති වේ. එමෙන්ම ඔබගේ ගේදොර, ඉඩකඩම්, යානවාහනවල මෙන්ම ව්‍යාපාරික කටයුතුවල අසාමාන්‍ය ආකාරයේ බිඳවැටීම්ද, රැකියා ස්ථානවල ඇති වන ගැටලුකාරී තත්ත්වයන්ද, අනවශ්‍ය නඩුහබවල පැටලීම්ද, හදිසි අනතුරු යනාදී කරදරද සෙනසුරු අපල පිළිබඳව දැනගැනීමට ඔබට ඉඟි කරයි. ඔබ එය නිසියාකාරව දැන ගැනීම වඩාත් වැදගත් වේ. එවැනි අවස්ථාවල ඔබ පරිපූර්ණ ජ්‍යෝතිර්වේදියෙකුට ඔබේ ජන්ම පත්‍රය ලබා දී පරීක්ෂා කරගැනීමෙන් නිවැරදිව අපල තත්ත්වයන් හඳුනාගත හැක.

එමෙන්ම සෙනසුරු අපල තත්ත්වයක් ඇති බවට ඔබට නිවැරදිම දැන ගැනීමට අතීතයේ සිට ගුරුකුලවලට පමණක් සීමා වී තිබූ විශේෂ රහස් ක්‍රමයක් පිළිබඳව අනාවරණය කිරීමට අපි සිතුවෙමු. නිවසක ආරක්ෂකයා මෙන්ම නිවසේ සුරතලා වන්නේ ආදරණීය බලු රාළය. බල්ලාට සෙනසුරු අපල හඳුනා ගැනීමට හැකියාව පවතින අතරම අපලවලින් ඔබව මුදවා ගැනීමටද බල්ලාට පුදුමාකාර හැකියාවක් ඇත. මන්ද මිනිසාට වඩා සොබාදහමේ ඇති වන ක්‍රියාවන්, වෙනස්වීම් පිළිබඳව බල්ලාට මෙන්ම අනෙකුත් සතා සිවුපාවුන්ටද ඇත්තේ උසස් සන්නිවේදන හැකියාවකි. මිනිසාගේ සිරස සිරස් අතටත් සතුන්ගේ සිරස තිරස් අතටත් පිහිටා තිබීම නිසා සතා සිවුපාවුන්ට විශ්වය තුළ පවතින අදෘශමාන බලවේග වල ක්‍රියාකාරීත්වය ඉතා හොඳින් තේරුම් ගැනීමට හැකිය.

ඔබට සෙනසුරු අපලයක් ඇත්නම් ඔබගේ ආදරණීය සුරතල් බලු රාළ ඔබ ළඟට පැමිණි විගසම ඔබගේ වම් පාදයේ විලුඹ සිට දණහිසේ පහළ කොටස දක්වා ස්පර්ශ කරමින්ද සිප ගනී. බල්ලා එම ලබාදෙන ඉඟිය තේරුම් ගැනීමට ඔබට හැකියාව ඇති නම් සෙනසුරු අපල පිළිබඳව කල්තියා දැනගැනීමටත් හැකිය. විශේෂයෙන්ම ගෙදර ස්වාමියාට මෙන්ම බලු රාළට ආදරය කරුණාව දක්වන අයගේ පමණක් මෙලෙස බල්ලා ඉඟි කිරීම දැකිය හැක. මෙම ක්‍රමවේදය අත්හදා බලා යථාර්ථය තේරුම් ගැනීමට ඔබට හැකිය. එමෙන්ම වෙනත් අසුබ, අදෘශන බලවේගවලින් ඔබට හිරිහැරයක්, කරදරයක් සිදුනොවන්නට ඔබගේ සුරතලා ඔහුගේ ජීවිතය පූජා කර හෝ ඔබව ආරක්ෂා කිරීමට කටයුතු කරන බව ඔබ ඇතැම්විට දන්නවා ඇත.

සෙනසුරු අපලවලදී සතා සිවුපාවුන් ගහකොළ යනාදී සොබාදහමට එරෙහිව ක්‍රියාකරන පුද්ගලයන්ට සෙනසුරු දැඩි සේ දඬුවම් පමුණුවන බවත්, එවැනි පුද්ගලයන්ව නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි ලෙඩරෝග, හදිසි අනතුරු, මාරාන්තික බලපෑම් ගෙන ඒමට සෙනසුරු පසුබට නොවී කටයුතු කරයි. එමෙන්ම එවැනි පුද්ගලයන් හට කරදර පමුණුවන්නේ උස් පහත් කුල භේදයකින් තොරවය. ඒ නිසාම කර්මයට ඵල දෙන්නා යන නාමයෙන් සෙනසුරු හඳුන්වන්නට පැරැන්නෝ අමතක නොකළහ.

එමෙන්ම වතුර, ගහකොළ, ඇළදොළ, ගංගා, පාෂාණ මෙන්ම ස්වාභාවික වස්තූන් උපයෝගී කර ගනිමන් සෙනසුරු අපල මෙන්ම ග්‍රහ අපලවලින් මිදෙන්නට සෘෂිවරු, මුණිවරු සඳහන් කළ ක්‍රමවේද ඇතත්, කාලයාගේ ඇවෑමෙන් බොහෝ ස්වාභාවික පිළිවෙත් අද වනවිට සැඟව ගොස් ඇත. සෙනසුරු අපලයට ශනි මෘතුංජය, නීල මණ්ඩලය, අඝෝරය වැනි යන්ත්‍ර පිළිබඳව බොහෝ පිරිස් අවධානයට යොමු කළත්, කාර්යබහුල දිවි පෙවෙතක් ගතකරන වර්තාමනය වන විට නැකැත් ක්‍රමවේද ඇතුළු යන්ත්‍ර බලගන්වන්නට අවශ්‍ය ක්‍රියාකාරකම් නිවැරදිව කිරීමට ගතවන කාලය පිළිබඳව ගැටලුවක් පවතී. සෙනසුරු අපලවනලින් මිදෙන්නට ඔබගේ නිවසේ සිටින බලුරාළට ආදරය කරුණාව දක්වමින් සහ පෝෂණය කිරීමද, සෙනසුරාදා දින 03ක් හිරු නැගෙන්නට පෙර ගිතෙල් මිශ්‍රකර කිරිබතක් සකසා කපුටන්ට දානයක් දීම, මහාමාර්ගවල අතරමං වී සිටින සුනඛයන් සඳහා සෙනසුරාදා දින තුනක් දානයක් ලබාදීම, සෙනසුරා දින 09ක් හෝ 19ක් බුද්ධ වන්දනාවක්, බෝධි වන්දනාවක නිරත වීම, මහලු හෝ තරමක කුදු හෝ හැරමිටියක් භාවිත කරන යාචකයෙකු සඳහා ආහාරපාන ලබා දී කළු මිශ්‍ර වස්ත්‍රාභරණයක් පිළිගැන්වීමද, කාක නිල් පාෂාණය සහිත මුදුවක් පැලඳීම, පුරපසළොස්වක පොහෝ දිනට දින නවයකට පෙර සිට හිමිදිරියේ බ්‍රහ්ම මූර්තියෙන් බුද්ධ වන්දනාව, බෝධි වන්දනාව, නවග්‍රහ ශාන්තිය ඇතුළු සෙත් පිරිත් සජ්ඣායනය තුළින් අනතුරුව සෙනසුරු අපලයන්ගෙන් මිදීමට හැකිය. එහිදී

ඉහත ක්‍රියාවන් සිදුකර අවසානයේ පහත ශ්ලෝකය සජ්ඣායනය කර සෙනසුරු දෙවියන්ගෙන් අපල දුරු කරන ලෙස ඉල්ලා සිටින්න.

**සූර්ය පුත්‍රෝදීර්ඝ දෙහො - විශාලාකෂ්‍යං ශිවප්‍රියඃ**
**දීර්ඝචාරඃ ප්‍රයන්තත්වා - පීඩං හරතු මේ ශනිඃ**

> **සෙනසුරුගෙ අපලයක් ඇති බවට ගෙදරදීම සොයා ගැනීමට හැකියාව ඇත. සෙනසුරු අපල තත්ත්වයක් ඇති විට පුද්ගලයෙකුගේ පාදවල විලුඹ, දණහිස, තුනටිය ආශ්‍රිත ප්‍රදේශවල සුළු වේදනා තත්ත්වයන් ඇති වේ. එක දිගටම එම වේදනාව නොමැති අතර විටෙක නහර ඇදුම් කෑම්, හිරිවැටීම් වැනි රෝග ලක්ෂණද උරහිසේ සිට පහළට අත්වල ඇඟිලි දක්වා විටින් විට වේදනාවක් හෝ හිරිවැටීමක් මෙන්ම සුළැඟිල්ල ආශ්‍රිතව ප්‍රදේශයේ දැවිල්ලක් හෝ පිච්චෙන ස්වභාවයක්ද ඇති වේ.**

# "එන්නත් ජාතිකවාදයක්" ගැන WHO ප්‍රධානියාගෙන් අනතුරු ඇඟවීමක්

ලොව පුරා ක්‍රියාත්මක COVID-19 වෛරසයට එරෙහි එන්නත්කරණ ක්‍රියාවලියේදී "එන්නත්කරණ ජාතිකවාදයක්" පිළිබඳව තමන්ට වාර්තා වන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අධ්‍යක්ෂ ජනරාල් ටෙඩ්‍රොස් අදානොම් ගෙබ්‍රෙයේසුස් යළිත් වරක් අවධාරණය කරයි. ඒ අනුව මේ තත්ත්වයත් සමග මෙම එන්නත් වැඩසටහන් දැවැන්ත විෂමතාවක් බවට පත්වීමේ අවස්ථාවක් පවතින බවත් ඔහු සඳහන් කරයි.

ඒ අනුව මෙම වසංගත තත්ත්වයත් සමග ලොව පුරා පවතින මෙම උපයෝජනයේ විෂමතාව පිළිබඳ අනාවරණය කෙරුණු බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසා සිටියි. එහිදී ලෝකයේ පොහොසත් රටවල් සහ දුප්පත් රටවල් අතර මෙම වසංගතය පිටුදැකීමේ කටයුත්තේ වඩා වැඩි පරතරයක් ඇති වීම එහි ප්‍රතිඵලය බවද ඔහු පෙන්වා දෙයි.

"මේ වසංගතය මර්දනය සඳහා දායක කරගත හැකි හොඳම උපාංගය වන මෙම එන්නත් එක සමානව බෙදී නොයෑම අද වනවිට දරුණුම තර්ජනය බවට පත්වෙලා." ඔහු පවසයි.

මෙහිදී 2009 වසරේ ලොව පුරා ව්‍යාප්ත වූ H1N1 වසංගත අවස්ථාවේදී එය පාලනය සඳහා ඉදිරිපත් කළ එන්නත් සියලු දෙනාටම ලබාගත හැකි වූ බවත්, ඒ හරහා වසංගතය නිමාවට පත් කෙරුණු බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා සිහිපත් කර දෙයි.


එහෙත් අද තත්ත්වය වෙනස් බවත් පොහොසත් රටවල් මේ වනවිට සිය රටවල් තුළ එන්නත්කරණය අරඹා තිබෙද්දී, දුප්පත් රටවලට එම එන්නත් වැඩසටහන් ඇරඹීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කරයි. ඒ අනුව මෙම රටවලට එන්නත් නොලැබීම යනු වසංගත තවත් කාලයකට



ලොව තුළ පැවතීම බවද ඔහු පෙන්වා දෙයි.

ඒ අනුව මෙම තත්ත්වයට පිළියමක් ලෙස එන්නත්කරණයේදී පසුපසට තල්ලු වන දුප්පත් රාජ්‍යයන් වෙත සහාය දීමක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් COVAX වැඩසටහන දියත් කර තිබේ. ඒ හරහා සෑම සියලු දෙනාටම අවශ්‍ය එන්නත් ලබාගැනීම වෙනුවෙන් අරමුදල් සැපයීම එහි අරමුණ වී ඇතැයිද ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩිදුරටත් සඳහන් කර තිබේ.

## COVID-19 ආසාදිතයෝ ලක්ෂ 1026 ඉක්මවති



ලොව පුරා වාර්තා වන COVID-19 ආසාදිතයෝ සංඛ්‍යාව ඊයේ සවස 7.00 වන විට 102,667,800ක් දක්වා ඉහළ නැග තිබෙන බව එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ නව කොරෝනා තොරතුරු මධ්‍යස්ථානය මගින් සඳහන් කෙරිණි. ඒ අතරින් වැඩිම ආසාදිතයන් පිරිස එක්සත් ජනපදයෙන් වාර්තා වන අතර එය 26,076,028 කි. එසේම දෙවැනි වැඩිම ආසාදියන් වාර්තා වන ඉන්දියාවේ එම සංඛ්‍යාව 10,746,174 කි. බ්‍රසීලයෙන් වාර්තා වන සංඛ්‍යාව 9,179,975 කි. රුසියාවෙන් සහ එක්සත් රාජධානියෙන් වාර්තා ආසාදිතයන් සංඛ්‍යාව 3,808,348ක් සහ 3,806,993ක් දක්වා ඉහළ නැග ඇත.

## යුරෝපයේ සිට පැමිණෙන සංචාරකයන්ට ඉරානයෙන් දැඩි සීමාවක්



යුරෝපා රාජ්‍යයන්හි සිට ඉරානය වෙත පැමිණෙන සංචාරකයන් එරට තුළ සිදුකරන PCR පරීක්ෂාවකදී COVID-19 වෛරසය ආසාදිත නොවන බවට සනාථ කෙරුණත් ඔවුන් වෙත සති දෙකක නිරෝධායන සීමාවක් පැනවීමට තීරණය කෙරී ඇතැයි එරට ජාතික කොරෝනා වෛරස කාර්ය සාධක බළකාය පවසයි.

එහි ප්‍රකාශක අලිරෙසා රායිසි එරට රාජ්‍ය රූපවාහිනිය හරහා මේ පිළිබඳව අනාවරණය කර තිබේ. ඒ අනුව එම යුරෝපා ජාතිකයන් තමන් පැමිණෙන රටෙහිදී COVID-19 පරීක්ෂාවක් සිදු කරගෙන එහි සෘණාත්මක වාර්තාවක් රැගෙන ආවද, ඉරානය තුළදීද නැවතත් පරීක්ෂාවක් සිදුකර එයද සෘණාත්මක වුවත්, ඔවුන් සියලු දෙනාම මෙලෙස ස්වයං නිරෝධායනයකට ලක්කරන බව ඔහු පවසා ඇත.

මේ අතර ඉරාන ජනතාව දැනට රට තුළ ක්‍රියාත්මක සෞඛ්‍ය ක්‍රමවේද ආරක්ෂා කිරීම අනිවාර්ය බවත්, එසේ නොවුණහොත් ඉදිරි මාස දෙක ඇතුළතදී යළිත් වරකට රට තුළ වසංගත රැල්ලක් ඇතිවීමේ හැකියාවක් පවතින බවත් එරට ජනාධිපති හස්සන් රොයුහානි පැවසූ බවද ඉරාන මාධ්‍ය සඳහන් කරයි. එසේම මේ වනවිටත් ඉරානය එරට තුළ COVID-19 මර්දන එන්නතක් නිපදවීමට කටයුතු අරඹා ඇතැයිද ඔහු පවසා තිබේ.

## ප්‍රංශය තුළ තෙවැනි ලොක්ඩවුන් කිරීමක් නෑ

◄ FRANCE ►

ප්‍රංශය තුළ වාර්තා වන COVID-19 වසංගතයේ තෙවැනි ව්‍යාප්තිය හේතුවෙන් ඉදිරියේදී රට තුළ තෙවැනි ලොක්ඩවුන් කිරීමක් සිදු නොකරන බව එරට බලධාරීන් පවසයි. ඒ වෙනුවට රට තුළ දැඩි සංචරණ සීමා පනවන බවත්, දැනට රට පුරා ක්‍රියාත්මක සවස 6.00 සිට අලුයම 6.00 දක්වා වූ ඇඳිරි නීතිය එලෙසින්ම වන බවත් සඳහන් වෙයි.

ප්‍රංශ අගමැති ජීන් කැස්ටෙක්ස් පසුගිය සතිඅන්තයේදී මේ පිළිබඳව අනාවරණය කර තිබේ. ජනපති එමානුවෙල් මක්රෝන් සහ ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් අතර පැවැත් වූ හමුවකින් අනතුරුව ප්‍රංශ රජය මෙම තීරණය ගෙන තිබේ.

"අපි දන්නවා මේ තත්ත්වය ප්‍රංශ ජනතාවට ඉතාමත් දැඩි ලෙස බලපා තිබෙනවා. ඒ නිසා තෙවැනි ලොක්ඩවුන් තත්ත්වයකට රට පත් නොකිරීමට අප තීරණය කර තිබෙනවා. එහිදී දැනට පවතින ඇඳිරි නීතියට අමතරව තවත් අමතර සීමා කිරීම් පැනවීමට අපි තීරණය කළා." යනුවෙන් ඔහු පවසා ඇත.

ඒ අනුව යුරෝපා සංගමයට අයත් නොවන රාජ්‍යයන් හා ප්‍රංශය අතර පවතින දේශසීමා අත්‍යවශ්‍ය සංචරණයන්ට හැර අනෙක් අවස්ථාවකදී වසා දැමීමටත්, යුරෝපා සංගමයද ඇතුළුව විදෙස් රටක සිට ප්‍රංශය වෙත පැමිණෙන අයෙකු සෘණාත්මක





PCR පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කිරීමත් අනිවාර්ය කෙරී ඇත. එසේම පාසල් තවදුරටත් විවෘතව තැබීමටත්, හැකි සෑම දෙනාටම නිවෙස්හි සිට රාජකාරි කරන ලෙසත් අගමැතිවරයා ඉල්ලා තිබේ.

◄ ALGERIA ►

## ඇල්ජීරියාවත් COVID-19 එන්නත්කරණය අරඹයි



අප්‍රිකානු මහාද්වීපයේ පිහිටි ඇල්ජීරියාව පසුගිය සෙනසුරාදා (30දා) දිනයේදී සිය COVID-19 එන්නත්කරණය ඇරඹූ බව විදෙස් මාධ්‍ය පවසයි. එරට ඇල්ජයර්ස් අගනුවර බ්ලිඩා නගරයේදී මෙම කටයුතු සිදුව තිබේ. මෙම නගරය 2020 වසර මුලදී එරට තුළ ප්‍රථම වරට COVID-19 රෝගියෙකු හමුවූ පළමු වැනි ස්ථානය ලෙසින්ද සැලකෙයි.

රුසියාවේ ගැමෙලියා ආයතනය මගින් නිපදවූ SputnikV එන්නත මෙලෙස ජනතාව වෙත ලබා දී තිබේ. මෙම වැඩසටහන යටතේ පළමුවෙන්ම සෞඛ්‍ය අංශ සේවකයන් වෙත, වැඩිහිටියන් වෙත මෙන්ම අවදානමට ලක්ව සිටින පිරිස් වෙත මුල්ම එන්නත් ලබාදෙන බව රජය පවසයි.

ඇල්ජීරියානු රජය මගින් දැනටමත් බ්‍රිතාන්‍යයේ AstraZeneca සමාගම මගින් සහ චීනයේ Sinopharm සමාගම මගින් නිපදවා ඇති එන්නතක්ද ඇණවුම් කර කර ඇතැයි සඳහන් වෙයි. ඒ අනුව ඉදිරියේදී මෙම එන්නත්කරණ වැඩසටහන තවදුරත් පුළුල් කිරීම අපේක්ෂාව බව එරට සෞඛ්‍ය අමාත්‍යවරයා සඳහන් කර සිටියි.

## COVID-19 වසංගතය හේතුවෙන් එමීරය විදේශිකයන්ට පුරවැසිභාවය දීමට යයි




◄ UAE ►

එක්සත් අරාබි එමීරයේ වෙසෙන විදේශිකයන් කිහිපදෙනෙකු වෙත පුරවැසිභාවය පිරිනැමීම එරට බලධාරීන් තීරණය කර ඇතැයි වාර්තා වෙයි. COVID-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්ව ඇති එරට ආර්ථිකය වෙත ලබාදෙන සහන යටතේ මෙම පුරවැසිභාවය ලබාදෙන බව වාර්තා වෙයි.

ඒ අනුව මේ පිළිබඳව නිවේදනයක් නිකුත් කළ ඩුබායි නුවර පාලකයා වන ෂෙයික් මොහොමඩ් බින් රෂීඩ් අල් මක්ටොයුම්, "ආයෝජකයන්, විශේෂඥ කුසලතා ඇති පිරිස් මෙන්ම විද්‍යාඥයන්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, කලාකරුවන්, ග්‍රන්ථ කර්තෘවරුන් ඇතුළු වෘත්තීන්හි නිරත වන පිරිස් වෙත සහ ඔවුන්ගේ පවුල් වෙත මෙම නව ක්‍රමවේදය හරහා එක්සත් අරාබි එමීරය තුළ පුරවැසිභාවය හිමි කරගත හැකියි." යනුවෙන් පවසා ඇත.

ඒ අනුව එක්සත් අරාබි එමීරයට අයත් එමීර හතෙන් එම පුරවැසිභාවය ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සහිත පුද්ගලයන් නම් කෙරනු ඇති බවත්, එලෙස පුරවැසිභාවය හිමි වන පුද්ගලයන්ට තමන්ගේ මුල් පුරවැසිභාවය තවදුරටත් පවත්වාගෙන යා හැකි බවත් ෂෙයික් මොහොමඩ් සිය ට්විටර් ගිණුම තුළ සඳහන් කර ඇත.

කෙසේ වෙතත් එක්සත් අරාබි එමීරය COVID-19 වසංගතය බවට සඳහන් කරමින් ගෙන ඇති මෙම තීරණය පිටුපස බොහෝ අරමුණු තිබෙන බව විචාරකයෝ පවසති. අද වනවිට එක්සත් අරාබි එමීරයේ ජනගහනයෙන් එරට පුරවැසියන්ගේ නියෝජනය සුළු වන අතර, එරට පැමිණ සිටින සංක්‍රමණික කම්කරුවන්ගේ සංඛ්‍යාව ඊට වඩා වැඩිය. එසේම එරට තුළ ක්‍රියාත්මක අඩු බදු ක්‍රමවේදය සහ සුඛෝපභෝගී දැවැන්ත ව්‍යාපෘති නිසාද එරට වෙත සංචාරක ආකර්ෂණය ඉහළ යමින් පවතී.

## Hualong One තාක්ෂණය යොදා ඉදිකළ චීනයේ ප්‍රථම න්‍යෂ්ටික විදුලි බලාගාරය මෙහෙයුම් අරඹයි

- ලොව තෙවැනි පරම්පරාවේ න්‍යෂ්ටික විදුලි බලාගාර තාක්ෂණයක් භාවිත කරන සිවුවැනි රට චීනය වෙයි

◄ CHINA ►



චීනය තුළ නිපදවන ලද තෙවැනි පරම්පරාවේ න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක මාදිලියක් වන Hualong One තාක්ෂණය යොදා ගනිමින් ඉදිකළ එරට පළමු වැනි න්‍යෂ්ටික විදුලි බලාගාරය පසුගිය සෙනසුරාදා (30දා) දිනයේදී සිය වාණිජ මෙහෙයුම් ඇරඹූ බව චීනයේ ජාතික න්‍යෂ්ටික සංස්ථාව පවසයි.

චීනයේ ගිනිකොණදිග පිහිටි ෆුජිආන් පළාතේ ෆුකින්ග්හි මෙම න්‍යෂ්ටික බලාගාරය පිහිටුවා තිබේ. චීන මාධ්‍ය සඳහන් කරන ආකාරයට එක්සත් ජනපදය, ප්‍රංශය සහ රුසියාවට පසුව මෙලෙස තෙවැනි පරම්පරාවේ න්‍යෂ්ටික විදුලි බලගාර තාක්ෂණයක් භාවිත කරන සිවුවැනි රට බවටද චීනය පත්ව තිබේ.

මෙම Hualong One තාක්ෂණය චීනයේ ජාතික න්‍යෂ්ටික සංස්ථාව සහ චීනයේ ජෙනරල් නියුක්ලියර් පවර් කෝපරේෂන් යන සමාගම් එක්ව ඉදිරිපත් කර වූවකි. එහිදී මෙම බලාගාරයට අවශ්‍ය උපාංගවලින් 88%ක්ම දේශීයව නිපදවා තිබේ. සියලුම මූලික උපාංගද ඒ අතර වන බව පැවසෙයි.

මෙම න්‍යෂ්ටික බලාගාරය තවත් වසර 60ක ආයු කාලයක් සඳහා නිර්මාණය කර තිබේ. එහිදී නැවතත් න්‍යෂ්ටික ඉන්ධන යොදවන තෙක් එහි පිහිටි ප්‍රතික්‍රියාකාර 177ක් තවත් මාස 18ක කාලයක් නොකඩවා ක්‍රියාත්මක වෙයි. මෙම එක් ඒකකයක් තුළ කිලෝවොට් මිලියන 1.16ක උත්පාදන ධාරිතාවක් පවතින අතර, එය වසරකට කිලෝවොට් පැය බිලියන 10ක විදුලියකි.



මෙම විදුලිබලය මිලියනයක ජනතාවක් වෙසෙන මැදි මට්ටමේ සංවර්ධිත රාජ්‍යයක වාර්ෂික විදුලි බල අවශ්‍යතාව සම්පූර්ණ කරවන්නකි. එසේම මෙම බලාගාරය හරහා වාර්ෂිකව ගල්අඟුරු ටොන් මිලියන 3.12ක් ආරක්ෂා කරන බවත්, ඒ හරහා වසරකට කාබන්ඩයොක්සයිඩ් පිටවීම ටොන් මිලියන 8.16කින් අඩු කරවන බවත් පැවසෙයි.

## අභ්‍යවකාශයේදී ප්‍රථම පැළ බද්ධය සිදු කරයි

අභ්‍යවකාශයේදී ප්‍රථම පැළ බද්ධය සිදු කරමින් ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ එළවළු නිෂ්පාදන පද්ධති පරිශ්‍රය තුළදී පළමු වැනි වරට පැළයක් බද්ධ කිරීමක් සිදු කළ බව නාසා ආයතනය පවසයි. එම මධ්‍යස්ථානයට ගොස් සිටිනි නාසාහි ගගනගාමී මයික් හොප්කින්ස් විසින් මෙම පැළ බද්ධය සිදුකර තිබේ. එහිදී අබ සහ සලාද ගස් වර්ග කිහිපයක් මෙලෙස බද්ධ කිරීමට ලක්කර ඇත.

විශේෂයෙන්ම නාසා ආයතනය මගින් ඉදිරියේදී සිදුකිරීමට සැලසුම් කර ඇති දිගුකාලීන මෙහෙයුම්වලදී ඒ සඳහා සම්බන්ධ වන ගගනගාමීන් වෙනුවෙන් අවශ්‍ය පෝෂණය ලබාදීම වෙනුවෙන් මෙලෙස අභ්‍යවකාශය තුළ වගා කිරීම පිළිබඳව පර්යේෂණ සිදුකරමින් සිටියි.

මෙහිදී මැටි පාදක කරගත් වගා මාධ්‍යයක් සහ පොහොර එක්කොට සකස් කරගත් විශේෂිත පිරවුමක් තුළ මෙම පැළ වගා කිරීම සිදු කරයි. එහිදී අබ පැළ ඉතා හොඳින් වැඩෙමින් ඇති අතර, සලාද පැළවල වර්ධනය යම් පමණකින් මන්දගාමී බවට ගගනගාමී මයික් හොප්කින්ස් හඳුනාගෙන ඇත. ඒ අනුව මෙලෙස වර්ධනය බාල වූ සලාද ගස් වෙත තවත් රිකිලි බද්ධ කරමින් ඒවායේ වර්ධනය වේගවත් කිරීමට හැකියාව ලැබුණු බව හොප්කින්ස් සඳහන් කරයි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මෙම වැඩසටහනේ වගා විද්‍යාඥයෙකු වන ගිඕයිආ මාසා, "මෙම අත්හදා බැලීම ඉතාමත් සුවිශේෂයි. එය මගින් ගගනගාමීන්ගේ දක්ෂතාව පෙන්නුම් කරනවා. ඒ වගේම යමක් සිදු කිරීමේදී ඔවුන්ගේ කැපවීම ඉන් දක්වනවා. ඒ වගේම ක්ෂුද්‍ර ගුරුත්වයකදී පවතින වෙනසත් මෙහිදී දැකගත හැකියි." යනුවෙන් පවසයි.



ඒ අනුව මෙම සාර්ථකත්වයත් සමග ඉදිරියේදී පෘථිවිය මතටත් වඩා හොඳින් මෙම ක්ෂුද්‍ර ගුරුත්වය තුළදී පැළෑටි වර්ධනය සඳහා අවස්ථාවක් උදා කරදෙනු ඇතැයි බලාපොරොත්තු තබා තිබෙන බවද මෙම පර්යේෂණ කණ්ඩායම් සඳහන් කරයි.

## "බ්ලැක් ලයිව්ස් මැටර්" නොබෙල් සාම ත්‍යාගයට යෝජනා වෙයි




ඇමෙරිකා එක්සත් ජනපදය තුළ කළු ජාතිකයන්ට එරෙහිව එල්ල වන පීඩා කිරීම්වලට විරුද්ධත්වය ප්‍රකාශ කිරීම සඳහා 2013 වසරේදී පිහිටවුණු 'බ්ලැක් ලයිව්ස් මැටර්' නම් සංවිධානය මීළඟ නොබෙල් සාම ත්‍යාගය සඳහා යෝජනා කෙරී ඇතැයි වාර්තා වෙයි.

පසුගිය වසරේ මැයි මාසයේදී එක්සත් ජනපදයේ පොලිස් නිලධාරියෙකු අතින් සිදුවුණු ජෝර්ජ් ෆ්ලොයිඩ් නම් කළු ජාතිකයාගේ ඝාතනයත් සමග මෙම සංවිධානය පිළිබඳ කතාබහ වැඩිවිය. එහිදී එම සංවිධානයේ මූලිකත්වයෙන් එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍ය ඇතුළු යුරෝපා රාජ්‍යයන්හිදීද දැවැන්ත උද්ඝෝෂණ ක්‍රියාත්මක විය. එම තත්ත්වයත් සමග ලොව තුළ වර්ගවාදී අසාධාරණයන්ට එරෙහි ගෝලීය ව්‍යාපාරයක් තත්ත්වයට පත්වීමට එම සංවිධානයට හැකියාව ලැබී ඇතැයි පැවසෙයි.

## මාස 8කට පසුව තායිවානයෙන් COVID-19 මරණයක්



2020 වසරේ මැයි මාසයෙන් පසුව ප්‍රථම වරට තායිවානයෙන් COVID-19 මරණයක් වාර්තා වී තිබෙන බව එරට සෞඛ්‍ය බලධාරීන් සඳහන් කරයි. මෙහිදී මරණයට පත්ව ඇති තැනැත්තා 80 හැවිරිදි කාන්තාවක බව හඳුනාගෙන ඇත. දේශීය ව්‍යාප්ත වූ COVID-19 පොකුරක ආශ්‍රිතයෙකු වන මෙම කාන්තාව COVID-19 ආසාදිත බවට හඳුනාගැනීමෙන් අනතුරුව රෝහල්ගත කර තිබේ.

පසුගිය මාසයේදී වාර්තා වූ මෙම ආසන්නතම වසංගත ව්‍යාප්තියත් සමග මේ දක්වා එරට තුළ රෝගීන් 19දෙනෙකු හඳුනාගෙන ඇත. මීට අමතරව විදේශයන්හි සිට පැමිණි 909දෙනෙකු තුළත් වෛරසය ඇති බවට සනාථ වී තිබේ. පසුගියදා සිදුවුණු මෙම මරණයත් සමග මේ දක්වා එරට තුළ සිදුව ඇති COVID-19 මරණ සංඛ්‍යාව 8ක් දක්වා ඉහළ නැග තිබේ.

## කැපිටල් හිල් උද්ඝෝෂණයට ට්‍රම්ප් හිතවාදිනියක් මුදල් දීලා



ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් අගනුවර කැපිටල් හිල් ගොඩනැගිල්ල තුළ පසුගිය ජනවාරි 06දා ඇති වූ ප්‍රචණ්ඩකාරී උද්ඝෝෂණය සඳහා එවකට ජනපතිවරයාව සිටි ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ආධාරකාරිනියක මුදල් ලබාදී ඇතැයි වාර්තා වෙයි.

ඒ අනුව එරට තුළ සුප්‍රසිද්ධ සුපිරි වෙළෙඳ සැල් ජාලයක් වන Publix හි හිමිකාරිනිය වන ජූලි ජෙන්කින්ස් විසින් මෙම උද්ඝෝෂණය පැවැත්වීම සඳහා ඩොලර් ලක්ෂ 3ක මුදලක් ප්‍රදානය කර ඇතැයි පැවසෙයි. ඇය ට්‍රම්ප්ගේ 2020 ජනපතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයේ මුල් පෙළේ දායිකාවක ලෙසින්ද හඳුනාගෙන ඇත.

එක්සත් ජනපද ඉතිහාසයේ වඩාත් දරුණුතම කළු පැල්ලමක් සටහන් වූ මෙම සිදුවීම අවස්ථාවේදී එක් පොලිස් නිලධාරියෙකු ඇතුළු පස්දෙනෙකු මරණයට පත්වූ අතර, තවත් 135දෙනෙකු පොලිස් අත්අඩංගුට පත්විය. එම අවස්ථාවේදී එරටට තේරීපත්ව සිටි ජනපති ජෝ බයිඩන්ගේ ජයග්‍රහණය ස්ථිර කරවීම සඳහා කැපිටල් හිල් ගොඩනැගිල්ලේ පැවැත්වෙමින් තිබූ ඡන්දය කඩාකප්පල් කිරීම මෙහි අරමුණ විය. මේ සඳහා සිය රිපබ්ලිකන් පක්ෂ ආධාරකරුවන් උසි ගැන්වූ බවට ට්‍රම්ප්ට චෝදනා එල්ල වී තිබේ.

# ක්‍රිකට් නිලවරණයේදී පාසල් ක්‍රිකට් සංගමයටත් ඡන්ද අයිතිය හිමිවන ලකුණු

● පැතුම් ශ්‍රී විජේරත්න

මෙම වසරේ පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය සඳහා මෙතෙක් ඡන්ද අයිතිය අහිමි කර තිබූ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයටද ඡන්ද අයිතිය හිමිවන ලකුණු පහළ වී තිබේ.

මේ බව නිරීක්ෂණය වූයේ නිලවරණ මෙහෙය වන විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු මාලිනී ගුණරත්න මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණ කමිටුව අදාළ ඡන්ද හිමි ක්‍රීඩා සමාජ ශ්‍රී ලංකා ක්‍රිකට් සාමාජික සංගම් වෙත යොමු කිරීමත් සමගිනි.

නිලවරණයේ ඡන්ද හිමි නාමලේඛනයට විරෝධතා දැක්වීමේ කාලය අද (01දා) පස්වරු 4.00ට අවසන් වන අතර, එම විරෝධතා ලිඛිතව සකස් කර නො. 35, මෙට්ලන්ඩ් පෙදෙස, කොළඹ-07 යන ලිපිනයට ගෙනවිත් භාරදීමට හෝ slcelection2021@srilankacricket.lk යන විද්‍යුත් ලිපිනයට ඊමේල් කිරීමේ හැකියාව පවතින බව නිලවරණ කමිටුව සාමාජික සංගම්වලට දන්වා තිබේ.

මෙවර නිලවරණය සඳහා සමස්ත ඡන්ද 146ක් පවතින අතර ඉන් 02ක් ඉවත් කර තිබේ. ඒ අනුව මෙවර නිලවරණය සඳහා සමස්ත ඡන්ද 144ක් ඡන්දය භාවිත කිරීමට නියමිතය. ඊට පළාත් ක්‍රිකට් සංගම් 05ක් (දකුණු පළාත් ක්‍රිකට් සංගමය ඊට ඇතුළත් කර ඇතත් දැනට ඡන්ද හිමිකම නොමැත යනුවෙන් දක්වා තිබේ), ක්‍රිකට් සංගම් (Cricket Associations) 06ක් දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් 22ක්, පාලන ක්‍රීඩා සමාජ 29ක්, අනුබද්ධ ක්‍රීඩා සමාජ 23ක් (කළුතර කායවර්ධන කවය ඊට ඇතුළත් කර ඇතත් දැනට ඡන්ද හිමිකම නොමැත යනුවෙන් දක්වා තිබේ) සුදුසුකම් ලබා තිබේ.

මෙහිදී පළාත් ක්‍රිකට් සංගම්, ක්‍රිකට් සංගම්, දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් සහ පාලන ක්‍රීඩා සමාජ සඳහා ඡන්ද 02 බැගින්ද, අනුබද්ධ ක්‍රීඩා සමාජ සඳහා එක් ඡන්දය බැගින්ද සුදුසුකම් ලබාදී ඇත.

දකුණු පළාත් ක්‍රිකට් සංගමයට සහ කළුතර කායවර්ධන කවය ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කර ඇතත් දැනට ඡන්ද හිමිකම නොමැත යනුවෙන් දක්වා තිබේ.

මේ අතර 2016 වසරේ සිට පාසල් ක්‍රිකට් සංගමයට ඡන්ද හිමිකම අහිමි කරමින් ක්‍රිකට් විධායක කමිටුවේ ස්ථිර එක් උපසභාපති තනතුරක් නිතරගයෙන් ලබාදීමට ව්‍යවස්ථා සංශෝධනයක් සහ ක්‍රීඩා පනතට රෙගුලාසි ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත් හිටපු ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා යොමු කළ අදාළ ගැසට් පත්‍රයට අනුව පාසල් ක්‍රිකට් සංගමයට මෙවර නිලවරණය සඳහා ඡන්ද හිමිකම හිමිවන ලකුණු පහළ වී තිබේ.

2016 වසරේ සිට මෙතෙක් සියලුම ක්‍රීඩා සංගම් (ක්‍රිකට් ඇතුළුව) තම විධායක කමිටුවේ ස්ථිර එක් උපසභාපති තනතුරක් නිතරගයෙන් ලබාදී නිලවරණයේදී ඡන්ද හිමිකම අහිමි කර තිබුණි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පසුගිය නිලවරණයේදීද (2019 වසරේ පැවැති) මෙය දැකගත හැකි විය.

හිටපු ක්‍රීඩා අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා යොමු කළ අදාළ ගැසට් පත්‍රයේ සඳහන් වනුයේ,

(අ)(i) වැනි අයිතමය ඉවත් කර පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

(i) සභාපතිවරයා සහ උපසභාපතිවරයන්, උපසභාපතිවරයන්ගෙන් එක් තැනැත්තකු, කමිටු රැස්වීම්වලදී ඡන්ද අයිතිය භාවිත කිරීමට අයිතිය නොමැති, අදාළ පාසල් සංගම්වල නියෝජිතයකු විය යුතුය' යන්නයි.

කෙසේ වෙතත් මෙහි කමිටු රැස්වීම් යන්න ක්‍රිකට් විධායක කමිටුවේ ඡන්ද අයිතිය බවත් මහසභා රැස්වීමේ ඡන්ද අයිතිය නොවන බවත් පාසල් ක්‍රිකට් සංගමයේ නිලධාරියෙකු 'අද'ට පැවසීය. එහෙයින් ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයට මෙවර ක්‍රිකට් නිලවරණයේදී ඡන්ද 02ක් අනිවාර්යෙන් හිමිවිය යුතු බව හෙතෙම දැඩිව අවධාරණය කර සිටියේය.

මේ අනුව බොහෝදුරට මෙවර ක්‍රිකට් නිලවරණය සඳහා ඡන්ද අයිතිය හිමිවනු ඇතැයි පාසල් ක්‍රිකට් සංගමය තර්ක කරයි.

එහෙත් මෙහි අවසාන තීන්දුව ගැනීමට බොහෝවිට මෙම කරුණ ක්‍රීඩා අමාත්‍යවරයා දක්වා දිග්ගැස්සෙනු ඇතැයි වාර්තා වේ.

බර ඉසිලීමේ සුපිරි සංචිතයේ දක්ෂතා ඇගයීමේ තරගාවලිය

# ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 07ක් ශ්‍රී ලංකා වාර්තා 17ක් අලුත් කරයි

● සංජීව ධර්මසේන



ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය මගින් සංවිධානය කරනු ලැබූ බර ඉසිලීමේ සුපිරි සංචිතයේ දක්ෂතා ඇගයීමේ තරගාවලියේදී ශ්‍රී ලංකා වාර්තා 17ක් අලුත් කිරීමට ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 07 දෙනෙක් සමත් වූහ. මෙම තරගාවලිය පොළොන්නරුව, ගල්ලෑල්ල ක්‍රීඩා සංකීර්ණයේදී පසුගියදා (28දා) අවසන් විය.

මෙහිදී කි.ග්‍රෑ 55 බර පන්තියේ දිලංක ඉසුරු, කි.ග්‍රෑ. 67 බර පන්තියේ තිලංක පළගසිංහ, කි.ග්‍රෑ. 102 බර පන්තියේ ශානක පීටර්ස් හා සුපිරි බර පන්තියේ තිමාලි හපුතැන්න ශ්‍රී ලංකා වාර්තා තුන බැගින් අලුත් කිරීමට සමත් වූහ. එමෙන්ම මෙහිදී තිමාලි හපුතැන්නගේ දක්ෂතා සුවිශේෂී වූ අතර, ඇය ස්නැච් හා ක්ලීන් ඇන්ඩ් ජර්ක් යන අංශ දෙකෙන්ම කි.ග්‍රෑ. 200ක බරක් එසවීමට සමත් වූවාය. එය බර ඉසිලීමේ අංශයෙන් මෙරට කාන්තාවක් කි.ග්‍රෑ. 200 සීමාවට ළඟා වූ පළමු අවස්ථාව ලෙස සැලකෙයි.

මෙම තරගාවලිය එළඹෙන අප්‍රේල් මාසයේදී උස්බෙකිස්තානයේ පැවැත්වීමට නියමිත ආසියානු බර ඉසලීමේ ශූරතාවලියට තේරීම් තරගයක් ලෙස පැවැති අතර, බර ඉසිලීමේ සුපිරි සංචිතය නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් 13ක් මේ සඳහා සහභාගි වූහ. කෝවිඩ්-19 වෛරසය හේතුවෙන් බර ඉසලීමේ ක්‍රීඩකයන්ටද නිසි පරිදි සිය පුහුණුවීම් කටයුතු සිදුකිරීමට නොහැකි වූ හෙයින් ඔවුන් සිය සුපුරුදු දක්ෂතා අතර සිටින බව තහවුරු කිරීමද මෙම තරගාවලිය පැවැත්වීමේ එක් අරමුණක් විය. මෙවර ආසියානු බර ඉසිලීමේ ශූරතාවලිය එළඹෙන ටෝකියෝ ඔලිම්පික් ක්‍රීඩා උළෙලට තේරීම් තරගාවලියක් ලෙසද මෙවර පැවැත්වේ.

**ශ්‍රී ලංකා වාර්තා පිහිට වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්**

**1 දිලංක ඉසුරු (කි.ග්‍රෑ. 55 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 111, ක්ලින් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 140, එකතුව කි.ග්‍රෑ. 251 (ශ්‍රී ලංකා වාර්තා 03)**

**2 තිලංක පළගසිංහ (කි.ග්‍රෑ. 67 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 119, ක්ලින් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 146, එකතුව කි.ග්‍රෑ. 265 (ශ්‍රී ලංකා වාර්තා 03)**

**3 ඉන්දික දිසානයක (කි.ග්‍රෑ. 81 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 132 (ශ්‍රී ලංකා වාර්තාවක්), ක්ලින් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 161**

**4 චින්තන විදානගේ (කි.ග්‍රෑ. 81 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 132, ක්ලින් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 171 (ශ්‍රී ලංකා වාර්තාවක්)**

**5 තිමාලි හපුතැන්න (සුපිරි බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 88, ක්ලින් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 112, එකතුව කි.ග්‍රෑ. 200 (ශ්‍රී ලංකා වාර්තා 03)**

**6 ශානක පීටර්ස් (කි.ග්‍රෑ. 102 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 134, ක්ලින් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 170, එකතුව කි.ග්‍රෑ. 304 (ශ්‍රී වාර්තා 03)**

**7 චතුරිකා වීරසිංහ (කි.ග්‍රෑ. 81 බර පන්තිය)**
**ස්නැච් - කි.ග්‍රෑ. 85, ක්ලින් ඇන්ඩ් ජර්ක් - කි.ග්‍රෑ. 110, එකතුව කි.ග්‍රෑ. 195 (ශ්‍රී ලංකා වාර්තා 03)**

# 'එස්. ආර්.' ද. පළාත් කාන්තා, පිරිමි විවෘත මේසපන්දු තරගාවලියට පෙබ. 01 දක්වා අයදුම්පත් භාරගැනේ

● කරන්දෙණිය එම්. සුසිල් ප්‍රියන්ත

එස්. ආර්. මේස පන්දු ඇකඩමිය පළමු වරට සංවිධානය කරනු ලබන දකුණු පළාත් කාන්තා, පිරිමි විවෘත ශ්‍රේණිගත කිරීමේ මේසපන්දු තරගාවලිය සඳහා අයදුම්පත් පෙබරවාරි මස 01වැනිදා දක්වා භාරගැනේ.

අයදුම්පත් ප්‍රධාන පුහුණුකරු, එස්.ආර්. සමීර රාජා මහතා, එස්.ආර්. මේසපන්දු ඇකඩමිය, අංක 117සී, ආඳදොළ පාර, වතුගෙදර යන ලිපිනයට යොමු කළ යුතුය.

අයදුම්පත් ලැබීමෙන් පසු තරගාවලි ක්‍රීඩක, ක්‍රීඩිකා සටහන සැකසීම (Draw) පෙබරවාරි මස 02වැනිදා වතුගෙදර පිහිටි එස්. ආර්. මේසපන්දු ඇකඩමියේදී සිදු කෙරේ.

තරගාවලිය පෙබරවාරි මස 6, 7 යන දෙදින තුළ බළපිටිය රේවත ජාතික පාසල් ස්වර්ණ ජයන්ති ශාලාවේදී පැවැත්වේ.

කෝවිඩ්-19 ව්‍යසනයෙන් පසුව දකුණු පළාතේ ආරම්භ කෙරෙන පළමු විවෘත ශ්‍රේණිගත කිරීමේ මේසපන්දු තරගාවලිය මෙය වන අතර, මේ තරගාවලියට සහභාගි විය හැක්කේ ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුනට අයත් දකුණු පළාතේ මේසපන්දු ක්‍රීඩක, ක්‍රීඩිකාවන්ට පමණි.

වයස 08න් පහළ, 10න් පහළ, 12න් පහළ, 15න් පහළ, 18න් පහළ, 21න් පහළ 40න් පහළ, විවෘත, කාන්තා, පිරිමි ඒකල ලෙස හා වයස 15න් පහළ යුගල, පිරිමි, කාන්තා ලෙස හා වයස 8න් පහළ ආධුනික පිරිමි, කාන්තා ඒකල ලෙස තරගාවලිය පැවැත්වේ.

මේ තරගාවලිය සඳහා වැඩි විස්තර තරග සංවිධායක සමීර රාජා මහතා (0775013619 හෝ 0770232377) ඇමතීමෙන් ලබාගත හැකිය.

# ක්‍රිකට් නංවන්න කරුණු 07ක යෝජනාවලියක්



● පැතුම් ශ්‍රී විජේරත්න

මෙරට ක්‍රිකට් ක්‍රීඩාවේ අභිවෘද්ධිය සඳහා ජාතික ක්‍රීඩා සභාව සහ ක්‍රීඩා අමාත්‍යාංශය එක්ව නව වැඩපිළිවෙළක් සහ ඒ හා සම්බන්ධ යෝජනාවලියක් සකස් කර තිබේ.

කරුණු 07කින් සමන්විත මෙම යෝජනාවලිය ක්‍රීඩා අමාත්‍යාංශය පසුගියදා (29දා) නිල වශයෙන් ප්‍රකාශයට පත් කළේය.

මෙම සාකච්ඡාවේදී ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ වත්මන් ක්‍රියාකාරීත්වය, ක්‍රීඩකයන්ගේ කළමනාකරණ කටයුතු සහ විධිමත්ව කණ්ඩායමට ක්‍රීඩකයන් තෝරා ගැනීමේ දී ක්‍රීඩකයන්ගේ දක්ෂතා විශ්ලේෂණය කිරීම සහ එහි පවතින යාන්ත්‍රණය පිළිබඳ සමාලෝචනය කර තිබේ.

ඊට අදාළව සැකසුණු නව යෝජනා 07 වන්නේ,

01. දැනට පවතින තේරීම් කමිටුව පිළිබඳ සළකා බැලීමත්, නව තේරීම් කමිටුවක් පත් කිරීමත්,

02. දැනට පවතින ප්‍රථම පන්තියේ ක්‍රිකට් තරගාවලිය සම්බන්ධයෙන් සළකා බලා එහි ව්‍යුහය අවම වශයෙන් කණ්ඩායම් 08ක් සහ උපරිම කණ්ඩායම් 14ක් ලෙස පළමු පෙළ තත්ත්වය (Tier-I) ලබාදීම, 'ටියර් බී' කණ්ඩායම් (Tier-II) සඳහා පළමු පෙළ තත්ත්වය ලබා නොදීම,

03. නව සුපිරි පළාත් තරගාවලියක් සංවිධානය කිරීම. කණ්ඩායම් 05ක් එයට එක්කිරීම මෙන්ම කණ්ඩායම් සඳහා ප්‍රිමියර් ('ටියර් ඒ' සහ 'ටියර් බී') ක්‍රීඩා සමාජ සහ අනෙක් ක්‍රීඩා සමාජ ක්‍රීඩකයන් නියෝජනය වන ලෙස කණ්ඩායම් සකස් කිරීම,

04. ජාතික කණ්ඩායමට පත් කළ යුතු ඉහළ හැකියාවන් සහ සුදුසුකම්ලත් නිලධාරීන් හඳුනා ගැනීම (කණ්ඩායම් උපදේශක, ක්‍රිකට් අධ්‍යක්ෂ, පූර්ණකාලීන කළමනාකරු පත් කිරීම),

05. ක්‍රීඩකයන්ගේ සහ පුහුණුකරුවන්ගේ ගිවිසුම් සැලසුම් කිරීමේදී දිරිගැන්වීමේ පටිපාටිය පිළිබඳව සලකා බැලීම. මෙහිදී ඔවුන්ගේ පෞද්ගලික දක්ෂතා සහ අඛණ්ඩව විනය පවත්වා ගැනීම පිළිබඳ වැඩි අවධානය යොමු කෙරේ,


06. ශ්‍රී ලංකා ක්‍රිකට් කළමනාකරුවන් මගින් ක්‍රීඩකයන්ගේ සහ සහායකයන්ගේ Contracted Staff) ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීමේදී ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතාව සහ විනය පිළිබඳව වඩාත් සැලකිලිමත් වීම,

07. තවදුරටත් ජාතික සහ අන්තර්ජාතික ක්‍රිකට් ව්‍යුහය සකස් කිරීමේදී ඒ සඳහා නිර්දේශිත ක්‍රිකට් කමිටුවක් (ක්‍රියාකාරී හා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් සමන්විත කමිටුවක්) නම් කිරීම වේ.






# ඔස්ට්‍රේලියානු විවෘත ටෙනිස් තරගාවලිය නැරඹීමට තිස්දහසකට අවසර



● ඕෂිත වරකපිටිය

එළඹෙන පෙබරවාරි මසදී ආරම්භ වන ඔස්ට්‍රේලියානු විවෘත ටෙනිස් තරගාවලිය නැරඹීමට දිනකට තිස්දහසක ප්‍රේක්ෂක සංඛ්‍යාවක් වෙනුවෙන් අවසර ලබාදීමට ඔස්ට්‍රේලියානු බලධාරීන් තීරණය කර ඇත.

ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියානු ආණ්ඩුකාරවරයා විසින් මෙම තීරණය ප්‍රකාශයට පත් කොට ඇත. මෙහිදී තරගාවලියේ මුල් දින 8දී නැරඹීම වෙනුවෙන් ප්‍රේක්ෂකයන් තිස්දහසකට අවසර ලැබෙන අතර, ඔවුන්ට දිවා හා රාත්‍රී තරග සඳහා වෙන් වෙන් වශයෙන් නැරඹීමට අවස්ථාව ලබාදීමට නියමිතය.

අනතුරුව අවසන් පූර්ව වටයේ සිට එම සංඛ්‍යාව විසිපන්දහස දක්වා අඩු කිරීමට නියමිතය. මෙය පසුගිය වර්ෂයේ තරගාවලිය නැරඹීමට දිනකදී පැමිණි ප්‍රේක්ෂක සංඛ්‍යාවේ සාමාන්‍යයෙන් අඩක් පමණ වේ.

වසරේ පැවැත්වෙන ප්‍රධානම ටෙනිස් තරගාවලි හෙවත් ග්‍රෑන්ඩ්ස්ලෑම් ටෙනිස් තරගාවලි හතරෙන් පළමුවැන්න වන මෙය එළඹෙන පෙබරවාරි 8වැනිදා සිට 21 වැනිදා දක්වා ඔස්ට්‍රේලියාවේ මෙල්බර්න්හිදී පැවැත්වීමට නියමිතය.

කෙසේ වෙතත් තරගාවලිය පැවැත්වෙන දින 14 තුළදී ලක්ෂ 4කට ආසන්න ප්‍රේක්ෂක සංඛ්‍යාවක් තරගාවලිය නැරඹීමට පැමිණෙනු ඇතැයි බලධාරීන් විශ්වාසය පළ කරයි. එය පසුගිය වර්ෂයේ තරගාවලිය නැරඹීමට පැමිණි සංඛ්‍යාවෙන් හරි අඩක් පමණ වේ.

මේ අතර මෙවර තරගාවලිය වෙනුවෙන් ක්‍රීඩකයන්, නිලධාරීන් හා සේවකයන් එක්දහස් හත්සියයකට අධික සංඛ්‍යාවක් ඔස්ට්‍රේලියාව බලා මේ වනවිට පැමිණ ඇත. ඔවුන් සියලු දෙනා නවාතැන්වල නිරෝධායනයට ලක්වන බව ඔස්ට්‍රේලියානු බලධාරීහු පවසා සිටිති. ඔස්ට්‍රේලියාව මේ වනවිට කෝවිඩ් -19 ව්‍යාප්තිය හොඳින් පාලනය කර ඇති අතර, මෙම වර්ෂය ආරම්භයේ සිට ඔස්ට්‍රේලියාවේ තවමත් කෝවිඩ්-19 මරණයක් වාර්තා වී නොමැත.

මහීපාල හේරත් අභියෝග ශූරතා මේසපන්දු තරගාවලිය-2021

# කාන්තා ඒකල ශූරතාව මුතුමාලි ප්‍රියදර්ශනීට



● ඕෂිත වරකපිටිය

ශ්‍රී ලංකා මේසපන්දු සම්මේලනයේ මෙහෙයවීමෙන් පැවැත්වෙන මහීපාල හේරත් අභියෝග ශූරතා සමස්ත ලංකා මේසපන්දු තරගාවලියේ කාන්තා ඒකල ශූරතාව දිනා ගැනීමට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මුතුමාලි ප්‍රියදර්ශනී සමත් වූවාය.

ඒ අවසන් මහා තරගයේදී කොළඹ කාන්තා විදුහලේ ජිතාරා වර්ණකුලසූරිය තියුණු තරගයකින් පසු තරග වට 3-2ක් ලෙසින් පරාජයට පත් කරමිනි. මෙහි අවසන් ලකුණු තත්ත්වය දැක්වුණේ 8/11, 11/8,7/11, 11/9,11/2ක් ලෙසිනි.

මෙම තරගාවලිය පසුගියදා (30දා) කෑගල්ල නගර සභා ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.මෙහිදී අවසන් පූර්ව වටයන්හිදී ජිතාරා වර්ණකුලසූරිය විසින් මහනුවර හිල්වුඩ් විදුහලේ බිමන්දි බණ්ඩාර තරග වට 3-0 (11/9,11/9,11/6)ක් ලෙසින් පරාජයට පත් කළ අතර, මුතුමාලි ප්‍රියදර්ශනී විසින් වරාය අධිකාරියේ ඉෂාරා මධුරංග තරග වට 3-2 (7/11,11/9,11/6,9/11,12/10)ක් ලෙසින් පරාජයට පත් කරන ලදී.



තරගාවලියේ ජයග්‍රාහකයන්ට ත්‍යාග ප්‍රදානය කිරීම වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය කනක හෙරත් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. මෙහි පිරිමි අංශයේ අවසන් තරග ඊයේ (31දා) පැවැත්වීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් නිරෝධායන පූර්වෝපායයක් ලෙසින් තරගාවලියේ යුගල තරග මෙවර නොපැවැත්වීමට සංවිධායකයන් මෙවර පියවර ගෙන තිබිණි.

## ලොතරැයි ප්‍රතිඵල



| | | | | | |
|---|---|---|---|---|---|
| මහජන සම්පත - 4383 | ධන නිධානය - 0420 | ගොවිසෙත - 2678 | සුපිරි වාසනා - 1569 | වාසනා සම්පත - 1658 | ජාතික සම්පත - 1092 |
| W 4 7 4 5 2 0 | J 16 27 39 41 | J 16 43 52 66 | 9 12 13 47 51 | X 23 25 48 70 | O 3 8 0 3 6 5 |
| නිරෝගා - 717 | සෙවණ - 313 | මෙගා පවර් - 750 | දරු දිරි සම්පත - 21 | ශනිදා වාසනාව - 3509 | ජයෝදා - 1728 |
| වෘෂ්චික 14 59 63 68 | G 12 28 34 51 | G 21 1 34 39 66 | M 01 12 34 61 | 46 62 73 74 O | 04 27 40 60 W |
| අද කෝටිපති - 1179 | සංර්ධන වාසනාව - 406 | ලග්න වාසනාව - 3060 | සුපර් බෝල් - 1353 | දෙලක්ෂපති - 103 | කෝටිපති කප්රුක - 683 |
| C 01 23 48 74 | 11 21 69 01 W | 01 07 36 60 මිථුන | Y 19 45 55 61 | 03 04 63 L | 09 40 53 79 F |

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 08 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2021 පෙබරවාරි මස 01වැනි සඳුදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.